# ප්‍රාථමිකය 7

අළුත් ගිවිසුම
වයස 8–11

# ප්‍රාථමිකය 7

## අළුත් ගිවිසුම

වයස අටේ සිට එකොළහ දක්වා ළමුන්ට ඉගැන්වීම පිණිසය

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව
සොල්ට් ලේක් නගරය, යූටා

© 2006 by Intellectual Reserve, Inc විසිනි.
සියලු හිමිකම් ඇවිරිනි
අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී
ඉංග්‍රීසි අනුමැතිය: 6/97
පරිවර්තන අනුමැතිය: 6/97
*Primary 7: New Testament* පරිවර්තනයයි
Sinhala

# පටුන


| පාඩමේ අංකය සහ මාතෘකාව | | පිටුව |
|---|---|---|
| ගුරුවරයාට උපකාර | | v |
| 1 | අතීත ගිවිසුම ගැන දැනුමක් ලබාගැනීම | 1 |
| 2 | අපගේ ගැලවුම්කරුවාණන් වීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කැමැත්තෙන්ම ඉදිරිපත්වූසේක | 4 |
| 3 | යොහාන් බව්තීස්තය යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය සූදානම් කළේය | 7 |
| 4 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීක පියාණන්වහන්සේගේ පුත්‍රයාණෝය | 10 |
| 5 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ළමාකාලය | 12 |
| 6 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බව්තීස්මය | 15 |
| 7 | සාතන් විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පරීක්ෂාකරන ලදී | 18 |
| 8 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දේවමාළිගාව පිරිසිදු කරනසේක | 21 |
| 9 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේරිතයන් කැඳවනසේක | 25 |
| 10 | කන්ද උඩ දේශනාව | 29 |
| 11 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යාච්ඤාව ගැන උගන්වනසේක | 32 |
| 12 | පර්වතය මත ගොඩනගන ලද ගෘහය | 35 |
| 13 | යේසුස් ක්‍රිස්ත්තුස්වහන්සේ රෝගීන් සුවකරනසේක | 38 |
| 14 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ සබත්දිනය | 41 |
| 15 | අන්‍යන්ට ආශිර්වාදකිරීම පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ පූජකවර බලය භාවිතා කළසේක | 44 |
| 16 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හාස්කම් ඉටුකළසේක | 47 |
| 17 | වපුරන්නාගේද තිරිඟු සහ කිරිඳි ගැන උපමාව | 50 |
| 18 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජාත්‍යාන්ධයෙකු සුවපත්කරනසේක | 53 |
| 19 | නැතිවූන බැටළුවා, නැතිවූන මිලය, සහ අකීකරු පුත්‍රයා | 56 |
| 20 | යහපත් සමාරියා ගැන උපමාව | 59 |
| 21 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුෂ්ඨ රෝගීන් දසදෙනෙකු සුවපත්කරනසේක | 62 |
| 22 | අකරුණාවන්ත දාසයා | 65 |
| 23 | යහපත් බැටළු එඬේරා | 68 |
| 24 | කනවැන්දඹුවගේ සල්ලිය | 71 |
| 25 | කන්‍යාවන් දසදෙනාගේ උපමාව | 75 |
| 26 | තලෙන්ත උපමාව | 79 |
| 27 | බැටළුවන් සහ එළුවන් ගැන උපමාව | 82 |
| 28 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලාසරුස් මළවුන්ගෙන් නැගිටවීම | 85 |
| 29 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විජයග්‍රාහීව ඇතුල්වීම සහ අන්තිම රාත්‍රී භෝජනය | 88 |

| | | |
|---|---|---|
| 30 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෙත්සෙමනෙහි සිටීම | 91 |
| 31 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පාවාදීම, අල්ලාගැනීම සහ නඩු විභාගය | 95 |
| 32 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේව කුරුසියේ ඇණගැසීම සහ භූමදානය | 98 |
| 33 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම | 102 |
| 34 | මාගේ බැටළුවන් පෝෂණයකරන්න | 105 |
| 35 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය | 109 |
| 36 | පෙන්තකෝස්ත දිනය | 113 |
| 37 | පේතෘස් නම් ප්‍රේරිතවරයා | 117 |
| 38 | බර්ණබස්, අනනියස්, සහ සප්පීරා | 121 |
| 39 | සෙත්පන්, වේද සාක්ෂිකරුවෙකු සේ මැරුම්කෑම | 124 |
| 40 | පේතෘස් සහ කොරනේලියස් | 127 |
| 41 | අපගේ දිව දමනය කිරීමට යාකොබ් අපට උගන්වයි | 130 |
| 42 | සාවුල්ගේ හැරීම | 134 |
| 43 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පාවුල් සාක්ෂිදරයි | 137 |
| 44 | පාවුල් නම්වූ ධර්මදූතවරයා | 140 |
| 45 | රෝමයට පාවුල්ගේ ගමන | 143 |
| 46 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙනසේක | 147 |
| 47 | අපගේ ජීවිත ආශිර්වාදකිරීමට පූජකවරයට හැකිය (පූජකවරයට සූදානම්වීමේ පාඩම) | 152 |

# ගුරුවරයාට උපකාර

ආඥාවන් පවත්වමින් ඉගැන්වීමේ වැදගත්කම ගැන ගැලවුම්කරුවාණන් මෙසේ කියමින් ඉගැන්වූසේක, "නමුත් ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ග රාජ්‍යයෙහි උතුම් යයි කියනු ලබන්නේය" (මතෙව් 5:19). සේවය කිරීමටත් ඔවුන්ගේ බව්තීස්ම ගිවිසුම් තැබීමටත් ළමයින්ට ඉගෙනගැනීම සඳහා උපකාරකිරීමේ පූජනීය වගකීමක් ඔබට දී තිබේ. එක් එක් ගැහැණු ළමයෙකු තරුණ කන්‍යාවක් බවට පත්වීමට සූදානම් වීමේදීද, එක් එක් පිරිමි ළමයෙකු තරුණ මිනිසෙකු බවට පත්වීමට සූදානම් වෙමින් පූජකවරය ලබාගැනීමේදී, ඔවුන්ගේ ජීවිතවලට ඔබට වැදගත් බලපෑමක් විය හැකිය.

1831 දී සභාව සංවිධානය කිරීමෙන් කෙටි කලකට පසු, ගැලවුම්කරුවාණන් මෙසේ ඉගැන්වූසේක බයිබලයේ සහ මෝර්මන්ගේ පොතෙහි සඳහන් එවිට තිබුන එකම ශුද්ධ ලියවිලි වන මගේ ශුභාරංචියේ මූලධර්ම ගුරුවරුන් ඉගැන්විය යුතුය (බලන්න ඩීසහගී 42:12), දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ළමයින්ගේ ඇදහීම වර්ධනයවීමට උපකාරවන දහම සහ ගිවිසුම්ද, අනගි මුතු ඇටයද අඩංගු සියලුම ප්‍රමිතියේ පොත්වලින් පූජනීය සත්‍යයන් ඉගැන්වීමේ වගකීම අද ගුරුවරුන්ට තිබේ.

**අධ්‍යයන පාඨමාලා**

ජනවාරි 1 ට අවුරුදු අටේ සිට එකොළහේ වයස් සීමාව ඇති සියලුම ළමයින්ට, ප්‍රාථමික 4, 5, 6 සහ 7 අත්පොත් එකකින් ඉගැන්විය යුතුවේ. මෙම වයස් සීමාවේ සියලු ළමයින්ට, එක් එක් වසරේදී, එක් පාඨමාලාවක් පමණක් භාවිතාකරනු ලැබේ. එක් එක් අධ්‍යයන පාඨමාලාවක්, ශුද්ධවූ ලියවිලි විශේෂිත පොතක් මත පදනම්වී තිබේ.: එනම් ප්‍රාථමික 4, මෝර්මන්ගේ පොත, ප්‍රාථමික 5 දහම සහ ගිවිසුම, ප්‍රාථමික 6 පරණ ගිවිසුම, සහ ප්‍රාථමික 7 අළුත් ගිවිසුම යනාදී වශයෙන්ය. අවුරුදු හතරක කාල පරිච්ඡේදයකදී, ප්‍රමිතියේ එක් එක් පොතක් ගැනම ළමයින් අධ්‍යයනයකරනු ලබන්නේය.

ප්‍රාදේශීය අවශ්‍යතාවයන් සහ අවුරුදු අටේ සිට එකොළහ දක්වා වයසැති ළමයින්ගේ සංඛ්‍යාව අනුව පුද්ගලික වයස් කංඩායම් වලට හෝ, පිරිමි ළමයින්ට සහ ගැහැණු ළමයින්ට වෙන් වෙන් වශයෙන් පංතිය සංවිධානය කිරීමටැහැකිය ඔබගේ පංතිය කෙසේ පිළියෙල කළත්, එක් එක් ළමයාට ප්‍රමාණවත් අවධානයක් ලැබෙනවාද කියා ඔබ සහතික කරගැනීම අවශ්‍යවේ.

ළමුන්ට වයස අවුරුදු දොළහ වන විට, තරුණ කාන්තාවන් හෝ ආරෝනික පූජකවර පංතිවලට යොමුවීමට පටන් ගනිති. කෙසේ වෙතත්, ඔවුන් ඉරුදින පාසලට පැමිණීමට පටන්ගන්නා විට, ජනවාරි මාසයේ පළවෙනි සතිය වන තෙක්, ඉරුදින පාසල් කාලයේදී, ඔවුන් ප්‍රාථමික පංතියට පැමිණෙනවා ඇත.

**පූජකවරයට සූදානම්වීමේ පාඩම**

"අපගේ ජීවිතවලට ආශිර්වාද කිරීමට පූජකවරයට හැකිය," යන විශේෂිතවූ පාඩම මෙම අත් පෙතෙහි අඩංගුවී ඇත. අවුරුදු 11 වයසැති පිරිමි ළමයි උපස්ථායකයන් වීමට සූදානම්වන විට, සහ ගැහැනු ළමයින් තරුණ කාන්තාවන් වශයෙන් ඉදිරියට යන විට, මෙම පාඩම ගුරුවරුන් භාවිතා කරනවා ඇත. ඔබගේ පංතියේ පළවෙනි ළමයා වයස 12 වීමට පෙර, මෙම පාඩම උගන්වන්න. පූජකවරය යනු කුමක්ද, එය ඔවුන්ගේ ජීවිතවලට ආශිර්වාදකරන අන්දම ගැනද, පූජකවරයට ගරුකිරීම පිණිස ඔවුන්ගේ වගකීම් පූර්ණකරන අන්දම ගැනද ළමයින්ට ඉගෙනගැනීම පිණිස, පාඩම සූදානම්වී ඉදිරිපත්කරන විට, ස්වාමීන්වහන්සේගේ මගපෙන්වීම පතා යාච්ඤාකරන්න.

**පාස්කුව සහ නත්තල ගැන පාඩම්**

පාස්කුව සහ නත්තල ගැන විශේෂිතවූ පාඩම් මෙම අත් පොතෙහි අඩංගුවී නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ දූතමෙහෙය ගැන මෙම අත්පොත යොමුවන නිසා පාස්කුව සහ නත්තල ගැන අමතර පාඩම් අවශ්‍ය නොවන බව ඔබට හැගෙනවා ඇත. විශේෂ පාඩමක් ඉගැන්වීමට ඔබට අවශ්‍යවන්නේ නම්, මෝරමන් පොතෙන්ද, අළුත් ගිවිසුමෙන් කරුණුද, ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලමෙන් සහ සභාවේ සඟරාව වන ලියහෝනාවෙන් වෙනත් සුදුසු කරුණුද, උපයෝගී කරගෙන පාඩමක් සූදානම් කරන්න. ළමයි යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සමීපවීමේ හැඟීම්ද, උන්වහන්ස්ගේ දූතමෙහෙය ගැන අවබෝධයක් ලබාගැනීමට උපකාරවන අන්දමේ පාඩම් සැලසුම් කරන්න.

### මෙම අත් පොතෙන් ඉගැන්වීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සහ දූතමෙහෙය අවධාරණයකරන අළුත් ගිවිසුමේ ඉගැන්වීම්වලට මෙම අධ්‍යයන පාඨමාලාව යොමුවන්නේය. මෙම ඉගැන්වීම් බෙදාගනිමින් සාකච්ඡාකරන විට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය සහ වන්දිගෙවීම ගැන වඩා හොඳ අවබෝධයක් ලබන අතර, උන්වහන්සේ තුල ඇදහීම සහ උන්වහන්සේ තුල ඔවුන්ගේ සාක්ෂි වඩාත් වර්ධනය වන්නේය. ඔවුන්ගේම ජීවිත තුලට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අදාළ කරගනිමින් උන්වහන්සේගේ පණත් තැබීමට වඩාත් ශක්තිමත් අභිලාශයක් ලබාගැනීමට ඔවුන් ඉගෙනගත යුතුය.

නිවසේදී අලුත් ගිවිසුම කියවීමට ළමුන්ව දිරිගන්වන්න. යේසුස්වහන්සේගේ ප්‍රේමය ගැන ඉගෙන ගැනීමෙන් සහ උන්වහන්සේගේ ඉගැන්වීම් වඩා හොඳට අවබෝධකරගැනීම තුලත් ගැලවුම්කාරයාණන් කෙරෙහි ප්‍රේමයෙන් වැඩෙන අතර උන්වහන්සේ මෙන් වීමට ළමයින්ට අවශ්‍ය වන්නේය. යේසුස්වහන්සේගේ ජීවිතයෙන් සහ ඉගැන්වීම් වලින් ළමයින් ඉගෙන ගන්නා වැදගත් සත්‍යයන්, ඔවුන්ගේ ගිවිසුම් තැබීමටත්, ඔවුන්ගේ ජීවිත කාලය තුලදීම සභාවේ සේවය කිරීමට සූදානම්වීම සඳහා ඒවා ඔවුන්ට උපකාරවනවා ඇත. අද ලෝකයේ පවතින පරීක්ෂාවන්ට විරුද්ධව නැගී සිටීමටද මෙම සත්‍යයන් ඔවුන්ට ශක්තිය දෙනු ඇත.

### ඉගැන්වීමට ඔබම සූදානම්වීම

ළමයින්ට ඉගැන්වීමේ ඔබගේ පූජනීය කැඳවීම සම්පූර්ණකිරීමට, මානසිකවත්, ආත්මිකවත් ඔබ සූදානම්විය යුතුය. ඔබ උගන්වන මූලධර්ම ගැන, අවබෝධයක් සහ සාක්ෂියක් තිබීම මෙම සූදානමේ කොටසක් වන්නේය. සියල්ලන්ටම වඩා ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකුවූ ගැලවුම්කරුවාණන් උන්වහන්සේගේ ශුභාරංචිය අන්‍යයන්ට ඉගැන්වීම පිණිස සූදානම්වීම ගැන අපට ඉගැන්වූසේක.

- යාච්ඤාව තුලින් යටහත්ව ආත්මයාණන්ව සොයන්න.යටහත්වීමට ස්වාමීන්වහන්සේ අපට අණකළසේක, අප යටහත්වූ විට, උන්වහන්සේගේ හස්තයෙන් අපට මගපෙන්වා, අපගේ යාච්ඤා වලට පිළිතුරු දෙන බවට උන්වහන්සේ පොරොන්දුවූසේක (බලන්න ඩීසහගී 112:10). අප යටහත් නම් උන්වහන්සේගේ දරුවන්ට ඉගැන්වීමට ස්වාමීන්වහන්සේට අවශ්‍ය ආකාරය දැනගැනීමට අපට අයිතියක් තිබේ.

- ශුද්ධ ලියවිලි සහ ජීවමාන අනාගතවක්තෘවරුන්ගේ වචන අධ්‍යයනය කරන්න. ස්වාමීන්වහන්සේගේ වචන ඉගෙනගැනීම සහ මෙනෙහිකිරීම තුල මහඟු බලයක් ඇත. පළමුව උන්වහන්සේගේ වචනය ලබාගැනීමටත්, ඉන්පසු අපගේ දිව නිදහස්කරන බවට උන්වහන්සේ අපට අණකළසේක; අනතුරුව, අප කැමති නම්, අපට උන්වහන්සේගේ ආත්මය සහ වචනය ලැබෙන්නේය. එසේය, එය වනාහි මිනිසුන්ට ඒත්තු ගැන්වීමේ දෙවියන්වහන්සේගේ බලයවේ (බලන්න ඩීසහගී 11:21).

  ස්වාමීන්වහන්සේගේ වචන ඉගෙනගැනීමට අපට තිබෙන අවශ්‍යතාවය ගැන, පසු දවස්වල අනාගතවක්තෘවරයෙකුවූ සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන් මෙසේ සහතික කළේය: "ශුද්ධවූ ලියවිලි අධ්‍යයනයකිරීම පිණිස නැවත පොරොන්දුවීමට මම ඔබලාට බලකරමි. ඒවා තුල ඔබ දිනපතා ඇලී ගැලී සිටින විට, ඔබගේ කැඳවීම කෙරෙහි යොමුවීම පිණිස ආත්මයාණන්ගේ බලය ඔබට ලැබෙන්නේය" (*Ensign*, මැයි 1986, ප. 82).

- ඔබගේ ගිවිසුම් තබන්න. ආත්මයාණන් විසින් මගපෙන්වීමේ ඔබගේ හැකියාව රඳාපවතින්නේ, ස්වර්ගික පියාණන්වහන්සේ සමග ඔබ තැබූ ගිවිසුම් ඇදහිලිවන්තව රක්ෂාකිරීම මතය. ඔබ තබන ලද ගිවිසුම් රක්ෂාකිරීමට ඔබ වෙහෙසදරන විට, ඔබ යහපත් ආදර්ශයක්ද තබන්නේය (බලන්න ඩීසහගී 42;13). ගැලවුම්කරුවාණන්ට ඔබගේ ප්‍රේමය සහ ශුභාරංචිය අනුව ජීවත්වීමට ඔබගේ කැපවීම ළමයින් දකින විට, උන්වහන්සේව අනුගමනයකිරීමට ඔවුන් වඩාත් පෙළඹෙනවා ඇත

- ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය ළමයින්ට හැඟෙන පිණිස ඔවුන්ට උපකාර කළහැකි ක්‍රම සොයන්න. ඔබ ඔවුන්ට කොපමණ ප්‍රේම කරනවාද කියා නිතර ඔවුන්ට කියන අතර, ඔවුන්ගේ වටිනාකම සහ හැකියාවන් ගැන ඔබගේ සතුට පළකරන්න. ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඔවුන්ට තිබෙන ප්‍රේමය වටහාගැනීමට ඔබගේ ප්‍රේමය සහ කරුණාව ළමයින්ට උපකාරවන්නේය. අනුන්ට ප්‍රේමකිරීම පිණිස ඉගෙනගැනීමටද ඔවුන්ට එය උපකාරවන්නේය.

### ඔබගේ පාඩම් සූදානම්කිරීම

ශුද්ධවූ ලියවිලිවලට යොමුවන පාඩම් සංවිධානයකිරීමට මෙම අත්පොත ඔබට උපකාර වන්නේය. අලුත් ගිවිසුමෙන් විස්තර සහ සටහන් පාඩමේදී භාවිතාකිරීම මගින් ශුභාරංචි මූලධර්ම ළමයින්ට අවබෝධකරගැනීමට උපකාරවේ. ශුද්ධවූ ලියවිලි විස්තර උගන්වන ආකාරය, නියම වශයෙන්ම පාඩමෙන් පෙන්වා නොදෙයි. ආත්මයාණන් මගින් සූදානම්වී උගන්වන අතර, ශුද්ධවූ ලියවිලි විස්තර, එහි අඩංගු මූලධර්ම, ඔවුන්ගේ ජීවිත තුල මෙම මූලධර්ම අදාළකර ගැනීමේ ආකාරය ගැන ළමයින්ට වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමට ඔබ ළමයින්ට උපකාර

කරන්නේය. ඔබගේ පාඩම් මනාව සූදානම්කිරීමෙන් හා සිත්ගන්නාසුළු වනවිට, සවන්දීමට හා ඉගෙනගැනීමට ළමයින් වඩාත් පෙළඹෙනවා ඇත.

ඔබගේ පංතියේ ළමයින්ට සාර්ථකව ඉගැන්වීමට වඩා හොඳට සූදානම්වීම පිණිස පහත සඳහන් පියවරවල් ඔබට උපකාරවන්නේය:

1. පාඩමේ අරමුණ සහ "සූදානම්වීම" කොටසේ සඳහන් ශුද්ධවූ ලියවිලි කොටස් පාඩම ඉගැන්වීමට සතියකට හෝ දෙකකට පෙර, යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. පාඩමේ අරමුණ සහ ශුද්ධ ලියවිලි කොටස් නැවත කියවා ඔබගේ පංතියේ ළමයින්ට ඒවා අදාලවන අන්දම ගැන සලකා බලන්න. ඔබගෙන්ම මෙසේ අසන්න: "මෙම පාඩමේ ප්‍රතිඵලයක් වශයෙන් එක් එක් ළමයාට ඉගෙනගැනීමට හා කිරීමට ස්වර්ගීය පියාණන්වහන්සේට අවශ්‍ය කුමක්ද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහීම වර්ධනයකිරීමට, ඔවුන්ගේ සාක්ෂි ශක්තිමත්වීමට, සහ ඔවුන් මුහුණ දෙන නපුරු පරීක්ෂාවන්ට විරුද්ධව නැගීසිටීමේ හැකියාව ලබාගැනීමට මෙම පාඩම උපකාරවන්නේ කෙසේද?" ඔබට එන අදහස් ලියන්න.

   මූලික ශුභාරංචි මූලධර්ම සහ දහම මත ශුභාරංචි මූලධර්ම පොත (31110) පුද්ගලික අධ්‍යයන මගපෙන්වීමක් ලෙස සූදානම්කර ඇත. ශුභාරංචි මූලධර්ම පොතේ විශේෂ පරිච්ඡේද "සූදානම්වීම" කොටසේ සමහර පාඩම්වල සඳහන්කර ඇත. ප්‍රධාන මූලධර්මය හෝ පාඩමේ අඩංගු දහම ඉගැන්වීමට සූදානම්වීම පිණිස මෙම පරිච්ඡේද ඔබට උපකාරවනු ඇත. ඔබගේ රැස්වීම් ගෘහයේ පුස්තකාලයෙන් පිටපතක් ලබාගැනීමට හැකිවේ. නැතහොත් ඔබගේ බෙදාහැරීමේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් පිටපතක් මිලදීගැනීමට හැකිය.

2. පාඩම පටන්ගැන්මේදී යෝජිත ක්‍රියාකාරීත්වයට යොමුකිරීම හෝ ඔබේම එකක් නිර්මානය කළ යුතුද කියා තීරණයකරන්න. ශුද්ධවූ ලියවිලි විස්තරය ඉගැන්වීමේදී එය සුදුසුද, අදාලද යන්න සහතිකකර ගන්න.

3. ශුද්ධවූ ලියවිලි විස්තරය උගන්වන ආකාරය පාඩමේ සඳහන් නොවන නිසා උගන්වන්නේ කුමක්ද, කෙසේද යන්න තීරණයකිරීමට ආත්මයාණන්ගේ උපකාරය ඔබ සෙවිය යුතුය. එක් එක් සතියේදී ඉගැන්වීමේ විවිධ ක්‍රම භාවිතා කරන්න. ("ශුද්ධවූ ලියවිලිවලින් ඉගැන්වීම" මෙම පිටුව බලන්න). ක්‍රියාකාරකම් ඉගෙනගැනීමේදී හැකි තරම් පංති සාමාජිකයන් සහභාගිකරගැනීමට සැලසුම්කරන අතර, ශුද්ධවූ ලියවිලි විස්තරය ළමයින් අන්‍යයන්ට නැවත කීමට හැකිවන ආකාරයට ඔබගේ පාඩම උගන්වන්න.

4. ශුද්ධවූ ලියවිලි ඉතාම හොඳට අවබෝධකරගෙන ඒවා ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවන අන්දමේ ඒවා "සාකච්ඡා සහ අදාළ ප්‍රශ්න" වලින් තෝරාගන්න. පාඩම වේලාවේදී ඕනෑම අවස්ථාවක එම ප්‍රශ්න ඔබට භාවිතාකිරීමට හැකිවේ. ඒවා සියල්ලම භාවිතා කිරීමට ඔබට අවශ්‍ය නොවනවා ඇත.

5. ශුද්ධවූ ලියවිලි සහ පාඩමේ අරමුණ, ඔබගේ පංතියේ ළමයින්ට ඉතාම හොඳට අවබෝධකර ගැනීමට උපකාරවේයැයි ඔබට හැඟෙන අන්දමේ ඒවා "සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්" වලින් කියවා ඒවා භාවිතාකරන අන්දම සහ වේලාව සැලසුම්කරන්න. එක් එක් පංතිය වෙනස්ය. එක් කණ්ඩායමකට මනාව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් වෙනත් කණ්ඩායමකට නොගැලපෙනවා ඇත.

6. පාඩමේ අරමුණ පෝෂණයකරන සුදුසු පුද්ගලික අත්දැකීම් බෙදාගැනීමට සැලසුම්කරන්න. පංතිය සමග ඔබ අත්දැකීම් බෙදාගන්නා විටද, පංතිය ඔබ සමග සහ එකිනෙකා සමග අත්දැකීම් බෙදාගන්නා විට, ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීමට ඉඩදෙන්න. ඇතැම් පවුල්වල සහ පෞද්ගලික ඉතාම පූජනීය හෝ ඉතාම පුද්ගලික අත්දැකීම් ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ යුතුය.

## ශුද්ධවූ ලියවිලිවලින් ඉගැන්වීම

ඔබ පාඩම් සූදානම්කර උගන්වන විට, නිතරම ඔබ ආත්මයාණන් සෙවිය යුතුය (බලන්න ඇල්මා 17:2–4; ධර්මසහශී 42:12–14; 50:17–22). ඔබගේ පාඩම් ළමයින්ට ජනප්‍රිය හා අර්ථවත්වීම පිණිස සකස්කිරීමට ආත්මයාණන්වහන්සේ උපකාරකරනසේක.

ඔබගේ පංතියේ සමහර ළමයි ශුද්ධවූ ලියවිලි ගැන හුරු නොවනවා ඇත. ඔබ එක්ව කියවන විට, ශුද්ධවූ ලියවිලි සොයාගැනීමට ඉගෙනගන්නා උපකාර අවශ්‍ය පංති සාමාජිකයන් කෙරෙහි සංවේදීව සිටින්න. අවුරුද්ද මුලදී යම්කිසි කාලයක් ඔබට අවශ්‍යවන්නේ, විශේෂයෙන්ම ඔබ බාල ළමුන්ට උගන්වනවා නම්, ළමයින්ට ශුද්ධවූ ලියවිලි සොයාගන්නා අන්දම පෙන්වීම සඳහාය.

ළමයින්ගේ උනන්දුව පවත්වාගැනීමට, කරුණු ඉදිරිපත්කිරීමේදී විවිධ ක්‍රම භාවිතාකිරීමට උත්සාහ කරන්න. පහත සඳහන් යෝජනා ශුද්ධ ලියවිලිවලින් විවිධ අන්දමින් ඉගැන්වීමට ඔබට උපකාර කරයි.

1. ශුද්ධවූ ලියවිලි විස්තරය ඔබගේම වචනවලින් කියන්න. එහි සඳහන් සිද්ධීන් සහ මිනිස්සු, සිතෙහි මවාගැනීමට ළමයින්ට උපකාර කිරීමට උත්සාහ කරන්න. ඔබ කථාකරන මිනිසුන් ඇත්ත වශයෙන්ම ජීවත්වූ බවද, එම සිද්ධීන් ඇත්තවශයෙන්ම සිදුවූ බවද, ළමයින්ට අවබෝධකර ගැනීමට උපකාරකරන්න.

2. මුලු විස්තරයම හෝ තෝරාගත් කොටස්, කෙලින්ම ශුද්ධවූ ලියවිලි වලින් කියවීමට ළමයින්ට සලස්වන්න. සියලුම ළමයින්ට හොඳට කියවීමට නොහැකි බවද, කියවීමේ හැකියාව වයස අනුව තීරණයකිරීමට නොහැකි බවද, සිහිතබාගන්න. සියලුම ළමයින්ට කියවීමට හැකිනම්, නිශ්චලව කියවීමට මිනිත්තු ස්වල්පයක් ඔවුන්ට දෙන්න. ඔවුන් කියවූ දෙය පසුව ඔබට සාකච්ඡාකළ හැකිය. ළමුන් කියවා නිම කළාට පසු, අමාරු වචන සහ කොටස් අවබෝධකරගැනීමට ඔවුන්ට උපකාර කරන පිණිස සාකච්ඡාකිරීමේ කාලය භාවිතාකරන්න.

3. සිදුවූ දෙය ළමයින්ට මනසින් සිතීමට උපකාරවන පිණිස, ශුද්ධ ලියවිලි ගැන යෝජිත විස්තර අඩංගු පින්තූර භාවිතාකරන්න. බොහෝ පාඩම්වල යෝජිත පින්තූර "අවශ්‍ය කාරුණු" කොටසෙහි අඩංගුවී ඇත. පිංතූරවලට අංක යොදා අත් පොතට ඇතුළත්කර ඇත. සමහර පිංතූර ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලමේද තිබෙන අතර, ඒවා රැස්වීම් ගෘහයේ පුස්තකාලයෙහි තිබෙනු ඇත. (රැස්වීම් ගෘහයේ පුස්තකාලයේ "අවශ්‍ය කාරුණු" කොටසේ අංක යොදා ඇත). බොහෝ පින්තූරවල පිටුපස සාරාංශය මුද්‍රණයකර ඇත. යෝග්‍ය පරිදි වෙනත් පින්තූර ඔබට භාවිතාකළ හැකිය.

4. ශුද්ධවූ ලියවිලි විස්තරය රඟපෑමට ළමුන්ට සලස්වන්න. (ශුද්ධවූ ලියවිලිවල පූජනීයත්වය අඩු නොවන අන්දමට රඟපෑම පිණිස සහතිකකරගන්න). ලෝගුවක්, හිස්වැස්මක්, යනාදී සරල මෙවලම් ඔබට ගෙන ආ හැකි අතර, මුලු විස්තරය හෝ එහි කොටසක් රඟපෑමට ළමුන්ට සලස්වන්න. ඔවුන් නියෝජනය කරන පුද්ගලයා ඔහු නම්, ඔවුන්ගේ අදහස් මොනවාද කියා ඔවුන්ගෙන් අසන්න. උත්පත්ති දර්ශනයකදී හැරුනු විට, ගැලවුම්කරුවාණන්ව රඟ නොදැක්විය යුතුය. ස්වර්ගික පියාණන්වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ කිසි දිනක රඟ නොදැක්විය යුතුය.

5. සරල රූප හෝ උදාහරන රට හුනු ලෑල්ලේ ලියන්න, නැත්නම් පිංතූර හෝ කපාගත් පිංතූර ශුද්ධවූ ලියවිලි විස්තරය ඔබ කියන හෝ කියවන විට භාවිතා කරන්න.

6. ශුද්ධවූ ලියවිලි විස්තරයේ මිනිසුන්ගේ කොටස් රඟපාන ළමයි බොහෝ දෙනෙක් සිටින විට, කියවීමේ පංති ශාලාවක් මෙන් මෙහෙයවන්න. යෝග්‍ය අවස්ථාවලදී දෙබස් කෙලින්ම ශුද්ධවූ ලියවිලි වලින් කියවීමට ළමුන්ට සලස්වන්න.

7. විස්තරය කීමට, දෙමව්පියෙකුට, කොට්ඨාශ හෝ ශාඛා සාමාජිකයෙකුට නැතිනම් පංතියේ සාමාජිකයෙකුට ආරාධනාකරන්න. සතියකට හෝ දෙකකට පෙර සූදානම්වීමේ කාලයක් ලබාදී, ඉදිරිපත්කිරීමේ සීමිත කාලයක් ඔහුට හෝ ඇයට දීමට වග බලාගන්න.

8. ශුද්ධවූ ලියවිලි විස්තරය ඉගැන්වීමට පෙර, සත්‍ය-අසත්‍ය හෝ කෙටි පිළිතුරු තරඟයක් වැනි සරල පෙර පරීක්ෂණයක් ළමයින්ට දෙන්න. විස්තරය ගැන ඔවුන්ගේ දැනීම සොයාබැලීමට ඔබට අවශ්‍ය බව පංතියට පහදාදෙන්න. ඉන්පසු එම පරීක්ෂණයම ඔවුන්ට දුන් පසු ඔවුන් ඉගෙනගත් දේවල් ගැන ඔවුන්ට බලාගැනීමට හැකිය.

9. ශුද්ධවූ ලියවිලි විස්තරයේ සඳහන් වැදගත් වචන හෝ ජනයාගේ නම් රටහුණු ලෑල්ලේ ලැයිස්තුගතකරන්න. ඔබ විස්තරය කියවන විට, මෙම වචන හෝ නම්වලට සවන්දීමට ළමයින්ට සලස්වන්න. ශුද්ධ ලියවිලි වඩා හොඳට අවබෝධකර ගැනීමට සහ නිවසේදී කියවමින් සතුටුවීම පිණිස, ළමයින්ගේ වචන මාලාව වැඩිදියුණුකර ගැනීමට ඔවුන්ට උපකාර කරන්න.

10. පාඩම දීමට පෙර, විස්තරය ගැන ප්‍රශ්න රටහුණු ලෑල්ලේ ලියන්න. විස්තරකරන වේලාවේ, පිළිතුරු ළමයින්ට ඇසෙන විට, ඒවා ගැන සාකච්ඡාකිරීමට නතරකරන්න.

11. විස්තරය කියන්න, ඉන්පසුව තමන් ප්‍රියකරන කොටස නැවත කීමට කැමැත්තෙන් ඉදිරිපත්වීමට ළමුන්ට සලස්වන්න. විස්තරය පටන්ගැනීමට එක් එක් පංති සාමාජිකයෙකුට කීමට ඔබට හැකිවේ. ඉන්පසු එය නොකඩවා කරගෙන යාමට අනෙක් ළමයින්ද කැඳවීමට හැකිය.

12. ශුද්ධවූ ලියවිලිවලින් තෝරාගත් පද කැටියකින් වාදනයකරන්න.

13. එකට ගැලපෙන ක්‍රීඩාවක් වාදනයකරන්න. 3" X 5" ගැලපෙන කාඩ්පත් හෝ කඩදාසි යුගල හතරක් හෝ අටක් සූදානම්කරන්න. පහත සඳහන් නිදර්ශනයෙහි, එක් එක් වාක්‍යයක් පළවෙනි කාඩ්පත්වලද, දෙවෙනි කොටස නැතිනම් ආශිර්වාදය අනෙක් කාඩ්පතෙහිද තැබීමට ඔබට හැකිය. කාඩ්පත් හෝ කඩදාසි කලවම්කර මුහුණත පහතට තිබෙන ලෙස මේසයක් මත හෝ පොළොව මත තබන්න. එක් එක්කෙනා බැගින් ඉදිරියට පැමිණ ලමයින්ට කාඩ් පත් දෙකක් හැරවීමට සලස්වන්න. එක් එක් කාඩ්පතෙහි සඳහන් දෙය, ශබ්දනගා කියවන්න. කාඩ්පත් ගැලපෙනවා නම්, (ඔවුන් ආශිර්වාද වාක්‍යයක් සම්පූර්ණ කළේ නම්), ඒවා උඩ අතට හරවා තබන්න. කාඩ්පත් නොගැලපෙන්නේ නම්, නැවතත් මුහුණත පහතට තබා වෙනත් ලමයෙකුට වාරයක් දෙන්න. සියලුම කාඩ්පත් නිවැරදිව ගැලපෙන තෙක් නොකඩවා කරන්න.

ගැලපෙන ආශිර්වාද වාක්‍ය ක්‍රීඩාවට යුගල අටක් භාවිතාකිරීමට ඔබට හැකිවේ:

යුගල 1: සිතින් දිළින්දෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.

යුගල 2: ශෝකවන්තෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු සනසනු ලබන්නෝය.

යුගල 3: මොලොක් ගුණ ඇත්තෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු පොළොව උරුමකර ගන්නෝය.

යුගල 4: ධර්මිෂ්ඨකමට සා පිපාසා ඇත්තෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු දයාව ලබන්නෝය.

යුගල 5: දයාවන්තයෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු දයාව ලබන්නෝය.

යුගල 6: සිතින් පවිත්‍රව සිටින්නෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේ දකින්නෝය.

යුගල 7: සමාදාන කරන්නෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය.

යුගල 8: ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාද ලද්දෝය—මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.

14. ප්‍රශ්න අසමින් ක්‍රීඩාවක් කරන්න. ජෝගුවක හෝ පෙට්ටියක ප්‍රශ්න කිහිපයක් තබා, මෙම ප්‍රශ්නවලින් එකක් තෝරා පිළිතුරු දීමට වාර අනුව පංති සාමාජිකයන්ට සලස්වන්න.

පංති සාකච්ඡා මෙහෙයවීම

ශුභාරංචි මූලධර්ම ඉගෙනගැනීමට සාකච්ඡාවලට සහ වෙනත් ඉගෙනගැනීමේ ක්‍රියාකාරකම්වලට සහභාගිවීම ලමුන්ට උපකාරවෙනවා ඇත. අර්ථවත් ප්‍රශ්න ඇසීමටත්, පංති සාකච්ඡා කෙරෙහි උනන්දුකිරීමටත් පහත සඳහන් මගපෙන්වීම් ඔබට උපකාරවෙනවා ඇත.

1. ප්‍රශ්න අසා ඒ පිළිබඳ ශුද්ධ ලියවිලි සටහන් දීමෙන් පංති සාමාජිකයන්ට ශුද්ධ ලියවිලි වලින් පිළිතුරු සොයාගැනීමට හැකිවේ.

2. "ඔව්" හෝ "නැත" යන්නෙන් පිළිතුරු දීමට නොහැකි නමුත් කල්පනාකිරීමෙන් සහ සාකච්ඡාකිරීමෙන් දිය හැකි ප්‍රශ්න අසන්න. කුමක්ද, කෙසේද, මොනවාද, කවදාද සහ කොහේද යනාදියෙන් පටන්ගන්නා ප්‍රශ්න සාමාන්‍යයෙන් වඩා සාර්ථකය.

3. සාමාන්‍යයෙන් සහභාගි නොවන ලමයින් ඔවුන්ගේ නමින්ම කැඳවා ඔවුන්ට පිළිතුරු දීමට හැකි යයි ඔබට හැඟෙන ප්‍රශ්න ඇසීමෙන් සහභාගිකරවාගන්න. පිළිතුරු දීමට ඔවුන්ට කාලය ලබාදෙන්න. අවශ්‍ය නම් ඔවුන්ට උපකාරකරන්න. නමුත් සිතීමට සහ පිළිතුරුදීමට කාලය දුන්නාට පසු පමණි.

4. ශුද්ධ ලියවිලිවලින් ඔවුන් ඉගෙන ගන්නා දේවල් ගැන තමන්ගේ හැඟීම් බෙදාගැනීමට ලමුන්ව දිරිමත්කරන්න. ඔවුන්ගේ දායකවීම ගැන ශුභවාදී අදහස් දක්වන්න.

5. ප්‍රශ්නවලට ඔවුන් පිළිතුරු දුන්නාට පසු, අවංකවම ලමයින්ට ප්‍රශංසා කරන්න. ඔවුන්ගේ සිතිවිලි සහ හැඟීම් වැදගත් බව අවබෝධකරගැනීමට ඔවුන්ට උපකාරකරන්න. සහභාගිවීමට අසතුටු ලමයි කෙරෙහි සංවේදීවන්න.

ශුද්ධ ලියවිලි අදාලකරගැනීමට ලමුන්ට උපකාරකිරීම

ලමයින් ඉගෙනගත් දේවල් ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගැනීමට ඔවුන්ට උපකාරකරන්න. යාකොබ් මෙසේ අපට අභියෝග කළේය. "නුඹුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක්ම නොවී, එය පිළිපදින්නෝ වෙයල්ලා" (යාකොබ් 1:22). මෙම වැඩකොටස ඉටුකිරීමට පහත සඳහන් අදහස් ඔබට උපකාරවෙනවා ඇත:

1. ආත්මයාණන් විසින් මගපෙන්වන පරිදි ඔබ උගන්වන දේවල සත්‍යතාවය ගැන ඔබගේ පෞද්ගලික සාක්ෂිය දරන්න. ඒත්තුගැන්වීමෙන් සහ අවංකභාවයෙන් ඔබ උගන්වනවිට, ඔබගේ පාඩම් වඩාත් බලවත් වන්නේය.

2. තමන්ම සහ තමාගේ පවුලේ අය සමග ශුද්ධ ලියවිලි නිවසේදී කියවීමට ලමුන්ව දිරිමත්කරන්න. තමන්ගේම ශුද්ධ ලියවිලි පිටපත් පංතියට ගෙනඒමට ලමුන් දිරිගන්වන්න. ලමුන්ට පෞද්ගලික ශුද්ධ ලියවිලි පිටපත් නොමැති නම්, නැතහොත්, පංතියට රැගෙනඒමට අමතකවෙනවා නම්, පංතියේදී ලමයින්ට භාවිතාකිරීමට අමතර පිටපත් තබාගන්න. කොට්ඨාශ හෝ ශාඛා පුස්තකාලයක් ඔබට තිබෙනවා නම්, ශුද්ධ ලියවිලි පිටපත් ඔබට එතැනින් ලබාගැනීමට හැකිවේ.

3. ඔවුන් ඉගෙනගත් දේවල් බෙදාගැනීමට ලමයින්ට කියන්න. පාඩමේදී උගන්වනු ලැබූ ශුද්ධ ලියවිලි මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගන්නා අන්දම ගැන ඔවුන්ගෙන් අසන්න.

4. ලමයින් ශුද්ධ ලියවිලි චරිත මෙන්, ඔවුන්ව සම්මුඛ පරීක්ෂණයකට භාජනකරන වාර්තාකරුවෙකු මෙන් රඟපාන්න. ශුද්ධ ලියවිලිවල විස්තරයේ තොරතුරු ඔබට කියන ලෙසත්, සිදුවූ දෙය ගැන ඔවුන්ට හැඟුනු දේවල් ගැනත්, ඔබට කීමට ඔවුන්ට කියන්න.

5. පංතිය කුඩා කණ්ඩායම් දෙකකට හෝ එයට වැඩියෙන් බෙදන්න. ශුද්ධ ලියවිලි විස්තරය බෙදාගත් පසු, එම විස්තරයේ වැදගත් මූලධර්ම ලිවීමට එක් එක් කණ්ඩායමට සලස්වන්න. ඉන් අනතුරුව මෙම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගන්නා අන්දම ගැන වාර අනුව සාකච්ඡා කිරීමට කණ්ඩායම්වලට සලස්වන්න.

6. ශුද්ධ ලියවිලි සොයාබැලීමක් කරන්න: තමන්ගේ ජීවිතවලට අර්ථවත් ලෙස අදාළවන විශේෂිතවූ ශුද්ධ ලියවිලි පද ලකුණුකිරීමට අවුරුද්ද පුරාම පංති සමාජිකයන් දිරිගන්වන්න. නිදර්ශනයක් වශයෙන්, මතෙව් 7:12, ලූක් 11:9, යොහාන් 3:16, සහ ක්‍රියා 2:38, යනාදී වශයෙන් ඔවුන්ට ලකුණුකිරීමට හැකිය. සිද්ධියක්, අවස්ථාවක් හෝ ප්‍රශ්නයක් වැනි හෝඩුවාවක් ඔවුන්ට දී, එයට අදාළවන ශුද්ධ ලියවිල්ල සොයාගැනීම පිණිස පංති සාමාජිකයන්ට අභියෝග කරන්න. පළමුවෙන් එය සොයාගත් ලමුන් ලවා, පංතියේ ඉතිරි ලමයින්ට ශුද්ධ ලියවිලි සොයාගැනීමට උපකාරකරන්න. එම හෝඩුවාවට මෙම ශුද්ධ ලියවිල්ල ගැලපෙන්නේ කුමක් නිසාද කියා කීමට ඔවුන්ට සලස්වන්න.

7. සාකච්ඡාකරන ලද මූලධර්මයට ලමයින් කීකරුවූ ඔබ දුටු විශේෂ අවස්ථාවන් බෙදාගන්න. කරුණාවන්තකම ගැන ඔබ පාඩමක් උගන්වනවා නම්, ලමයින් අන්‍යයන්ට කරුනාව දැක්වූ ඔබ දුටු අවස්ථාවන් නිදර්ශනයක් වශයෙන් ඔබට පෙන්වාදීමට හැකිය

8. පැවරුම් අනුව යන්න. ඕනෑම විටකදී ඔබ පැවරුමක් හෝ අභියෝගයක් ඉදිරිපත් කලා නම්, ඊලඟ ඉරුදින පංතිය පටන්ගත් විටම ඔවුන්ගේ අත්දැකීම් ගැන ලමයින්ගෙන් ඇසීමට වගබලාගන්න.

### ශුද්ධ ලියවිලි කටපාඩම් කිරීමට ලමයින්ට උපකාරකිරීම

ශුභාරංචි සත්‍යයන් ඉගැන්වීමේ සාර්ථකම ක්‍රමය නම් ශුද්ධ ලියවිලි කටපාඩම් කිරීමය. විනෝදාත්මක සහ නිර්මානාත්මක ක්‍රම ඔබ භාවිතාකරන විට, වෙනත් බොහෝ ලමයි කටපාඩම්කිරීම විනෝදයක් කරගනිති. විනෝදාත්මක ලෙස ලමයින්ට කටපාඩම් කිරීමට පහත සඳහන් යෝජනා උපකාරාත්මක වෙනවා ඇත:

1. කටපාඩම්කිරීමට තිබෙන එක් එක් වචනයේ මුල අකුර හුණුලෑල්ලේ ලියන්න. නැතිනම් සටහනක් අඳින්න. පළවෙනි ඇදිල්ලේ වචන සඳහා පහත සඳහන් සටහන නිදර්ශනයක් වශයෙන් ඔබට සෑදිය හැකිය.

   අ ඇ අ ද ඉ ර් උ එ ං ක ග ජ ට ඩ ණ ය හ ර ල ව ස හ

   එක් එක් සමාන වචන ඔබ කියවන විට අකුරුවලට යොමුවන්න. ස්වල්ප වතාවක් නැවත කියවා ලමුන්ට හැකි අන්දමට නැවත කීමට සලස්වන්න. වැඩිකල් යාමට පෙර සටහන ඔවුන්ට අවශ්‍ය නොවනවා ඇත.

2. ශුද්ධ ලියවිලි කෙටි වාක්‍ය කණ්ඩවලට බෙදන්න. අඩුවෙන්ම හුරු කොටස ලමයින්ට නැවත පළමුව නැවත කියවීමට හැකි පරිදි හැම වාක්‍ය කණ්ඩයක්ම කෙළවරින් පටන්ගෙන පසුපස්සට ශබ්දනගා නැවත කියවන්න. නිදර්ශනයක් වශයෙන් මතෙව් 5:16 ලමයින්ට කිහිප වතාවක් නැවත කියවීමට හැකිය "ස්වර්ගයේ සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරවකරපල්ලා" ඉන්පසු ඔවුන්ට "එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක" ඊලඟ වාක්‍ය කණ්ඩය එකතුකිරීමට හැකිවේ. ඉන්පසු සම්පූර්ණ වාක්‍ය කණ්ඩයම ඔවුන්ට කියවීමට හැකිවේ.

3. ලමයින් හොඳට කියවනවා නම්, එක් එක් ලමයෙකු උදෙසා ශුද්ධ ලියවිලි ලියන ලද පිටපතක් සූදානම්කරන්න. එක් එක් පිටපත වචනවලට හෝ වාක්‍ය කණ්ඩ තීරුවලට කපන්න. එම පද ස්වල්ප වතාවක් එක්ව කීවාට පසු, එම තීරු කලවම්කොට ලමයින්ට දී පුද්ගලිකව හෝ පංතියක් වශයෙන් එම තීරු පිළිවෙලට සකස්කිරීමට සලස්වන්න.

4. ශුද්ධ ලියවිල්ල කිහිප වතාවක් නැවත කියවන අතර, ඊලඟ වචනය හෝ වාක්‍ය කණ්ඩය ලමයෙකුට කීම පිණිස නවත්වන්න. අනතුරුව තවත් ලමයෙකුට තවත් වචන එකතුකිරීමට සලස්වන්න. සෑම ලමයෙකුටම අඩු වශයෙන් එක වාරයක්වත් ලැබෙන තෙක් එය කරගෙන යන්න.

5. ලමයින්ට කටපාඩම් කිරීමට උපකාරවීමට සංගීතය භාවිතාකරන්න.

6. කාණ්ඩ දෙකකට ලමයින්ව බෙදන්න. එක් එක් කාණ්ඩ වාර අනුව වචන හෝ වාක්‍ය කණ්ඩ පිළිවෙලට නැවත කියවීමට සලස්වන්න. එක් කණ්ඩායමක් පළවෙනි වචනයද, අනෙක් කණ්ඩායම දෙවෙනි වචනයද, වශයෙන් පදය කියවීමට ඔබට සැලැස්විය හැකිය.

7. ලමයින්ට කටපාඩම්කිරීම සඳහා ඔබට අවශ්‍ය ශුද්ධ ලියවිලි ඡේදයක් තෝරාගන්න. ශුද්ධ ලියවිල්ල හුණු ලෑල්ලේ හෝ දැන්වීමක ලියන්න. ඡේදය කිහිප වතාවක් නැවත කියවන්න. ලමයින් මුළු ශුද්ධ ලියවිල්ම කටපාඩම් කරගන්නා තෙක්, ක්‍රමානුකූලව වචන වසමින් හෝ වැඩි වැඩියෙන් වචන මකමින් කියවන්න.

**අමතර කාලය ඥානවන්තව භාවිතාකිරීම**

පංතියේ නියමිත කාලයට පෙර ඔබ පාඩම නිමකලා නම්, ඉතිරි කාලය පිරවීමට ක්‍රියාකාරකමක් ආරම්භකිරීමට ඔබට හැකිවේ. මෙම කාලය සාර්ථකව භාවිතා කිරීමට පහත සඳහන් යෝජනා ඔබට උපකාරවනවා ඇත:

1. ලමයින්ට තමන්ගේ ප්‍රියතම ශුද්ධ ලියවිලි කථාන්තර ගැන කියවීමට සලස්වන්න.
2. ලමයින් දැනටමත් ලකුණුකර ඇති වැදගත් ශුද්ධ ලියවිලි සටහන් සෙවීමට හෝඩුවාවක් දී, ශුද්ධ ලියවිලි සෙවීමක් මෙහෙයවන්න. දෙදෙනෙක් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් එක්ව නිවැරදි ශුද්ධ ලියවිලි ඡේද කියවීමට සලස්වන්න.
3. ශුද්ධ ලියවිල්ලක් හෝ පාඩමෙන් ඇඳහිල්ලේ කරුණක් කටපාඩම් කිරීමට ලමුන්ට සලස්වන්න.
4. නිවසේදී, පාසලේදී සහ ඔවුන්ගේ මිතුරන් සමග පාඩමේ මූලධර්ම භාවිතාකිරීමට හැකි අදහස් බෙදාගැනීමට ලමයින්ට සලස්වන්න.
5. පංතිය කණ්ඩායම්වලට බෙදා, වාර අනුව පාඩම ගැන එකිනෙකාගෙන් ප්‍රශ්න ඇසීමට සලස්වන්න.
6. පාඩමේ අරමුණ මතක්වීම පිණිස ගෙදර ගෙනගොස් තැබීමට පාඩමට සම්බන්ධ පින්තූරයක් ඇඳීමට හෝ උපුටාගැනීමක් ලිවීමට එක් එක් ලමයාට සලස්වන්න.
7. ඉදිරි අධ්‍යයනය සඳහා ශුද්ධ ලියවිලි සටහන් ලකුණුකිරීමට ලමයින්ට ආරාධනාකරන්න. පාඩමේ ඔවුන් විශේෂයෙන්ම කැමති පද ලකුණුකිරීමට ලමයින්ට කීමට ඔබට හැකිය. නැතහොත් පාඩමේ අරමුණ ලමයින්ට මතක්කරන ඔබ සිතන පද යෝජනාකිරීමට ඔබට හැකිය.
8. පොත්වල ශුද්ධ ලියවිලිවල තිබෙන පිළිවෙලට කටපාඩම්කිරීමට ලමයින්ට උපකාර කරන්න.
9. පසුගිය පාඩමේ මූලධර්ම හෝ ශුද්ධ ලියවිලි විස්තර නැවත බලන්න.

---

**පංති කාමරය තුල සංගීතය**

සංගීතය මගින් ශුභාරංචි ඉගැන්වීම් සාරවත් සහ ශක්තිමත් කල හැකිය. බොහෝ විට සංගීතය මගින් වඩා හොඳට සිහිතබාගැනීමටත්, ඉගෙනගැනීමටත් ලමයින්ට හැකියාව තිබේ.

ආත්මයාණන්වහන්සේ හැඟීමට සහ ශුභාරංචිය ඉගෙනගැනීමට සුදුසු සංගීතය තේරීම පිණිස ඔබ සංගීතඥයෙකු විය යුතු නොවේ. පාඩම් පටන්ගැනීමේදී කැසට් පටියක හෝ සංගීත කණ්ඩායමක සංගීත අඩංගුකර ගැනීමට හැකිවේ. ඔබගේ පාඩමට ලමයින්ව සහභාගිකර ගැනීමට ඔබටද ගීතයේ වචන ගායනාකිරීමට හෝ කියවීමට හැකිය.

---

**බෙදාගැනීමේ කාලය**

ඇතැම්විට ප්‍රාථමිකයේ බෙදාගැනීමේ කාලය තුල්දී සරල ශුභාරංචි ඉදිරිපත්කිරීමක් දීමට පංතියට කියනු ලැබේ. මෙම ඉදිරිපත්කිරීම් පාඩමෙන් ගතහැකි වන අතර, කෙටි පෙරහුරුවක් මගින් ඔබ උගන්වන මූලධර්ම ඔවුන් තුල ශක්ති-මත් කිරීමට උපකාරවෙනවා ඇත. බෙදාගැනීමේ කාලය තුල්දී පහත සඳහන් යෝජනා ඔබට භාවිතාකල හැකිවේ:

1. ශුද්ධ ලියවිලි විස්තරයක් රඟදක්වන්න.
2. කටපාඩම්කල ශුද්ධ ලියවිලි එකට කියවන්න.
3. ඇදහිල්ලේ කරුණක් කියවා හෝ ගායනාකර, එහි අර්ථය පහදාදෙන්න.
4. ශුභාරංචි මූලධර්මයක් නවීන ආකාරයට අදාළකරගැනීම රඟදක්වන්න.

**ඇදහිල්ලේ කරුණු**

ප්‍රාථමිකයෙන් උසස්වීමට පෙර, එක් එක් ළමයාට ඇදහිල්ලේ කරුණු කටපාඩම් කරගැනීම පිණිස ඔබගේ පාඩම්වලට ඇදහිල්ලේ කරුණු සම්බන්ධකර ගත යුතුය. ඇදහිල්ලේ කරුණු කටපාඩම් කිරීමටත්, අවබෝධකර ගැනීමටත් හැකි සෑම අවස්ථාවකදීම ළමයින්ට උපකාරකරන්න.

**අටේ සිට අවුරුදු එකොළහ දක්වා ළමුන්ව තේරුම්ගැනීම**

ඉගෙනගැනීමටත් ආත්ම විශ්වාසය ළමයින්ට ලබාගැනීම පිණිස උපකාරකිරීමට ඔවුන්ගේ අවශ්‍යතාවයන් සහ ස්වභාවය වටහාගැනීමට අවශ්‍යවන අතර, සුදුසු ක්‍රියාකාරකම් සහ පංති සැලසුම්කරන්න. මෙම වයසේ ළමුන්ගේ ස්වභාවය ගැන වැඩි විස්තර සඳහා බලන්න *Teaching—No Greater Call* (33043), පිටු 37–38.

ගතිගුණ

ශාරීරික

වේගයෙන් සහ ප්‍රමාදවී වැඩෙන කාල පරිච්ඡේද තිබේ
නුහුරු ගති පැවතුම් ඇත
කණ්ඩායම් සමග ක්‍රීඩාකරමින් විනෝදවේ

මානසික

ඉගෙනීමට උනන්දුව
පසුගිය අත්දැකීම් ගැන සිතීම
තර්කානුකූලව තීරණගැනීමට පටන්ගැනීම
කුමක්ද කියා දැනගැනීමේ අවශ්‍යතාව
විනිශ්චයකිරීම
වීරයන්ට නමස්කාරකිරීම
වඩාත් වගකීම් සහගතවීම
මනසින් වැඩකිරීමට කැමැත්ත

සාමාජීය

විරුද්ධ ලිංගික අකමැත්තෙන් මිදී පිරිමි ළමයි සහ ගැහැණු ළමයි අතර කටයුතුකිරීමේ වැඩි කැමැත්තක් ඇතිවීමට පටන්ගැනීම
කණ්ඩායම් සහ පෞද්ගලික කාල දෙවර්ගයම තුල ප්‍රීතිවීම
ස්වාධීනත්වය කෙරෙහි දැඩි අවශ්‍යතාවයක හැඟීමක් ඇතිවීම
හාස්‍යජනක දේවල් කෙරෙහි හැඟීම් වර්ධනයවීම
අන්‍යයන් කෙරෙහි උනන්දුවීම

චෛතසික

විවේචනය අකමැත්ත
සමාජ ප්‍රශ්න ඇතිවූවිට නුසුදුසු පැවැත්මක් පෙන්නුම්කිරීම
බලාපොරොත්තු තැබිය හැකි වඩා විශ්වාසවන්ත බවට පත්වීම
සාධාරනත්වය ගැන සිහි කල්පනාවෙන් යුක්තවීම
ඔහුගේ හෝ ඇයගේ ආත්ම වටිනාකම ගැන සැක පහලවීමට පටන්ගැනීම
ඔහුගේ හෝ ඇයගෙම මාර්ග කෙරෙහි අඩු පාලනයක් සහ අඩු වශයෙන් තීරනාත්මකවීම

ආත්මික

ශුභාරංචි මූලධර්ම ඉගෙනීම හා පුරුදු පුහුණුවීමෙන් ප්‍රීතිවීම
අන්‍යයන්ගේ සාක්ෂි මගින් බලපෑමක් ඇතිවීම
ශුභාරංචි මූලධර්ම වඩා අවබෝධකර ගැනීමේ ශක්තියෙන් වැඩීම
හරි සහ වැරදි දෙය ගැන ප්‍රබල හැඟීමක් ඇතිවීම

---

### ආබාධිතයන් ඇතුලත්කිරීමේදී විශේෂිතවූ මගපෙන්වීම්

ආබාධිතයන් කෙරෙහි අපගේ හැඟීම් සහ අනුකම්පාව පෙන්වීම ගැන ගැලවුම්කරුවාණන් අපට ආදර්ශයක් තැබූසේක. නැවත නැගිටීමෙන් පසු, නිෆායිවරුන් බැහැදුටු උන්වහන්සේ මෙසේ කීසේක:

"නුඹලා අතර රෝගීන් සිටිත්ද? ඔවුන් මෙහාට ගෙනෙන්න. කොරවූ අය, නොණ්ඩි අය, අබ්බගාත අය, ලාදුරු රෝගීහු, වියැලුන අය, බිහිරෝ හෝ වෙනයම් රෝගවලින් පෙළෙන අය නුඹලා අතර සිටිත්ද? ඔවුන් මෙහාට ගෙනෙන්න. මම ඔවුන් සුවපත් කරන්නෙමි. මන්ද යත් මට නුඹලා කෙරෙහි දයාව ඇත්තේය" (3 නිෆායි 17:7).

ප්‍රාථමික ගුරුවරයෙකු වශයෙන් දයාව පෙන්වීම පිණිස ඔබ සිටින්නේ ඉතාම විශිෂ්ඨ ස්ථාවරයකය. සමහරවිට වෘත්තීය ආධාර ලබාදීමට ඔබ නුපුහුනු කෙනෙකු විය හැකිය, නමුත් ආබාධිත ළමුන් අවබෝධකරගෙන, ඔවුන්ව පෝෂණයකිරීමට ඔබට හැකිය. ඉගෙනීමේ ක්‍රියාකාරකම්වලට එක් එක් පංති සාමාජිකයෙකු ඇතුළත්කර ගැනීමට සැලකිල්ල, අවබෝධය, සහ කැමැත්ත අවශ්‍යවේ.

අබාධිත ළමයින්ගේ අවබෝධකර ගැනීමේ තත්වය කුමක් වුවද, ආත්මයාණන්වහන්සේ මගින් ස්පර්ශකල හැකිවේ. ප්‍රාථමිකයේ සම්පූර්ණ කාලය තුළදීම පැමිණ සිටීමට සමහර ළමයින්ට නොහැකි වුවත්, කෙටි කාලයක් හෝ පැමිණ සිටීම අවශ්‍යවේ. මක්නිසාද ආත්මයාණන්ගේ හැඟීම් ලැබීමේ ප්‍රස්ථාවය ලැබීමටය. ප්‍රාථමික කාලයේදී සම්පූර්ණ කණ්ඩායමෙන් ළමයාට ඉවත්ව සිටීමට අවශ්‍යවූ විට, ළමයාගේ අවශ්‍යතාවයන්ට සංවේදශීලී සහකාරයෙක් සිටීම අවශ්‍ය වෙනවා ඇත.

ඉගෙනගැනීමේ ආබාධ, බුද්ධිමය අඩුපාඩු, භාෂාවේ හෝ කථාකිරීමේ ප්‍රශ්න, පෙනීමේ හෝ ඇසීමේ දුබලතාවයන්, හැසිරීමේ හෝ සාමාජීය ප්‍රශ්න, මානසික අසනීප, එහා මෙහා යාමේ අපහසුතාවය, හෝ නිදන්ගත සෞඛ්‍යය අපහසුතාවයන්ගෙන් සමහර පංති සමාජිකයන්ට අභියෝගයක් විය හැකිය. පෞද්ගලික තත්වයන් නොසළකා, එක් එක් ළමයාට ප්‍රේමය සහ පිළිගැනීමේ අවශ්‍යතාවයන් බෙදාගැනීම එක සමානය. එනම් ශුභාරංචිය ඉගෙනගැනීම, ආත්මයාණන් හැඟීම, සාර්ථකව සහභාගිවීම හා අන්‍යයන්ට සේවයකිරීම අවශ්‍යවේ.

ආබාධිත ළමයෙකුට ඉගැන්වීමේදී මෙම මග පෙන්වීම් ඔබට උපකාරවනවා ඇත:

ආබාධිත තත්වය අභිබවා බලමින් ළමයාව දැන ඇඳිනගන්න. තත්විකව, මිත්‍රශීලීව, පෙම්බරකමින් යුක්තවන්න.

ළමයාගේ විශේෂිතවූ ශක්තීන් සහ අභියෝග ගැන ඉගෙනගන්න.

සෑම පංති සාමාජිකයෙකුටම ගරුකිරීමේ ඔවුන්ගේ වගකීම ගැන පංති සාමාජිකයන්ට ඉගැන්වීමට සහ මතක්කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරන්න. පංතියේ ආබාධිත ළමයෙකුට උපකාරකිරීම මුළු පංතියම ක්‍රිස්තුස් වැනි ඉගෙනීමේ අත්දැකීමක් විය හැකිය.

දෙමාපියන් සමග පවුලේ අනෙකුත් සාමාජිකයන්ද, සුදුසු අවස්ථාවකදී ළමයා සමගද සොයා බලා සාකච්ඡාකිරීම ඉගැන්වීමේ ඉතාම හොඳ ක්‍රමය වෙයි.

කියවීමට, යාච්ඤාකිරීමට, හෝ වෙනයම් සහභාගීත්වයකට ආබාධිත ළමයෙකු කැඳවීමට පෙර, පංතියේදී යමකට සහභාගිවීම ගැන ඔහුගේ හෝ ඇයගේ හැඟීම් විමසා බලන්න.එක් එක් ළමයාගේ හැකියාවන් සහ දක්ෂකම් අවධාරණයකරන අතරම, පහසුවෙන් සහ සාර්ථකව එකිනෙකාට සහභාගිවීමේ ක්‍රම ගැන විමසිලිමත්ව සිටින්න.

ආබාධිත ළමයින්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සපුරාලන අන්දමේ පාඩම් උපකරණ සහ භෞතික වටපිටාව සරිලනසේ සකස්කරන්න.

## අපවාද ප්‍රශ්න සමග කටයුතුකිරීම

චෛතසික සහ ශාරීරික වධවේදනාවලින් පෙළෙන ඔබගේ පංතියේ ළමයි ගැන ගුරුවරයෙකු ලෙස ඔබට දැනගත හැකිය. ඔබගේ පංතියේ ළමයෙකු ගැන ඔබ කනස්සල්ලට පත්වන්නේ නම්, කරුණාකර ඔබගේ සභානායකයා සමග සාකච්ඡාකරන්න. පාඩම සූදානම් කර ඉදිරිපත් කිරීමේදී, ස්වාමීන්වහන්සේගේ පිහිට සහ මගපෙන්වීම් පතා යාච්ඤාකරන්න. ඔබගේ පංතියේ හැම ළමයෙක්ම ස්වර්ගික පියාණන්වහන්සේගේ අගනා ළමයෙකු බව ඔහුට හෝ ඇයට හැඟෙන්ට උපකාරකරන අතර, ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප එක් එක් අයට ප්‍රේමකරන බවත්, සතුටෙන් සහ ආරක්ෂාවෙන් සිටීම එතුමාට අවශ්‍ය බවත් කියන්න.

# අළුත් ගිවිසුම ගැන දැනුමක් ලබාගැනීම

1
වෙනි පාඩම

**අරමුණ** අලුත් ගිවිසුම ලමයින්ට හඳුන්වාදී, ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීම පිණිස ඔවුන්ව දිරිගැන්වීමය

**සූදානම්වීම**

1. 2 තිමොති 3:1–7, 13–17 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර පාඩමේ ප්‍රධාන අරමුණ ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරනයකරන්න. බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," ප. 00 (vi) සහ" ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 (vii).
2. අමතර කියවීම්: සුභාරංචි මූලධර්ම පරිච්ඡේද 10.
3. ලමයින්ව සහභාගිකිරීමට හැකි පාඩමේ අරමුන ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන, සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. පහත සඳහන් වචනතීරු අට සූදානම්කරන්න. ශුද්ධ ලියවිලි, අනුමත පොත්, බයිබලය, පරන ගිවිසුම, අළුත් ගිවිසුම, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම, අනගි මුතු ඇටය. (වචන තීරු වෙනුවට හුණුලෑල්ල ඔබට භාවිතා කිරීමට හැකිය.)
5. අවශ්‍ය උපකරන:
   අ. එක් එක් ලමයා සඳහා බයිබලයක් හෝ අළුත් ගිවිසුමක්
   ආ. අනුමත පොත් කට්ටලයක්.

සටහන: ඉතා හොඳට කියවීමට නොහැකි ලමයි ඔබගේ පංතියේ සිටිනවා ඇත. ඔවුන්ට අපහසුතාවයක් නොහැ-ගෙන පරිදි, ඔවුන්ව සහභාගිකරවා ගැනීමට උපකාරවන මාර්ග සොයන්න. සෑම සතියකම ශුද්ධ ලියවිලි සමග සුභවාදී අත්දැකීමක් සියලුම ලමයින්ට තිබිය යුතුය. ශුද්ධ ලියවිලි කෙරෙහි ඔබගේ උනන්දුව, ඔවුන්ට එය අධ්‍යයනයකිරීමට සහ ඉගෙනගැනීමට උපකාරවනවා ඇත.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

යොමුකිරීමේ ක්‍රියාකාරකම පහත සඳහන් හෝඩුවාවවන් ලමයින්ට දී, එම හෝඩුවාවට ගැලපෙන වචනය ඔවුන් දන්නවා නම්, ඔවුන්ගේ අත් එසවීමට සලස්වන්න.

ඒවා හතරක් ඇත.

මේවා තිබෙන (ශුද්ධ ලියවිලි පොත් හතරම තිබෙන ඔවුන් දන්නා පංතියේ ලමයෙකුගේ හෝ වෙනයම් කෙනෙකුගේ නමක්)

අනුමත පොත් කියා ඒවා හඳුන්වනු ලැබේ.

එහි දෙවියන්වහන්සේගේ වචනය අඩංගුය.

ඒවා පොත්ය.

වචනය ශුද්ධ ලියවිල්ල යයි ලමයින් අනුමාන කල විට,මෙම පාඩම ශුද්ධ ලියවිලි ගැන උගන්වන බව පහදාදී, ඒවා අපගේ ජීවිතවලට වැදගත්වන බවද පහදා දෙන්න.

සාකච්ඡා සහ අදාලකිරීමේ ප්‍රශ්න ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ලමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳින් තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ශුද්ධ ලියවිලි යනු මොනවාද? වෙනත් ලියවිලිවලට වඩා ශුද්ධ ලියවිලි වෙනස්වන්නේ කෙසේද? (2 තිමෝති 3:16.)
- ශුද්ධ ලියවිලි කියවීම අපට අවශ්‍යවන්නේ කුමක් නිසාද? ශුද්ධ ලියවිලි කියවීම අප ආරම්භකළ යුත්තේ කවදාද? (2 තිමෝති 3:14–15.) අප බාල වයසේ පටන්ම ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීම වැදගත්වන්නේ කුමක් නිසාද?

ඔබගේ ශුද්ධ ලියවිලි පිටපත් පෙන්වා, "අනුමත පොත්" යන වචන තීරුව පෙන්වන්න. ශුද්ධ ලියවිලිවලට අනුමත පොත් යයි අප කියන්නේ ඒවා සභාවේදී අප පාවිච්චිකරන නිළ ශුද්ධ ලියවිලි නිසා බව පහදා දෙන්න.

ශුද්ධ ලියවිලි ගැන ඔවුන් දන්නා දේවල් පංතිය සමග බෙදාගැනීමට ළමයින්ට ආරාධනාකරන්න. එක් එක් ශුද්ධ ලියවිලි පොතක් ඔබ සාකච්ඡාකරන විට, අදාල වචන තීරුව පෙන්වන්න. නැතිනම් හුණුලෑල්ලේ වචන ලියන්න. (සුභාරංචි මූලධර්ම, පරිච්ඡේද 10 බලන්න.)

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අපි කියවන්නේ කුමන අනුමත පොතකද? පහත සඳහන් පද කියවන්න, නැතිනම් එය කියවීමට ළමයෙකුට ආරාධනාකරන්න. මෝසෙස් 8;24 (ශුද්ධාත්මය යන වචනවල සිට), දහම සහ ගිවිසුම 20:29, 2 නිෆායි 25:26, සහ ගීතාවලිය 83:18 (යෙහෝවාවහන්සේ යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේට කියන තවත් නමක් බව පහදාදෙන්න). අනුමත සියලුම පොත් හතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදරන බව අවබෝධකරගැනීමට ළමයින්ට උපකාරකරන්න.
- බයිබලයේ පටුන පිටුව පෙරලීමට ළමුන්ට සලස්වන්න. (පරණ සහ අලුත් ගිවිසුමේ පොත් ලැයිස්තුව). බයිබලය බෙදා ඇති ප්‍රධාන කොටස් දෙක මොනවාද? එක් එක් කොටසක් යටතේ ඇති ලැයිස්තුව කුමක්ද? පරණ සහ අළුත් ගිවිසුමේ වඩා කුඩා පොත් ලියන ලද්දේ වෙනස් වෙනස් අනාගතවක්තෘවරුන් හෝ සභා නායකයන් විසින් බව පහදාදෙන්න. (කෙටි නම් යොදා ඇති සටහනක් තිබේ නම්, මේවා ළමයින්ට පහදාදෙන්න.) යේසුස්වහන්සේගේ මැරෙන සුළු ජීවිතය සහ මෙහෙය පිළිබඳ විස්තරය අපට ලැබෙන්නේ කොහෙන්ද? (අලුත් ගිවිසුම) අලුත් ගිවිසුමේ ලැයිස්තුව ළමයින්ට බලන්ට සලස්වා, මෙම අවුරුද්දේ පාඩම් අලුත් ගිවිසුමේ ඉගැන්වීම් මත යොමුවන බව පහදාදෙන්න.
- මතෙව්, මාක්, ලූක් සහ යොහාන් කවුද? ඔවුන් ලීවේ කුමක් ගැනද? (මෙම මිනිසුන් හතර දෙනාගෙන් හැම කෙනාම ලීවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ විස්තරය ගැනද, නිතර එකම සිද්ධියක් ගැන ලියමින්, උන්වහන්සේ ගැලවුම්කරුවාණන් බව සාක්ෂිදැරීම බව ළමයින්ට අවබෝධකරගැනීමට උපකාරකරන්න.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ ඔවුන් ප්‍රියකරන කථාන්තර සහ ඉගැන්වීම් බෙදාගැනීමට ළමුන්ට ආරාධනාකරන්න.
- ක්‍රියා පළවෙනි පරිච්ඡේදය පෙරලීමට ළමුන්ට සලස්වන්න. යේසුස්වහන්සේගේ මරණයෙන් සහ නැවත නැගිටීමෙන් පසු, ප්‍රේරිතවරුන් ශුභාරංචිය ඉගැන්වීම ගැන ක්‍රියා පොත කියන බව පහදාදෙන්න. ඔබ සිතන ආකාරයට යෙසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේදී ප්‍රේරිතවරු කුමන අන්දමේ වැඩ කළෝද? ප්‍රේරිතවරුන් අද කරන වැඩ මොනවාද?
- පටුන පිටුව නැවතත් පෙරලීමට ළමුන්ට සලස්වන්න. අලුත් ගිවිසුමේ ඉතිරි පොත් බොහොමයක්ම යේසුස්වහන්සේගේ ප්‍රේරිතයන් හෝ සභාවේ වෙනත් නායකයන් විසින් සභා සාමාජිකයන්ට ලියන ලද ලිපි බව පහදාදෙන්න. ඔවුන් ඒවා ලීවේ කුමක් නිසාදැයි ඔබ දන්නවාද? සභාවේ මුල් සමාජිකයන්ට සුභාරංචිය අවබෝධකරගැනීමට සහ භක්තිමත්ව සිටීමට උපදෙස් ලබාදීම පිණිස මෙම ලිපි උපකාරවූ බව පහදාදෙන්න. අද සභාවේ මෙම ලිපිවලට සමානව අපට තිබෙන්නේ මොනවාද? (ප්‍රධාන අධිකාරය මගින් ලියහෝනාවේ පලකරන ලිපි, චන්ද්‍රිකා මගින් ප්‍රචාරයකිරීම සහ ප්‍රධාන සහ ස්ටේක සම්මන්ත්‍රන.)

අලුත් ගිවිසුමේ එක් එක් පොත් පරිච්ඡේද සහ පදවලට බෙදා තිබෙන නිසා ශුද්ධ ලියවිලි වාක්‍ය කණ්ඩ පහසුවෙන් සොයාගැනීමට අපට හැකි බව පහදාදෙන්න.

- *මතෙව් 28;2–9* හුණුලෑල්ලේ ලියන්න. මෙම ශුද්ධ ලියවිල් කුමන අනුමත පොතක අපට සොයාගැනීමට හැකිවේද? පරිච්ඡේදය කුමක්ද කියා අපට කියන්නේ කුමන අංකයද? පදය කුමක්ද කියා අපට කියන්නේ කුමන අංකයද? මෙම පද ළමුන් සමග කියවන්න. මෙම ශුද්ධ ලියවිල්ල විස්තරකරන්නේ කුමක්ද? ශුද්ධ ලියවිලිවල මෙම සිද්ධිය වාර්තාකිරීමේ වැදගත්කම කුමක්ද?

## සාරවත්කරේමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකළ හැකිය.

1. අලුත් ගිවිසුමේ පොත් පිළිවෙලට කටපාඩම්කිරීමට ලමුන්ට උපකාරකරන්න. පසු සති ස්වල්පය තුළදී පොත් නැවත බලන්න.
2. අටවෙනි ඇදහිල්ලේ කරුණ ලමුන් සමග සාකච්ඡාකර එය කටපාඩම්කිරීමට ඔවුන්ට උපකාරකරන්න. (බලන්න "ශුද්ධ ලියවිලි කටපාඩම්කිරීමට ලමුන්ට උපකාරකිරීම," පි. 00 X). පිටපත් කර, නැවත අතින් පිටපත් කල පැරණි ලියවිලිවලින් අපගේ බයිබලය පරිවර්තනයකර ඇති බවද, පරිවර්තනය කිරීමේදී පරිවර්තනය කිරීමේදී සහ නැවත පිටපත් කිරීමේදී වැරදි තිබෙන බවද ලමයින්ට මතක්කරන්න. බයිබලය බොහෝ දුරට නිවැරදි වුවත්, "බොහෝ සරල අගනා කොටස්" ඉවත්කර ඇති බව අනාගතවක්තෘ නිෆායි ලියා ඇත. (1නිෆායි 13:28). අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් දෙවියන්වහන්සේගේ ආනුභාවය තුලින් බයිබලය නිරීක්ෂනයකර, ඉවත්කරන ලද හෝ වෙනස්කරන ලද තැන්වලට කොටස් එකතු කළේය. ශුභාරංචිය ගැන වඩා වැඩි දේවල් අවබෝධකර ගැනීමට මෙම කොටස් අපට උපකාරවන බව පහදාදෙන්න.
3. ලූක් 24:27 කියවා සාකච්ඡාකරන්න. යේසුස්වහන්සේ ශුද්ධ ලියවිලි අධ්‍යයනයකර බොහෝ විට එමගින් ඉගැන්වූ බව අවබෝධකර ගැනීමට ලමයින්ට උපකාර කරන්න. යේසුස් වහන්සේ අධ්‍යයනයකළ ශුද්ධ ලියවිලි මොනවාද? (පරණ ගිවිසුම.)
4. වචන තීරු ඉවතට ගෙන ඒවා කලවම්කර, බිම හෝ මේසයක් මත තබන්න. පහත සඳහන් ඒවාට සමාන ප්‍රශ්න ලමයින්ගෙන් අසන්න:
   - එකම අර්ථකථනයක් ඇත්තේ කුමන වචන තීරු දෙකේද? ("ශුද්ධ ලියවිලි" සහ "අනුමත පොත්.")
   - තුන්වන පොතක කොටස් කුමන වචන තීරු දෙකෙන් නම්කරන පොත්ද? "අලුත් ගිවිසුම" සහ "පරණ ගිවිසුම". ඒවා බයිබලයේ කොටස්ය.)
   - අනුමත පොත්වලට අඩංගු පොත් මොනවාද? (බයිබලය, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම සහ අනගි මුතු ඇටය.)

   ලමයෙක් ප්‍රශ්නවලට පිළිතුරු දුන් විට, ඇය හෝ ඔහු ඉදිරියට පමුණුවා, සුදුසු වචන තීරු පෙන්වීමට සලස්වන්න.

## අවසානය

**සාක්ෂිය**

ශුද්ධ ලියවිලිවල සත්‍යබව සහ අපගේ ජීවිතවලට ඒවායේ වැදගත්කම ගැන සාක්ෂිදරන්න. ශුද්ධ ලියවිලි කියවීමෙන් ඔබගේ ජීවිතයට උපකාරීවූ අවස්ථාවක් ලමයින් සමග බෙදාගන්න. දිනපතා ශුද්ධ ලියවිලිවලින් කියවීමට ලමුන්ව දිරිගන්වන්න.

**නිවසේදී ඉගැන්වීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂණ කිරීමක් වශයෙන් 2 තිමොති 3:14–17 අධ්‍යනය කිරීමට ලමුන්ට යෝජනා කරන්න.

අ වසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

2

වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් වීමට සිය කැමැත්තෙන් ඉදිරිපත් වූසේක

**අරමුණ**

මැරෙන සුළු ජීවිතයට පෙර ඔවුන්ගේ ගැලවුම්කරුවාණන් වීමට සිය කැමැත්තෙන් ඉදිරිපත්වීම ගැන ඉගැන්වීමෙන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි වඩා වැඩි ප්‍රේමයේ හැඟීමක් ලමයින් තුල ඇතිකිරීම සඳහා උපකාර වීමටය.

**සූදානම්වීම**

1. යොහාන් 15:13, හෙබ්‍රෙව් 12:9, එළිදරව් 12:7–9, දහම සහ ගිවිසුම 93:21, සහ මෝසෙස් 4:1–4 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ශුභාරංචි මූලධර්ම පරිච්ඡේද 2 සහ 3 ද බලන්න. ඉන්පසු පාඩම අධ්‍යයනය කර ශුද්ධ ලියවිලි විස්තර ලමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම පි. 00 (vi), සහ" ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම පි. vii).
2. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරන:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් අනගි මුතු ඇටය එක් එක් ලමයෙකු උදෙසා
   ආ. 7-1 පින්තූරය, යේසුස් නම්වූ ක්‍රිස්තුස් (ශුභාරංචි කලා පින්තූර මෙවලම 240; 62572), සහ අළුත උපන් ළදරුවෙකුගේ පින්තූරයක්, පංති සාමාජිකයෙකුගේ හෝ ඔබේ නම් වඩා හොඳය.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

යොමුකිරීමේ ක්‍රියාකාරකම්

අළුත උපන් ළදරුවාගේ පින්තූරය පෙන්වා ඔහු කවුද කියා අනුමාන වශයෙන් කීමට පංතියට සලස්වන්න.

- මෙම පුද්ගලයාගේ ජීවිතයේ ආරම්භය මෙය නොවන්නේ කුමක් නිසාද?

අප පොළොවේ උපදින්ට පෙර, ස්වර්ගීය පියාණන්වහන්සේ සමග ආත්මික දරුවන් මෙන් අප සියලු දෙනාම ජීවත්වූ බවට ලමයින්ට සාක්ෂිදරන්න. අත්, කකුල්, ඇස් යනාදියෙන් යුත් භෞතික ශරීර මෙන් අපගේ ආත්මික ශරීර පෙනුන නමුත්, මාංශ සහ ලේ නොමැති බව පහදාදෙන්න. ආත්මික දරුවන් වශයෙන්වූ මෙම ජීවිතයට, මැරෙන සුළු ජීවිතෙන් පෙර ජීවිත යයි කියනු ලබන බවද පහදාදෙන්න. මෙම මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේදී, අපගේ ස්වර්ගීය දෙමා-පියන් ශුභාරංචිය සහ ජීවිතයේ සැලසුම අපට ඉගැන්වූසේක.

බ්‍රිගම් යන්ගේ මෙම උපුටාගැනීම ඔබ බෙදා ගන්නවා ඇත: "දෙවියන්වූ අපගේ ස්වර්ගික පියාණන් වහන්සේ ඔබ හොඳින් අඳුනනවා ඇත. . . . උන්වහන්සේගේ නිවස තුල ජීවත්ව උන්වහන්සේ සමග වාසය නොකළාවූ කිසිම ආත්-මයක් ඔබලා අතර නැත. . . . එම උත්තමයාගේ පුත්‍රයෙකු හෝ දියණියක නොවන කිසිම පුද්ගලයෙක් අද ඔබලා අතර නැත." (*Discourses of Brigham Young*, පි. 50).

ශුද්ධ ලියවිලි විස්තරය

පහත සඳහන් වැනි ප්‍රශ්න අසා, ඔවුන්ගේ හැඟීම් සාකච්ඡාකිරීමට ලමයින්ට අවස්ථාවක් දෙන්න.

- ඔබට ප්‍රේමකරන්නේ කවුද?
- යමෙක් ඔබට ප්‍රේමකරන බව ඔබට කීමට හැකි කෙසේද?
- ඔබ ප්‍රේමකරන්නේ කා හටද?

යමෙකු තවත් පුද්ගලයෙකුට ප්‍රේමකරන අතර,එම ප්‍රේමකළ තැනැත්තා ඔහු හෝ ඇය ඉතාම වැදගත් දෙයක් කල බව කියන කථාන්තරයක් කියන්න. එනම් මවක් රෝගීවූ දරුවා බලාගැනීම පිණිස රෑ නොනිදා සිටීම නැතහොත් වැඩිමහල් සහෝදරයා හෝ සහෝදරිය බාල සහෝදරයාට හෝ සහෝදරියට පාසලේ ව්‍යාපෘතියකට උපකාරකිරීම.

අප එක් එක්කෙනාට උන්වහන්සේගේ මහත්වූ ප්‍රේමය පෙන්වීම පිණිස මැරෙන සුළු ජීවිතයට පෙර, යේසුස්වහන්සේ කල දේ ගැන මෙම පාඩමෙන් උගන්වන බව පහදා දෙන්න.

යේසුස්වහන්සේගේ පින්තූරයක් පෙන්වා, අපගේ ගැලවුම්කරුවාණන් වීම පිණිස යේසුස්වහන්සේගේ කැමැත්තෙන්ම ඉදිරිපත්වීමේ කථාන්තරය කියන්න. (ශුද්ධ ලියවිලි විස්තරය ඉගැන්වීමට යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවි-ලිවලින් ඉගැන්වීම," පි. vii.) සහත සඳහන් අදහස් අවබෝධකර ගැනීමට උපකාර කරන්න;

1. මැරෙන සුළු ජීවිතයට පෙර අපි ආත්මික දරුවන්වූ අතර,අපගේ සවර්ගික පියාණන් සමග ජීවත් වූනෙමු (හෙබ්‍රෙව් 12:9).

2. ස්වර්ගික පියාණන්වහන්සේගේ කුළුඳුල් ආත්මික දරුවා යේසුස්වහන්සේ වූ අතර (ඩීසහගී 93:21), අපගේ ආත්මවල වැඩිමහල් සහෝදරයා වේ.

3. සාතන්වූ ලුසිෆර්ද, ස්වර්ගික පියාණන්ගේ ආත්මික දරුවෙක් විය.

4. උන්වහන්සේගේ දරුවන් සියලුදෙනාම උදෙසා, ස්වර්ගික පියාණන්වහන්සේ රැස්වීමක් කැඳවූසේක. අපට උන්ව-හන්සේ මෙන් වීමට උන්වහන්සේගේ සැලසුම මෙම රැස්වීමේදී උන්වහන්සේ පහදා දුන්සේක. භෞතික ශරීරයක් අපට ලබාගැනීමට අප පොළොවට යාම උන්වහන්සේට අවශ්‍ය බව උන්වහන්සේ කීසේක. උන්වහන්සේගේ පණත් අප තබනවාද කියා බැලීමට පරීක්ෂාකරන බව උන්වහන්සේ අපට පහදා දුන්සේක.

5. පොළොවේදී අප සියලුදෙනාම පාපයට වැටෙන බවත්, අප සියලුදෙනාම මැරෙන බවත්, මෙම රැස්වීමේදී ස්වර්ගීය පියාණන්වහන්සේ පහදා දුන්සේක. අපට නැවත නැගිටීමට හැකිවන පරිදි අපගේ පාපවලට දුක්විඳ, අප වෙනුවෙන් මරණයට පත්වීමට ගැලවුම්කරුවෙකු ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍යවිය.

6. ස්වර්ගීය පියාණන්වහන්සේ ලවා උන්වහන්සේගේ සැලසුම වෙනස්කිරීමට ලුසිෆර්ට අවශ්‍යවිය. ඔවුන්ගේ තෝරාගැනීමේ නිදහස ඉවත්කර සියලුදෙනාම ඔහුට ගලවාගැනීමට හැකි බව ලුසිෆර් කීවේය. ඒ අනුව අපට වැරැද්දක් කිරීමට හෝ ධර්මිෂ්ඨවීමට හැකියාවක් නොමැත. සියලු ගෞරවය ලුසිෆර්ට අවශ්‍යවිය (මෝසෙස් 4:1).

7. උන්වහන්සේ අපට ප්‍රේමකරන නිසා (යොහාන් 15:13), අපගේ ගැලවුම්කරුවාණන් වීමට යේසුස්වහන්සේ සිය කැමැත්තෙන් ඉදිරිපත්වූසේක. ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම අනුගමනය කරමින් ස්වර්ගික පියාණන්වහන්සේට මහිමය දීමට උන්වහන්සේට අවශ්‍යවිය මෝසෙස් 4:2).

8. අපගේ ගැලවුම්කරුවාණන් වීමට යේසුස්වහන්සේව ස්වර්ගික පියාණන්වහන්සේ තෝරාගත්සේක. ලුසිෆර් අමනාපවී ස්වර්ගික පියාණන්වහන්සේට විරුද්ධව කැරලි ගැසුවේය (එළිදරව් 12:7–9; මෝසෙස් 4:3–4).

9. යේසුස්වහන්සේ හෝ ලුසිෆර් අනුගමනයකිරීම පිණිස ස්වර්ගික පියාණන්වහන්සේගේ ආත්මික දරුවන්ට තීරණයක් ගැනීමට සිදුවිය.

10. ස්වර්ගික පියාණන්වහන්සේගේ ආත්මික දරුවන්ගෙන් තුනෙන් එකක් ලුසිෆර් අනුගමනයකිරීමට තෝරාගත් අතර, ඔවුන්ව ස්වර්ගයෙන් නෙරපන ලදී. ලුසිෆර් සාතන් බවට පත්වී, ඔහු අනුගමනය කළ ආත්ම අශුද්ධ ආත්ම බවට පත්ව, අප ලවා වැරදි කරවීමට උත්සාහ දරති. සාතන්ව අනුගමනය කළ මෙම ආත්මවලට භෞතික ශරීර නොලැබුනි.

11. මැරෙන සුලු ජීවිතයට පෙර ජීවිතයේදී ස්වර්ගික පියාණන්ගේ සැලසුම තෝරාගෙන යේසුස්වහන්සේව අනුගමනය කළ පොළොවෙහි ඉපදුන හෝ ඉපදෙන්ට සිටින සියලුම ආත්ම මාංශ සහ ලෙයින් යුත් භෞතික ශරීර ලබති.

12. මෙම පංතියේ සිටින සියලුම ළමයි ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම අනුගමනයකිරීමට තෝරාගත් බැවින් පොළොවෙහි ඉඳිී මැරෙන සුලු ජීවිතය ලබාගෙන සිටිති.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමට එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනී-මක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- මෙම අලුත උපන් ළදරුවා ගැන දෙමාපියන්ගේ හැඟීම් කෙසේදැයි ඔබ සිතන්නේද?
- ස්වර්ගීය පියාණන් සමග ස්වර්ගයේ ජීවත්වීම කුමක් වැනිදැයි ඔබට සිතීමට හැකිද?
- අපගේ ආත්මවල වැඩිමහල් සහෝදරයා යේසුස් යන්නෙහි අර්ථය කුමක්ද?
- ස්වර්ගීය පියාණන්වහන්සේගේ සැලසුම ලුසිෆර්ට වෙනස් කිරීමට අවශ්‍යවූයේ මන්ද?

- ඔබ වෙනුවෙන් දුක්විඳ මරණයට පත්වීමට සිය කැමැත්තෙන් යේසුස්වහන්සේ ඉදිරිපත්වීම දැනගැනීමෙන් ඔබට හැඟුනේ කුමක්ද?
- මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේදී යේසුස්වහන්සේ අනුගමනයකිරීමට ඔබ තෝරාගත් බව ඔබ දන්නේ කෙසේද? ඔබගේ එම තේරීම ගැන ඔබ සතුටුවන්නේ මන්ද?
- මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේදී යේසුස්වහන්සේ අනුගමනයකිරීමට තෝරාගැනීමෙන් ඔබ ගැන ඔබට වැටහෙන්නේ කුමක්ද?
- දැන් අප මැරෙන සුලු ජීවිතයේ උපත ලබා ඇති බැවින්, තවමත් යේසුස්වහන්සේ අනුගමනය කිරීමේ වැදගත්කම කුමක්ද?

ළමයින්ට බයිබලය පෙන්වා යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයන් පොළොවේ ජීවත්වූ විට, ඔවුන් කළ දේවල් අලුත් ගිවිසුම සහ බයිබලය කියන බව පහදාදෙන්න. යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ ජීවිතය සහ ඉගැන්වීම් මත මෙම වසරේ පාඩම් පදනම්වී තිබෙන බව පහදාදෙන්න. සෑම ඉරුදිනකම ඔවුන්ගේ බයි-බල් රැගෙන ඒමට ළමුන්ව දිරිගන්වන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. නැවත බැලීමක් වශයෙන් පහත සඳහන් වචන හුණුලෑල්ලේ ලියන්න

   *තුනෙන් එකක්*
   *කුළුඳුල්*
   *වැඩිමහල් සහෝදරයා*
   *අපගේ ආත්මවල පියා*
   *ස්වර්ගයේ රැස්වීම*
   *ලුසිෆර්*

   කුඩා කණ්ඩායම්වලට පංතිය බෙදන්න. මෙම සංකල්පවලින් එකක් හෝ වැඩියෙන් සාකච්ඡාකිරීමට ළමුන්ට කියා, ඔවුන්ට මතක දේවල් පංතියට කීමට සූදානම්වීමට කියන්න. මිනිත්තු ස්වල්පයකට පසු පංතියට වාර්තාකිරීමට ළමුන්ට කියන්න.

2. අලුත් ගිවිසුමේ පොත් ලැයිස්තුවට බයිබලය පෙරළීමට ළමුන්ට කියන්න. පහත සඳහන් ප්‍රශ්න කිහිපයක් අසමින් පළවෙනි පාඩම නැවත බලන්න: මතෙව්, මාර්ක්, ලූක් සහ යොහාන්ගේ පොත්වල සමාන වන්නේ කෙසේද? ඒවා වෙනස් වන්නේ කෙසේද? ක්‍රියා පොතේ සඳහන් වන්නේ කුමක් ගැනද? පොතේ ඉතිරි බොහෝ කොටස්වලට ලිපි යයි සඳහන් කරන්නේ කුමක් නිසාද? අලුත් ගිවිසුමේ පොත්වල සටහන් හුණු ලෑල්ලේ ලියමින්, ඔවුන්ගේ බයිබලයේ පිටපත්වල එම සටහන් සොයාගැනීමට සලස්වමින් එම පොත්වලට වඩාත් හුරුවීමට ළමුන්ට උපකාරකරන්න.

3. යොහාන් 15:13 කටපාඩම්කිරීමට ළමුන්ට උපකාරකරන්න.

## අවසානය

**සාක්ෂිය**

ඔබ සහ ඔබගේ පංතියේ සිටින ළමුන් ස්වර්ගීය පියාණන්වහන්සේගේ ආත්මික දරුවන් බවත්, යේසුස්වහන්සේ අපට ඉතාමත් ප්‍රේමකරන බැවින් මැරෙන සුලු ජීවිතයට පෙර ජීවිතයේදී උන්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් වීමට සිය කැමැත්තෙන් ඉදිරිපත්වූ බවට සාක්ෂි දරන්න. ස්වර්ගීය පියාණන්වහන්සේට අප ඉතාම ආදරයකළ බැවින්, උන්-වහන්සේගේ සැලසුම අනුගමනය කිරීමට අපි තෝරාගත්තෙමු. මෙම පොළොවේදී ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම ළමයින් අඛන්ඩව අනුගමනය කිරීමේ වැදගත්කම ගැන විශේෂයෙන් අවධාරනයකරන්න. යේසුස්වහන්සේ අනුගමනයකරමින් උන්වහන්සේගේ පණත්වලට කීකරුවීම සත්‍යයේ ප්‍රීතියේ එකම මාර්ගය බවට සාක්ෂිදරන්න.

**නිවසේදී කීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂණය කිරීමක් වශයෙන් මෝසෙස් 4:1–4 අධ්‍යයනයකිරීමට ළමුන්ට යෝජනාකරන්න.

අ වසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# යොහාන් බව්තීස්ත යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය සූදානම් කළේය.

## 3
වෙනි පාඩම

**අරමුණ**

ස්වර්ගීය පියාණන්වහන්සේගේ පොළොවේ වැඩවල වැදගත් කොටසක් කිරීමට පූර්වයේ පටන් ඔවුන්ව නියමකර ඇති බව අවබෝධකරගැනීමට ළමයින්ට උපකාර කිරීමය

**සූදානම්වීම**

1. ලූක් 1:5–25, 57–80; මතෙව් 3:1–6; සහ දහම සහ ගිවිසුම 84:27–28 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න “ඔබගේ පාඩම සූදානම්කිරීම” පි 00 (vi ) “සහ ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම” පි 00 vii).
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. *මම තෝරාගත් ආත්මයක් වෙමි,* යන වචන ලියන ලද කොලයක් එක් එක් ළමයා සඳහා.
   ඇ. 7-2 පින්තූරය, යොහාන් වනාන්තරයේ දේශනාකිරීම (ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 207; 62132).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව අවසන්වූ විගසම ඔබ සූදානම්කළ කොල අනෙක් ළමයින්ට දීමට පංතිය පටන්ගන්නට පෙර එක් එක් ළමයාට කියන්න.

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

යොමුවීමේ ක්‍රියාකාරකම

පංතියේ සාමාජිකයන්ට කොල බෙදා දීමට ළමයෙකුට සලස්වන්න.පංතිය පටන්ගැනීමට පෙර, කොල බෙදාදීමේ මෙම සේවය ඉටුකිරීමට ළමයෙකු තොරාගත් බව පහදාදෙන්න.පූර්වයේ පටන් තෝරාගැනීමද මෙයට සමානය. (පූර්වයේ පටන් තෝරාගැනීම හුණු ලෑල්ලේ ලියන්න.) උන්වහන්සේ වෙනුවෙන් පොළොවෙහි විශේෂිතවූ ක්‍රියාවක් කිරීමට මැරෙන සුළු ජීවිතයට පෙර ස්වර්ගීය පියාණන්වහන්සේ අපව පූර්වයේ පටන් තෝරාගත්සේක. අප එම වැඩය කිරීම පූර්වයේ පටන් තෝරාගැනීමෙන් අදහස් නොකරයි; අපට තවමත් නිදහස් කැමැත්ත තිබේ. නමුත් අප තෝරාගන්නේ නම්, අවස්ථාව අප සතුය. පොළොවෙහි වැදගත් දූතමෙහෙයක් ඉටුකිරීම පිණිස පූර්වයෙන් නියමකළ හෝ පූර්වයේ පටන් හෝ තෝරාගත් කෙනෙකු වන යොහාන් බව්තීස්ත ගැන ළමයින් මෙම පාඩමෙන් ඉගෙන ගන්ට යන බව පහදා දෙන්න. ඔවුන්ගේ කොලයේ තිබෙන වචන ශබ්දනගා කියවීමට ළමයින්ට සලස්වන්න. යොහාන් බව්තීස්ත තෝරාගත් ආත්මයක් වන අතර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය සූදානම් කිරීමට මැරෙන සුළු ජීවිතයට පෙර තෝරාගත් බවද, ඔවුන් අධ්‍යයනයකරන ශුද්ධ ලියවිලි පහදා දෙන බව කියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

“සූදානම” යන කොටසේ ලැයිස්තුගතකර තිබෙන ශුද්ධ ලියවිලි මගින් යොහාන් බව්තීස්තගේ උපත, ළමාකාලය සහ දූතමෙහෙය ගැන කථාන්තරය ළමයින්ට උගන්වන්න. යොහාන් වනාන්තරයේ දේශනාකිරීමේ පින්තූරය සුදුසු වේලාවේදී පෙන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම” පි. vii.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සවන්දීම පිණිස ජනතාව සූදානම්කිරීමට යොහාන් බව්තීස්ත පූර්වයේදී තෝරාගත් බව ළමයින්ට අවබෝධකර ගැනීමට උපකාර කරන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම් ගැනීමටද එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න භාවිතාකරන්න. ළමයින් සමග පංතියේදී සටයහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- යොහාන් බව්තීස්තගේ දෙමාපියන් ගැන අප දන්නේ මොනවාද? (ලූක් 1:5–7.)
- සෙකරියස් ගොළුවූ බැවින් ඔහුට කථාකිරීමට නොහැකිවූයේ කුමක් නිසාද? (ලූක් 1:18–20.)

- සෙකරියස් සහ එළිසබෙත් ඔවුන්ගේ පුත්‍රයාට යොහාන් යයි නම් තැබුවේ කුමක් නිසාද? (ලූක් 1:13.)
- යොහාන්ගේ ළමාකාලය ගැන අප දන්නේ කුමක්ද? (ලූක් 1:80; දහම සහ ගිවිසුම 84:27–28.)
- යොහාන් බව්තීස්ත පූර්වයෙන් නියමකරන ලද්දේ කුමක් කිරීමටද? ලූක් 1:15–17, 76–77.)
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය පිළියෙල කිරීමේ පූර්වයෙන් නියමකළ ඔහුගේ දූතමෙහෙය යොහාන් බව්තීස්ත ඉටුකලේ කෙසේද? (මතෙව්3: 1–6.)
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය පිළියෙල කරමින් ස්වර්ගීය පියාණන්වහන්සේගේ දේව රාජ්‍යය ගොඩනැගීමට උපකාරවීම පිණිස යොහාන් බව්තීස්ත තෝරාගත් විශේෂ ආත්මයක් වූවා මෙන්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන වඩා වැඩියෙන් දැනගැනීමට ජනතාවට උපකාර කිරීමෙන් ස්වර්ගීය පියාණන්වහන්සේගේ දේව රාජ්‍යය ගොඩනැ-ගීමට උපකාරවීම පිණිස අප තෝරාගත් විශේස ආත්ම වන බව පහදාදෙන්න.

සභාපති එෂ්රා ටැෆ්ට් බෙන්සන්ගේ මෙම උපුටාගැනීම කියවන්න: “ඔබලා විශේෂ ආත්ම නම්, ඔබලාගෙන් බොහෝ අය අවුරුදු 6,000ක සිට මතු ප්‍රයෝජනයට වෙන්කර තබා මෙම දිනයේදී පරීක්ෂාවන්, වගකීම්, සහ ප්‍රස්ථාවන් අධිකව ඇති මෙම කාලයේදී ඉදිරියට ඒමට වෙන්කර තබන ලදී” (Conference Report තුලිනි, ඔක්තෝ. 1977, ප. 43; හෝ *Ensign*, නොවැ. 1977, පි. 30).

- ස්වර්ගීය පියාණන්වහන්සේ ඔබ පුද්ගලිකව දැන, මේ කාලයේදී පොළොවට ඒමට තෝරාගත් බව දැනගැනීමෙන් ඔබට හැඟෙන්නේ කුමක්ද?
- ස්වර්ගීය පියාණන්වහන්සේගේ දේව රාජ්‍යය ගොඩනැගීමට අපට කිරීම පිණිස පූර්වයෙන් නියමකර ඇති සමහර දේවල් මොනවාද? (ධර්මදූත සේවයේ යෙදීම, අපගේ ගිවිසුම් තබමින් යහපත් ආදර්ශයක් වීම, පූජකවරය ඉසිලීම, ධර්මිෂ්ඨ පවුල් ඔසවාතැබීම, සහාවේ කැඳවීම් ඉෂ්ඨකිරීම.'
- මෙම පොළොවේ ඔබට කිරීමට ස්වර්ගීය පියාණන්වහන්සේට අවශ්‍ය අවශ්‍ය කුමක්දැයි ඔබට දැනගැනීමට හැකිවන්නේ කෙසේද? (තීරණ ගැන යාච්ඤාකරන්න, ආත්මයාණන්ට සවන්දෙන්න.) නියම වයසේදී, ස්ටේකයේ ආදි පීතෘගෙන් ආදි පීතෘ ආශිර්වාදය ලබාගැනීමේ අවස්ථාවක් ස්වර්ගීය පියාණන්වහන්සේ අපට දී තිබෙන බව පහදා දෙන්න. අපට ලැබෙන කැඳවීම් හෝ අපගේ ජීවිතවලින් අප කිරීමට ස්වර්ගීය පියාණන්වහන්සේට අවශ්‍ය දේ බොහෝ විට ආදි පීතෘ ආශිර්වාදයෙන් පෙන්වාදෙයි. ඔබට කිරීමට ස්වාභවර්ගීය පියාණන්ට අවශ්‍ය දේ කිරීමට ඔබට සූදානම්විය හැක්කේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් හෝ ඔබට භාවිතාකිරීමට හැකිය.

1. එක් එක් ළමයෙකු සඳහා පහත සඳහන් කියමන් සමග කොල (පිළිතුරු නොමැතිව) සූදානම්කරන්න, නැත්නම් එම කියමන් හුණුලැල්ලේ ලියන්න.

   යොහාන් බව්තීස්ත:
   අ. ජීවත්වූයේ ______________________.
   ආ. යේසුස්වහන්සේට වඩා මාස ______________________ වැඩිමහල්ය.
   ඇ. ඇඳ සිටි ඇඳුම් සාදා තිබුනේ ______________________ සහ ______________________.
   ඈ. සහ ______________________ කෑවේය ______________________.
   ඉ. මාර්ගය පිළියෙල කළේය ______________________.

   පිළිතුරු: අ. වනාන්තරය; ආ. හය; ඇ. ඔටු රෝම, හම්පටිය; ඈ. පළගැටියන්, වන මී; ඉ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

   හිස්තැන් පිරවීම සඳහා ළමයින්ට ලූක් 1:26–27, 35–36, 76 සහ මතෙව් 3:1–4 කියවීමට සලස්වන්න. (පළගැටියන් යන්න ළමයින් නොදන්නේ නම්, ඔවුන් විශාල පියාඹන කෘමීන් බව පහදාදෙන්න.) වනාන්තරය තුල සරළ නිහතමානී ජීවිතයක් යොහාන් බව්තීස්ත ගතකළත්, ඇදහිල්ලෙන් යුතුව තම දූතමෙහෙය ඉටුකර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය පිළියෙල කළ බව අවබෝධකර ගැනීමට ඔවුන්ට උපකාර කරන්න.

2. පොළොවේ තමන්ගේ දූතමෙහෙය උදෙසා පූර්වයෙන් නියම කළාවූ වෙනත් අය සොයාගැනීමට පහත සඳහන් ශුද්ධ ලියවිලි කියවීමට ළමුන්ට සලස්වන්න:

යෙරමියා 1:5—යෙරමියා
1 නිෆායි 11:18—මරියා, යේසුස්වහන්සේගේ මව (නිෆායිට දුන් දර්ශනය)
ඊතර් 3:14—යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
දහම සහ ගිවිසුම 138:53, 55—ජෝසෆ් ස්මිත් සහ වෙනත් අය
ආබ්‍රහම් 3:23—ආබ්‍රහම්

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | යොහාන් බව්තීස්ත යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය පිළියෙල කිරීමට සහ උන්වහන්සේ ගැන සාක්ෂිදැරීමට පූර්වයෙන් නියම කල ආකාරයට, පොළොවේ අපගේ දූතමෙහෙයට අප එක් එක්කෙනා පූර්වයෙන් නියමකරන ලදී. ශුභාරංචිය අනුව ජීවත්වීමේ වැදගත්කම සහ ස්වර්ගික පියාණන්වහන්සේ පූර්වයෙන් නියම කළ කුමන දෙයක් වුවත් කිරීමට සූදුස්සන් වීමේ ඔබගේ හැඟීම් ප්‍රකාශකරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම තිරීක්ෂනය කිරීමක් වශයෙන් ලූක් 1:5–23, 57–80 සහ මතෙව් 3:1–6 අධ්‍යයනයකිරීමට ළමයින්ට සලස්වන්න.<br><br>අ වසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

4

වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීය පියාණන්වහන්සේගේ පුත්‍රයාණෝය

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ඒකජාතක මාංශමය පුත්‍රයාණන් බව ලමයින්ට තේරුම්ගැනීමට උපකාරවීමටය

**සූදානම්වීම**

1. මතෙව් 1:18–25 සහ ලූක් 1:26–38, 2:1–20 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 (vi) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii).
2. අමතර කියවීම්: යොහාන් 3:16–17, ඇල්මා 22:14. දහම සහ ගිවිසුම 19;16–19, සහ *සුභාරංචි මූලධර්ම*, පරිච්ඡේද 11.
3. ලමයින්ව සහභාගි කරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ලබාගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. 7-1 පින්තූරය, ක්‍රිස්තුස් නම්වූ යේසුස්වහන්සේ (ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 240; 62572) 7-3, යේසුස්වහන්සේගේ උපත (ශුභාරංචි චිත්‍ර මෙවලම 200; 62116); 7-4, එඬේරුන්ට ක්‍රිස්තුස්වහන්සේගේ උපත නිවේදනයකිරීම (ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 202; 62117); සහ 7-5, ළදරුවෙකු සමග පවුලක් (62307).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න

ක්‍රියාකාරකම්වලට යොමුවීම

පින්තූරය 7-5 පෙන්වන්න. ළදරුවෙක් සමග පවුලක්. පහත සඳහන් ප්‍රශ්න ලමයින්ගෙන් අසන්න:

- මෙම අලුත උපන් ළදරුවා ගැන දෙමාපියන්ගේ හැඟීම් කෙසේදැයි ඔබ සිතන්නේද?
- ඉපදීමට පෙර මෙම ළදරුවාගේ ආත්මය ජීවත්වූයේ කොහේද?
- පොළොවේ ඔහුගේ මවු කවුද? පොළොවේ ඔහුගේ පියා කවුද? ඔහුගේ ආත්මයේ පියා කවුද?

මෙම ළදරුවාට මෙන්ම, අප එකිනෙකාටද පොළොවේ පියෙක් සහ මවක්ද වන අතර, ස්වර්ගීය පියාණන්වහන්සේ අපගේ ආත්මවල පියාණන්ද වන බව පහදාදෙන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පින්තූරය පෙන්වන්න.

- යේසුස්වහන්සේගේ මව කවුද? යේසුස්වහන්සේගේ පියා කවුද?

යේසුස්වහන්සේ අපට වඩා වෙනස්වන්නේ යේසුස්වහන්සේගේ පොළොවේ ශරීරයේ පියා ස්වර්ගීය පියාණන්වහන්සේ වන නිසා බව ලමයින්ට තේරුම්ගැනීමට උපකාර කරන්න. මෙම පාඩම යේසුස් වහන්සේගේ උපත ගැන වඩා වැඩි-යෙන් උගන්වන බව ඔවුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තර

සුදුසු අවස්ථාවලදී පින්තූර භාවිතාකරමින් "සූදානම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන ශුද්ධ ලියවිලි වලින් මරියා සහ යෝසෙප් සහ යේසුස්වහන්සේගේ උපත ගැන කථාන්තරය උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම" පි. 00 vii.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මික ශරීරයේද පියා ස්වර්ගීය පියාණන් බව අවබෝධකර ගැනීමට ලමුන්ට උපකාර කරන්න.

සාකාච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම් කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ලමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනු ඇත.

- යේසුස්වහන්සේ ඉපදීමට පෙර ස්වර්ගීය පියාණන්වහන්සේගේ දේවදූතයා ඒ ගැන මරියාට සහ යොසෙප්ට කීවේ කුමක්ද? (මතෙව් 1:19–23; ලූක් 1:30–33, 35.) ඒ මන්ද?
- එඬේරුන්ට දේවදූතයන් දර්ශනය වූයේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (ලූක් 2:9–14.) (ස්වර්ගීය පියාණන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයා බෙත්ලෙහෙමේ උපන් බව එඬේරුන්ට සාක්ෂි දරීමටය.)
- යේසුස්වහන්සේ ගැන එඬේරුන් ජනතාවට කුමක් කීවේද කියා ඔබ සිතන්නේද? (ලූක් 2:15–20.)
- පියාණන්ගේ ඒකජාතක පුත්‍රයා යයි යේසුස්වහන්සේට කියන්නේ කුමක් නිසාද? (භෞතික ශරීරයේ පියා ස්වර්ගීය පියාණන්වහන්සේ වී, මැරෙන සුලු ජීවිතයේ උපන් එකම තැනැත්තා යේසුස් වහන්සේය.) මරියාගේ සැමියා වශයෙන් යේසුස්වහන්සේට උගන්වමින් ඇතිදැඩි කිරීමට උපකාරවීමට තෝරාගත් මිනිසා යොසෙප් බව පහදාදෙන්න.
- ස්වර්ගීය පියාණන්වහන්සේ සමග යේසුස්වහන්සේගේ සම්බන්ධය ස්වර්ගීය පියාණන්වහන්සේ සමග අපගේ ඇති සම්බන්ධයට වඩා වෙනස්වන්නේ කෙසේද?
- යේසුස්වහන්සේගේ මව මැරෙනසුළු වීමේ වැදගත්කම කුමක්ද? මරියා මැරෙනසුළු වූ බැවින්, යේසුස්වහන්සේද මැරෙනසුළු වූයේ අප වෙනුවෙන් මැරෙන්ට හැකිවීමට බව අවබෝධකර ගැනීමට ළමුන්ට උපකාරකරන්න. යේසුස්වහන්සේගේ භෞතික ශරීරයේ පියා ස්වර්ගීය පියාණන් බැවින්, යේසුස්වහන්සේට මැරෙන්ට අවශ්‍ය නොවූ බවද අවබෝධකර ගැනීමට ළමුන්ට උපකාරකරන්න.(බලන්න යොහාන් 5:26; 10:17–18). අපගේ පාපවලට වේදනා විඳ මරණය ජයගැනීමට උන්වහන්සේ තෝරාගත්සේක (බලන්න ඇල්මා 22:14; ඩීසහගී 19:16–19).

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. යොසෙප් මෙන් වූවා නම් පිරිමි ළමයින්ට කුමක් සිතාගැනීමට හැකිවන්නේදැයි ඔවුන්ගෙන් අසන්න. මරියා මෙන් වූයේ නම්, ගැහැණු ළමයින්ට කුමක් සිතාගැනීමට හැකිවන්නේදැයි ඔවුන්ගෙන් අසන්න. දේවදූතයා ඔවුන්ව බැහැදුටුවේ නම්, ඔවුන් කුමක් සිතන්නේ දැයි ඔබ සමග කීමට ඔවුන්ට සලස්වන්න. ගැලවුම්කරුවාණන්ගේ පොළොවේ දෙමාපියන් වීමට ඔවුන්ට කීවේ නම්, ඔවුන්ට කුමක් හැඟෙන්නේදැයි කීමට සලස්වන්න.
2. යේසුස්වහන්සේ එකම ඒකජාතක පුත්‍රයාණන් බවට සඳහන් පහත සඳහන් ශුද්ධ ලියවිලිවලින් එකක් එක් එක් ළමයාට සොයාගැනීමට සලස්වන්න. යොහාන් 1:14; 3:16–18; 1 යොහාන් 4:9; යාකොබ් 4:5, 11; ඇල්මා 5:48; 12:33–34; දහම සහ ගිවිසුම 29:42, 46; 93:11; සහ මෝසෙස 1:6. (පංතියේ ළමයින් නව දෙනෙකුට වැඩිය සිටිනවා නම්, ළමයි දෙදෙනෙකුට එක් ශුද්ධ ලියවිල්ල බැගින් ඔබට පැවරිය හැකිය.) මෙම ක්‍රියාකාරකම ළමයි නිමකළාට පසු, ස්වර්ගීය පියාණන්වහන්සේගේ භෞතික පුත්‍රයා වශයෙන් මෙම පොළොවේ උපන් එකම පුද්ගලයා යේසුස්වහන්සේ බව ඒකජාතක පුත්‍රයා යන නාමය ලියන බව ඔවුන්ට අවබෝධවිය යුතුය.
3. ඔවුන්ට වැදගත්වන, ඔවුන් දන්නා යමක් යේසුස්වහන්සේ ගැන කීමට ළමුන්ට සලස්වන්න.
4. පළවෙනි ඇඳහිල්ලේ කරුණ ළමුන් සමග නැවත බලන්න.

## අවසානය

**සාක්ෂිය**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිය දරමින් උන්වහන්සේ ස්වර්ගික පියාණන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන් ගැන හෝ ස්වර්ගීය පියාණන්වහන්සේ භෞතික ශරීරයේ පියා වශයෙන් උපන් එකම පුද්ගලයා බවට විශේෂයෙන් අවධාරනය කරන්න. යේසුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් බවට සාක්ෂිදරන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් බවට සාක්ෂියක් ලබාගැනීම පිණිස අධ්‍යයනය කරමින් යාච්ඤාකිරීමට ළමුන්ව දිරි-ගන්වන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන්, ලූක් 1:26–38 අධ්‍යයනයකිරීමට ළමුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට පංති සාමාජිකයෙකුට ආරාධනාකරන්න.

# 5
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ළමාකාලය

**අරමුණ**

යේසුස්වහන්සේගේ ළමාකාලය ගැන ඉගෙනගැනීමට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයාණන් බවට සාක්ෂිදැරීමට දෙවියන්වහන්සේ සාක්ෂිකරුවන් ලබාදෙන බවත් තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කිරීමය.

**සූදානම්වීම**

1. ලූක් 2:21–52, සහ දහම සහ ගිවිසුම 93;11–14 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 (vi) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii).
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ලබාගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. පංතියේ සඟවා තැබීමට පහසු කුඩා ප්‍රමාණයේ පවුල විසින් ආරක්ෂාවෙන් තබාගන්නා ප්‍රියමනාප උපකරණයක්.
   ඇ. පින්තූරය 7-6, යේසුස් නම් පිරිමි ළමයා දේවමාළිගාවේ (සුභාරංචි චිත්‍ර පටේන්තූර මෙවලම 205, 62500).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරකමට යොමුවීම

ළමයි පංතියට එනවිට ඔවුන්ගෙන් දෙදෙනෙකුට හෝ තුන්දෙනෙකුට ඔබ ගෙනා උපකරණය පෙන්වන්න; ඉන්පසුව පංතියේ ඉතිරි අය පැමිණෙන්ට පෙර, එය සඟවන්න. එය දුටු එක් ළමයෙකුට එය කුමක්ද කීමට නොකියා, උපකරණය විස්තර කිරීමට කියන්න. උපකරණය කුමක්ද කියා පංතිය දන්නවාදැයි අසන්න. උපකරණය දුටු අනිත් ළමයින්ට එය විස්තරකිරීමට සලස්වන්න. එක් පුද්ගලයෙකුට වඩා වැඩි අයගෙන් යමක් ගැන ඇසෙනවිට, එය වඩාත් සහතික බව අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරකරන්න. එම උපකරණය පංතියට පෙන්වන්න.

උපකරණය පළමුවෙන් දුටු ළමයි, එය ගැන දන්නා බැවින්ද, උපකරණයේ ආකාරය විස්තරකළ බැවින්ද, ඔවුන් සාක්ෂිකරුවන් මෙන් ක්‍රියාකළ බව ළමුන්ට පහදාදෙන්න. යම් දෙයක් ගැන පුද්ගලික දැනීමක් ඇතිව, එම දැනීම අන්‍යයන් සමග බෙදාගන්නා තැනැත්තා සාක්ෂිකාරයෙකි. සාක්ෂියක් දීමට හෝ ඔප්පුකරන යම් දෙයක්ද සාක්ෂියක් විය හැකිය; නිදර්ශනයක් ලෙස යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවට මෝර්මන්ගේ පොත සාක්ෂිදරයි. යේසුස්වහන්සේ ළමයෙක්ව සිටියදී යේසුස්වහන්සේ තම පුත්‍රයාණන් බවට සාක්ෂිදැරීමට ස්වර්ගීය පියාණන්වහන්සේ බොහෝ සාක්ෂිකරුවන් ලබාදුන්සේක.

ශුද්ධ ලියවිලි විස්තර

යේසුස්වහන්සේගේ ළමාකාලය ගැන විස්තරය "සූදානම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන පරිදි උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම", පි. 00 vii.)

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත. මෙම පාඩම ඉගැන්වීමට පෙර, පසුගිය පාඩමේ සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් අංක 1 නැවත බැලීමක් වශයෙන් භාවිතාකරන්න.

- මරියා සහ යොසෙප් ළදරු යේසුස් දේවමාළිගාවට රැගෙන ආවේ කුමකටද? (ලූක් 2:21–24.)
- යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව සිමියොන් දැනගත්තේ කෙසේද? (ලූක් 2:25–30.)

- යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවට ආනා සාක්ෂිදැරුවේ කෙසේද? උන්වහන්සේ කවුදැයි කියා ඇය දැනගත්තේ කෙසේදැයි ඔබ සිතන්නේද? (ලූක් 2:36–38.)
- යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව ශාස්ත්‍රවන්තයන් දැනගත්තේ කෙසේද? ඔවුන් උන්වහන්සේට පඬුරු දුන්නේ කුමක් නිසාද? (මතෙව් 2:2, 11.)
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂිකරුවෙකු වීමට ඔබට හැකිවන්නේ කෙසේද?
- තම පවුල මිසරයට ගෙනයාමට ස්වර්ගීය පියාණන්වහන්සේ යොසෙප්ට කීවේ කුමක් නිසාද? (මතෙව් 2:13–14.) යේසුස්වහන්සේ රජකමට පත්වීම වැළැක්වීමට හෙරෝද් කුමක් කළේද? (මතෙව් 2:16.) මිසරයෙන් හැරීයාමට කාලය සුදුසු බව යොසෙප් දැනගත්තේ කෙසේද? (මතෙව් 2:19–20.) ජීවත්වීමට එම පවුල ගියේ කොහේද? (මතෙව් 2:21–23.)
- අත්දැකීම් සහ දැනීම ලබාගැනීමට පිරිමි ලමයෙකු වශයෙන් යේසුස්වහන්සේ කුමක් කළේදැයි ඔබ සිතන්නේද? ලූක් 2:40, 52; ඩීසහගී 93:11–14.) ඔබ වැඩෙන විට ඔබ ඉගෙනගත යුතු දේවල් මොනවාද? ඔබ තබා ඇති ඉලක්ක මොනවාද?
- යේසුස් නම් පිරිමි ලමයාගේ පින්තූරය පෙන්වන්න. දේවමාළිගාවේ මිනිසුන් යේසුස් වහන්සේ කෙරෙහි විස්මිත වූයේ කුමක් නිසාද? (ලූක් 2:46–47. “ඔවුහු උන්වහන්සේට සවන්දෙමින්ද, ප්‍රශ්න විචාරමින්ද සිටිබව” ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ මෙම ශුද්ධ ලියවිල්ලේ කියවෙන බව සටහන් කරගන්න.) යේසුස්වහන්සේ තම ලමාකාලයේ ඉගෙනගත් දේවල් කොපමණද කියා මෙය කියන්නේද? ශුබාරංචිය ගැන වඩා වැඩියෙන් ඉගෙනගැනීමට ඔබට කුමක් කළ හැකිද? දේවමාළිගාවේදී යේසුස්වහන්සේ තම පියාණන්ට ගෞරවකරමින් කීකරුවූයේ කෙසේද?
- යොසෙෆ්ට සහ මරියාට ගෞරවකිරීමටත්, කීකරුවීමටත් යේසුස්වහන්සේ කුමක් කළේද? (ලූක් 2:51–52.) අපගේ ළමාකාලයේ අපගේ දෙමාපියන් අපට උගන්වන ආකාරයට යොසෙෆ් සහ මරියා යේසුස්වහන්සේගේ ලමාකාලයේ උන්වහන්සේට ඉගැන්වූ බව පහදාදෙන්න. ඔබගේ දෙමාපියන්ගේ ඔබ ගෞරවකරන්නේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකළ හැකිය.

1. පසුගිය පාඩම්වලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවට සාක්ෂිදැරූ වෙනත් පුද්ගලයන්ගේ නම් හැකිතරම් කීමට ලමයින්ට සලස්වන්න. මෙම සාක්ෂිකරුවන් මතකතබාගැනීම පිණිස ලමයින්ට උපකාරවීමට පහත සඳහන් ශුද්ධ ලියවිලි බැලීමට ඔවුන්ට සලස්වන්න. ලූක් 1:30–32 (ගේබ්‍රියෙල්), ලූක් 1:41–43 (එලිසබෙත්), යොහාන් 1:29–34 (යොහාන් බව්තීස්ත) සහ ලූක් 2:8–17 (දේවදූතයන් සහ එඬේරුන්).
2. ශුභාරංචියය ගැන වඩාත් වැඩියෙන් ඉගෙනගැනීම පිණිස ශුද්ධ ලියවිලි දිනපතා කියවීම, යාච්ඤාකිරීම, පවුල් නිවාස සැන්දෑවට සහභාගිවීම වැනි දේවලට උපකාරවීම සඳහා ඉලක්ක තැබීම ගැන ලමයින් සමග සාකච්ඡාක-රන්න. මෙම වසරේ ශුභාරංචිය ගැන වඩා වැඩියෙන් ඉගෙනගැනීමට උපකාරවිය හැකි ඉලක්ක දෙකක් කඩදාසි කැල්ලක ලිවීමට ලමයින්ට කියන්න. නිතර පෙනෙන ස්ථානයක එම කඩදාසිය තැබීමට ඔවුන්ව දිරිමත්ක-රන්න.
3. මෙම පාඩමේ අග තිබෙන සිතියමේ පිටපතක් පංතියේ එක් එක් ලමයෙකු උදෙසා සාදන්න. යේසුස්වහන්සේ වාසයකළ ස්ථාන සොයාගෙන ඒවා සලකුණු කිරීමට ලමයින්ට සලස්වන්න: යෙරුසලම, බෙත්ලෙහෙම, මිසරය, සහ නාසරෙත්.
4. ඇදහිල්ලේ පළවෙනි කරුණ කටපාඩම් කිරීමට ලමයින්ට උපකාරකරන්න.
5. යේසුස්වහන්සේ තම පුත්‍රයණන් බවට ස්වර්ගීය පියාණන්වහන්සේ සාක්ෂිදැරූ අවස්ථාවන් ගැන ශුද්ධ ලියවිලි සටහන් හුණුලෑල්ලේ ලියන්න (මතෙව් 3:16–17; 17:5; 3 නිෆායි 11:6–8; ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17). සටහන් බැලීමට ලමයින්ට සලස්වා එක් එක් අවස්ථාවක සිදුවූ දෙය ගැන සාකාච්ඡාකරන්න.
6. ලූක් 2;52 කටපාඩම් කිරීමට ලමයින්ට උපකාර කරන්න.

## අවසානය

සාක්ෂිය


යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔබගේ හැඟීම් ළමයින් සමග බෙදාගෙන, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වීම ඔබට වැදගත්වන්නේ මන්දැයි ළමයින්ට කියන්න. යේසුස්වහන්සේගේ ආදර්ශය ඔවුන් අනුගමනය කරනවා නම්, ඔවුන්ට වඩාත් උන්වහන්සේ මෙන් වීමට අවබෝධකරගැනීම පිණිස ඔවුන්ට උපකාරකරන්න.

පාඩම ජීවිතයට අදාළකරගැනීම වශයෙන් සාරවත්කිරීමේ ක්‍රියාකාරකම භාවිතාකිරීමට හැකිය

**නිවසේදී කීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂණයක් වශයෙන් ලූක් 2:40–52 අධ්‍යනයකිරීමට ළමයින්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.




යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වාසයකළ ස්ථාන

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බව්තීස්මය

6
වෙනි පාඩම

| | |
|---|---|
| **අරමුණ** | ළමුන්ගේ බව්තීස්ම ගිවිසුම් තැබීමට ඔවුන්ට උපකාරකිරීමය. |

**සූදානම්වීම**

1. මතෙව් 3:13–17; යොහාන් 3:5; 2 නිෆායි 31:4–10, 17–21; මොසායා 18:8–17; සහ දහම සහ ගිවිසුම 33:15 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න "ඔබගේ පාඩම් සූදානම්කිරීම" පි. 00 (vi) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. vii).
2. අමතර කියවීම්: යොහාන් 1:29–34, දහම සහ ගිවිසුම 20:37, සහ සුබාරංචි මූලධර්ම, 20 වෙනි පරිච්ඡේදය.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි සහ පාඩමේ අරමුණ ඉතාම හොඳට ලබාගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. මෝර්මන්ගේ පොතක්.
   ඇ. හතරවෙනි ඇදහිල්ලේ කරුණ සටහන (65004).
   ඈ. පින්තූරය 7-7, යොහාන් බව්තීස්ත යේසුස්වහන්සේ බව්තීස්මකිරීම (ශුභාරංචි චිත්‍ර පිනතූර මෙවලම 208; 62133).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරකම්වලට යොමුවීම**

ළමුන් දෙදෙනෙකුට පංතිය ඉදිරියට පැමිණ එකිනෙකාට මුහුණ ලා සිට අතින් ළමයින්ට යටින් යාමට ඉඩසලස්වන්න. මෙම ළමයින් ඉතාම වැතගත් දොරටුවක් නියෝජනයකරන බව පහදාදෙන්න. සදාකාල ජීවනයට මගපෙන්වන අවහිර පටු මාර්ගයට ඇතුල්වන දොරටුව මෙය බව ළමයින්ට කියන්න. 2:නිෆායි 31:17 කියවීමට ළමයෙකුට සලස්වන්න. සදාකාල ජීවනයේ එක් පළවෙනි පියවරක් නම් දොරටුව තුලින් ගමන්කිරීම (බව්තීස්මවීම) බව පහදාදෙන්න. දොරටුව තුලින් ගමන්කිරීමට ළමුන්ට සලස්වන්න.

**ශුද්ධ ලියවිලි විස්තර**

යොහාන් බව්තීස්ත යේසුස්වහන්සේව බව-තීස්මකරන පින්තූරය පෙන්වන්න. "සූදානම්වීම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන ආකාරයට ශුද්ධ ලියවිලි කියවන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි විස්තර සටහන් අධ්‍යයනයකරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබ සිතන ප්‍රශ්න තෝරාගන්න.ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස්වහන්සේව බව්තීස්මකලේ කවුද? (මතෙව් 3:13.)
- යේසුස්වහන්සේව බව්තීස්ම කිරීමට යොහාන් බව්තීස්ම අකමැතිවූනේ මන්ද? (මතෙව් 3:14.)
- බව්තීස්මවීම යේසුස්වහන්සේට අවශ්‍යවූයේ කුමක් නිසාද? (මතෙව් 3:15; 2 නිෆායි 31:7, 9.)
- අප බව්තීස්මවීමේ අවශ්‍යතාවය කුමක්ද? (යොහාන් 3:5.) *ගිල්වීමේ* අර්ථය කුමක්ද? බව්තීස්මවන විට අප සම්පූර්ණයෙන්ම ජලය යටට යා යුතු වන්නේ කුමක් නිසාද? (3 නිෆායි 11:26–28.)
- යේසුස්වහන්සේ බව්තීස්මවූ විගසම සිදුවූයේ කුමක්ද? (මතෙව් 3:16–17.)
- ශුද්ධාත්මයාණන්ගේ දීමනාව අප ලබාගන්නේ කෙසේද? (ඩීසහගි 33:15.)

- ඔබ බව්තීස්මවූවාට පසු ඔබට කුමක් හැඟුනේද? ඔබව ස්ථිරකොට, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලැබුනාට පසු ඔබට කෙසේ හැඟුනේද?

- ඔබ බව්තීස්මවන විට, ඔබ පොරොන්දුවූයේ කුමක්ද? ස්වර්ගීය පියාණන්වහන්සේ අපට පොරොන්දුවූයේ කුමක්ද? (මෝසායා 18:8–13; ඩීසහගී 20:37.)

අප හා ස්වර්ගීය පියාණන් අතර වන මෙම පොරොන්දු බව්තීස්මය ගිවිසුම් වන බව පහදාදෙන්න. අප බව්තීස්මවන විට අප මෙසේ ගිවිසුම් තබන්නෙමු:

යේසුස්වහන්සේගේ සභාවේ සාමාජිකයන්වීම.
අන්‍යයන්ට උපකාරකිරීම.
සියලු කාලයන්හිදී සහ සියලු තැන්හිදී ස්වර්ගීය පියාණන්වහන්සේගේ සාක්ෂිකරුවන් මෙන් නැගීසිටීම.
ස්වර්ගීය පියාණන්වහන්සේට සේවයකරමින් එතුමාගේ පනත් තැබීම.

අපගේ ගිවිසුම් අප තබනවා නම්, ස්වර්ගීය පියාණන්වහන්සේ මෙසේ ගිවිසුම් තබනසේක:

අපගේ පව්වලට කමාවීම.
අපට බොහෝ ආශිර්වාද ලබාදීම.
ශුද්ධාත්මයාණන් මගින් අපට දිනපතා මගපෙන්වීම් ලබාදීම.
සදාකාල ජීවනය අපට ලබාදීම (බලන්න සුභාරංචි මූලධර්ම පරිච්ඡේද 20.)

- බව්තීස්ම දොරටුව තුලින් අප යන විට, අප ඇතුල්වන්නේ කුමකටද? (2 නිෆායි 31:17–18.) සදාකාල ජීවනය ලබාගැනීමට සහ ස්වර්ගීය පියාණන්වහණ්සේ සමග සදාකාලයට ජීවත්වීමට හැකිවීම සඳහා බව්තීස්මයෙන් පසු අප කුමක් කළ යුතුද? (2 නිෆායි 31:18–20.)

ඇදහිල්ලේ කරුණ

හතරවන ඇදහිල්ලේ කරුණේ සටහන පෙන්වන්න. එය කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න.

---

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක්, හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. බව්තීස්මය ගැන පහත සඳහන් ප්‍රශ්න සහ ඒවායේ ශුද්ධ ලියවිලි සටහන් හුණුලෑල්ලේ හෝ කඩදාසි කෑල්ලක ලියන්න: අප බව්තීස්මවන්නේ කුමක් නිසාද? (ඩීසහගී 49:13; 2 නිෆායි 31:18.) අප බව්තීස්මවන්නේ කෙසේද? (ඩීසහගී 20:72–74.) අප බව්තීස්මකරනු ලබන්නේ කවුරුන් විසින්ද? (ඩීසහගී 20:73.) අප බව්තීස්මවිය යුතු කාලය කුමක්ද? (ඩීසහගී 68:27.) ශුද්ධ ලියවිලි බලා පිළිතුරු සාකච්ඡාකිරීමට ළමුන්ට සලස්වන්න.

2. පහත සඳහන් එක් එක් වාක්‍ය කණ්ඩ කඩදාසි කෑල්ලක වෙනම ලියන්න.

   අපගේ පාපවලට කමාව
   සභාවේ සාමාජිකයන්වීම
   එවිට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව අපට ලබාගැනීමට හැකිවේ
   කීකරුව සිටීමට
   අවහිර සහ පටු මාර්ගයට පිවිසීම

   පාඩම පටන්ගැනීමේදී භාවිතාකළ දොරටුව තුලින් යෑමට ළමුන්ට සලස්වන්න. එක් එක් ළමයා එතුලින් යන විට, ඔහුට හෝ ඇයට කඩදාසිවලින් එකක් දෙන්න. අප බව්තීස්ම විය යුතු කරුණු ඒවා බව පහදාදෙන්න. අපගේ බව්තීස්ම ගිවිසුම් රක්ෂාකරගත හැකි අන්දම ළමුන් සමග සාකාච්ඡාකරන්න.

3. ළමයෙකු බව්තීස්මවන පින්තූරයක් (62018) සහ යොහාන් බව්තීස්ත යේසුස්වහන්සේව බව්තීස්මකරන පින්තූරය භාවිතාකරමින් ඔබගේ බව්තීස්මය ගැන කියන්න, නැතහොත් ඔහුගේ හෝ ඇයගේ බව්තීස්මය ගැන කීමට ළමයෙකුට කියන්න.

4. 2 නිෆායි 31:20 කටපාඩම් කිරීමට ළමයින්ට උපකාරකරන්න.

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | බව්තීස්මවීමේ වැදගත්කම ගැන සහ සදාකාල ජීවනයට මගපෙන්වන අවහිර පටුමාර්ගයට දොරටුව බව්තීස්මය බවට සාක්ෂිදරන්න. සමහර ළමයින්ට ඔවුන්ගේම බව්තීස්මය ගැන සාක්ෂිදැරීමටද අවශ්‍යවනවා ඇත. |
| ගෙදරදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 3:13–17 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

7

වෙනි පාඩම

# සාතන් විසින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පරීක්ෂාකරන ලදී

**අරමුණ** සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධවීමට එක් එක් ළමයාට උපකාරවීමය

**සූදානම්වීම**

1. මතෙව් 4:1–11, මාර්ක් 1:12–13, ලූක් 4:1–13 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 (vi,) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii).
2. අමතර කියවීම් 1 කොරොන්ති 10:13; 2 නිෆායි 2:18; 28:19–22; 3 නිෆායි 18:18; සහ දහම සහ ගිවිසුම 10:5, 27; 11:12.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. එක් එක් ළමයෙකුට කඩදාසියක් සහ පැන්සලක්.
   ඇ. පහත සඳහන් වචන තීරු තුන:
      තීරණයකරන්න
      යාච්ඤාකරන්න
      ශුද්ධාත්මයාණන්ට සවන්දෙන්න
   ඈ. පින්තූරය 7-8, දේවමාළිගාවේ කොත

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරකම්වලට යොමුවීම

එක් එක් ළමයාට කඩදාසි කෑල්ලක් දෙන්න. ඔවුන්ගේ වයසේ ළමයින්ට ඔවුන් සිතන ආකාරයට වැරදි දේ කිරීමට පොළඹවන කරුණු තුනක් ලිවීමට ළමයින්ට සලස්වන්න. ඔවුන් ලියූ දේවල් ඔබට කීමට ළමුන්ට කියන්න. ඔවුන්ගේ පිළිතුරු හුණුලෑල්ලේ ලියා, අද ඔවුන්ට මුහුණදීමට තිබෙන ප්‍රශ්න සාකච්ඡාකිරීමට ඔබට අවශ්‍යවනවා ඇත. එවැනි පරීක්ෂාවලින් වැළකී සිටීමට ඉගෙනගැනීම පිණිස මෙම පාඩම උපකාරවන බව ඔවුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තර

"සූදානම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන ශුද්ධ ලියවිලි සඳහන් යේසුස්වහන්සේව පරීක්ෂාකිරීමේ කථාන්තරය කියන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.) සටහන ජේම්ස් රජුගේ බයිබල් අනුවාදයේ සඳහන් විස්තරය ජෝසෆ් ස්මිත්ගේ පරිවර්තනයෙහි (ජෝස්ප) පැහැදිළිකර තිබේ. "දෙවියන්වහන්සේ සමග සිටීමට යේසුස්වහන්සේව වනාන්තරයට මගපෙන්වන ලදී" යක්ෂයා විසින් පරීක්ෂාකිරීමට නොවන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරකරන්න. පරීක්ෂාකිරීමේ එවැනි තත්වයකට යේසුස්වහන්සේ කැමැත්තෙන්නොගිය බවත්, අපද එසේ නොකිරීම උන්වහන්සේට අවශ්‍ය බවත් පහදාදෙන්න. බයිබලයේ සඳහන් පරිදි යක්ෂයා මගින් නොව ආත්මයාණන් මගින් යේසුස්වහන්සේව කොතට සහ උස් කඳු මුදුනට මගපෙන්වූ බව (ජෝස්ප) සඳහන්වන බව පහදාදෙන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස්වහන්සේ වනාන්තරයට ගියේ කුමක් නිසාද? (මතෙව් 4:1පාද සටහන් ආ.)

- යේසුස්වහන්සේ වනාන්තරයේ සිටින විට උන්වහන්සේ "දෙවියන්වහන්සේ සමග සංවාදයෙහි යෙදුනසේක." ඔබ සිතන ආකාරයට දෙවියන්වහන්සේ සමග සංවාදයෙහි යේදීම යනු කුමක්ද? දෙවියන්වහන්සේ සමග ඔබට සංවාදයෙහි යේදීමට හැකිවන්නේ කෙසේද?
- දින හතලිහක් උපවාසයේ යේදී දෙවියන්වහන්සේ සමග සංවාදයෙහි යේදීමෙන් පරීක්ෂාවෙන් වැළකී සිටීමට යේසුස්වහන්සේව සූදානම්කිරීමට ඔබ සිතන අන්දමට උපකාරවූයේ කෙසේද?
- සාතන් යේසුස්වහන්සේව පළමුවෙන් පරීක්ෂාකළේ කෙසේද? (මතෙව් 4:3.) මෙම පරීක්ෂාව දරාගැනීමට උන්වහන්සේට අපහසුවූයේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? (මතෙව් 4:2.) යේසුස්වහන්සේ සාතන්ට පිළිතුරු දුන්නේ කෙසේද? යේසුස්වහන්සේ අදහස් කළේ කුමක්ද? (මතෙව් 4:4.)
- සාතන් යේසුස්වහන්සේව පරීක්ෂාකළ වෙනත් ක්‍රම මොනවාද? (මතෙව් 4:5–6, 8–9.) යෙ-සුස්වහන්සේ මෙම පරීක්ෂාවන්ට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? මතෙව් 4:7, 10.) යේසුස්වහන්සේව පරීක්ෂාකළ එකම වාර මේවා බව ඔබ සිතන්නේද? (ලූක් 4:13 "කාලයක් සඳහා" යන්නෙන් අදහස් කරන්නේ ඒවා එකම වාර නොවන බවය.)
- පරීක්ෂාවලින් වැළකී සිටීමට ශුද්ධ ලියවිලි අධ්‍යයනය යේසුස්වහන්සේට උපකාර කළේ කෙසේද? මතෙව් 4:4, 6–7, 10.)
- සාතන් අප එකිනෙකාට කිරීමට උත්සාහකරන්නේ කුමක්ද? 2 නිෆායි 2:18; 28:20–22; ඕසහබී 10:27.)
- පරීක්ෂාවන්ට විරුද්ධවීමට ඔබට උපකාරකිරීම පිණිස ස්වර්ගීය පියාණන් වහන්සේට හැකිවන්නේ කෙසේද? අනාගතයේදී ඇතිවන පරීක්ෂාවන් වැළැක්වීමට උපකාරවීම පිණිස දැන්මම ඔබට කළහැක්කේ කුමක්ද?
- අපගේ පරීක්ෂාවන් පිළිබඳව ස්වාමීන්වහන්සේ දී තිබෙන ශ්‍රේෂ්ඨ පොරොන්දු මොනවාද? (1 කොරොන්ති 10:13.) මෙම ශුද්ධ ලියවිල්ල එක්ව කියවන්න.

පරීක්ෂාවෙන් වැළකීමට සහ විරුද්ධව එක්ව නැගීසිටීමට අපට උපකාරවන දේවල් තුනක් සාකච්ඡාකරන්න. ඔබ ඒවා සාකච්ඡාකරන විට වචන තීරු තුන පෙන්වන්න.

1. එයට මුහුණදීමට පෙර පරීක්ෂාවන්ට විරුද්ධව නැගීසිටීමට තීරණයකරන්න.

   සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් උපුටාගැනීම කියවා සාකච්ඡාකරන්න:

   "එම තත්වයට පැමිණෙන්ට පෙර කල් වේලා ඇතිව තීරණගැනීම ඉතා පහසුය. . . .

   "කිසිම දිනක තේ, කෝපි, දුම්කොළ හෝ මත්ද්‍රව්‍යවල. . . රස නොබැලීමට මම තරුණ කාලයේදීම මගේ සිත හදාගත්තෙමි. . . .

   "වෙළඳ ආයතනයෙහි ලියන්නා, ඉතිරි මුදල් ඔබට වැඩියෙන් දීමට පෙර. . . අවංකකම ගැන තීරණයකිරීමට කාලය වේ. ඔබ කැමති මිතුරෙකු ඔබගේ බිය හෝ [ධර්මිෂ්ඨකම] නිසා හෝ [නීතිවිරෝධී] මත්ද්‍රව්‍ය ගැනීමේ ඔබගේ අකමැත්තට විහිළුකිරීමට පෙර, එයට විරුද්ධව තීරණගැනීමේ කාලයයි. අපගේ [ස්වර්ගීය] පියාණන්වහන්සේ සමග සදාකාලයටම ජීවත්වීමේ අවස්ථාවටහැර වෙන කිසිම දෙයකට යොමු නොවීමට තීරණය ගැනීමේ කාලය දැන්ය" ("Decisions: Why It's Important to Make Some Now," *New Era,* අප්‍රේ. 1971, පි. 3).

2. පරීක්ෂා වළක්වාගැනීමට හැකිවන පිණිස යාච්ඤාකරන්න (මාර්ක් 14:38) යම්සේ ඔබ පෙළඹුනේද එයට විරුද්ධවීමට ඔබට බලය සහ ඇදහිල්ල තිබීම පිණිසය. දිනපතා යාච්ඤාව, ඕනෑම ආකාරයක පරීක්ෂාවකින් වැළකීමට උත්සාහදැරීම, ප්‍රයෝජනවත් වැඩකටයුතු සහ ක්‍රියාකාරකම්වල යේදීම අපට උපකාරවන බව පහදාදෙන්න.

3. *ආත්මයාණන්වහන්සේට සවන්දීම.* අප බව්තීස්මවූවාට පසුව, ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව අපට දෙනු ලැබේ. පරීක්ෂාවන් ජයගැනීමට එය අපට උපකාරවන්නේය (බලන්න ඕසහබී 11:12).

ඔවුන් පරීක්ෂාවට වැටුනු විට ඔවුන් ලැබූ අත්දැකීම් ගැන කථාකිරීමට ළමුන්ට කියන්න. පරීක්ෂාවෙන් වැළකීමට හෝ විරුද්ධව නැගීසිටීමට ඔවුන් කළ දේවල් බෙදාගැනීමට සලස්වන්න.

පාඩම පටන්ගැනීමේ ක්‍රියාකාරකමේදී හුණුලෑල්ලේ ලියනලද පරීක්ෂාවන් වෙතට යොමුවන්න. පුද්ගලිකව මේවායින් සමහරක් සාකච්ඡාකර, තරුණ පුද්ගලයෙක් මේවා එකින් එක වළකාගැනීමට හා විරුද්ධව නැගීසිටීමට හැකිවන ආකාරය ගැන සලකාබැලීමට ළමුන්ට සලස්වන්න. විරුද්ධ නැගීසිටීමට ඔවුන්ට අවශ්‍ය පරීක්ෂාවක් පුද්ගලිකව

තෝරාගැනීමට ළමුන්ට කියා එම පරීක්ෂාවන් වැළකීමට හෝ විරුද්ධව නැගීසිටීමට සැලසුම්කරන අන්දම ගැන කීමට සලස්වන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. “මොකද කරන්නේ” යන ක්‍රීඩාව සෙල්ලම් කරන්න. පහත සඳහන් නිදර්ශන ප්‍රශ්න මෙන් පංති සාමාජිකයන්ට මුහුනපෑමට සිදුවිය හැකි පරීක්ෂාවන් විස්තරකරන “මොකද කරන්නේ” ප්‍රශ්න කඩදාසි කැල්ලක ලියන්න. පෙට්ටියෙන් හෝ ජෝගුවෙන් එයින් එක ප්‍රශ්නයක් රැගෙන ප්‍රශ්නය කියවා එයට පිළිතුරු දීමට ළමයෙකුට සලස්වන්න. ඉන්පසුව තවත් “මොකද කරන්නේ” ප්‍රශ්නයක් තවත් ළමයෙකු ලවා පෙට්ටියෙන් තෝරාගැනීමට ළමයෙක් තෝරන්න. පරීක්ෂාවට විරුද්ධවීමට කලින් තීරණයකිරීම වැදගත් ලෙස උපකාරවන බව විශේෂයෙන් අවධාරණයකරන්න.

   වෙන කෙනෙකුට අයිති යමක් ඔබ සොයාගතහොත් මොකද කරන්නේ?
   ඔබගේ පියාට ඔබ උපකාරවන බව පොරොන්දුවූ විට, මිතුරෙක් පැමිණ ඔබ සමග සෙල්ලම්කිරීමට ඔහු ඔබට කථාකරන්නේ නම් ඔබ මොකද කරන්නේ?
   ඔබගේ මිතුරන්ට ලැබුන සිගරට් ඔබ බොන්නේ නැති බැවින් (නැතහොත් මද්‍යසාරය හෝ මත් කුඩු) ඔවුන් ඔබව විහිළුවකට ලක්කරන්නේ නම් ඔබ මොකද කරන්නේ?
   ඔබ සත්‍යය ප්‍රකාශකළ හොත් කරදරයට වැටෙන බව දන්නේ නම් ඔබ මොකද කරන්නේ?

2. පරීක්ෂාවන්ට විරුද්ධව යෑම අංගචලනයකිරීමට හෝ රඟපෑමට ළමයින්ට සලස්වන්න.

3. “පරීක්ෂාවේ කාඩ්පත්” සූදානම්කරන්න. නැතහොත් “3" X 5" කාඩ්පත් හෝ කඩදාසි කැලිවල බොරුකීම, රැවටීම, සොරකම්කිරීම, අසභ්‍ය වචන භාවිතාකිරීම, වැනි ළමයින්ට ඇතිවිය හැකි පරීක්ෂාවන් ලියන්න. අනෙක් කාඩ්පත්වල “උපකාර කාඩ්පත්” වල යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල ඇදහීම, දෙමාපියන්, ගුරුවරු, යහපත් මිතුරන්, සභා නායකයන්, ශුද්ධ ලියවිලි, ශුද්ධාත්මයාණන්වහන්සේ, පරීක්ෂාවන්ගෙන් වැළකීම යනාදී මිනිසුන්ට පරීක්ෂාවන්ට විරුද්ධවීමට උපකාරවන වෙනත් දේවල් ලියන්න.

   පරීක්ෂා කාඩ්පත් මුහුණ පහතට හරවා එක ගොඩකටද, උපකාර කාඩ්පත් මුහුණ පහතට හරවා තවත් ගොඩකටද තබන්න. උපකාර සහ පරීක්ෂා කාඩ් පතක් තෝරාගෙන එහි ලියා තිබෙන දෙය පංතියට කීමට ළමයෙකුට සලස්වන්න. පරීක්ෂා කාඩ්පතෙහි තිබෙන දෙය විරුද්ධවීමට හෝ වළකීමට උපකාර කාඩ් පතෙන් පහසු කරන ආකාරය සාකාච්ඡාකිරීමට පංතියට කියන්න. එක් එක් ළමයෙකුට වාර අනුව කාඩ්පතක් තෝරාගැනීමට සලස්වන්න.

4. සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්ගේ පහත සඳහන් උපුටාගැනීම ළමයින් සමග බෙදාගන්න. “පුරුදු සාදාගැනීම පහසුය. නපුරු ඒවා සාදාගන්නවා මෙන්ම, යහපත් පුරුදු සාදාගැනීම පහසුය.” (නිව් ඒරා, ජූලි 1972, පි. 23). ළමයින් විසින් මෙම උපුටාගැනීම කටපාඩම්කිරීම ඔබට අවශ්‍යවනවා ඇත.

5. අනාගතයේදී පරීක්ෂාවෙන්ගෙන් වැළකී සිටීමට ඔවුන්ට උපකාරවීම පිණිස ඔවුන් ගෙන ඇති තීරණ නම්කිරීමට ළමයින්ට කියන්න.

6. මතෙව් 4;4 කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න.

## අවසානය

සාක්ෂිය

අපට පැමිණෙන පරීක්ෂාවන්ට විරුද්ධවීම පිණිස අපට බලය තිබෙන බවට සාක්ෂි දරන්න. සාතන්ගේ පරීක්ෂා-වන්ට විරුද්ධවීමේ උන්වහන්සේගේ ආදර්ශය උදෙසා යේසුස්වහන්සේට ඔබගේ ඇති ප්‍රේමය ප්‍රකාශකරන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසෙ-දී මෙම පාඩම තීරීක්ෂණයක් වශයෙන් මතෙව් 4;1–11 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දේවමාළිගාව පවිත්‍රකරනසේක

**8**
වෙනි පාඩම

**අරමුණ**

ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේටද, පූජනීය ස්ථානවලටද, වඩා ප්‍රේමයක් සහ ගෞරවයක් හැඟීමට එක් එක් ලමයෙකුට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. යොහාන් 2:13–16, මතෙව් 21:12–14, ලූක් 19:45–48, සහ නික්මයාම 20:7 යාච්ඥාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණය කරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 (vi) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii).
2. අමතර කියවීම්: මාර්ක් 11:15–17.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයෙකු සඳහා
   ආ. පහත සඳහන් වචන තීරු:
      ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට අපගේ ආදරය සහ ගෞරවය මෙසේ පෙන්විය හැකිය:
         ප්‍රාථමිකයේ සහ සක්‍රමේන්තු රැස්වීමේදී අපගේ ගෞරවය.
         යාච්ඥාකරන විට අප භාවිතාකරන භාෂා විලාශය
         අප අඳින පළඳින ආකාරය.
         අප ක්‍රියාකරන ආකාරය.
         අප කථාකරන ආකාරය.
   ඇ. පින්තූරය 7-9, යේසුස්වහන්සේ දේවමාලිගාව පවිත්‍රකිරීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 224; 62163).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඥාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.


**යොමුවීමේ ක්‍රියාකාරකම**

හුනුලෑල්ලේ හරහට ඉරක් අඳින්න. ගෞරවකිරීම ඉරට උඩින්ද, අගෞරවකිරීම ඉරට යටින්ද ලියන්න. තමන්ගේ නිවසට මිතුරෙකු පැමිණෙන බව සිතාගැනීමට ලමයින්ට සලස්වන්න. හුණුලෑල්ලේ ගෞරවකිරීමේ ඉරක් ඔබ අඳින්න යන බව ලමයින්ට කියන්න. මිතුරා කරන දේවල් සඳහන්කරන්න (බලන්න පහත), මිතුරා ඔබට සහ ඔබගේ නිවසට ගෞරවය හෝ අගෞරවය පෙන්වනවාද කියා පංතියට තීරණයකිරීමට සලස්වන්න. හුණුලෑල්ලේ හරස් ඉර කැපෙන ලෙස ඉරක් අඳින්න. ගෞරවය පෙන්වන අවස්ථාවේදී ඉහළටත්, අගෞරවය පෙන්වන අවස්ථාවේදී පහත-ටත් එය ගෙනයන්න. පහත සඳහන් අවස්ථාවන් වැනි දේ භාවිතාකරන්න:

මිතුරා:

ආරාධනාකරන තෙක් නිශ්චලව එලියට වී සිටියි.
මඩ තැවරුන සපත්තු යුතුව ඇතුළට ඇවිදියි.
පැමිණීමට කළ ආරාධනාවට ඔබට ස්තුතිකරයි.
ශබ්දනගා ඔබගේ නිවස තුල කෑකෝ ගසයි.
ඔබගේ දෙමාපියන්ට ශීලාචාරව ආචාරකරයි.
කෑමට යමක් ඉල්ලයි.
ඔබට අයිති දේවලට ප්‍රවේශමෙන් සලකයි.
ඔහු හෝ ඇය සමග කථාකරන විට ඔබගේ දෙමාපියන් නොසලකා හරියි.
ඔහුගේ හෝ ඇයගේ නිවසට පැමිණීමට ඔබට ආරාධනාකරයි.

ඔබගේ ගෞරවකිරීමේ ඉර මේ ආකාරයෙන් පෙනෙනවා ඇත:




පහත සඳහන් ප්‍රශ්නවලට තමන්ටම පිළිතුරු ලබාගැනීමට ළමයින්ට සලස්වන්න:

- ඔබ මිතුරෙකුගේ නිවස බැහැදකින විට, ඔබගේ "ගෞරවකිරීමේ ඉර" කෙසේ පෙනෙනවා ඇතිද?
- ඔබ ප්‍රාථමිකයට පැමිණිවිට, ඔබගේ "ගෞරව කිරීමේ" ඉර කෙසේ පෙනෙනු ඇතිද?
- ඔබ ඔබගේම නිවසෙහි සිටින විට, ඔබගේ "ගෞරව කිරීමේ" ඉර කෙසේ පෙනෙනවා ඇතිද?

**ශුද්ධ ලියවිලි විස්තර**

යේසුස්වහන්සේ යෙරුසලමේ දේවමාළිගාව පවිත්‍රකිරීමේ විස්තරය උගන්වන්න. පළවෙනි පවිත්‍රකිරීමේ විස්තරය යොහාන් 2:13–16 සඳහන්වේ. දෙවෙනි විස්තරය, අවුරුදු තුනකට පමණ පසු, උන්වහන්සේව කුරුසියේ ඇණගැසීමට ස්වල්ප දිනකට පෙර මතෙව් 21:12–14 සහ ලූක් 19:45–48 සඳහන්වේ. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.) ස්වර්ගීය පියාණන්වහන්සේ සහ දේවමාළිගා ගැන යේසුස්වහන්සේට කෙසේ හැඟෙනු ඇතිදැයි ඔබ මෙම විස්තර උගන්වන විටදී ළමයින්ට ඔවුන්ගෙන්ම ඇසීමට සලස්වන්න. අද අපට තිබෙන දේවමාළිගා සහ සභාවේ රැස්වීම් ගෘහයන් මෙන්ම, මෙම දේවමාළිගාවත් පූජනීය ස්ථානයක් බව අවබෝධකරගැනීමට ළමුන්ට උපකාරකරන්න. මෙම ශුද්ධ ස්ථානවලට අප ගරුකිරීම යේසුස්වහන්සේට අවශ්‍යවේ.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනයකරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- සමහර මිනිසුන් දේවමාළිගාව තුළ කරන්නේ කුමක්ද කියා යේසුස්වහන්සේ සොයාගත්තේ මොනවාද? (යොහාන් 2:14.)
- විකුණන්ද, මිල මාරුකරන්නන්ද දේවමාළිගාවෙන් පිටතට යේසුස්වහන්සේ පලවාහැරියේ කුමක් නිසාද? (යොහාන් 2:16; මතෙව් 21:13; ලූක් 19:45–46.)
- ඔවුන්ව පලවාහැරියාට පසු, යේසුස්වහන්සේ දේවමාළිගාව තුළ කුමක් කළේද? (මතෙව් 21:14; ලූක් 19:47.)
- ශුද්ධ ස්ථානවන නිවාස, දේවමාළිගා සහ සභාවේ ගොඩනැගිලි තුළ ගෞරවාන්විතව සිටීමේ වැදගත්කම ඔබ සිතන අන්දමට කුමක්ද? අප ගෞරවය පෙන්වන්නේ කා හටද?

ස්වාමීන්වහන්සේට කැපකරන ලද ස්ථානවලදී ගෞරවාන්විතව සිටීමේ වැදගත්කම ගැන සාකච්ඡාකරන්න. ගෞරවකිරීම ගැඹුරු උදාරත්වය සහ ප්‍රේමය බව අවබෝධකරගැනීමට ළමුන්ට උපකාරකරන්න.

- මිල මාරුකරන්නන් පළවාහැරි විටදී, යේසුස්වහන්සේ ගෞරවය සහ ප්‍රේමය දැක්වූයේ කා හටද? (යොහාන් 2:16.) උන්වහන්සේ මෙය කළේ කුමක් නිසාද?
- සභාවේදී, නිවසේදී, පාසලේදී, ක්‍රීඩාකිරීමේදී ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට ප්‍රේමය සහ ගෞරවය දැක්වීමට අපට හැකිවන්නේ කෙසේද?

එක් වතාවකට එක බැගින් වචන තීරු පෙන්වන්න. ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස් වහන්සේට ප්‍රේමය සහ ගෞරවය පෙන්වීමේ ක්‍රම ළමයින් සමග සාකච්ඡාකරන්න. පහත සඳහන් අදහස් ඇතුළත්කරන්න:

සක්‍රමේන්තු වෙලාවේදී අප ගෞරවාන්විතව සිටින විට යේසුස්වහන්සේට සහ ස්වර්ගීය පියාණන්වහන්සේ සමග අප තබන ගිවිසුම්වලට අපි ප්‍රේමය සහ ගෞරවය පෙන්වන්නෙමු.

සක්‍රමේන්තු රැස්වීමේ කථාවලට අප සවන්දෙන විටද, ප්‍රාථමිකයේ ගෞරවාන්විතව සිටින විටද, ස්වර්ගීය පියාණන් සහ යේසුස්වහන්සේ ගැන සහ අපි ඉගෙනගත යුතු උන්වහන්සේලාට අවශ්‍ය දේවල් ගැන වැඩියෙන් ඉගෙන ගන්නෙමු.

අප සුදුසුලෙස ආකාරයෙන් යාච්ඤාකරන විට ස්වර්ගීය පියාණන්වහන්සේට අපගේ ගෞරවය පෙන්වන්නෙමු.

අප විනීත ලෙස ඇඳුම් අඳින විට,ස්වර්ගීය පියාණන්වහන්සේගේ පූජනීය මැවිල්ලක් වන අපගේ ශරීරවලට අපි ගෞරවය පෙන්වන්නෙමු.

ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට අවශ්‍යවන ආකාරයට අප ක්‍රියාකරන විට, උන්වහන්සේලා කෙරෙහි අප විශ්වාසකරන බවද, උන්වහන්සේලා අපට කියා තිබෙන දේවල් අපට වැදගත් බවද අපි පෙන්වන්නෙමු.

ස්වාමීන්වහන්සේගේ නාමය අතිසි ලෙස නොව ගෞරවනීය ලෙස පාවිච්චිකිරීමෙන් උන්වහන්සේට අපි ගෞරවය සහ ප්‍රේමය දක්වන බව අන් අයට පෙන්වන්නෙමු.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්කම් එකක් හෝ වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකළ හැකිය.

1. නික්මයාම 20:7 කටපාඩම්කිරීමට ළමයින්ට කියන්න. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් කියන ලද පහත සඳහන් සිද්ධිය කියා සාකච්ඡාකර, මෙම වැදගත් පණත තැබීමට පොරොන්දු තැබීමට ළමයින්ට උපකාරකරන්න.

   "දිනක් රෝහලේදී මා රෝද පුටුවක තබා උපස්ථායකයෙකු විසින් ශල්‍යාගාර කාමරයෙන් පිටතට ගෙන එද්දී ඔහු හැපී වැටුන විට, ක්‍රෝධයෙන් යුත් ඔහුගේ තොල්වලින් ගැලවුම් කරුවාණන්ගේ නම් සම්බන්ධකරගනිමින් නපුරු ශාපයක් [දිවුරුමක්] පිටවිය. අඩ සිහියෙන්වුද මම පිළිකුලින් මෙසේ ආයාචනා කළෙමි: 'කරුණාකරල! කරුණාකරල! ඔබ ගරහන්නේ මගේ එම ස්වාමීන්වහන්සේටය. අධික නිශ්වලතාවයක් එහි විය. ඉන්පසු දමනයකරළ හඬකින් ඔහු මෙසේ කෙඳුරුවේය: 'මට සමාවෙන්න. 'ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ජනතාවට ඉතා ප්‍රබලව කරනලද ආඥාව ඔහුට මොහොතකට අමතක විය. 'තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ නාමය නිකරුනේ ව්‍යවහාර නොකරව; මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන් නාමය නිකරුනේ ව්‍යවහාරකරන තැනැත්තා නිවැරදිකාරයෙකු කොට ගණන් නොගන්නාසේක' (නික්මයාම 20:7)" ("President Kimball Speaks Out on Profanity," *Ensign*, පෙබ. 1981, පි. 3).

2. දේවමාළිගා සහ සභාවේ ගොඩනැගිලි කිහිපයක පින්තූර ලබාගන්න. වෙන වෙනම කඩදාසිවල දේවමාළිගා හා ගොඩනැගිලිවල නම් ලියාඑම නම් පින්තූර සමග සමානකිරීමට ළමයින්ට කියන්න. ස්වාමීන්වහන්සේගේ වැඩකටයුතු පොළොවේ ඉදිරියට ගෙනයාමට මෙම ගොඩනැගිලි උපකාරවන බව ඔබ පහදාදෙන විට, දෙවෙනි වතාවටත් එම නම් සහ පින්තූර සමානකිරීමට ළමයින්ට සලස්වන්න.

3. දේවමාළිගාවට ඔබ ගිය විට, ඔබට ඇතිවූ හැඟීම් විස්තරකරන්න. නැතිනම් ඔබගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ යමෙකුට දේවමාළිගාව ගැන ඔහුගේ හෝ ඇයගේ හැඟීම් බෙදාගැනීමට ආරාධනාකරන්න. දේවමාළිගාවේ පූජනීයභාවය සහ එහි යන අයට එහිදී ස්වාමීන්වහන්සේගේ සමීපතාවය හැඟෙන බව අවබෝධකරගැනීමට ළමයින්ට උපකාරකරන්න. දේවමාළිගාවට ඇතුල්වීම පිණිස සුදුස්සන්වීම සඳහා ඔවුන්ගේ ජීවිත තුල ලමුන්ට කළ හැකි දේවල් ගැන සාකච්ඡාකරන්න.

4. එක් එක් ළමයෙකුට කඩදාසි කැල්ලක් සහ පැන්සලයක් දෙන්න. ප්‍රේමය, ගෞරවය සහ සැලකිල්ල ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට එන සතියේ පෙන්වීමට හැකි විශේෂිත ක්‍රම ලිවීමට ලමුන්ට සලස්වන්න. ඔවුන්ට නිතර පෙනෙන ස්ථානයක එම ලැයිස්තුව තැබීමට ඔවුන්ට කියන්න.

5. සභාවේ ගොඩනැගිලි තුල ගෞරවය හෝ අගෞරවය පෙන්වන ක්‍රියාවල නිදර්ශන ළමයින් දෙන විට තවත් "ගෞරවයේ ඉරක් " හුණුලෑල්ලේ ලියන්න.

| | |
|---|---|
| අභියෝගය | ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමග ඔවුන්ගේ සම්බන්ධකම්වලට “ගෞරවයේ ඉරක්” ලමුන්ට අවශ්‍ය බව කියමින් “ගෞරවයේ ඉරක්” වෙතට නැවතත් යොමුකරන්න. ඔවුන් කරන සියල්ලේදී ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමය සහ ගෞරවය පෙන්වමින් ඔවුන්ගේ රේඛාව ඉහළට තබාගැනීමට ලමයින්ට අභියෝග කරන්න. |

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඔබගේ ගෞරවනීය හැඟීම්ද, ඔබගේ ප්‍රේමය, ගෞරවය සහ සැලකිල්ල ඔබ ජීවත්වන ආකාරය මගින් පෙන්වීමට ඔබට ඇති ආශාව ගැන ප්‍රකාශකරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 21:12–14 අධ්‍යයනය කිරීමට ලමයින්ට යෝජනාකරන්න.<br><br>අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න. |

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේරිතවරුන් කැඳවනසේක

9

වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කැඳවන උන්වහන්සේගේ විශේෂිතවූ සාක්ෂිකරුවන්වූ ප්‍රේරිතයන්ට වඩා ප්‍රේමයක් සහ ගෞරවයක් ඇතිකර ගැනීමට එක් එක් ළමයාට උපකාරකිරීමය

**සූදානම්වීම**

1. මතෙව් 4:18–22, ලූක් 5:1–11, 6:12–16, මතෙව් 16:13–19, මාර්ක් 3:13–19, 16:15, ක්‍රියා 10:39–43, 3 නීෆායි 12:1–2, සහ දහම සහ ගිවිසුම 107:23 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න “ඔබගේ පාඩම් සූදානම්කිරීම” පි. 00 (vi,) සහ “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම” පි. 00 vii).
2. අමතර කියවීම්: මතෙව් 10:2–4, මාර්ක් 1:16–20, සහ යොහාන් 1:35–51.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකාච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. දහම සහ ගිවිසුම පිටපත් කිහිපයක්.
   ඇ. හතරවෙනි ඇඳහිල්ලේ කරුණ සටහන.
   ඈ. 7-10 පින්තූරය, යේසුස්වහන්සේ සහ මසුන් මරන්නන් (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 209; 62496), සහ 7-11, සහ ක්‍රිස්තුස්වහන්සේ ප්‍රේරිතවරුන්ව පත්කිරීම (සුසභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 211; 62557), සහ වත්මන් ප්‍රේරිතවරුන්ගේද පින්තූර (64329–64378. ඔබගේ රැස්වීම් ගෘහයේ පුස්තකාලයේ මෙම පින්තූර නැතිනම්, වර්තමාන සභා සඟරාවල සම්මන්ත්‍රන වාර්තා බලන්න).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

යොමුවීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ශුද්ධ ලියවිලි සටහන් හුණුලෑල්ලේ ලියන්න:

*1 කොරොන්ති 12;28*
*එපීස 2:20*
*දහම සහ ගිවිසුම 107:23*

සෑම එකකම සඳහන් වැදගත් වචනයක් සොයාගැනීමට සටහන් බැලීමට ළමයින්ට කියන්න. කණ්ඩායම් දෙකක් හෝ තුනක් එකට කටයුතුකිරීට ළමයින්ට සැලැස්වීමට ඔබට අවශ්‍යවනවා ඇත. ඔවුන්ට උපකාර අවශ්‍ය නම්, වචනය පටන්ගන්නා අකුර ප්‍රේ (ප්‍රේරිතයා) යයි ඔවුන්ට කියන්න.

දහම සහ ගිවිසුම 107:23 ළමයෙකු ලවා පංතියට කියවා ප්‍රේරිතයෙකු ස්වාමීන්වහන්සේගේ වැදගත් සේවකයෙකු වන්නේ කුමක් නිසාද කියා සොයාගැනීමට සලස්වන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

සුදුසු අවස්ථාවලදී පින්තූර පෙන්වමින්, යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් කැඳවීමේ විස්තරය උගන්වන්න (මතෙව් 4:18–22; ලූක් 5:1–11) සහ පසුව ප්‍රේරිතවරුන් දොළොස්දෙනා (මාර්ක් 3:13–19; (ලූක් 6:12–16). (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට යෝජිත ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම” පි. 00 vii.)

මෙම විස්තර ඔබ උගන්වන විට, ගෝලයන් යයි කියන බොහෝ අනුගාමිකයන් යේසුස්වහන්සේට සිටිය බව ළමයින්ට අවබෝධවනවාද කියා සහතිකකර ගන්න. ප්‍රථමයෙන් උන්වහන්සේ පේත්‍රුස්, අන්ද්‍රා, යාකොබ් සහ යොහාන් ඔවුන්ගේ මසුන් අල්ලන බෝට්ටු වෙතින් උන්වහන්සේගේ ගෝලයන් වීමට කැඳවූසේක. ගෝලයන්වූ මෙම විශාල කාණ්ඩායමෙන් ප්‍රේරිතයන්වීමට මිනිසුන් දොළොස් දෙනෙකු උන්වහන්සේ තෝරාගත්සේක (බලන්න ලූක්

6:13). අදත් ප්‍රේරිතයන් පත්කරන ආකාරයට ඔවුන්ගේ හිස මත අත් තබා උන්වහන්සේ ඔවුන්ව පත්කොට, ප්‍රේරිත-වරුන්ට අද තිබෙන ආකාරයට එම අධිකාරීබලය ඔවුන්ට දුන්සේක (බලන්න මාර්ක් 3:13–15).

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- පේතෘස්, අන්ද්‍රා, යාකොබ්, සහ යොහාන් ජීවත්වීම පිණිස කළේ කුමක්ද? (මතෙව් 4:18–22.) “මනුෂ්‍යයන් අල්ලන්නන් ” යන්නෙහි අර්ථය කුමක්ද? (මතෙව් 4:19.) අද ප්‍රේරිතවරුන් “මනුෂ්‍යයන් අල්ලන්නන් ” වන්නේ කෙසේද? (ධ්‍රසහ්‍රි 18:27–29.)
- තමන්වහන්සේව අනුගමනයකිරීමට යේසුස්වහන්සේ ඔවුන්ට කී විට, පේතෘස්, අන්ද්‍රා, යාකොබ්, සහ යොහාන් ප්‍රතිචාර දැක්වූවේ කෙසේද? (මතෙව් 4:19–22.) *එකෙණෙහිම* යන්නෙහි අදහස වහාම යන්න බව පහදාදෙන්න. යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවට ඔවුන් විශ්වාසකළ බව පිළිතුරුවලින් පෙනුනේ කෙසේද? (උන්වහන්සේව අනුගමනයකිරීමට පෙර, උන්වහන්සේ කවුද කියා ඔවුන්ට කී බව ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ මතෙව් 4:18 සඳහන්වන බව සටහන්කරගන්න.) යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව අප දැනගැනීමේ වැදගත්කම කුමක්ද?
- යේසුස්වහන්සේ සීමොන්ගේ දැල්වලින් කුමක් කිරීමට කීසේදක්ද? (ලූක් 5:4.) (සීමොන්, සීමොන් පේතෘස්, සහ පේතෘස් යන සියලුම නම් එකම පුද්ගලයෙකුගේ බව පහදාදෙන්න.0 යේසුස්වහන්සේ කිරීමට කී දෙය ගැන සීමොන් ප්‍රශ්න කළේ කුමක් නිසාද? (ලූක් 5:5.) සිදුවූයේ කුමක්ද? (ලූක් 5:6–7.) යේසුස්වහන්සේ කෙරෙහි වඩා වැඩි ඇදහීමක් ගෝලයන් තුළ ඇතිවීමට මෙම සිද්ධිය උපකාරවූයේ කෙසේද? ලූක් 5:8–10.) යේසුස්වහන්සේ කෙරෙහි ඇදහීම ඇති බව ඔප්පුකිරීමට පේතෘස්, යාකොබ් සහ යොහාන් කළේ කුමක්ද? (ලූක් 5:11.) අප යෙ-සුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකරන බව අපට පෙන්විය හැක්කේ කෙසේද?
- තම ප්‍රේරිතයන් කැඳවීමට පෙර යේසුස්වහන්සේ කොපමණ වේලා යාච්ඤා කළසේක්ද? (ලූක් 6:12.) මෙම වැදගත් තීරණය ගැනීමට පෙර යේසුස්වහන්සේ යාච්ඤා කළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? අද ප්‍රේරිතවරුන් කැඳවන්නේ කවුද? (ස්වර්ගීය පියාණන්වහන්සේ පළවෙනි සභාපතිත්වයට පෙළඹවීම මගින් උපදෙස් ලබා දෙනසේක.)
- ගෝලයන් සහ ශුද්ධ ලියවිලි ගැන ශුද්ධ ලියවිලි කථාකරයි. ගෝලයෙකු සහ ප්‍රේරිතයෙකු අතර වෙනස කුමක්ද? (ලූක් 6:13.)

ගෝලයෙකු යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයෙකු බව පහදාදෙන්න. ප්‍රේරිතයෙකු යනු, විශේෂයෙන් තෝරාගත් කණ්ඩායමක කෙනෙකු වන අතර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන මුලු ලොවට සාක්ෂි දැරීමට විශේෂ-යෙන් නියමකරන ලද්දෙකි. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවත්, උන්වහන්සේ නැවත නැගිටි බවත් ඔහු සාක්ෂි දරයි. ලොව සෑමතැනම ශුභාරංචිය දේශනාකිරීම ගැන, ඔහු සාක්ෂි දරයි. (බලන්න මාර්ක් 16:15 සහ ධ්‍රසහ්‍රි 107:23.)

- ඔබ ගෝලයෙක්ද, නැතහොත් ප්‍රේරිතයෙක්ද?
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විශේෂ සාක්ෂිකරුවෙකු වීම යන්නෙහි අර්ථය කුමක්ද? (ක්‍රියා 4:33; 10:39–43; ධ්‍රසහ්‍රි 107:23.) යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවට පේතෘස් සාක්ෂි දැරුවේ කෙසේද? (මතෙව් 16:13–17.) පේතෘස්ගේ සාක්ෂිය නිසා යේසුස්වහන්සේ පේතෘස්ට පොරොන්දුවූයේ කුමක්ද? (මතෙව් 16:18–19.) ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේගේ වැඩකටයුතු පොළොවෙහි කිරීමට ප්‍රේරිතවරුන්ට දී තිබෙන අධිකාරීබලය “රාජ්‍යයෙහි යතුරු” නමින් හැඳින්වෙන බව අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරකරන්න. අන්වෙසක්වූ කන්ද උඩදී පේතෘස්, යාකොබ් සහ යොහාන් පොරොන්දු යතුරු ලබාගැනීමේ විස්තරය 15 වෙනි පාඩමේදී සාකාච්ඡා කරනු ලැබේ.
- යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව අද ප්‍රේරිතවරුන් සාක්ෂිදරන්නේ කෙසේද?

ස්වාමීන්වහන්සේගේ ප්‍රේරිතයෙකු වන වැඩිහිටි ඩේවිඩ් බී. හයිට්ගේ පහත සඳහන් විස්තරය කියන්න:

“මගේ සෞඛ්‍යය තත්වය අසාධ්‍යවූ සැන්දෑවේ, ඉතාම දරුණු යමක් මට සිදුවී ඇති බව මම දැනගත්තෙමි. …උන්වහන්සේගේ වැඩකටයුතු කිරීමට මට තව ස්වල්ප කාලයක් වැඩියෙන් දීම පිණිස මගේ ජීවිතය ටික කාලයකට දීර්ඝකිරීම උන්වහන්සේගේ කැමැත්ත නම්, එසේ කිරීමට මම ආයාචනා කළෙමි.

“යාච්ඤාවෙහි තවමත් යෙදී සිටින විට, මට සිහිය නැතිවීමට පටන් ගත්තේය. මට සිහි නැතිවීමට පෙර, අන්තිමට මට මතක තිබුනේ, අතිරේක වෛද්‍යාධාර සපයන වාහනයේ අනතුරු ඇඟවීමේ නළාවේ ශබ්දයයි. එය දවස් ගණනක් පවතිනවා ඇත.

“අධික වේදනාව සහ මිනිසුන්ගේ කළබලය නැවතිනි. මම දැන් නිසල සමාදානයේ තත්වයක සිටින අතර, සියල්ල සන්සුන්ය, නිශ්චලය….

“කිසිම හඬක් මට නොඇසුන අතර, ශුද්ධවූ වාතාවරනයක සිටමේ සිහි බුද්ධිය මට තිබින. පසුවූ හෝරාවන් සහ දින ගණන්වල්දී නැවත නැවතත් මගේ මනසට කාවැදුනේ මනුෂ්‍ය පුත්‍රයාගේ සදාකාල දූතමෙහෙය සහ උත්කර්ෂ තත්වයයි. උන්වහන්සේ යේසුස් නම්වූ ක්‍රිස්තුස්වහන්සේය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ය, සියල්ලන්ගේ ගැලවුම්කරුවාණන්ය, සියලු මනුෂ්‍ය වර්ගයාගේ මිදුම්කරුවාණන්ය, අසීමිත ප්‍රේමය, දයාව, කමාවේ දායකයාණෝය. ලෝකයේ ආලෝකය හා ජීවනය බවට මම ඔබලාට සාක්ෂිදරමි. මෙම සත්‍යය මම කලින් දැනසිටියෙමි—කිසිදිනක මම සැක කළේවත්, පුදුමවුනේවත් නැත. මෙම දිව්‍යමය සත්‍යයන් ඉතාම අසාමාන්‍ය අන්දමට මගේ සිතට සහ ආත්මයට ආත්මයාණන්වහන්සේ කාවැද්දීමට සැලැස්වූ බැවින් මම දැන් දැන සිටියෙමි.

“පොළොවෙහි උන්වහන්සේගේ මෙහෙය ගැන හාත්පස පෙනෙන දර්ශනයක් මට පෙන්වන ලදී: උන්වහන්සේගේ බව්තීස්මය, උන්වහන්සේගේ ඉගැන්වීම්, උන්වහන්සේ රෝගීන්, කොරුන් සුවකිරීම, අපහාසාත්මක විනිශ්චය, උන්වහන්සේගේ කුරුසපත්වීම, උන්වහන්සේ නැවත නැගිටීම, සහ ස්වර්ගස්තවීම මට පෙන්වන ලදී. අනතුරුව උන්වහන්සේගේ පොළොවෙහි මෙහෙය ගැන දර්ශන, ශුද්ධ ලියවිලි විස්තරකරන ඇසින් දුටු සාක්ෂිවල විස්තර, මගේ මනසට සවිස්තරව කාවැදුනි. බොහෝ දේවල් දැකගැනීම පිණිස දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මගින් මට උගන්වන ලදී. තවද මාගේ අවබෝධයේ ඇස් විවරකරන ලදී” (*Conference Report* තුලිනි, ඔක්තෝ. 1989, පි. 73; හෝ *Ensign,* නොවැ. 1989, පිටු. 59–60).

- පොලොවේ අද සිටින ප්‍රේරිතවරුන් කවරහුද?

පළමු සභාපතිත්වයේ සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ පුද්ගලයන්ගේ නම් හඳුනාගන්න. මෑතකදී ඔබගේ පළාතට පැමිණි නැතහොත් ඔබගේ පළාතට පැමිණීමට සිටින කෙනෙකු කෙරෙහි යොමුවෙමින් වර්තමාන ප්‍රේරිතයෙකු ගැන ඔබ දන්නා යමක් කියන්න.

- ප්‍රේරිතවරුන්ගේ අවවාදවලට අප සවන්දෙන විට අපගේ ජීවිතවලට ආශිර්වාද ලැබෙන්නේ කෙසේද? (3 නීෆයි 12:1–2.)

ඇදහිල්ලේ කරුණ

හයවෙනි ඇදහිල්ලේ කරුණ කටපාඩම්කිරීමට ළමුන්ට උපකාර කරන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකළ හැකිය.

1. පළවෙනි සභාපතිත්වයේ සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ පුද්ගලික පින්තූර පංතියට ගෙනෙන්න. කඩදාසිවල වෙන වෙනම ඔවුන්ගේ නම් ලියා නම් පින්තූර සමග සමානකර, ජ්‍යෙෂ්ඨත්වයේ පිළිවෙලට සකස්කිරීමට ළමයින්ට කියන්න. පුද්ගලික පින්තූර නොමැතිනම්, ජ්‍යෙෂ්ඨත්වයේ පිළිවෙලට සකස්කිරීමට ළමයින්ට සලස්වන්න. හැම ළමයෙකුටම වාරයක් දෙන්න.
2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කැඳවූ ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ නම් ලැයිස්තුව සාකච්ඡාකරන්න. (ලූක් 6:12–16.)
3. අලුත් සභා සඟරාවක අලුත් සම්මන්ත්‍රන වාර්තාවක් හෝ සම්මන්ත්‍රන නිකුතුවක් භාවිතාකරමින් ප්‍රේරිතවරුන් පවත්වන ලද කථා සෙවීමට ළමුන්ට සලස්වන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔවුන්ගේ විශේෂිත සාක්ෂිය ප්‍රේරිතවරුන් මෙම කථාවල්දී ප්‍රකාශකල ස්ථාන සෙවීමට ඔවුන්ට කියන්න (බොහෝ විට මේවා ඔවුන්ගේ කථාවේ අවසානයේ ඇත).

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | ප්‍රේරිතවරුන්ට ඔබගේ ඇති කෘතඥතාවය ගැන ළමයින් සමග බෙදාගනිමින්, ඔවුන්ගේ අවවාද ඔබ අනුගමනයකළ විට, ඔබගේ ජීවිතය ආශිර්වාදිතවූ ආකාරය ඔවුන්ට කියන්න. උන්වහන්සේගේ නාමය කෙරෙහි සාක්ෂිදැරීමටද, ලොව පුරා ශුභාරංචිය ඉගැන්වීමටද, ජීවමාන අනාගතවක්තෘ මගින් යේසුස්වහන්සේ ප්‍රේරිතවරුන් කැඳවන බවට ඔබගේ සාක්ෂිය දරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනකිරීමක් වශයෙන් මතෙව් 4:18–22 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනාකරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

# කන්ද උඩ දේශනාව

# 10
වෙනි පාඩම

| | |
|---|---|
| **අරමුණ** | කන්ද උඩ දේශනාවේ යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීමෙන් වඩාත් උන්වහන්සේ මෙන් වීමට උත්සාහ-කිරීමට ළමයින්ට උපකාර කිරීමය. |

**සූදානම්වීම**

1. මතෙව් 5:1–6:4 සහ 7:12 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 (vi,) සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii).
2. අමතර කියවීම් ලූක් 6:17–36 සහ 3 නිෆායි 12.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, සහ පාඩමේ අරමුන ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. ළමයින්ට මුහුනදීමට සිදුවිය හැකි දේවල් ලියන ලද කඩදාසි (බලන්න ක්‍රියාකාරකම්වලට යොමුවීම).
   ඇ. 7-12 පින්තූරය, කන්ද උඩ දේශනාව (ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 212; 62166).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

යොමුවීමේ ක්‍රියාකාරකම්

එක් එක් ළමයාට පංතිය ඉදිරියට ඒමට සලස්වා ඔහුට හෝ ඇයට මුහුණදීමට සිදුවිය හැකි දුෂ්කර අවස්ථාවන් ඔබ ලියන ලද කඩදාසි කැල්ලක් වරකට එක් අයෙකු බැගින් පැමිණ ගැනීමට සලස්වන්න. පහත සඳහන් නිදර්ශන අවස්ථා භාවිතා කරන්න:

ඔබගේ සහෝදරයා හෝ සහෝදරිය ඔබව විවේචනය කරයි.
පාසලේදී යමෙක් ඔබව පහත්කොට සලකයි.
සිගරට් එකක් බීමට ඔබ ප්‍රතික්ෂේප කල නිසා අනෙක් ළමයි ඔබව සිනහවට ලක්කරති.
ඔබ නොදිව්රන නිසා අන්‍යයෝ ඔබව සිනහවට ලක්කරති.

එම අවස්ථාවට ඔහු හෝ ඇය ප්‍රතිචාර දක්වන ආකාරය කීමට එක් එක් ළමයාට කියන්න. පංතියේ අනෙක් සාමා-ජිකයන්ට ඔවුන්ගේ අදහස් එක්කිරීමට සලස්වන්න. එම අවස්ථාවේදී කිරීමට ඔවුන්ට උපකාරවන, යේසුස්වහන්සේ කන්ද උඩ දේශනාවේ උගන්වන යම් දේවල් ඔවුන් සාකච්ඡාකිරීමට යන බව පහදාදෙන්න. වඩාත් යේසුස්වහන්සේ මෙන් වීමට මෙම ඉගැන්වීම් අපට උපකාරවනු ඇත. මන්ද උන්වහන්සේට අවශ්‍ය වන අන්දමට අපට ජීවත්වීමට මේවා කියා දෙන නිසාය.

ශුද්ධ ලියවිලි විස්තරය

කන්ද උඩ දේශනාවේ පින්තූරය පෙන්වන්න. "සූදානම්වීම" කොටසේ ලැයිස්තුගත කරන ලද ශුද්ධ ලියවිලි භාවිතා-කරමින් යේසුස්වහන්සේ කන්ද උඩ දේශනාව දීම ගැන ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.) පහත සඳහන් කරුණු අවධාරනයකරන්න.

ආශිර්වාද වාක්‍යය
ඔබගේ සතුරන්ට ප්‍රේමකිරීම
සර්ව සම්පූර්ණවීම
රන් අණ (එබැවින් මනුෂ්‍යයන් විසින් තුඹලාට යමක් කරනවාට තුඹලා කැමතිද, තුඹලාත් එසේම ඔවුන්ට කරපල්ලා.)

## සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- මතෙව් 5:3–11 එන ඉගැන්වීම්වලට ආශිර්වාද වාක්‍ය යයි බොහෝ විට කියනු ලබන බව පහදාදෙන්න. (යේසුස්වහන්සේ නිෆායිවරුන්ට ආශිර්වාද වාක්‍යය දෙන විට, "මා වෙතට එන යමෙකු" යන වාක්‍ය කණ්ඩය උන්වහන්සේ ඇතුලත්කල බව පෙන්වාදෙන්න.මතෙව් 5:3, 3 නිෆායි 12:3 සමග සසඳන්න. අපට යේසුස්වහන්සේ මෙන් වීමට ආශිර්වාද වාක්‍ය උපකාරවන්නේ කෙසේද?
- ධර්මිෂ්ඨකමට සා පිපාසා ඇත්තෝ යන්නෙහි අර්ථය කුමක්ද? (මතෙව් 5:6.) මෙය අපට කල හැකි වන්නේ කෙසේද? එසේ කළ විට අපට ලැබෙන ආශිර්වාද මොනවාද?
- පවිත්‍ර සිතක් යනු කුමක්ද? (මතෙව් 5:8.) පවිත්‍ර සිතක් ඇත්තාට පොරොන්දුවී ඇත්තේ කුමක්ද? පවිත්‍ර සිත් වැඩිදියුණුකර ගැනීමට අපට හැකිවන්නේ කෙසේද?
- සමාදානකරන්නෙක් වීමේ වැදගත්කම කුමක්ද? (මතෙව් 5:9.) සමාදානකරන්නන් වීමට අපට හැකිවන්නේ කෙසේද?
- "පොලොවේ ලුනු මෙන් " වීමේ අර්ථය කුමක්ද? (මතෙව් 5:13) ලුනු මෙන් වීමට අපට හැකිවන්නේ කෙසේද? (සාරවත් ක්‍රියාකාරකම් 2 බලන්න.) "ලෝකයට ආලෝකයක් " වීම යන්නෙහි අර්ථය කුමක්ද? (මතෙව් 5:14–16.) අන් අයට ආලෝකයක් වීමට අපට හැකිවන්නේ කෙසේද?
- අප සහ තවත් කෙනෙක් අතර ප්‍රශ්නයක් ඇතිවූවහොත් අප කළ යුත්තේ කුමක්ද? (මතෙව් 5:23–24.) අපගේ සතුරන්, නැතිනම් අපට අකමැති අයට අප සැලකිය යුත්තේ කෙසේද? මතෙව් 5:43–47.)
- සම්පූර්ණවීමට අපට හැකිවන්නේ කෙසේද? (මතෙව් 5:48.)

සර්වසම්පූර්ණවීම ගැන වැඩිහිටි ජෝසෆ් ෆීල්ඩින්. ස්මිත්ගේ ප්‍රකාශය සාකච්ඡාකරන්න: "[සම්පූර්නත්වය] එකවරම පැමිණෙන දෙයක් නොවේ. නමුත් අණ පිට අණය, පනත පිට පනතය, ආදර්ශය පිට ආදර්ශය, යනාදී වශයෙන් වුවද, අපි මෙම මැරෙන සුලු ජීවිත කාලය තුලදීද නොවේ.... නමුත් එම සම්පූර්ණත්යට සූදානම්වීම පිණිස... මෙහිදී අපි අත්තිවාරම දමන්නෙමු. ඊයේට වඩා අද හොඳවීමත්, අදට වඩා හෙට හොඳවීමත් අපගේ යුතුකම වේ" (*Doctrines of Salvation,* 2:18).

- සේවා ක්‍රියා අප කළ යුත්තේ කෙසේද? (මතෙව් 6:1–4.) අන් අයට අපට කළ හැකි රහසිගත සේවා ක්‍රියා මොනවාද?
- මතෙව් 7:12 බොහෝ විට කියන්නේ රන් අණ කියාය. අපට කිරීමට යේසුස්වහන්සේ කියන්නේ කුමක්ද? මෙය අපට කළ හැක්කේ කෙසේද?

කන්ද උඩ දේශනාවේදී යේසුස්වහන්සේ ඉගැන්වූ දේවල් ඔවුන්ගේ ජීවිතවලදී කිරීමට උත්සාහ කරනවා නම්, සම්පූර්ණත්වෙයේ මාර්ගයට ඔවුන් පිවිසෙන බව අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරකරන්න. මෙම ජීවිත කාලය තුළදී ඉටුකරගැනීමට නොහැකි සම්පූර්ණත්වය අනුක්‍රමයෙන් ඉටුකරගත යුතු දෙයක් බව අවධාරනයකරන්න. දැනට අප කළ යුතු අවශ්‍ය දෙයක් වන්නේ, එක් එක් දිනයකදී වඩාත් යේසුස්වහන්සේ මෙන් වීමට උත්සාහ දැරීමය.

යොමුවීමේ ක්‍රියාකාරකම් වලින් අවස්ථාවන් නැවත බැලීමට ළමයින්ට සලස්වන්න. යම් යම් අවස්ථාවලදී අප ප්‍රතික්‍රියා කිරීමට යේසුස්වහන්සේට අවශ්‍යවන අන්දම ගැන ඔවුන් ඉගෙනගත් දේවල් කීමට ළමයින්ට සලස්වන්න. කන්ද උඩ දේශනාවේ යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුව අප සියලු දෙනාම ජීවත්වන්නේ නම් සිදුවන දෙය ගැන ඔවුන් කුමක් සිතනවාදැයි ළමයින්ගෙන් අසන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් මෙන් හෝ අභියෝගයක් මෙන් පාවිච්චිකිරීමට ඔබට හැකිය.

1. "මා වෙතට එන සිතින් දිළින්දෝ වාසනාවන්තයෝය" යන ආකාරයට ආශිර්වාද වාක්‍යවල පළවෙනි කොටස කාඩ්පත් වල ලියා, "මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය" යන දෙවෙනි කොටස වෙනත් කාඩ්පතක ලියන්න.

කාඩ්පත් කලවම් කොට, මුහුනත පහතට සිටිනසේ මේසයක් මත හෝ බිම පේළියට තබන්න. වරකට එක් කෙනා බැගින් පැමිණ, කාඩ්පත් දෙකක් හරවා, සමානකිරීමට පංති සාමාජිකයන්ට සලස්වන්න. (ඔවුන්ට උපකාරවීම පිණිස ළමුන්ගේ ශුද්ධ ලියවිලි භාවිතාකිරීමට ඔවුන්ට හැකිය.) කාඩ්පත් සමානවන්නේ නම්, සමානවූ කාඩ්පත් මුහුණ උඩට හරවා තබන්න. කාඩ්පත් සමාන නොවන්නේ නම්, ඒවා නැවත මුහුණ පහතට හරවා තබන්න. පළවෙනි වතාවේ සෑම කෙනෙකුටම වාරයක් නොලැබුනා නම්, කාඩ්පත් කලවම්කර, ඒවා හරවා නැවත සමානකිරීමට ළමයින්ට සලස්වන්න.

2. මෙම පාඩම උපවාස ඉරුදිනක නොවේ නම්, ලුණු මිශ්‍ර ඉරිඟු පොරි බත් පිටිවලින් තැනූ ආහාරයක් වැනි දෙයක් සූදානම්කරන්න. ලුණු වෙන්කොට තබා එක් එක් ළමයාට එම ආහාරවල රසබැලීමට කියන්න. (ආහාර අසාදානය ගැන දෙමාපියන් විමසන්න). ලුණු ස්වල්පයක් මිශ්‍රකොට නැවත එම ආහාරවල රසබැලීමට ළමයින්ට සලස්වන්න. ලුණු ඉතාම කුඩා ප්‍රමාණයකින් විශාල වෙනසක් කිරීමට හැකි බව පෙන්වාදෙන්න. ධර්මිෂ්ඨ පුද්ගලයන් ස්වල්ප දෙනෙකුටද විශාල වෙනසක් කිරීමට හැකිය. ධර්මිෂ්ඨව ජීවත්වීමෙන් ඔවුන්ට වෙනසක් කළ හැකි බව සාකාච්ඡාකිරීමට ළමයින්ට සලස්වන්න. මතෙව් 5:13 කියවන්න.

3. ළමයින් දෙදෙනෙකුට එකම ආසනය අවශ්‍යවීම, සමහර ළමයින් එකිනෙකාට විරුද්ධව ක්‍රෝධයෙන් කථාකිරීම, වැනි කළහකාරී තත්වයන් ඉදිරිපත්කරන්න. මෙම තත්වයන් රඟපෑමට සලස්වා, එක් එක් ළමයෙකුට සමාදානකරන්නෙකු මෙන් රඟපෑමට සලස්වන්න. යමෙකු අපහාසාත්මක යමක් කියමින් විරෝධය පළකිරීම, යමෙක් ඔවුන්ගේ දෙයක් ගැනීම, මිතුරෙකු ඔවුන් සමග අමනාපවීම, සභාවේ සාමාජිකයෙකු වීම නිසා යමෙකු ඔවුන්ව විවේචනයකිරීම, යනාදී අවස්ථාවන් ගැන සිතීමට ළමයින්ට සලස්වන්න. මතෙව් 5:44 අනුව, මෙවැනි අවස්ථාවලදී ඔවුන් ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේදැයි ඔවුන්ගෙන් අසන්න.

4. ඔහු හෝ ඇය කළ දෙයක් හෝ කළ හැකි සේවයක් අංග චලනයෙන් දැක්වීමට ළමයෙකුට සලස්වන්න. ළමයා කරන දෙය අනුමාන වශයෙන් කීමට අනෙක් ළමයින්ට සලස්වන්න. අන්‍යයන්ට සේවයකිරීමේ වැදගත්කම ගැන සාකච්ඡාකරන්න. යමෙකුට උපකාරකිරීමෙන් ඔවුන්ට හැඟෙන ආකාරය ගැන කථාකිරීමටත්, පුද්ගලයන්ට පිහිටවීමේදී ලැබෙන සියලුම සුභවාදී ප්‍රතිඵල ගැන සිතීමට ඔවුන්ට කියන්න.

5. මතෙව් 5:16 හෝ මතෙව් 7;12 පළවෙනි කොටස කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න.

6. එක් එක් ළමයෙකුට නිවසට ගෙනයාමට ආශිර්වාද වාක්‍යය පිටපත බැගින් සූදානම්කරන්න. නැතහොත් ඔවුන්ගේම ශුද්ධ ලියවිලිවල ඒවා ලකුණුකිරීමටමට ළමයින්ට සලස්වන්න.

7. පහත සඳහන් සටහන් කොල කෑලිවල හෝ හුණුලෑල්ලේ ලියන්න.

   *මතෙව් 5:3 3 සහ 3 නිෆායි 12:3*
   *මතෙව් 5:6 3 සහ 3 නිෆායි 12:6*
   *මතෙව් 5:10 සහ 3 නිෆායි 12:10*
   *මතෙව් 5:48 සහ 3 නිෆායි 12:48*

   සටහන් දෙකම ළමුන්ට කියවීමට සලස්වා, ඒවා වෙනස් වන ආකාරය සාකච්ඡාකරන්න. යුදෙව්වරුන්ට සහ නිෆායිවරුන්ට එක සමාන දේවල් යේසුස්වහන්සේ ඉගැන්වූ බවත්, මෝර්මන්ගේ පොතෙහි ඒවා වැඩියෙන් පැහැදිළි බවත් අවබෝධකරගැනීමට ළමුන්ට උපකාරකරන්න.

---

## අවසානය

සාක්ෂිය

කන්ද උඩ දේශනාවේ යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුව අප ජීවත්වන්නේ නම්, සම්පූර්ණත්වෙයේ මගට අපි පිවිසෙන බවට ඔබගේ සාක්ෂිය දරන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයක් වශයෙන් මතෙව් 5:3–11 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

11

වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යාච්ඤාව ගැන උගන්වනසේක

**අරමුණ** දිනපතා පුද්ගලික යාච්ඤාව පැවැත්වීමට ආශාවක් ඇතිකරගැනීමට එක් එක් ලමයාට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 6:5–13, 7:7–11 සහ ඇල්මා 34:19–27 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00(vi), සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii).
2. අමතර කියවීම්: මතෙව් 4:2, 14:23; 26:36–46; ලූක් 9:28–29; 11:2–4, 9–13; යොහාන් 17; 3 නීෆයි 14:7–12; 17:14–21; 18:16.
3. ඔබගේ පංතියේ ලමුන් සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. මෝර්මන්ගේ පොතක්.
   ඇ. ශුද්ධ ලියවිලි සළකුණුකිරීමට පැන්සල්.
   ඈ. පින්තූරය 7-12, කන්ද උඩ දේශනාව (සුභාරංචි කලා චිත්‍ර පින්තූර මෙවලම 212; 62166), සහ 7-13, අවුරුදු එකොළහක ලමයෙක් යාච්ඤාවෙන් දණගසා සිටීම (62218).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

**යොමුකිරීමේ ක්‍රියාකාරකම්** පහත සඳහන් ලැයිස්තුවට සමාන ලමයින්ට සිදුවිය හැකි අවස්ථාවන් කිහපයක් කොළ කෑලිවල වෙන වෙනම ලියන්න. (නැතහොත් එම අවස්ථාවන් ඔවුන්ට කීමට ඔබට පුළුවන). එක් එක් ලමයෙකුට ඉදිරියට පැමිණ කඩදාසි කෑල්ලක් තෝරාගැනීමට කියන්න. එම අවස්ථාවේදී ඔවුන්ට හැඟෙන ආකාරයත් ඔවුන් ක්‍රියාකරන ආකාරයත් ගැන කථාකිරීමට සලස්වන්න.

ඔබ පාපැදියෙන් වැටී කකුල තුවාලවී ඇත. කිසිකෙනෙකු අවට නැත. ගෙදරට ඇවිද යාමට හැකිවේද කියා ඔබ නොදනී.

ඔබට උණ සහ බඩේ අමාරුවක් ඇත. ඔබට යහපත් හැඟීමක් ඇතිකිරීමට ඔබගේ දෙමාපියන්ට හැකි සියල්ල ඔවුන් කර ඇත. නමුත් ඔබ තවමත් අධිකව රෝගීව සිටියි.

හෙට දිනයේදී ඔබට පාසලේ පැවරුමක් ඇත. ඔබ බොහෝ මහන්සිවී ඒ සඳහා වැඩකර ඇතත්, ඔබට අවශ්‍ය අන්දමට එය එතරම් හොඳ නැත. එය වැඩිදියුණුකිරීමට ඔබ නොදනී.

ඔබ පිටත ක්‍රීඩාකරමින් සිට ගෙදර පැමිණෙණ විට, එහි කිසිවෙකු නැත. පවුලේ අය කොහේ ගියාදැයි නොදැනීම නිසා ඔබ බියට පත්වේ.

ඔබගේ උපන්දිනය වෙනුවෙන් ඔබගේ සීයා සහ ආච්චී ඔබට මුදල් ටිකක් දුන් අතර, එය තැබුවේ යයි ඔබ සිතන තැන දැන් එය නැත.

අන්ධකාර වේලාවේ එළිමහනේ ඔබ වාඩිවී සිටින අතර තාරකා කෙතරම් ලස්සනට පේනවාද කියා ඔබ සිතයි.

වතු වගාවට පවුලේ අයට ඔබ උදව් කරයි, පැළැටි වැඩෙන බව ඔබ දුටු අතර, එළවලු සහ පලතුරු ඉදී තිබෙන බව ඔබ දකියි.

අපට කරදර ගෙන දෙන ඕනෑම ප්‍රශ්නයකට උපකාර ලබාගැනීමට, අපගේ හැඟීම් උන්වහන්සේ සමග බෙදාගැනීමට, හෝ අපගේ කෘතඥතාවය පළකිරීම පිණිස ස්වර්ගීය පියාණන්වහන්සේට යාච්ඤාකිරීමට අපට හැකි බව පහදාදෙන්න. අපගේ අවංක යාච්ඤාව ස්වර්ගීය පියාණන්වහන්සේ නිතරම අසනසේක,

**ශුද්ධ ලියවිලි විස්තරය**

යාච්ඤාකරන අන්දම කන්ද උඩ දේශනාවේදී තම ගෝලයන්ට යේසුස්වහන්සේ පෙන්වා දුන් බව ළමයින්ට උගන්වන්න. (මතෙව් 6:9–13 බලන්න.) (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.) මෙම පද වාර අනුව ළමයින් සමග කියවීමට ඔබට අවශ්‍යවිය හැකිය. ඔවුන්ගේම ශුද්ධ ලියවිලිවල ඕනෑම හෝ සියලුම පද ලකුණුකිරීමට ඔවුන්ට කාලය ලබාදීමටද ඔබට අවශ්‍යවිය හැකිය. එක් එක් පදයක සංකල්පය සාකච්ඡා කොට, අමාරුවචන ඇත්නම් පහදාදෙන්න.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- "තවද තුඹලා යාච්ඤාකරන කල්හි වංචාකාරයන් කරන්නාක් මෙන් නොකරල්ලා"? (මතෙව් 6:5) යයි යේසුස්වහන්සේ කී විට උන්වහන්සේ අදහස් කළේ කුමක්ද? වංචාකාරයන් නොවන අන්දමට අපට අවංකව යාච්ඤාකිරීමට හැකිවන්නේ කෙසේද? (ඔහු හෝ ඇය යහපත් කෙනෙකු නොවන අතර, නැතහොත් යහපත් වුවත් එසේ නොපෙන්වන යමෙකු වංචාකාරයෙකි.)
- අප අපගේ පුද්ගලික යාච්ඤාව ඔප්පුකරන විට, වංචාකාරයන් වෙනස්විය යුතු අන්දම යේසුස්වහන්සේ කියන්නේ කුමක්ද? (මතෙව් 6:6.)
- තවද "යාච්ඤාකිරීමේදී අන්‍ය ජාතීන් මෙන් නිරර්ථක වචන කියගෙන කියාගෙන නොයල්ලා," යයි උන්වහන්සේ කී විට, යේසුස්වහන්සේ අදහස් කළේ කුමක්ද? (මතෙව් 6:7.) (අන්‍ය ජාතීන් යනු මෙහිදී අර්ථය නම් බොහෝ දෙවිවරුන්ට නමස්කාර කරන පුද්ගලයන් හෝ ක්‍රිස්තියානු නොවන අයය. නිරර්ථක යනු සිතීමෙන් හෝ අවවංකකමින් තොරව එකම වචනය කිහිප වතාවක් කීමය.) අප යාච්ඤාකරන විට "නිරර්ථක වචන" වලින් වැළකී සිටීමට අපට හැකිවන්නේ කෙසේද?
- ඉල්ලාපල්ලා, සොයාපල්ලා, තට්ටුකරපල්ලා යයි යේසුස්වහන්සේ කියන විට උන්වහන්සේ එයින් අදහස්කරන්නේ කුමක්ද? (මතෙව් 7:7–11.) ඉල්ලන්නන්ට, සොයන්නන්ට, තට්ටුකරන්නන්ට ස්වර්ගීය පියාණන්වහන්සේගේ පොරොන්දුව කුමක්ද? (මතෙව් 7:7–8.) ස්වර්ගීය පියාණන්වහන්සේට යාච්ඤාව තුලින් ඔබට උපකාර ලැබුනේ කෙසේද?
- ස්වර්ගීය පියාණන්වහන්සේ නිතර අපගේ යාච්ඤාවන්ට පිළිතුරු දෙනසේක්ද? අපගේ යාච්ඤාවන්ට ක්ෂණික පිළිතුරු නොලැබුනත්, නැතහොත් අප බලාපොරොත්තුවන අන්දමට පිළිතුරු නොලැබුනත් අපගේ සියලුම අවංක යාච්ඤාවන්ට ස්වර්ගීය පියාණන්වහන්සේ පිළිතුරු දෙන බව අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරකරන්න. "නැත" හෝ "තවම නැත" යන්න සමහරවිට උන්වහන්සේගේ පිළිතුර විය හැකිය.
- "නැත" හෝ "තවම නැත" යන අන්දමට ස්වර්ගීය පියාණන්වහන්සේ පිළිතුරු දෙන්නේ කුමක් නිසාද? හැකි නම් ඔබගේම අත්දැකීමකින් නිදර්ශනයක් දෙන්න. ස්වර්ගීය පියාණන්වහන්සේ සියල්ල දන්නා බැවින් අපට ඉතාම හොඳ දෙය උන්වහන්සේ දන්නාසේක.
- කොතැනකට කෙසේද අපගේ පුද්ගලික යාච්ඤාව අප ඔප්පුකළ යුතු වන්නේ? (ඇල්මා 34:19–27.) කුමක් ගැන අප යාච්ඤාකළ යුතුද? අප ස්තුතිවන්තවීමට ස්වර්ගීය පියාණන්වහන්සේ අපට කුමක් දෙන ලද්දේද?
- අප උන්වහන්සේට යාච්ඤාකිරීම ස්වර්ගීය පියාණන්වහන්සේට අවශ්‍යවන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?
- සෑම උදෑසනකම සහ රාත්‍රියකම පුද්ගලික යාච්ඤාව පැවැත්වීමේ වැදගත්කම කුමක්ද? (ඇල්මා 37:37.)
- නිහතමානී අවංක පුද්ගලික යාච්ඤාවක් ඔබ ඔප්පුකළ විට ඔබට හැඟෙන්නේ කෙසේද? යාච්ඤාව තුලින් ස්වර්ගීය පියාණන්වහන්සේ වෙතට සමීපවීමට අපට හැකිවන්නේ කෙසේද? අපගේ හදවත් තුල නිතර යාච්ඤාවක් තබාගැනීමට අපට හැකිවන්නේ කෙසේද? මෙය කිරීමට අප උත්සාහ කළ යුත්තේ කුමක් නිසාද?

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. පංතිය කුඩා කණ්ඩායම්වලට බෙදා, පහත සඳහන් ශුද්ධ ලියවිලි සටහන් සොයාගැනීමට එක් එක් කණ්ඩායමට සලස්වන්න. ඉන්පසු මුලු පංතියටම ශුද්ධ ලියවිල්ල ගැන කීමට කණ්ඩායමට සලස්වන්න. යේසුස්වහන්සේ යාච්ඤා කලේ කුමක් නිසාද යන්න එක් එක් අවස්ථාවකදීම සාකච්ඡා කරන අතර, අපගේ යාච්ඤාවලදී උන්වහන්සේගේ ආදර්ශය අපට උපකාරකරන ආකාරය ගැන තීරණයකරන්න.

   මතෙව් 14:23
   ලූක් 9:28–29
   යොහාන් 17
   මතෙව් 26:36–42
   3 නිෆායි 17:14–21, 18:16

2. ඔබගේ යාච්ඤාවන්ට පිළිතුරු ලැබුනු අවස්ථාවන් ගැන ළමුන්ට කියන්න, නැතහොත් යාච්ඤාව ගැන ඔවුන්ගේ විශේෂිත අත්දැකීම් බෙදාගැනීමට ළමුන්ට කියන්න. පහත සඳහන් කථාවද කීමට ඔබට අවශ්‍යවනවා ඇත.

   "එක් විශිෂ්ඨ ධර්මදූත නායකයෙක්. . .පොළඹවන සුළු අත්දැකීමක් කීවේය, බ්‍රසීලයේ පෙට්‍රොපොලිස් නම් ස්ථානයේ ඔහු ජාතික භාෂාව කථාකිරීමට නොදත් අතර දේවගෘහයේ හෝ ධර්මදූතයන්ගේ ලිපිනයවත් නොදැන ඔහු අතරමං විය. ඔහුගේ දූතමෙහෙය සම්පූර්ණකිරීමට ඔහුට උපකාර අවශ්‍ය බවට ස්වාමින්වහන්සේට ආයාචනාකළ බලවත් යාච්ඤාවකින් පසු එහි කොතනක සිටින මිනිසා අනුගමනයකිරීමට කියන හඬක් ඔහුට දෙවතාවක් ඇසුනි. කීකරුකමින් ඔහුට මගපෙන්වූ පරිදි එම මිනිසා අනුගමනයකළ විට, වැඩිපුර කිසිම කරදරයක් නොමැතිව කෙළින්ම දේවගෘහයට මග පෙන්වනු ලැබුවේය" (L. Brent Goates, *Harold B. Lee, Prophet and Seer,* පි. 282).

3. ඔබවහන්සේට, ඔබවහන්සේ, ඔබවහන්සේගේ, ඔබවහන්සේගේම යන විශේෂ වචන භාවිතා කරමින් අප යාච්ඤාකරන විට දෙවියන්වහන්සේට ඇමතිය යුතු බව ළමුන්ට කියන්න. මෙම වචන අපගේ ගෞරවය සහ ප්‍රේමය උන්වහන්සේට පෙන්වයි. මතෙව් 6:9–13 කියවීමට ළමයෙකුට සලස්වා, යාච්ඤාවේ මෙම වචන එකක් හෝ අනෙක් ළමයින්ට ඇසුන විට ඔවුන්ගේ අත් එසවීමට සලස්වන්න. ගීතයේදීද එසේම කරන්න. "මම තුතිපුදමි ඔබට, ආදර පියාණෙනි" (*ළමා ගී පොත,* පි. 7).

4. සමහර වචනවලට හිස්තැන් තබමින්, වැඩිහිටි බොයිඩ් කෝ. පැකර්ගේ පහත සඳහන් ප්‍රකාශයේ සටහනක් සූදානම්කරන්න, නැතිනම් හුණුලෑල්ලේ ලියන්න. බැහැරකළ වචන, වචනතීරුවල හෝ හුණුලෑල්ලේ තීරුවක ලියන්න. වචනතීරුවේ වචන යොදමින් හිස්තැන් පෘරවීමට ළමයින්ට සලස්වන්න.

   "____(ඈ)____ කියවීමෙන් (ආ) වල ඇති සමහර දේවල් ලැබෙනවා ඇත. ____(ඈ)____ වලින් සමහර ඇසෙන දේවල්ය. සමහරවිට වැදගත්වූ අවස්ථාවක කෙලින්ම සමහර දේවල් පැමිණේ. ____(උ)____ පෙළඹවීම් ____(අ)____ නොවැරදෙන සුළුය (Conference Report තුලිනි, ඔක්තෝ. 1979, පි. 30; හෝ *Ensign,* නොවැ. 1979, පි. 20).

   අ. පැහැදිළි
   ආ. පිළිතුරු
   ඇ. කථිකයින්
   ඈ. ශුද්ධ ලියවිලි
   ඉ. බලවත් පෙළඹවීම්

5. යාච්ඤාව ගැන පහත සඳහන් ශුද්ධ ලියවිලි එකක් කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න: මතෙව් 7:7, යාකොබ් 1:5, 3 නිෆායි 18:20, හෝ දහම සහ ගිවිසුම 19:38 පළවෙනි කොටස.

6. "සිතුවාද ඔබ යාච්ඤාකිරීමට" (ගීතිකා අංක 140 හෝ "ළමයෙකුගේ යාච්ඤාව" *ළමා ගී පොත,* පි. 12).

---

**අවසානය**

සාක්ෂිය

ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ පුද්ගලික යාච්ඤා අසා පිළිතුරු දෙන බවට, සාක්ෂිය දරන්න. සෑම උදෑසනකම සහ සෑම රාත්‍රියකම අප යාච්ඤාකිරීමේ වැදගත්කම ගැන සාක්ෂි දරා, ලබන සතියේදී එය කිරීමට ළමයින්ට අභි-යෝග කරන්න.

නිවසේදී කීමට යෝජිත දේ

නිවසෙ-දී මෙම පාඩම තිරීක්ෂනය කිරීමක් වශයෙන්, මතෙව් 6:5–8 අධ්‍යයනය කිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# පර්වතය මත ගොඩනගන ලද නිවස

# 12
වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ශුභාරංචිය ඔහුගේ හෝ ඇයගේ ජීවිතයේ සත්‍යවූ පදනම කරගැනීමට පණත්වලට කීකරුවීමේ ආශාව එක් එක් ලමයා තුළ ශක්තිමත්කිරීමය.

**සූදානම**

1. මතෙව් 7:24–27, ලූක් 6:47–49, සහ දහම සහ ගිවිසුම 111:24 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධවූ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. vii).
2. අමතර කියවීම්: හෙලමන් 5:12 සහ 3 නිෆායි 14: 24–27.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. දහම සහ ගිවිසුම 11:24 දැන්වීමක් සාදන්න. නැතහොත් රටහුණු ලැල්ලේ ලීවීමට සැලසුම්කරන්න.
5. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා
   ආ. 3" X 5" ප්‍රමාණයේ කාඩ්පත් කිහිපයක් සහ වැලි හෝ ලුණු (මනාපය පරිදි)
   ඇ. පින්තූරය 7-12, කන්ද උඩ දේශනාව (ශුභාරංචි මූලධර්ම මෙවලම 212; 62166).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

පසුගිය සතියේ සෑම උදෑසනකම සහ සැන්දෑවකම යාච්ඤාකිරීමට මතක් වුනාද කියා ලමයින්ගෙන් අසන්න. මෙය කළ විට ඔවුන්ට කුමක් හැඟුනේද කියා ඔවුන්ගෙන් අසන්න.

**යොමුකිරීමේ ක්‍රියාකාරකම්**

කුණාටුවකදී භයංකාර අත්දැකීමක් ඔබට ඇතිවූවා නම්, එය විස්තරකරන්න. ඔබ එය ගැන සැලකිලිමත්වූ ආකාරය සහ හැකි පමණින් ආරක්ෂාවීමට ඔබ කළ දේවල් ගැන පහදා දෙන්න. ලමයින් යම්විටකදී කුණාටුවකට භයවූවාදැයි අසමින්, එසේ වූවා නම් ඔවුන්ට හැඟුන දේවල් පංතිය සමග බෙදාගැනීමට කැමති ලමයින්ට ආරාධනාකරන්න.

**යොමුකිරීමේ විකල්ප ක්‍රියාකාරකම්**

3" X 5" ප්‍රමාණයේ එක සමාන කාඩ්පත් එකට අලවන්න. නැතිනම්, ටේප්වලින් ඔතන්න. කුඩා ගෙයකට සමානවන සේ සකස්කර ගන්න. (මේවා අලංකාරවිය යුතු නොවේ. කාඩ් පත් හතරක් එකට ටේප්වලින් බැඳ පෙට්ටියක් සාදාගැනීම මෙම ක්‍රියාකාරකමට ප්‍රමාණවත්වේ.) මෙම එක් සැලැස්මක් මේසය මතද, අනෙක් එක මේසය උඩ වැලි ගොඩක් මතද තැබීමට ලමයෙකුට සලස්වන්න. ඉන්පසු මේසය සොලවන්න. එවිට වැලි උඩ තිබෙන කාඩ්පත් සෙලවී, හෝ බිමට වැටෙනවා හෝ ඇත. වැලි පහසුවෙන් සෙලවෙන බැවින් වැලි මත තැනූ ගෙය කඩා වැටෙන බව ඔවුන්ට කියන්න.

**ශුද්ධවූ ලියවිලි විස්තර**

මතෙව් 7:24–27 සහ ලූක් 6:47–49 සඳහන් වැලි මත සාදනවා වෙනුවට පර්වතය මත ගෙය සාදන අන්දම ගෝලයන්ට යේසුස්වහන්සේ කියන විස්තරය උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 (vii.) අපගේ ජීවිතවල පරීක්ෂා සහ විරුද්ධත්වය හෝ ප්‍රශ්න ජයගැනීම පිණිස යේසුස්වහන්සේගේ ශුභාරංචිය අනුව ජීවත්වීමට අපට උපකාරවන බව පහදාදෙන්න.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ලමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවෙනවා ඇත.

- නුවණ ඇති මනුෂ්‍යයා ගෙය සෑදුවේ කොහේද? (මතෙව් 7:24; ලූක් 6:47–48.) ඔහු නුවණැත්තෙකු යයි ඔබ සිතන්නේ කුමක් නිසාද?

- නුවණ නැති මනුෂ්‍යයා ඔහුගේ ගෙය සෑදුවේ කොහේද? (මතෙව් 7:26; ලූක් 6:49.) ඔහු නුවණ නැත්තෙකු යයි ඔබ සිතන්නේ කුමක් නිසාද? වැලි පදනමක් මත යමෙක් නිවසක් සාදන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? පදනමක් දැමීමට වඩාත් පහසු ස්ථානය කොහේද?—වැලි මතද, නැතහොත් ශක්තිමත් පොළොවෙහිද?

- "යේසුස්වහන්සේ කියන දේ අසා ඒවා කිරීම" යන්නෙහි අදහස කුමක්ද?

- "යේසුස්වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීම් අසා ඒවාට කීකරුවන තැනැත්තා පර්වතය මත තමාගේ ගේ සාදන මිනිසෙකුට සමාන කරන්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද?

- යේසුස්වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීම් අසා ඒවාට කීකරු නොවන තැනැත්තෙකු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදන මිනිසෙකුට සමානකරන්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද?

දහම සහ ගිවිසුම 11:24 ජෝසෆ් ස්මිත් මගින් ඔහුගේ සහෝදරයා වන හයිරම්ට දෙන ලද එළිදරව්වේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කියන ලද දෙය කියවන්න. මෙම ශුද්ධ ලියවිල්ල ලියන ලද කඩදාසිය පෙන්වන්න., නැතිනම් එම පදය රටහුණු ලෑල්ලේ ලියන්න.

- අපගේ ගෙවල්, නැතහොත් වෙනත් වචනයෙන් කියනවා නම්, අපගේ ජීවිත යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියවූ පර්වතය පිට ගොඩනැගිය යුතු වන්නේ කුමක් නිසාද? (හීලමන් 5:12.)

අපගේ සත්‍යයවූ එකම පදනම යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් බව අවබෝධකරගැනීමට ලමයින්ට උපකාරකරන්න. වෙනත් යම්කිසි දෙයක් මත අප අපගේ ජීවිත ගොඩනගන්නේ නම්, එය වැලි මත ගොඩනැගීමට සමානය.

- එය මත ගොඩනගන සමහරුන්ගේ ජීවිත වැලිවලට සමානකරන්නේ කුමක් නිසාද?

මුදල්, කීර්තිය, ප්‍රසිද්ධිය, ක්‍රීඩා, ශාරීරික අලංකාරය යනාදිය ගැන සාකච්ඡා කරන්න. ජීවිතයේ ප්‍රධාන ඉලක්ක මෙන් තිබෙන මේවා වැලි සහිත පදනම් බව පහදා දෙන්න.

- මුදල් උපයාගැනීම, ක්‍රීඩා හා ව්‍යායාමකිරීම, මිතුරන් ඇතිකරගැනීම හා ඔවුන්ට ප්‍රියමනාප දේවල් කිරීම අපගේ ජීවිත තුළ වැදගත් වන්නේද? ඒ කුමක් නිසාද?

ආහාර, ඇඳුම් ආදිය ගැනීමට මුදල් අපට අවශ්‍ය බව පහදාදෙන්න. මිතුරන් සහ වැඩකටයුතුද අපගේ ජීවිතවලදී වැදගත්වේ. නමුත් ගැලවුම්කරුවාණන් අනුගමනයකිරීම සහ සුභාරංචිය අනුව ජීවත්වීමට වඩා වැඩියෙන් මෙම දේවල් වැදගත්වන්නේ නම්, සදාකාල ජීවිතයේ ආශිර්වාද අපට අහිමිවෙනවා ඇත.

- ස්වර්ගික පියාණන්වහන්සේ අප පොළොවට එව්වේ කුමක් සඳහාද?

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් මත අපගේ ජීවිත ගොඩනැගීමේ යම් විශේෂිත ක්‍රම මොනවාද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවද, පාඩමේ පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගේ සත්‍යවූ පදනමවේ. කඩදාසි කෑල්ලක හරහට උඩින් ලියා, එක් එක් ලමයෙකුට දෙන්න. එම වාක්‍ය අවසානකිරීමට ඔවුන්ට සිතාගැනීමට හැකි බොහෝ දේවල් ලිවීමට ලමයින්ට කියන්න. ඉන්පසු ඔවුන්ගේ පිළිතුරු ඔබට කීමට ඔවුන්ට කියන්න. පහත සඳහන් කරුණු ගැන ඔවුන් සිතුවේ නැතිනම්, ඔබ ඒවා සඳහන්කිරීමට වගබලාගන්න.

උන්වහන්සේ මට ප්‍රේමකරනසේක.
සුදුසු ලෙස ජීවත්වීමට උන්වහන්සේ මට ඉගැන්වූසේක.
උන්වහන්සේ මා වෙනුවෙන් ආදර්ශයක් තැබූසේක.
උන්වහන්සේ මා වෙනුවෙන් ජීවිතය දුන්සේක.
මගේ පාපවලට උන්වහන්සේ වධ වින්දසේක.
උන්වහන්සේ නිසා මම නැවත මලවුන්ගෙන් නැගිටින්නෙමි.
ස්වර්ගික පියාණන් වෙත නැවත යෑමට උන්වහන්සේ මට සැලැස්වූසේක.

2. එක් එක් ළමයා ලවා මේ වාක්‍යය සම්පූර්ණ කරන්න, "ගැලවුම්කරුවාණන් මත මා මගේ ජීවිතය ගොඩනගන්නේ______________." පිළිතුරුවලට කිව හැකි දේවල්, පවුල් නිවාස සැන්දෑවට සහභාගිවීම, නිවසේ වැඩකටයුතුවලට උපකාරවීම, දසයෙන් කොටස ගෙවීම, යාච්ඤාකිරීම, ප්‍රඥාවේ වචනයට කීකරුවීම, සත්‍යය පැවසීම, අන් අයට කරුණාවන්තවීම, ශුද්ධ ලියවිලි කියවීම, සදාචාර සම්පන්නවීම. අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට හැම ළමයාටම වාරයක් දෙන්න. කල්පනාකර පණත් නම් කිරීම සඳහා ඔවුන්ට වුවමනා තරම් කාලයක් ලබාදෙන්න. සදාකාල ජීවනය ලබාගැනීමේ එකම මග සුභාරංචි නීතිවලට කීකරුවීම බව පෙන්වාදෙන්න. එක් එක් ළමයා, ඔහු හෝ ඇය කරන බව කී දේවල් වෙන වෙනම කඩදාසි කෑලිවල ලියා, එම කඩදාසි ගල්කැටයක බැඳ, එක් එක් ළමයාට නිවසට ගෙනයාමට දීමට ඔබට අවශ්‍යවනවා ඇත.

3. කීකරුකම ගැන යේසුස්වහන්සේ කී දෙය ගැන බැලීමට පහත සඳහන් ශුද්ධ ලියවිලි බලන ලෙස ළමයින්ට කියන්න. අපගේ ජීවිත ස්ථිර පදනමක් මත ගොඩනැගීමට හැකිවන්නේ, යේසුස්වහන්සේගේ පණත්වලට කීකරුවීමෙන් පමණක් බව ළමයින්ට මතක්කරන්න.

   මතෙව් 7:21 (පාදසටහන් ඊ බලන්න)
   ලූක් 11:28
   යොහාන් 15:10

4. තුන්වෙනි ඇදහිල්ලේ කරුණ ළමයින් සමග නැවත බලන්න.

5. දහම සහ ගිවිසුම 11:24 සටහනෙන් හෝ හුණුලෑල්ලෙන් කියවා කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න.

---

## අවසානය

**සාක්ෂිය**

ගැලවුම්කරුවාණන්ට ඔබගේ ප්‍රේමය ප්‍රකාශකරමින් උන්වහන්සේ අපට දී තිබෙන සෑම පණතකින්ම ප්‍රීතිය ලබාගැනීමට අපට උපකාරවන අතර, අකීකරුකම දුකට මගපෙන්වන බවට සාක්ෂි දරන්න. සුභාරංචිය අනුව ජීවත්වීම ඔබට ආශිර්වාදයක් වීම ගැන ඔබ ලැබූ අත්දැකීමක් බෙදාගැනීමට ඔබට වුවමනාවිය හැකිය.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

මෙම පාඩම තිරීක්ෂනයක් වශයෙන් නිවසේදී මතෙව් 7:24–27 අධ්‍යයනයකිරීමට ළමුන්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 13
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රෝගීන් සුවකරනසේක

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රෝගීන් සුවකරන විට, කළාක් මෙන් අන්‍යයන්ට ප්‍රේමය සහ අනුකම්පාව පෙන්වීමේ ආශාව ඇතිකරගැනීමට එක් එක් ළමයාට උපකාරකිරීමය

**සූදානම්වීම**

1. මතෙව් 8:5–10, 13; 25:34–40; මාර්ක් 1:40–45; ලූක් 4:38–40; 7:11–17; සහ යොහාන් 4:46–54; 13:34–35 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 (vi), සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 (vii).
2. ළමයින් සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකාච්ඡා ප්‍රශ්න සහ සාරවත් ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ: බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

යොමුකිරීමේ ක්‍රියාකාරකම්

සභාවේ හත්වෙනි සභාපතිවරයා බවට පත්වූ, හීබර ජේ. ග්‍රාන්ට් පිළිබඳ පහත සඳහන් කථාව කියන්න.

හීබර් ඔහුගේ සියුම් කබාය තමා වටා ඔතාගෙන සීතලේ වෙව්ලමින් සිටියේය. ඔහුගේ උපන් දිනය ඉතාම ළඟය. ඔහුට අවශ්‍යවූ එකක් දෙය උණුසුම් කබායකි. නමුත් කබායක් මිළදී ගැනීමට නොහැකි තරම් ඔවුහු දුප්පත්වූහ. ඇතැම් විට ඔවුන් වේලාසනින්, නින්දට ගියේ නිවස උණුසුම්කිරීමට අවශ්‍ය ඉන්ධන නැති නිසාය. එසේම සමහරවිට, ප්‍රමාණවත් ආහාර නොමැති කමින් ඔහු කුසගින්නේ සිටියේය. මුදල් උපයාගැනීම පිණිස හීබර්ගේ මව, බොහෝ රෑ වන තෙක් අන්‍යයන්ට ඇඳුම් මැසුවාය.

ඉතිරිවූ රෙදිවලන් සෑදූ ලස්සන කබායක් හීබර්ග් උපන්දිනයේදී ඔහුගේ මව ඔහුට දුන්නාය. එලිමහනට ගොස් එහි උණුසුම ලබන තුරු හීබර්ට ඉවසිල්ලක් නැතිවිය.

සති කිහිපයකට පසු, ඔහුගේ තරමේ ළමයෙක් හඬමින් සිටිනවා හීබර් දුටුවේය. ඔහු ඝන කමිසයක් පමණක් හැඳ සිටි බැවින්, ඔහුට කොපමණ සීතල ඇතිදැයි හීබර් දැනසිටියේය. පිරිමි ළමයා හීබර්ගේ කබාය දෙස ඉතා ඕනෑකමින් බැලුවේය. හීබර් නැවතී,කිසිවක් නොසිතා, කබාය ගලවා එම පිරිමි ළමයාට දුන්නේය.

එම සැන්දෑවේ හීබර් ඔහුගේ පරණ කබාය ඇඳ සිටිනවා ඔහුගේ මව දුටුවාය. ඇය මෙසේ ඇසුවාය. "ඔබගේ අළුත් කබායට කුමක් කළේද?" ඇයට කෙසේ කියන්නදැයි හීබර් කල්පනා කළේය. අනතුරුව ඔහු මෙසේ කීවේය, "මටත් වඩා එය අවශ්‍යව තිබූ මා දුටු පිරිමි ළමයෙකුට මම එය දුන්නෙමි."

"ඔබගේ පරණ එක ඔහුට දෙන්ට නොතිබුනේද?" යයි ඇය ඇසුවාය.

ඇය තේරුම්ගනු ඇතැයි සිතා, තම මව දෙස බැලූ හීබර්ට ඇයගේ දෙනෙත් කඳුලින් පිරී තිබුන බව පෙනින. ඇයගෙ ප්‍රශ්නයට ඇයම පිළිතුරුදෙන විට, ඔහු තම දෙඅත් ඇයගේ කරවටා යැවුවේය. "ඇත්තෙන්ම එසේ කිරීමට ඔබට නොහැකිය හීබර්" යයි ඇය කීවාය. (උපුටා ගැනීම "The Coat," නැවත කීම, Lucile C. Reading, *Children's Friend,* නොවැ. 1966, පි. 5.)

සීතල නිසා හඬන පිරිමි ළමයා දුටු හීබර්ට ඇතිවූ හැඟීම ගැන සිතා බැලීමට ළමයින්ට කියන්න. පිරිමි ළමයා කෙරෙහි ප්‍රේමය සහ අනුකම්පාව හීබර්ට ඇතිවූ බව පහදාදෙන්න. සභාපති ග්‍රාන්ට් කළාක් මෙන් අප අන්න්‍යයන්ට ප්‍රේමකිරීම යේසුස්වහන්සේට අවශ්‍යවන්නේය. රෝගීන්ව සුවකිරීම මගින් යේසුස්වහන්සේ ප්‍රේමය සහ අනුකම්පාව පෙන්වා ආදර්ශයක් තැබූ අන්දම මෙම පාඩමෙන් පෙන්වන බව පහදාදෙන්න.

**යොමුකිරීමේ විකල්ප ක්‍රියාකාරකම්**

යොහාන් 13:34 හැම වචනයක්ම කඩදාසි කැලිවල වෙන වෙනම ලියන්න. ඒවා විසුරුවා හැර සුදුසු පිළිවෙලට සකස්කිරීමට ළමයින්ට කියන්න. ඔවුන්ට උපකාර අවශ්‍ය නම්, ඔවුන්ගේ ශුද්ධ ලියවිලි පාවිච්චිකිරීමට සලස්වන්න.

**ශුද්ධ ලියවිලි විස්තර**

යේසුස්වහන්සේගේ ආශ්වර්‍යමත් සුවකිරීම්වල පහත සඳහන් විස්තරය උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම” පි. 00 vii.) රෝගීන් උදෙසා මහත් ප්‍රේමයක් සහ අනුකම්පාවක් යේසුස්වහන්සේට තිබුන බව අවබෝධකරගැනීමට ළමයින්ට උපකාරකරන්න.

1. ශතාධිපතියාගේ දාසයා සුවකිරීම (මතෙව් 8:5–10, 13). ශතාධිපතියා රෝම හමුදාවේ නිලධාරියෙක්වූ අතර, ඔහු බොහෝ භටයන්ට අණ දුන්නේය. යේසුස්වහන්සේ ගැන ඇසූ ඔහු, උන්වහන්සේ කෙරෙහි අදහාගත්තේය.
2. කුෂ්ඨ රෝගියෙකු සුවකිරීම (මාර්ක් 1:40–45). කුෂ්ඨ රෝගීන් භයානක සමේ රෝගයකින් පෙළෙන බව පහදාදෙන්න. කුෂ්ඨ රෝගය හදිසි බෝවෙන බැවින්, එම අසනීපය තිබෙන අයට නගරයේ එම රෝගය නොමැති අය සමග ජීවත්වීමට ඉඩනොදෙන ලදී.
3. පේතෘස්ගේ නැන්දම්මා සහ තවත් බොහෝ දෙනෙකු සුවකිරීම (ලූක් 4:38–40).
4. කනවැන්දඹුවගේ පුත්‍රයා මරණයෙන් නැගිටුවීම (ලූක් 7:11–17).
5. ඇමතියෙකුගේ පුත්‍රයා සුවකිරීම (යොහාන් 4:46–54).

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමටද ඔවුන්ට උපකාරවනවා ඇත.

- මෙම හාස්කම් යේසුස්වහන්සේ ඉටුකළේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? (මාර්ක් 1:41; ලූක් 7:13; යොහාන් 9:1–3.)
- මෙයට සම්බන්ධ ජනතාවගේ ජීවිතවලට මෙම සුවකිරීම ආශිර්වාදිතවූයේ කෙසේද? (ලූක් 7:2, 12; යොහාන් 4:52–53.)
- මෙම විස්තරවල සඳහන් ගැලවුම්කරුවාණන්ගේ ආදර්ශ අප අනුගමනය කරන්ට යනවා නම්, අපගේ ජීවිතවල කුමන ගුණාංග වැඩිදියුණුකිරීම අපට අවශ්‍යද? (යොහාන් 13:34–35. මෙම පදවලට යටින් ඉරිගැසීම ළමයින්ට කාලය දීමට ඔබට අවශ්‍යවිය හැකිය.) අවශ්‍යතාවයන් ඇති ජනයාට ප්‍රේමය, අනුකම්පාව සහ සැලකිල්ල පෙන්වීමට අපට හැකිවන්නේ කෙසේද? යමෙකු ඔවුන්ට උපකාරකළ විට, ඔවුන්ට හැඟෙන අන්දම ගැන අත්දැකීම් බෙදාගැනීමට ළමයින්ට ආරාධනාකරන්න.
- යේසුවහන්සේ සුව කළ සියලුම පුද්ගලයන් උන්වහන්සේ දැනසිටි සේක්ද? (මතෙව් 8:5–8.) අවශ්‍යතාවයක් ඇති යමෙකු අප දුටු විට, අප උපකාරකළ යුතු කවරෙකුටද කියා මෙය අපට කියන්නේ කුමක්ද?
- යේසුස්වහන්සේ කුෂ්ඨ රෝගියාව සුවකළ පසු, කුමක් කිරීමට යේසුස්වහන්සේ ඔහුට කීසේක්ද? (මාර්ක් 1:43–44.) අන් අයට අප උපකාර කළ යුතු අන්දම ගැන මෙය අපට කියන්නේ කුමක්ද?
- අවශ්‍යතාවයන් ඇති අන්‍යයන්ට අප උපකාරකිරීම මගින් ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ වෙතට අප වඩාත් සමීපවන්නේ කෙසේද?

---

## සාරවත්කිරමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ වැඩියෙන් පාඩමේ ඕනෑම අවස්ථාවක, හෝ නැවත බැලීමක්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට ඔබට හැකිය.

1. 1 යොහාන් 3:18 කියවීමට ළමයෙකුට සලස්වන්න. අපගේ ක්‍රියාවලින් අපගේ ප්‍රේමය පෙන්විය යුතු අතර, අප පුද්ගලයන්ට ප්‍රේමකරනවා යයි කීම පමණක් ප්‍රමාණවත් නොවන බව මෙම පදයෙන් අපට කියන බව පහදාදෙන්න. අපගේ ප්‍රේමය අපට පෙන්වීමට හැකිවන්නේ යමෙකුට අප යමක් කිරීමෙන්ය. ඔවුන්ගේ පවුල්වලට හෝ මිතුරන්ට ප්‍රේමය දැක්වීමටහැකි ක්‍රම රඟදැක්වීමට ළමයින්ට සලස්වන්න.
2. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ උපුටාගැනීම කියවීමට ළමයෙකුට සලස්වන්න: “දෙවියන්වහන්සේ අප ගැන සැලකිලිමත්වන අතර, අප කෙරෙහි පරීක්ෂාවෙන් බලාසිටිනසේක. නමුත් සාමාන්‍යයෙන් අපගේ

අවශ්‍යතාවයන් සපුරාලන්නේ වෙනත් පුද්ගලයෙකුගේ මාර්ගයෙන්ය." ("Small Acts of Service," *Ensign,* දෙසැ. 1974, පි. 5). වෙනත් පුද්ගලයෙකුගේ මාර්ගයෙන් ලමයෙකුගේ අවශ්‍යතාවයන් ස්වර්ගික පියාණන්වහන්සේ ඉටුකළ අවස්ථාවන් ගැන කීමට එක් එක් ලමයාට කියන්න. යමෙකුගේ අවස්ථාවකදී උපකාර කළ ඔබ දන්නා පුද්ගලයෙකු ගැන ලමයින්ට කීමට ඔබටද හැකිවෙනවා ඇත. මෙම පුද්ගලයා ප්‍රේමය, අනුකම්පාව, සහ අන්‍යයන්ට සැලකිල්ල වර්ධනය කිරීමෙන් සේවයකිරීමේ ක්‍රියා තුළින් ප්‍රේමය දක්වන බව අවධාරනය කරන්න.

3. අන්‍යයන්ට සේවයකිරීම ගැන පහත සඳහන් ශුද්ධ ලියවිලි කියවීමට ලමයින්ට සලස්වන්න: මතෙව් 25: 34–40 සහ මොසායා 2:17–18, 4:14–15. අන්‍යයන්ට අප කළ යුතු මෙම ශුද්ධ ලියවිලිවලින් කියන දේවල් ගැන ලැයිස්තුවක් එක්ව සාදන්න. ලබන සතියේදී ඉටුකිරීමට සේවයකිරීමේ ක්‍රියාවක් තෝරාගැනීමට ලමයින්ට සලස්වන්න.

4. පංතිය කුඩා කණ්ඩායම්වලට බෙදා, එක් එක් කණ්ඩායමට පහත සඳහන් එකක් හෝ එයට වඩා දෙන්න. ඔබට ඔබගේම අවස්ථාවන් ඉදිරිපත් කිරීමට හැකිය. ප්‍රේමය හා අනුකම්පාව පෙන්වමින් මෙම ජනතාවට සේවයකළ හැකි මාර්ග රඟදැක්වීමට ලමයින්ට සලස්වන්න.

   කිසිවෙක් නාඳුනන අළුත් ලමයෙක් ප්‍රාථමිකයට එයි.
   ඔබගේ ප්‍රාථමික පංතියේ ලමයෙක් අසනීප වෙයි.
   ඔබගේ මිතුරා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙක් නොවේ.
   ඔබගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ යමෙක් හුදකලාවේ.
   ඔබගේ දෙමාපියෝ කාර්‍ය බහුල නිසා ඔබගේ කුඩා සහෝදරයා හෝ සහෝදරිය බලාගැනීමට උපකාරවීමට ඔබට කියති.
   ඔබගේ මිතුරෙකුට යමෙක් අකරුණාවන්ත වචන කියයි.

---

## අවසානය

**සාක්ෂිය**

ගැලවුම්කරුවාණන්ගේ ජීවිතයට සහ ආදර්ශයට ඔබගේ කෘතඥතාවය පළකරන්න. අප අවට සිටින අයට අප ප්‍රේමය සහ අනුකම්පාව පෙන්වන විට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අප අනුගමනය කරන බවට සාක්ෂිදරන්න. මෙම සතිය තුළදී ඔබගේ පවුලේ අයට සහ අන්‍යයන්ට වඩාත් ප්‍රේමය පෙන්වීමේ සේවයේ සුළු ක්‍රියා කිරීමට ලමයින්ට යෝජනා කරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් ලෙස මාර්ක් 1:40–45 සහ ලූක් 7:11–17 අධ්‍යයනයකිරීමට ලමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ සබත් දිනය

14
වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සහ ස්වර්ගික පියාණන්ට සබත් දිනයේදී ගෞරවකිරීමට සහ සිහිකිරීම පිණිස එක් එක් ළමයෙකුට කිරීමට අවශ්‍ය දේවල් ගැන උපකාරකිරීම පිණිසය.

**සූදානම්වීම**

1. උත්පත්ති 2:1–3, නික්මයාම 20:8–11, සහ ඉගැන්වීම සහ ගිවිසුම 59:9–14 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර ළමයින්ට ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම තීරණයකරන්න ("බලන්න ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00vii).
2. අමතර කියවීම්: මාර්ක් 2:23–28, 3:1–6, සහ ලූක් 6:1–11.
3. ළමයින්ව සහභාගිකරවාගැනීමට හැකි සහ පාඩම් අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ: බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී අන්‍යයන්ට ප්‍රේමය දක්වමින් සේවයකළ අන්දම පංතියට කීමට ළමයින්ට ආරාධනා කරන්න. ඔවුන්ගේ අත්දැකීම් ගැන කථාකිරීමට ඔවුන්ට සලස්වන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පහත සඳහන් ප්‍රහේලිකාවලට උත්තරය ඔවුන් දන්නා බව සිතුන විට, තම අත් එසවීමට ළමයින්ට කියන්න.

එය කිහිප අවස්ථාවක්ම ශුද්ධ ලියවිලිවල සඳහන්කර ඇත.
එය ඉතාම වැදගත්බව ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ කියනසේක.
එය ශුද්ධය.
ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට ඔවුන් ප්‍රේමය දක්වන බව එය ශුද්ධව තබන පුද්ගලයෝ පෙන්වාදෙති.
එය හතෙන් එකකි.
එය අනෙක් හයට වඩා වෙනස්ය.
ඒදින අපි ස්වර්ගික පියාණන්වහන්සේට නමස්කාර කරන අතර, අපගේ වැඩකටයුතු වලින් විවේක ගන්නෙමු.
එය සතියේ දිනයකි.

පිළිතුර: සබත් දිනය

**ශුද්ධ ලියවිලි විස්තරය**

"සූදානම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන යේසුස්වහන්සේ සබත් දිනයේ සුවකිරීම ගැන විස්තරය උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම" පි. 00vii).

ඔබ මෙම විස්තර උගන්වන විට, යේසුස්වහන්සේගේ කාලයේ අණ කළ පරිදි යුදෙව්වරු ජීවත් නොවූ බව තේරුම්-ගැනීමට ළමයින්ට උපකාර කරන්න. තද නීති ඔවුන් සාදාගත් බැවින් ස්වර්ගික පියාණන්ට නමස්කාර කිරීමට ඒවා ඔවුන්ට උපකාරවූනේ නැත. උදාහරණයක් වශයෙන් ගැටයක් එක අතකින් ලිහීමට හැකි නම් එය ගැටගැසීම සබත් දින නීත්‍යානුකූල නමුත්, එය ලිහීමට අත් දෙකම අවශ්‍ය නම්, එය නීත්‍යානුකූල නොවේ. "සබත් දිනයේ ගිනි ඇවිළීම හෝ නිවීම [නීත්‍යානුකූල නොවේ]. කැඩුණු කකුලක් සකස්කිරීම, හෝ විසන්ධිවූ සන්ධියක් නැවත සකස්-කිරීම…තහනම්ය විය.…සබත් දිනයේ තටබුන් අතර වැළලුන අයෙකු ජීවත්වන්නේ නම්, හාරා ගොඩගැනීමට හැකිය, නමුත් ඔහු මියගොස් නම්, සබත් දිනය නිමවන තෙක් තිබූ තැනම ඔහුව තැබිය යුතුවේ" (James E. Talmage, *Jesus the Christ,* පි. 215–16).

මෙම නීති වැරදි බව යේසුස්වහන්සේ යුදෙව්වරුන්ට ඉගැන්වූසේක. පුද්ගලයන්ට උපකාරකිරීම වැනි යහපත් සුදුසු දේවල් කරමින් උන්වහන්සේට උන්වහන්සේගේ පියාණන්වහන්සේට සබත් දිනයේ ගෞරවකිරීමට උන්වහන්සේගේ ආදර්ශය මගින් එතුමා පෙන්වා දුන්සේක.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනයකරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- සබත් දිනයේදී කිරීමට අපට අණ කර ඇත්තේ කුමක්ද? (නික්මයාම 20:8–11). මෙය කිරීමට අපට අණ කර ඇත්තේ කුමක් නිසාද? (උත්පත්ති 2:1–3).
- ආබාධිත මිනිසා (නික්මයාම යොහාන් 5:6, 8); වියලුනු අතක් ඇති මිනිසෙකු (මතෙව් 12:13); කුදු ස්ත්‍රිය (ලූක් 13:13); දිය උදර රෝගියා (ලූක් 14:4 දිය උදර යනු ඇඟ ඉදිමීමෙන් වැළඳෙන රෝගයක් බව පහදා දෙන්න) සුවකිරීමට සබත් දිනයේදී යේසුස්වහන්සේ කළේ කුමක්ද? මෙවැනි ක්‍රියාවන් කිරීම වර්තමානයේදී සබත් දිනවල පිළිගත හැකි බව සලකන්නේද? ඒ මන්ද?
- ගෝලයන් සබත් දිනයේ ඉරිඟු කරල් කැඩුවේ කුමක් නිසාද? (මතෙව් 12:1.) එක් එක් දිනයේදී, සබත් දින පවා කිරීමට අවශ්‍ය දේවල් මොනවාද?
- යේසුස්වහන්සේ සබත් දිනය පිළිපැද්දේ කෙසේද? යුදෙව්වරු එය පිළිපැද්දේ කෙසේද? (ජනතාවට උපකාර කරමින්, එමගින් ස්වර්ගික පියාණන්ට ගරු බුහුමන් දැක්වීමට, යේසුස්වහන්සේ සබත් දිනය පාවිච්චිකළ බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න.)
- යුදෙව් නායකයන් යේසුස්වහන්සේ සමග අමනාපවූ කාරණා දෙක කුමක්ද? (යොහාන් 5:18.)
- ලෝකය පටන්ගැන්මේ සිට සබත් දිනය සම්බන්ධව නීති සම්පාදනය කළේ කවරෙක්ද? (මතෙව් 12:8; උත්පත්ති 2:1–3. ස්වර්ගික පියාණන්වහන්සේගේ මගපෙන්වීම යටතේ යේසුස්වහන්සේ ලො-කය මැවූ බව ළමයින්ට මතක් කරන්න.) උන්වහන්සේ පනවන ලද නීති යුදෙව්වරුන් වෙනස් කළ විට, යේසුස්වහන්සේට කුමක් හැඟුනේදැයි ඔබ සිතන්නේද?
- බෙතෙස්දාවේ පොකුණ ලඟ සිටි ආබාධිත මිනිසා, කුදු ස්ත්‍රිය, වියලුනු අතක් ඇති මිනිසා දිය උදරයෙන් පෙළුන මිනිසා යන අය සුවවූ පසු ඔවුන්ට කුමක් හැඟුනේදැයි ඔබ සිතන්නේද? (ලූක් 13:13.) සබත් දිනයේදී මෙම දේවල් කරමින් යේසුස්වහන්සේ උන්වහන්සේගේ පියාණන්ට ගෞරව දැක්වූයේ කෙසේද?
- සබත් දිනයේ යහපත්කම් කරන්ට සුදුසු යයි, යේසුස්වහන්සේ පැවසූ විට එහි අදහස කුමක්දැයි ඔබ සිතන්නේද? (මතෙව් 12:12.) සබත් දිනයේදී කළ යුතු යහපත් දේ මොනවාද කියා ඔබ දන්නේ කෙසේද? (නික්මයාම 20:8–11; ඕසහසී 59:9–14).)
- සබත් දිනයේ අප නොකළ යුතු දේවල් මොනවාද? පළවෙනි සභාපතිත්වයේ ප්‍රකාශය සාකච්ඡාකරන්න: "සාප්පු යාමෙන් සහ වෙනත් වෙළඳ කටයුතුවලින්ද, ක්‍රීඩා කියාකාරකම් වලින්ද අපි වැළකී සිටිය යුතුවෙමු" (*Ensign*, ජන. 1993, පි. 80).

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ උපුටාගැනීම සාකාච්ඡාකරන්න: "සබත්දිනය පැවැත්වීම අපගේ ස්වර්ගික පියාණන්වහන්සේට අපගේ ප්‍රේමය දැක්වීමේ මිණුම් දණ්ඩකි" (*The Teachings of Spencer W. Kimball*, පි. 218). සභාවට යෑම, ශුද්ධ ලියවිලි කියවීම, තම දිනපොත්වල ලිවීම, නෑදෑයන් සහ රෝගීන් බැහැදැකීම, උසස් සංගීත-යෙන් විනෝදවීම, නමස්කාරකිරීම, අන්‍යයන්ට සේවයකිරීම, පවුල ප්‍රධානකරගත් විවේකශීලී ක්‍රියාකාරකම්වලට සහභාගිවීම යනාදී සුදුසු ක්‍රම තුළින් සබත් දිනයේදී ස්වර්ගික පියානන්වහන්සේට තම ප්‍රේමය දැක්වීමට හැකි බව සාකච්ඡාකිරීමට ළමයින්ට සලස්වන්න. ප්‍රශ්නාර්ථ ක්‍රියාකාරකමක් සඳහන් කළ හොත්, ස්වර්ගික පියාණන්වහන්-සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඔවුන්ගේ ප්‍රේමය සහ ගෞරවය දැක්වීමට එය යහපත් ක්‍රියාකාරකමක්ද, නැත-හොත් වෙනත් දිනයක එය කිරීමට වඩා හොඳ දෙයක්ද යන්න තීරණයකිරීමට ළමයින්ට කියන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ උයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය

1. දහම සහ ගිවිසුම 59:9–23 කියවීමට ළමයින්ට සලස්වා, සබත් දිනයේ ස්වාමීන්වහන්සේ අපට අණ කර තිබෙන සමහර ක්‍රියාකාරකම්ද, එම පණත් තැබීමෙන් උන්වහන්සේ පොරොන්දුවී තිබෙන ආශිර්වාදද ලැයිස්තුගත කිරීමට ඔවුන්ට සලස්වන්න.
2. සබත් දිනයේදී මිනිසුන් කරන සමහර ක්‍රියාකාරකම් නම්කිරීමට ළමයින්ට සලස්වන්න. පහත සඳහන් ප්‍රශ්න අසමින් මෙම ක්‍රියාකාරකම් සබත් දිනයේ කිරීමට සුදුසුද යන්න තීරණයකරන්න:

   ස්වර්ගික පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ගෞරව කිරීමට එය මට උපකාරවන්නේද?<br>සබත් දිනය උදෙසා ස්වර්ගික පියාණන්වහන්සේ අපට දී තිබෙන පණත්වලට ඒවා අනුකූලද?<br>එය කලබලකාරී නොවන්නේද?<br>එය යමෙකුට සේවයක් වන්නේද?

   සබත් දිනය ශුද්ධව තබාගැනීමට සැලසුම්කිරීමට ළමයින්ට අභියෝගකරන්න.
3. පළවෙනි සභාපතිත්වයේ ප්‍රකාශය සාකච්ඡාකරන්න: "මෙම ශුද්ධවූ දිනය ලෞකික ක්‍රියාකාරකම්වලින් වෙන් කොට තබා නමස්කාර කිරීමේ ආත්මය තුළට ඇතුල්වී, ස්තුති දීමේද, සේවයේද, සබත් දියට සුදුසු පවුල් පදනම් ක්‍රියාකාරකම්වලට කැපවීම පිණිස සියලුම පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් අපි තරයේම ඉල්ලා සිටිමු. ස්වාමීන්වහන්සේගේ ආත්මයේ අදහසට අනුකූලව සභා සාමාජිකයන් සබත් ක්‍රියාකාරකම් පැවැත්වීමට උත්සාහදරන විට, ඔවුන්ගේ ජීවිත ප්‍රීතියෙන් හා සාමයෙන් පිරී පවතිනවා ඇත" (*Ensign,* ජන. 1993, පි. 80).
4. සබත් දිය මම ශුද්ධව තබමි, යන්න කඩදාසි කැල්ලක ලියා, පාට පැන්සල් හෝ ලකුණුකිරීමේ පැන්සල් වලින් අලංකාර කිරීමට ළමයින්ට සලස්වන්න.

## අවසානය

**සාක්ෂිය**

යහපත් සුදුසු දේවල් කරමින් සබත් දිනය ශුද්ධව තබාගැනීමෙන්ද එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔබට ලැබුණු ආශිර්වා-දය අගය කරමින් ඔබගේ සාක්ෂිය දරන්න. ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ගෞරව වන ආකාරයේ කටයුතු කිරීමට ළමයින් දිරිගන්වන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් යොහාන් 5:2–16 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 15
වෙනි පාඩම

# අන් අයට ආශිර්වාද කිරීමට යේසුස් ක්‍රිස්තුස්වයහන්සේ තම පූජකවර බලය පාවිච්චි කළසේක

**අරමුණ**

පූජකවරයේ බලය වඩා හොඳට අවබෝධකර ගැනීමට එක් එක් ලමයෙකුට උපකාරවීමය.

**සූදානම්වීම**

1. මාර්ක් 4:35–41, 6:33–44, ලූක් 9:37–43, මතෙව් 14:23–33, ක්‍රියා 10:38, සහ දහම සහ ගිවිසුම 13, 27:12, 124:123 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii බලන්න.)
2. අමතර කියවීම්: මතෙව් 8:23–27; යොහාන් 6:1–14, 16–21; සුභාරංචි මූලධර්ම පරිච්ඡේදය 13.
3. ලමයින්ව සහභාගිකිරීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ලමයෙකු සඳහා.
   ආ. 7-15 පින්තූර, කුණාටුව සංසිඳුවීම (ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 214; 62139); 7-16, පන්දහසකට කන්ට දීම (62143); සහ 7-17 යේසුස්වහන්සේ මුහුද පිට පයින් යෑම.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

කාමරයේ ආලෝකය නවත්වන්න. නැතහොත් විදුලි පන්දමක් දල්වන්න. ආලෝකය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කුමක්දැයි අසන්න. (බලය.) ක්‍රියාකිරීමට බලය අවශ්‍ය යම් යම් දේවල් කීමට ලමයින්ට සලස්වන්න. වෙනත් බලය ඇති දේවල් මොනවාද? සියලුම බලයටත් වඩා විශාල, ස්වභාව ධර්මයටත් වඩා ප්‍රබල බලයක් ගැන ඔවුන් අද ඉගෙනගන්ට යන බව ලමයින්ට කියන්න. එය දෙවියන්වහන්සේගේ බලය වේ. එයට අප පූජකවරය යයි කියනු ලැබේ.

විකල්ප ක්‍රියාකාරීත්වයට යොමුවීම

කාන්දමක් සහ යකඩ කැලි ටිකක් ලමයින්ට පෙන්වන්න. මේසය හරහා යකඩ කැලි ඇදගැනීම පිණිස කාන්දම භාවිතාකිරීමට ලමයින්ට ඉඩදෙන්න. කාන්දමක් නැතිනම් බැලුමක් පුරවා රෙදි මත අතුල්ලා බිත්තියට හෝ ලමයෙකුට ඇලී සිටීමට සලස්වන්න. තවද ඔහුගේ හෝ ඇයගේ හිසකෙස් තුළින් පනාවක් කිහිප වතාවක් ලමයෙකු ලවා යවා, පසුව එමගින් කුඩා කඩදාසි කැලි ඇහිඳ ගැනීම පිණිසද එය භාවිතාකළ හැකිය.

- කාන්දම යකඩ ඇදගැනීමත් බැලුම බිත්තියට හෝ රෙද්දට ඇලී සිටීමත්, නැතහොත් පනාවට කඩදාසි කැලි ඇහිඳගැනීමටත් හේතුවූයේ කුමක්ද? (කාන්දමට යකඩ කැලි ඇදගැනීමට බලයක් ඇත. බැලුම බිත්තියට හෝ රෙද්දට ඇලී සිටීමත්, පනාවට කඩදාසි කැලි ඇහිඳගැනීමටත් කුමවත් බලයක් විදුලියට ඇත.)
- ඔබට සිතීමට හැකි වෙනත් බලයන් මොනවාද? (විදුලි කෙටීම, විදුලි බලය, සුළඟ යනාදියයි.)

බලයක් ගැන ලමයින් ඉගෙනගැනීමට යන බව ඔවුන්ට පහදාදෙන්න. එය සියල්ලටම වඩා විශාල බලයකි. එය පූජකවරය වන දෙවියන්වහන්සේගේ බලයවේ.

ශුද්ධ ලියවිලි විස්තර, සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

සුදුසු අවස්ථාවලදී පින්තූර භාවිතාකරමින් යේසුස්වහන්සේ උන්වහන්සේගේ බලය භාවිතාකරන විස්තර උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)

1. කුණාටුව සංසිඳවීම (මාර්ක් 4:35–41)

- කුණාටුවේදී යේසුස්වහන්සේගේ ගෝලයන්ට කුමක් හැඟුනේද? (මාර්ක් 4:38.) යේසුස්වහන්සේ ඔවුන් ගැන නොසලකන්නේ කුමක් හෙයින්ද කියා ඔවුන් සිතුවේද? ස්වර්ගික පියාණන්වහන්සේ ඔබ ගැන සලකන අන්දම ඔබ දන්නේ කෙසේද?
- යේසුස්වහන්සේ කුණාටුව සංසිඳවූයේ කෙසේද? (මාර්ක් 4:39.)
- උන්වහන්සේ කුණාටුව සංසිඳවූවාට පසු, යේසුස්වහන්සේ ගැන ගෝලයන්ට හැඟුනේ කෙසේද? (උන්වහන්සේගේ බලය—දෙවියන්වහන්සේගේ බලය.) (ඩීසහගී 124:123. පූජකවරයේ බලය.)
- කුණාටුව සංසිඳවීමෙන් පසු යේසුස්වහන්සේ ගෝලයන්ගෙන් කුමක් ඇසූසේක්ද? (මාර්ක් 4:40.)
- උන්වහන්සේ කුණාටුව සංසිඳෙව්වාට පසු යේසුස්වහන්සේ ගැන ගෝලයන්ට හැඟුනේ කුමක්ද? (මතෙව් 8:27; මාර්ක් 4:41.)

2. පන්දහසකට කන්ට දීම (මාර්ක් 6:33–44)

   - ජනතාව කාන්තාරය තුළට යේසුස්වහන්සේව අනුගමනය කළේ ඔබ සිතන අන්දමට කුමක් හෙයින්ද? (මාර්ක් 6:33.) පන්දහසකට කන්ටදීම පිණිස හාස්කම අනුගමනය කිරීමට පෙර, යේසුස්වහන්සේ කුමක් කළේද? (මතෙව් 14:14.) රෝගීන් සුවකිරීම පිණිස යේසුස්වහන්සේ භාවිතා කළේ කුමන බලයක්ද? (පූජකවරයේ බලය.) අපගේ ජීවිතවලට ආශිර්වාද කරන බලයේ උල්පත වන්නේ කවරක්ද? (ක්‍රියා 10:38.)
   - සියලු දෙනාටම ප්‍රමාණවත් තරම් කෑම සැපයීමට යේසුස්වහන්සේ භාවිතාකළ බලය කුමක්ද? ඉතිරිවූ කෑම ප්‍රමාණයට හේතුවූ හාස්කම කුමක්ද? (මාර්ක් 6:42–44; යොහාන් 6:12–13.)

3. අශුද්ධ ආත්මයක් ඇති පිරිමි ළමයෙකු යේසුස්වහන්සේ සුවකරනසේක (ලූක් 9:37–43)

   - මිනිසාගේ පුත්‍රයාට වූයේ කුමක්ද? (ලූක් 9:38–40.) යේසුස්වහන්සේට කිරීමට මිනිසා කීවේ කුමක්ද?
   - පිරිමි ළමයා වෙනුවෙන් යේසුස්වහන්සේට කළ හැකිවූයේ කුමක්ද? (ලූක් 9:42.) යේසුස්වහන්සේ සමග සිටි ජනතාව මෙම හාස්කමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (ලූක් 9:43.)
   - උපකාර පතා මිනිසා ගිය වෙනත් අය කවුද? ලූක් 9:40.) මෙම මිනිසාට සහ ඔහුගේ පුතාට උපකාරකිරීමට ගෝලයන්ට නොහැකිවූයේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? “ඇදහිලි නැත්තවුන් ” යයි යේසුස්වහන්සේ තම ගෝලයන්ට කීවේ කුමක් නිසාද? (ලූක් 9:41.) පූජකවර බලය ක්‍රියාත්මක කිරීමට ඇදහීම අවශ්‍යවන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?

4. මුහුද පිට පයින් යාම (මතෙව් 13:22–33)

   - තම ගෝලයන් සිටි බෝට්ටුව වෙතට යේසුස්වහන්සේ වතුර පිට පයින් ගමන් කළේ කුමන බලයක් මගින්ද? පළමු වතාවට උන්වහන්සේව දුටු විට, ගෝලයන් සිතුවේ කුමක්ද? (මතෙව් 14:26.) යේසුස්වහන්සේ ඔවුන්ට කුමක් කීසේක්ද? (මතෙව් 14:27.)

සාරාංශ සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

මෙම හාස්කම් හතර යේසුස්වහන්සේ තම බලයෙන් ඉටුකළ බව පහදාදෙන්න.පූජකවරයේ බලය භාවිතාකරමින් උන්වහන්සේ තවත් බොහෝ හාස්කම්ද ඉටු කළසේක. අද පූජකවරය උසුලන්නන් සමග යේසුස්වහන්සේ උන්වහන්-සේගේ බලය බෙදාගෙන ඇතිසේක.

අන්වෙසක්වීමේ කන්ද උඩදී පේත්‍රුස්, යාකොබ්, සහ යොහාන් පූජකවරයේ යතුරු ලබාගත්සේක (මතෙව් 17:1–9). මෙම පූජකවරයේ යතුරු පේත්‍රුස්ට, යාකොබ්ට සහ යොහාන්ට දෙනු ලැබුවේ, යේසුස්වහන්සේ ගියාට පසු පූජක-වරය ඔවුන් සතුව තිබීම පිණිසය. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටුනාට පසු, සභාවේ සභාපති පේත්‍රුස්වූ බැවින්, සභාවේ වැඩකටයුතු කරගෙන යාමට ඔහුට යතුරු අවශ්‍යවිය.

- පේත්‍රුස්, යාකොබ් සහ යොහාන්ට මොසෙස් සහ එලියා දෙනු ලැබුවේ කුමන පූජකවරයේ යතුරුද? (ඉශ්‍රායෙලය එක්රැස් කිරීමේ පූජකවරයේ යතුරු මෝසෙස් ඔවුන්ට දුන්නේය; මුද්‍රාකිරීමේ බලයේ යතුරු එලියා ඔවුන්ට දුන්නේය [බලන්න ඩීසහගී 110:12–16].)
- එක්රැස් කිරීමේ යතුරු අද අප භාවිතාකරන්නේ කෙසේද? (ඇදහිල්ලේ කරුණු 1;10. ධර්මදූත කටයුතු.) ධර්මදූත කටයුතුවලට සහභාගිවීමට දැන් ඔබට හැකිවන්නේ කෙසේද? තවද පූර්ණකාලීන ධර්මදූත සේවයේ යෙදීමට ඔබට සූදානම්විය හැකිවන්නේ කෙසේද?

- මුද්‍රාකිරීමේ යතුරු අප අද භාවිතාකරන්නේ කෙසේද? (දේවමාලිගාව තුළ.) දේවමාලිගාවට යාමට ඔබට සූදානම්විය හැකිවන්නේ කෙසේද?

යේසුස්වහන්සේගේ සහ ප්‍රේරිතවරුන්ගේ මරණින් පසු, සභාවේ ආශිර්වාද සහ පූජකවරය පෙළොවේ ජනතාව වෙතින් ආපසු ගනු ලැබූ බව, පහදාදෙන්න. පූජකවරය නැවත පොළොවේ පිහිටුවීම අද අවශ්‍යවිය. අද අප සියලුදෙනාගේම ජීවිතවලට පූජකවරයේ ආශිර්වාද ලබාගැනීම පිණිස ජෝසෆ් ස්මිත් මාර්ගයෙන් යේසුස්වහන්සේ සභාව සහ පූජකවරය නැවත පිහිටුවූසේක.

- අද සභාවට පූජකවරය තිබීමේ වැදගත්කම කුමක්ද? පූජකවර දෙක කුමක්ද? ආරෝනික පූජකවරය නැවත පිහිටුවූයේ කෙසේද? (ඩීසහගී 13.) මෙල්කිසදෙක් පූජකවය නැවත පිහිටුවූයේ කෙසේද? (ඩීසහගී 27:12.) (ඩීසහගී 27:12.)

යොහාන් බව්තීස්ත ජෝසෆ් ස්මිත්ට සහ ඔලිවර් කව්ඩරිට නැවත පිහිටුවූ එම පූජකවරයම අවුරුදු දොළහක් වයසැති සුදුසු පිරිමි ලමයින්ට ලබාගත හැකි බව ලමයින්ට තේරුම්ගැනීමට උපකාරවන්න. පිරිමි ලමයින්ට ආරෝනික පූජකවරය ලැබුනුවිට, ඔවුන්ගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ සාමාජිකයන්ට ආශිර්වාදකිරීම පිණිස දෙවියන්වහන්සේගේ නාමයෙන් ක්‍රියාකිරීමට ඔවුන්ට බලයදෙන බව පහදාදෙන්න.

- පූජකවරය තුළින් අපට ලැබෙන ආශිර්වාද මොනවාද? (ළදරුවන්ට නම්තැබීම සහ ආශිර්වාදකිරීම, බව්තීස්මකිරීම, ස්ථිරකිරීම, සක්‍රමේන්තුව, දේවමාලිගා මුද්‍රාකිරීම, යනාදියවේ.) පූජකවරය තුළින් අපට ලැබෙන පෞද්ගලික ආශිර්වාද සමහරක් මොනවාද? (රෝගීන්ට ආශිර්වාදකිරීම, පීතෘ ආශිර්වාද, නිවාස ගුරුවරුන්.)
- ඔබගේ ජීවිතයට පූජකවරයේ ආශිර්වාද ලැබී ඇත්තේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වඩා වුවද පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක්, සාරාංශයක් ශෝ අභියෝගයක් මෙන් භවිතාකිරීමට ඔබට හැකිය.

1. *බව්තීස්මය සහ ස්ථිරකිරීම, රෝගීන් ආශිර්වාදකිරීම, පීතෘ ආශිර්වාදයක්, දේවමාලිගා විවාහයක්,* සහ *සක්‍රමේන්තුව* යානිදිය නමන ලද කඩදාසි කැලිවල ලියන්න. "පූජකවරයේ නියෝග සහ ආශිර්වාද" යනාදී වශයෙන් ලේබල් අලවා එම කැලි පෙට්ටියක හෝ ලියුම් කවරයක තබන්න. එක් කැල්ලක් එළියට ගෙන එය පංතියට කියවන ලෙස ලමයෙකුට කියන්න. ආශිර්වාදයේ හෝ නියෝගයේ පූජකවරයේ කාර්‍යභාරය සාකච්ඡාකරන්න. අනෙක් කැලිද ඒ අන්දමින් නැවත කියවන්න. මෙම නියෝග ආශිර්වාද ගැන ලමයින්ට තිබුන අත්දැකීම් බෙදාගැනීමට ඔවුන්ට කියන්න.
2. ඇදහිල්ලේ පස්වෙනි කරුණ නැවත බලා එය කටපාඩම්කිරීමට ලමයින්ට උපකාරකරන්න.
3. සභාවේ පිරිමි ලමයෙකුට අවුරුදු දොළෙහක්වූ විට, ඔහු සුදුසු නම්, ඔහුට ආරෝනික පූජකවරය ලබාගැනීමට හැකි අතර, ඔහුව උපස්ථායක නිළයකට පත්කරනු ඇති බව පහදාදෙන්න. පහත සඳහන් වචන තීරු සූදානම්කරන්න:

    සක්‍රමේන්තුව බෙදාහැරීම
    පිදුම් එකතුකිරීම
    සභානායකවරයාගේ පණිවුඩකරුවෙකු මෙන් ක්‍රියාකිරීම
    ස්වාමීන්වහන්සේගේ දේපළ රැකබලාගැනීම

    උපස්ථායකවරයෙකුගේ වගකීම් නම්කිරීමට ලමයින්ට කියන්න. ලමයින් නිවැරදි පිළිතුරු දෙන විට, සුදුසු වචන තීරුව පෙන්වන්න. අවශ්‍ය නම් ඇඟවීම් කරමින් සියලුම වගකීම් හඳනාගැනීමට ඔවුන්ට උපකාරවන්න.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස්වහන්සේ සතු පූජකවරයේ බලය ගැන ඔබගේ සාක්ෂිය දරන්න. සභාවේ සුදුසු මිනිසුන්ට සහ පිරිමි ලමයින්ට එම පූජකවරයේ බලය අද තිබෙන බව සහ සමහර ආශිර්වාද පූජකවරය මගින් පමණක් අපට තිබෙන බවටද සාක්ෂිදරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයක් වශයෙන්, මාර්ක් 4:35–41 අධ්‍යයනය කිරීමට ලමයින්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හාස්කම් ඉටු කළසේක.

16
වෙනි පාඩම

**අරමුණ**

අපට ඇදහීම තිබෙන විට, ස්වර්ගික පියාණන්වහන්සේගේ කැමැත්ත අනුව හාස්කම් සිදුවන බව දැනගැනීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ළමයින්ගේ ඇදහීම ශක්තිමත්කර ගැනීමට ඔවුන්ට උපකාරවීමටය.

**සූදානම්වීම**

1. මාර්ක් 2:1–12, 5:21–43, සහ 1 නිෆායි 7:12 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර ඉගැන්වීම්: මතෙව් 9:1–8, 18–31; 17:20; ලූක් 8:41–56; ඊතර් 12:6, 12, 16, 18; සහ සුභාරංචි මූලධර්ම 18 වෙනි පරිච්ඡේදය.
3. ළමයින්ව සහභාගිකරවා ගැනීමට හැකි, පාඩම් අරමුණ ඉතාම හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා
   ආ. 7-18 පින්තූරය, යේසුස්වහන්සේ යායිරස්ගේ දුවට ආශිර්වාද කිරීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 215; 62231).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

කවදා හෝ ඔවුන් බොහෝසේ අසනීපව සිටියාද කියා ළමයින්ගෙන් අසන්න. එක කුමක් මෙන් වූවාද කියා කීමටත්, ඔවුන්ට සුවවීම පිණිස ඔවුන්ගේ පවුලේ අය උපකාරකළ අන්දම ගැන පහදා දීමට සලස්වන්න. පූජකවර ආශිර්වාද ලබාගත් ළමයින්ට ඔවුන්ගේ අත්දැකීම් ගැන අනිත් ළමයින්ට කීමට සලස්වන්න. ඔවුන්ට අසනීපවූ විට හෝ ප්‍රශ්න ඇතිවූ විට, යාච්ඤාව තුලින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔවුන්ගේ ඇදහීම පෙන්වීම ගැන අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරවන්න.

උන්වහන්සේ තුල මහත් ඇදහීමක් තිබුන බැවින් යේසුස්වහන්සේ සුව කළ පුද්ගලයන් ගැන කථාන්තර මෙම පාඩමේ සඳහන්වන බව ළමයින්ට පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි ප්‍රශ්න, සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

සූදානම කොටසේ ලැයිස්තුගතකර තිබෙන යේසුස්වහන්සේ රෝගීන් සුවකිරීම ගැන ශුද්ධ ලියවිලි සඳහන් විස්තර උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)

1. යේසුස්වහන්සේ අංශභාග රෝගියෙකු සුවකරනසේක (මාර්ක් 2:1–12)

- අංශභාග රෝගියාට යේසුස්වහන්සේ පළමුවෙන්ම කීවේ කුමක්ද? (පාලනයකිරීමට නොහැකි ලෙස මස්ගොබ සෙලවීම)? (මාර්ක් 2:5.) යේසුස්වහන්සේගේ ප්‍රකාශයට ලියන්නන්ගේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? (මාර්ක් 2:7.) දේව අපහාසය යනු කුමක්ද? (දෙවියන්වහන්සේට අගෞරවය දැක්වීම හෝ දෙවියන්වහන්සේ බවට වංක අයිතිවාසිකම් කීම.) යේසුස්වහන්සේ දේව අපහාසයක් කළසේක්ද? යේසුස්වහන්සේ දේව පුත්‍රයාණන් බව ලියන්නන් විශ්වාස නොකළ නමුත්, උන්වහන්සේ දේව පුත්‍රයාණන් වන බැවින්, පාපවලට කමාව දීමට හැකියාව තිබෙන බව රෙුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න.
- ලියන්නන්ට යෙ-සුස්වහන්සේ කීවේ කුමක්ද? (මාර්ක් 2:8–9.) අංශභාග රෝගියාට උන්වහන්සේ කීවේ කුමක්ද? (මාර්ක් 2:10–11.)
- අංශභාග රෝගියා සුවකළ පසු ජනතාවගේ ප්‍රතිචාරය වූයේ කුමක්ද? (මාර්ක් 2:12.) මෙම මිනිසා සුව වූයේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?

2. යේසුස්වහන්සේ යායිරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටුවනසේක (මාර්ක් 5:21–24, 35–43)

පින්තූරය 7-18 පෙන්වන්න, යේසුස්වහන්සේ යායිරස්ගේ දුවට ආශිර්වාදකිරීම.

- යායිරස් කවරෙක්ද? යේසුස්වහන්සේට ඔහු තුළ ඇදහීම තිබුන බව අප දන්නේ කෙසේද? (මාර්ක් 5:22–23.) ඔහුගේ ඇදහීම ශක්තිමත්ව තබාගැනීමට යේසුස්වහන්සේ යායිරස්ට උපකාර කළේ කෙසේද? (මාර්ක් 5:35–36.)
- යායිරස් සමග යායිරස්ගේ නිවසට යේසුස්වහන්සේ පැමිණෙන විට, සමහර මිනිසුන් කුමක් කරමින් සිටියේද? (මාර්ක් 5:38. ආදරවන්තයෙකු මියගිය විට, දුක්වන අය මහත්සේ ශබ්දකිරීම එම කාලයේදී එහි සිරිතක් බව පහදාදෙන්න.) දුක් වන අය කරන දෙයත්, යායිරස් කළ දෙයත් අතර වෙනස කුමක්ද?
- ගැහැණු ලමයාව සුවකිරීමට ඇයගේ කාමරයට ඇතුළුවීමට පෙර, යේසුස්වහන්සේ නොඇදහිලිමතුන් පිටතට හැරියේ කුමක් නිසාද? (මාර්ක් 5:40.)

3. මහ ලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රියක් යේසුස්වහන්සේ සුවකරනසේක (මාර්ක් 5:25–34)

- යේසුස්වහන්සේගේ සළුවේ වාටිය අතගැසූ ස්ත්‍රිය යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල පෙන්වූවේ කෙසේද? (මාර්ක් 5:27–28.)
- යේසුස්වහන්සේගේ වස්ත්‍රයට ස්ත්‍රිය අතගැසූ බව යේසුස්වහන්සේ දැනගත්තේ කෙසේද? (මාර්ක් 5:30.) යමෙකු තමා අතගැසූ බව දැනගැනීම උන්වහන්සේට අසමාන දෙයක් වූයේ කුමක් නිසාද? (මාර්ක් 5:31.)
- ස්ත්‍රියට සුවවූයේ කුමක් නිසාද? (මාර්ක් 5:34.) යේසුස්වහන්සේගේ සළුවේ වාටියේ කිසිම හාස්කමක් නොතිබුන බව පහදා දෙන්න. යේසුස්වහන්සේ තුල ඇයගේ ඇදහිල්ලද, ස්වර්ගික පියාණන්ගේ කැමැත්තද නිසා, ස්ත්‍රිය සුවපත් වූවාය. සරල සුළු ක්‍රියා නිසා අපගේ ජීවිතවල සිදුවන සමහර හාස්කම් මොනවාද?

සාරාංශ සාකච්ඡාව සහ අදාලකිරීමේ ප්‍රශ්න

- යේසුස්වහන්සේ හාස්කම් සිදු කළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (මතෙව් 9:29–30; මාර්ක් 1:41; 2:5, 10, 5:36. දෙවියන්වහන්සේගේ දිව්‍යමය පුත්‍රයා බව ඔප්පුකිරීමටද, උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන අයගේ ඇදහිල්ල ශක්තිමත්කිරීමටද, මන්ද, අවශ්‍යතාවයන් ඇති අයට උන්වහන්සේ ප්‍රේමකරමින් අනුකම්පාකළ බැවින්ද, උන්වහන්සේ කෙරෙහි විශ්වාස කළ අයගේ ඇදහීමද නිසාය.)
- අපගේ ජීවිත තුළ අද තිබෙන සමහර හාස්කම් මොනවාද?

යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතිව ධර්මිෂ්ඨ ජීවිත අප ගතකරනවා නම්, දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව අප හාස්කම් අත්දකින බව තේරුම්ගැනීමට ලමයින්ට උපකාරවන්න (බලන්න 1 නිෆායි 7:12).

- යාච්ඤා පිරිනැමුවත් ඇතැම්විට රෝගී හෝ ආබාධිත පුද්ගලයෙකුට සුවය නොලැබෙන බව පහදාදෙන්න. අපට ඇදහිල්ලක් නැති බව එයින් අදහස්වන්නේද? කුමක් හෙයින්ද? පුද්ගලයාට සුවය ලැබීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වීමට නොහැක්කේ කුමක් නිසාද? පුද්ගලයාගේ පවුලේ ඇදහීම පරීක්ෂාකිරීමට දෙවියන්වහන්සේට වුවමනා වනවා ඇත. පුද්ගලයාට ඉවසීම දියුණුකරගැනීම යනාදිය, උන්වහන්සේගේ වුවමනා වනවා ඇත.)

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් උපුටාගැනීමට යොමුවන්න: "ස්වාමීන්වහන්සේ නිතරම රෝගීන් සුව නොකරන අතර, භයානක තත්වයක සිටින අය ගලවා නොගන්නවා ඇත. වේදනා සහ විපත් වලින් උන්වහන්සේ නිතර සහනය ලබා නොදෙනසේක. මක්නිසාද මේවා අප්‍රසන්න තත්වයන් මෙන් පෙණුනත් අරමුණකින් යුත් සැලසුමක කොටසක් වීමට හැකිය" (*Tragedy or Destiny,* පි. 5).

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහීම තිබීම යන්නෙහි අර්ථය කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවද, ලෝකයේ ගැලවුම්කරුවාණන් බවට විශ්වාසකිරීමද, යේසුස්වහන්සේට සියලුම බලය ඇති බවට විශ්වාසකිරීමද, ස්වර්ගික පියාණන් වහන්සේ සහ යේසුස්වහන්සේ අප වෙනුවෙන් ඉතාම යහපත් දේ කිරීම ගැන විශ්වාසය තැබීමද, දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිගැනීමද, දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවීමට ආශාවක් ඇතිවීමය.)
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල වඩා වැඩි ඇදහීමක් දියුණුකර ගැනීමට ඔබට හැකිවන්නේ කෙසේද?

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. ඇදහිල්ලේ හතරවෙනි කරුණ නැවත කියවා "ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහීම" සුභාරංචියේ පළවෙනි මූලධර්මය වන්නේ ඔවුන් සිතන ආකාරයට කුමක් නිසාදැයි ළමයින්ගෙන් අසන්න. ඔවුන්ට එම පදය මතසින් නැවත කීමට හෝ කටපාඩම්කිරීමට හෝ ඔවුන්ට සලස්වන්න.
2. "ස්වාමීන්වහන්සේට හැකියාව ඇත" යන වාක්‍ය කණ්ඩයෙන් පටන්ගෙන 1 නිෆායි 7:12, කටපාඩම් කිරීමට ළමයින්ට සලස්වන්න.
3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අද ජීවත්වන බව අප දන්නේ කෙසේද කියා විස්තර කිරීමට ළමයින්ට කියන්න. මේවා සහ ඔබට සිතීමට හැකි වෙනත් පිළිතුරුවල වචන තීරු සෑදීමට ඔබට හැකිය. ප්‍රධාන වචන හුණු ලෑල්ලේ ලිවීමටද ඔබට හැකිය.

   අනාගතවක්තෘවරුන් විසින් ලියන ලද ශුද්ධ ලියවිලි යේසුස්වහන්සේ ගැන අපට කියයි.
   අන් අය උන්වහන්සේ ගැන සාක්ෂි දරා ඇත.
   උන්වහන්සේගේ ප්‍රේමය අපට හැඟෙනු ඇත.
   ජෝසෆ් ස්මිත් උන්වහන්සේව දැක ඇති අතර, උන්වහන්සේගේ සභාව නැවත පිහිටුවීමට උපදෙස් දෙන ලදී.
   අප යාච්ඤාවෙන් සිටිනවා නම්, යේසුස්වහන්සේ ජීවත්වන බව ශුද්ධාත්මයාණන්වහන්සේ අපට සාක්ෂි දරනු ඇත.
4. මතෙව් 17:20 කියවීමට ළමයින්ට කියන්න. අබ ඇටයක් ඉතාම කුඩා වුවත් පඳුරු සහිත විශාල ගසක් බවට වැඩෙන බව පහදාදෙන්න. ගසක් මෙන් වැඩීමට එම ඇටයේ හැකියාව මෙන් අපගේ ඇදහීම ශක්තිමත් නම්, ශ්‍රේෂ්ට දේවල් ඉටුකිරීමට අපට හැකිවේ.

**අවසානය**

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහීම අපට ඇත්නම්, ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේ සිටි පුද්ගලයන් මෙන් හාස්කම් අත්දැකීමට අපට හැකිවේ. ඔබගේ ජීවිතයේ හාස්කමක් බෙදාගැනීමට ඔබට වුවමනාවනවා ඇත. නැතහොත් ඔවුන්ගේම එකක් බෙදාගැනීමට පංති සමාජිකයන්ට ආරාධනා කරන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයක් වශයෙන් මාර්ක් 2:1–12 අධ්‍යයනය කිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# 17
වෙනි පාඩම

# තිරිඟු සහ ඉරිඟු සහ වපුරන්නාගේ කථාව

**අරමුණ**

යේසුස්වහන්සේ ප්‍රකාශකළ උපමා කථා දෙකේ එන ආත්මික පණිවුඩය තේරුම්ගෙන ඒවා අදාළකර ගැනීමට එක් එක් ළමයාට උපකාර කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 13:1–9, 18–30, 37–43; මාර්ක් 4:14–20; ලූක් 8:11–15; සහ දහම සහ ගිවිසුම 86:1–7 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර ශුද්ධවූ ලියවිලි විස්තර ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම" පි. 00 vi සහ "ශුද්ධවූ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)
2. අමතර කියවීම්: මාර්ක් 4:1–9, ලූක් 8:4–8, සහ දහම සහ ගිවිසුම 101:65–66.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. "සැඟවුන පණිවුඩයේ ප්‍රහේළිකාව" හෝ පංතියට කළ හැකි විශාල ප්‍රහේළිකාවක් සහිත කඩදාසියක් එක් එක් ළමයෙකු සඳහා.

ප්‍රහේළිකාවේ සැඟවුන පණිවුඩය

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | අ | පි | 9 | 1 | ඉ | ෙ | ග | න | ග | ති | මු | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 1 | 2 | ෙ | ව | ති | න් | 3 | 4 | ඒ | ම | 5 | 6 | 7 | 8 | 9 |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | උ | ප | ම | ා | 9 | ක | ථ | ා | ව | න් | 1 | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

**යෝජිත පාඩම වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

ඔබ සූදානම් කළ කඩදාසි ළමයින්ට දෙන්න. නැතිනම් විශාල ප්‍රහේළිකාව ප්‍රදර්ශනය කරමින් එහි අංක අතර සැඟවී තිබෙන පණිවුඩය සෙවීමට ළමයින්ට කියන්න.

යේසුස්වහන්සේ ජනතාවට උගන්වන විට, උපමා මගින් සමහර අවස්ථාවලදී එතුමා ඉගැන්වූසේක. ඒවා ආත්මික පණිවුඩයක් සැඟවී ඇති කෙටි කථාන්තර බව පහදා දෙන්න.

**ශුද්ධ ලියවිලි විස්තර සහ සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

වපුරන්නාගේ සහ තිරිඟු සහ ඉරිඟු ගැන උපමාව ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.) යේසුස්වහන්සේ උපමා මගින් උගන්වන විට, ආත්මික පණිවුඩය ඉගැන්වීමට ජනතාව හොඳින් දන්නා දේවල් උන්වහන්සේ භාවිතාකළ බව පහදා දෙන්න. ඔබ මෙම උපමා භාවිතාකරන විට, සැඟවුන ආත්මික පණිවුඩයට සවන්දීමට ළමුන්ට සළස්වන්න.

1. වපුරන්නාගේ උපමාව (මතෙව් 13:1–9, 18–23; මාර්ක් 4:14–20; ලූක් 8:11–15)

   - වපුරන්නාගේ උපමාවෙහි ජනතාව හොඳින් දන්නා කුමක් ගැන යේසුස්වහන්සේ කථා කළසේක්ද? (මතෙව් 13:3–8.)
   - මතෙව් 13:18–23, මාර්ක් 4:14–20, සහ ලූක් 8:11–15 පංතිය සමග කියවන්න. බීජය කුමක්දැයි ඔබ සිතන්නේද? එම බීජය කන පක්ෂීන් නියෝජනය කරන්නේ කුමක්ද? ගල් සහිත පොළොව කුමක්ද? කටු මොනවාද? සරු බිම කුමක්ද? මුල් මොනවාද? ලෝකය ගැන වෙහෙසීම් මොනවාද?
   - දෙවියන්වහන්සේගේ වචනය අප ඉගෙනගන්නේ කෙසේද?
   - දෙවියන්වහන්සේගේ වචනය අප ලබාගත යුත්තේ කෙසේද? අප කුමන වර්ගයේ "පොළොවක්" විය යුතුද?
   - වපුරන්නාගේ උපමාවෙහි තිබෙන සැඟවුන ආත්මික පණිවුඩය කුමක්ද?

2. තිරිඟු සහ කිරිඳි ගැන උපමාව (මතෙව් 13:24–30)

   - තිරිඟු සහ කිරිඳි ගැන උපමාවේ ජනතාව හොඳින් දන්නා කුමක් ගැන යේසුස් වහන්සේ කථා කළසේක්ද?
   - මෙම උපමාවේ වපුරන්නා ඔබ සිතන අන්දමට කවරෙක්ද? තිරිඟුවලින් නියෝජනය වන්නේ කුමක්ද? රාත්‍රියේ පැමිණ කිරිඳි වපුරන්නේ කවුද? කිරිඳි යනු කුමක්ද? කපන කාලය නියෝජනය කරන්නේ කුමක්ද? මතෙව් 13:37–43 සහ දහම සහ ගිවිසුම 86:1–7 ළමයින් සමග කියවා මෙම ප්‍රශ්න නැවත අසන්න.
   - ඔබ කැමති කුමක් වීමටද, තිරිඟුද, නැතිනම් කිරිඳිද, ඒ මන්ද?
   - මෙම උපමාවේ සැඟවුන ආත්මික පණිවුඩය කුමක්ද?

---

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් සාරාංශයක් හෝ අභියෝගයක් වශයෙන් නැවත භාවිතාකිරීමට ඔබට හැකිය.

1. උපමා දෙකෙහි අර්ථය තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවීම සඳහා පහත සඳහන් එකට සමාන සිතියමක් සාදාගන්න. නැතිනම් ඔබ උපමා භාවිතාකරන විට, එම තොරතුරු රටහුණු ලෑල්ලේ ලියන්න. සියලුම තොරතුරු ඔබ ලැයිස්තුගත කළාට පසු, තීරීක්ෂණය පිණිස නැවත එයට යොමුවන්න. මෙම සිතියම්වල පිටපත් ළමයින්ටම සාදාගැනීමට උපකාරකිරීමට සැලැස්වීමට ඔබට හැකිය.

වපුරන්නාගේ උපමාව

| | |
|---|---|
| බීජ | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය නැතහොත් දෙවියන්වහන්සේගේ වචනය |
| පස | වචනය අසන්නාගේ සිත් |
| මග අසල | තේරුම් නොගන්නේය |
| ගල්බිම් වල | ඇසූ නමුත් මුල් නැති බැවින්; පහසුවෙන් පීඩාවට පත්වේ |
| කටු අතරෙහි | ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ රැවටිලිකාර කමින්ද වචනය යටවන්නේය |
| සරු බිමෙහි | අසා තේරුම්ගන්නේය |
| පක්ෂීහු | සාතන් |
| ඵල | යහපත් ක්‍රියා |

කිරිඳි සහ තිරුඟු ගැන උපමාව

| | |
|---|---|
| වපුරන්නා | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ප්‍රේරිතවරු |
| හොඳ බීජ | යේසුස්වහන්සේගේ අමුගාමිකයෝ |
| කෙත | ලෝකය |
| සතුරා | සාතන් |
| කිරිඳි | සාතන්ගේ අනුගාමිකයෝ |
| කපන්නන් | දේවදූතයෝ |
| කපන කාලය | Jesus' second coming |

2. යම් වර්ගයක බීජයක් රැගෙන එන්න (පලතුරු, එළවළු, හාල්, තිරිඟු, බෝංචි). එම බීජය වැඩී හොඳ එල ඉදිරියට ගෙන ඒමට අවශ්‍ය කුමක්ද කියා සාකච්ඡා කරන්න. එම බීජය මග අසල, ගල් බිම්වල හෝ කටු අතරෙහි පැල කළා නම්, කුමක් වන්නේදැයි ළමයින්ගෙන් අසන්න. දෙවියන් වහන්සේගේ වචනය අපගේ සිත් තුල පැල කිරීම මෙය සමග සමාන කරන්න. එක් එක් වර්ගයේ පස නියෝජනය කරන්නේ කුමන වර්ගයේ සිතක්ද, ශුභාරංචිය අපගේ සිත් තුල වැඩී අපගේ ජීවිත තුලට හොඳ එල ඉදිරියට ගෙන ඒමට අවශ්‍ය මොනවාද කියා සාකච්ඡා කිරීමට ළමයින්ට ඉඩදෙන්න.

3. කන්, ඇස් සහ සිත යන වචන හුණු ලෑල්ලේ ලියන්න.

   - ඔබ ඔබගේ කන් වලින්, ඇස් වලින්, සහ සිතින් කරන්නේ මොනවාද? මතෙව් 13:15 කියවීමට ළමුන්ට සලස්වන්න. අපගේ ශරීරවල මෙම කොටස් වලින් අප කළ යුතු දේවල් ගැන යේසුස්වහන්සේ කීවේ කුමක්ද? මෙම පදය උපමාවලට සහ සහ සුභාරංචියට අදාළ කරන්න. දෙවියන්වහන්සේගේ වචනය ඇත්ත වශයෙන්ම අප අසා, එහි ඇති සත්‍යය දැක, යේසුස්වහන්සේට අවශ්‍ය දෙය අප කරනවා නම්, මෙම උපමාවන අපි කවුරුන් නම් වන්නෙමුද?

4. ළමුන් ලවා සැඟවුන ප්‍රහේළිකාවේ නැතහොත් විශාල ප්‍රහේළිකාවේ අකුරු එළියට පෙනෙන ලෙස තුනී කඩදාසි-යක් මත තබා පිටපත් කිරීමට, පාට කිරීමට හෝ යටින් ඉරි ඇඳීමට ළමුන්ට සලස්වන්න. මෙම උපමා දෙකෙන් ඉගෙනගත් එක් දෙයක් නම් කිරීමට ළමුන්ට කියන්න.

5. මතෙව් 13 සඳහන් වෙනත් උපමා ළමයින් සමග කියවා, එහි අර්ථය කුමක්ද කියා තීරණය කිරීමට ළමයින්ට උපකාරවන්න. මෙම උපමා තේරුම්ගැනීමට උපකාරවීම සඳහා බලන්න, James E. Talmage, *Jesus the Christ*, chapter 19, හෝ Bible Dictionary in the LDS edition of the Bible උපමා කථා.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් බවද, උන්වහන්සේගේ වචන ඉගෙනගනිමින් පණත් රකින්නේ නම්, අපට ස්වර්ගීය පියාණන්වහන්සේ මෙන් වී, නැවත උන්වහන්සේ සමග ජීවත්වීමට හැකි බවට සාක්ෂිදරන්න.

**නිවසේදී කීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂණයක් වශයෙන් මතෙව් 13:1–9 අධ්‍යයනය කිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජාත්‍යාංධයෙකු සුවපත්කරනසේක

18

වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණීමෙන් පරීක්ෂා සහ අභියෝග ජයගැනීමට අපට හැකිවන බව එක් එක් ළමයාට තේරුම්ගැනීමට උපකාරවීමය.

**සූදානම්වීම**

1. යොහාන් 9 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණය කරන්න. (බලන්න "ඔබගේ පාඩම් සූදානම් කිරීම" පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.) සටහන: මෙම පාඩම සූදානම්කර ඉගැන්වීමේදී. පෙනීමේ ආබාධ ඇති ළමුන් ඔබගේ පංතියේ සිටිනවා නම්, ඔවුන් කෙරෙහි සංවේදී වන්න.

2. ළමුන්ව සහභාගිකරවා ගැනීම හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.

3. අවශ්‍ය උපකරණ:
   - අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා.
   - ආ. ඇස් බැඳීමට රෙදි කෑල්ලක්.
   - ඇ. පින්තූරය 7-14, යේසුස්වහන්සේ අන්ධයෙකු සුවකිරීම (සුභාරංචි කලා පින්තූර මල්ල 213; 62145).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ළමයෙකුගේ ඇස් බැඳ, වාහනයක කොටසක් වැනි උපකරණයක කොටසක් රටහුණු ලෑල්ලේ ඇඳීමට ඔහුට හෝ ඇයට කියන්න. දෙවෙනි ළමයාට පැමිණ ඇස් වසා බැඳ, එම උපකරණයේම තවත් කොටසක් ඇඳීමට සලස්වන්න. ළමයි ස්වල්ප දෙනෙක් උපකරණයේ කොටසක් අඳින තෙක් නොකඩවා කරන්න. මෙය අපහසු වැඩක කොටසක් වන්නේ කුමක් හෙයින්ද කියා ළමයින් සමග සාකච්ඡා කරන්න.

- පෙනීමේ හැකියාව නොමැති නිසා පින්තූරය ඇඳීමට අපහසු වන්නේ කෙසේද?
- නැවත කිසි දිනෙක ඔබට පෙනෙන්නේ නැතිවුව හොත් ඔබට හැඟෙන්නේ කෙසේද?

අන්ධවීමේ වර්ග දෙකක් ගැන ඔබ කථාකිරීමට යන බව ළමුන්ට කියන්න. ශුද්ධ ලියවිලි විස්තරය ඔබ උගනවන විට, අන්ධවීමේ විවිධ ක්‍රම ගැන සවන්දීමට ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

යේසුස්වහන්සේ අන්ධයින් සුවකිරීමේ පින්තූරය පෙන්වන්න. උපන්දා පටන් අන්ධවූ මනුෂ්‍යයෙකු යේසුස්වහන්සේ සුවකිරීමේ යොහාන් 9 විස්තරය උගන්වන්න (ශුද්ධ ලියවිලි විස්තර උගන්වන යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. vii.) ඔබ කථාව උගන්වන විට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ජනතාව විශ්වාස කරන්නේ නම්, ඵරිසිවරුන් (යුදෙව්වරුන්ගේ ආගමික පාලකයන්) ඔවුන්ගේ ප්‍රසිද්ධිය අහිමිවේයයි කනස්සල්ලට පත්වූ බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. එමනිසා යේසුස්වහන්සේ සහ උන්වහන්සේ කළ දේවල්ද, ඉගැන්වූ දේවල් ගැනද, ජනතාව තුළ සැකයක් ඇතිකිරීමට ඔවුහු නිතර උත්සාහ දැරුවෝය. යේසුස්වහන්සේ ඉගැන්වූ සුභාරංචි සත්‍යයන් ඔවුන්ට හඳුනාගැනීමට නොහැකිවූ බැවින්, ඔවුහු ආත්මික අන්ධයන්වූහ. ගැලවුම්කරුවාණන් අනුගමනය කිරීමේදී, අපගේම ආත්මාර්ථ හැඟීම්වලට අප ඉඩසැලසුව හොත්, අපද ආත්මිකව අන්ධවීමට හැකි බව පහදා දෙන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- උපතින්ම අන්ධවූ මිනිසා ගැන ගෝලයින් යේසුස්වහන්සේගෙන් ඇසුවේ කුමක්ද? (යොහාන් 9:2.) යමෙකු පව් කළ නිසා ලෙඩ රෝග සහ විරුද්ධත්වය සමහරවිට පැමිණෙන බව ජනතාව සිතන්නේ කුමක් නිසාද? මිනිසාගේ අන්ධභාවයට හේතුව ගැන යේසුස්වහන්සේ කුමක් කීසේක්ද? (යොහාන් 9:3.)
- ඵරිසිවරු ආත්මිකව අන්ධවූයේ කුමණ මගකින්ද? (යොහාන් 9:16.) ඔවුන් යේසුස් වහන්සේට දොස් තැබුවේ කුමක් නිසාද? යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව ඔවුන් පිළිනොගත්තේ, ඔබ සිතන අන්දමට කුමක් නිසාද?
- කුමක් සිදුවූනාදැයි උපතින් අන්ධ මිනිසාගෙන් ඵරිසිවරු ඇසූ විට, ඔහු යේසුස්වහන්සේ ගැන සඳහන් කළේ කෙසේද? (යොහාන් 9:11.) දෙවෙනි වතාවට ඔවුන් එම මිනිසාගෙන් ඇසූ විට, යේසුස්වහන්සේ කවරෙකුද කියා ඔහු කීවේද? (යොහාන් 9:17.)
- මිනිසාගේ ආත්මික සහ භෞතික පෙනීමට සිදුවූයේ කුමක්ද? තුන්වෙනි වතාවටත් ඔවුන් යේසුස්වහන්සේ ගැන එම මිනිසාගෙන් ඇසූ විට, ඔහු කීවේ කුමක්ද? (යොහාන් 9:30–33.)
- යේසුස්වහන්සේ ගැන සාක්ෂිදැරූ බැවින් එම මිනිසාට සිදුවූනේ කුමක්ද? (යොහාන් 9:22, 34.) එම මිනිසා සිනගෝගයෙන් (යුදෙව්වරුන්ගේ ආගමික රැස්වීම් ගෘහයක්) අහක්කළ බව යේසුස්වහන්සේට ඇසුන විට, උන්වහන්සේ කුමක් කළසේක්ද? (යොහාන් 9:35.) යේසුස්වහන්සේ ඔහු සොයා පැමිණිවිට, එම මිනිසාට ඔබ සිතන අන්දමට කෙසේ හැඟුනේද? යේසුස්වහන්සේ ගැන එම මිනිසාගේ අන්තිම සාක්ෂිය වූයේ කුමක්ද? (යොහාන් 9:35–38.) ඔහුගේ ආත්මික පෙනීමට කුමක් වූයේද?
- අපගේ ජීවිතවලට පරීක්ෂාවන් සහ ප්‍රශ්න ඇතිවීමට ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ ඉඩදීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? අපගේ ආත්මික අන්ධභාවය සුවකරගැනීමට මෙ පරීක්ෂාවන් සහ ප්‍රශ්න උපකාරවන්නේ කෙසේද? අපගේ පරීක්ෂාවන් සහ ප්‍රශ්නවලදී ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ අපට උපකාරවන්නේ කෙසේද? (සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් 4 බලන්න.)
- ඔබ සහ ඔබගේ පවුල පරීක්ෂාවන්වලදී ආශිර්වාද ලැබුවේ කෙසේද? මෙම ප්‍රශ්නය සාකච්ඡාකිරීමට ළමයින්ව දිරිගන්වන්න, නමුත් පුද්ගලිකවූ පවුලේ පෞද්ගලික කරුණු ගැන ළමයින් කථා නොකිරීම ගැන වගබලාගන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතකිරීමට ඔබට හැකිය.

1. පංතිය කණ්ඩායම්වලට බෙදන්න. එක් එක් කණ්ඩායමට කියවීමට පහත සඳහන් ශුද්ධ ලියවිලි දෙන්න. ශුද්ධ ලියවිලි සඳහන් පුද්ගලයා හෝ ජනතාව ඔවුන්ගේ පරීක්ෂාවන් කෙරෙහි ක්‍රියාකළ අන්දම ඔවුන්ගේ කණ්ඩායම් තුළ කථාබහ කොට පංතියට වාර්තාකිරීමට ඔවුන්ට සලස්වන්න.

   දානියෙල් 3:17–18, 23–25, 28
   1 නිෆායි 18:16, 20–22
   මොසායා 24:13–16
   ඇල්මා 14:8–11

2. ආබාධිත අය ගැන පරීක්ෂාවීමේ වැදගත්කම ගැන තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. ශාරීරික ආබාධයක් ඇති වැඩිහිටියෙකුට (හෝ ආබාධිත ළමයෙකුගේ දෙමාපියන්ට) පංතියට පැමිණ ආබාධිත අයට කරුණාවන්තවීමේ ක්‍රම සාකච්ඡාකිරීමට කීමට ඔබට හැකිය. ආබාධිත පුද්ගලයන් සරදමට භාජන නොකිරීම ගැන අවධාරනය කරන්න; අප ඔවුන්ට විහිළු නොකළ යුතුය. ඔවුන්ට උපකාර අවශ්‍ය නම්, උපකාරකිරීමට අපට හැකිය; අප සමග ක්‍රීඩාකිරීමට ඔවුන්ට ආරාධනාකිරීමට අපට හැකිය; අපට ඔවුන්ගේ මිතුරන් වීමට හැකිය. ඔවුන් අපගේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධකරගෙන, අප සමග සහභාගිවීමට සැලැස්විය යුතුය.

3. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ මෙම ප්‍රකාශය කියවා සාකච්ඡාකරන්න:

   "සෑම යාච්ඤාවකටම ක්ෂණිකවම පිළිතුරු දිය යුතුද…වේදනාව, දුක, අධෛර්‍යය, සුළුවෙන් හෝ මරණය පවාද ඇත., තවද මේවා නොමැති නම්, ප්‍රීතිය, සාර්ථකත්වය, මළවුන්ගෙන් නැවත නැගිටීම, නැතහොත් සදාකාල ජීවනය සහ දේවත්වයද නොමැතිවන්නේය" (*Faith Precedes the Miracle*, පි. 97).

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | අප උන්වහන්සේගේ පණත්වලට කීකරුවන්නේ නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහීම ඇතිව උන්වහන්සේ මෙන් වීමට වඩාත් උත්සාහ දරන්නේ නම්, ස්වාමීන්වහන්සේ අපට ආශිර්වාද කරමින් අපගේ ප්‍රශ්න සහ පරීක්ෂාවන් වලදී අපට උපකාරකරන බවට ඔබගේ සාක්ෂිය දරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂණයකිරීමක් වශයෙන් යොහාන් 9:1–38 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

# 19
වෙනි පාඩම

# නැතිවූන බැටළුවා, නැතිවූන මිලය සහ අකීකරු පුත්‍රයා

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ ක්‍රියාකාරීත්වයෙන් අඩු අය, පූර්ණ ක්‍රියාකාරීත්වයට නැවත ගෙන ඒමට උපකාරවීම පිණිස අභිප්‍රායක් ඇතිකිරීමට එක් එක් ළමයාට උපකාරවීමටය.

**සූදානම්වීම**

1. ලූක් 15, මතෙව් 18:12–14 සහ දහම සහ ගිවිසුම 18:10–11 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම් සූදානම්කිරීම" පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණහොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීම් ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. 7-19 පින්තූර, යහපත් එඬේරා, සහ 7-20, අකීකරු පුත්‍රයා (62155).

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ඔබ හෝ ඔබ දන්නා යමෙකුගේ වටිනා දෙයක් නැතිවී, නැවත ලැබුනු අවස්ථාවක් ගැන ළමයින් සමග බෙදාගන්න. එම භාණ්ඩයේ වටිනාකම, එය නැතිවූවිට ඔබට ඇතිවූ හැඟීම්, එය සොයාගැනීමට ඔබ කළ දේවල්, එය නැවත ලැබුණු පසු ඔබට ඇතිවූ හැඟීම් ගැන ළමුන්ට විස්තර කරන්න. සුදුසු නම්, පංතියට පෙන්වීමට එම භාණ්ඩය ගෙනඒමට ඔබට හැකිය. ඔවුන්ගේ ජීවිතවලදී යම් වටිනා දෙයක් නැතිවී, එය නැවත සොයාගත් සිද්ධියක් ගැන කීමට ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

සුදුසු අවස්ථාවලදී පින්තූර භාවිතාකරමින්, නැතිවූ බැටළුවා, නැතිවූ මිලය, සහ අකීකරු පුත්‍රයා යන උපමා උගන්-වන්න. ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි vii.) වපුරන්නාගේ සහ තිරිඟු සහ කිරිඳි උපමා මෙන්ම මෙම උපමාද, වැදගත් ශුභාරංචි මූලධර්මයන් උගන්වන බව ළමයින්ට විස්තර කරන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

1. නැතිවූන බැටළුවා සහ නැතිවූන මිලය

   - බැටළුවන් සීයයකගෙන් එකෙකු ගැන එඬේරාද, දසයෙන් එක මිලය ගැන ස්ත්‍රියද එතරම් සැලකිලිමත්වූනේ මන්ද? (ලූක් 15:4, 8.) ජනතාව සාමාන්‍යයෙන් දිළිඳු නිසා, එක මිලයක් හෝ බැටළුවෙකු ඔවුන්ට ඉතා වටිනා බව පහදාදෙන්න. එසේම, ස්වාමීන්වහන්සේගේ සියළුම දරුවන් උන්වහන්සේට වටින්නේය. අප එක් එක් අය ස්වර්ගික පියාණන්වහන්සේට වටින්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද?
   - බැටළුවා නැතිවූයේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? මිලය නැතිවූයේ ඔබ සිතන අන්දමට කෙසේද? අප හෝ අප දන්නා යමෙකු නැතිවිය හැක්කේ කෙසේද? නැතිවෙනවා යනු, ජනතාව පනත්වලට කීකරු නොවී, ස්වාමීන්වහන්සේ වෙත නැවත යාමට නුසුදුසු දේවල් කිරීම බව ළමයින්ට තේරුම්ගැනීමට උපකාර වන්න.
   - නැතිවූ බැටළුවා සොයාගත්තාට පසු, එඬේරා කුමක් කළේද? (ලූක් 15:5. උන්වහන්සේ බැටළුවන්ට ප්‍රේමකරන බව උන්වහන්සේගේ මෙම ක්‍රියාවෙන් පෙන්වූයේ කෙසේද? එඬේරාව නියෝජනය කරන්නේ කව්රුන්ද? බැටළුවන්ව නියෝජනය කරන්නේ කව්රුන්ද?

- නැතිවුන මිලය සොයාගැනීමට ස්ත්‍රිය කළේ කුමක්ද? (ලූක් 15:8.) නැතිවුන සහ පණත් නොතබන අයට උපකාර පිණිස යේසුස්වහන්සේ කුමක් කළසේක්ද? (බලන්න ඩීසහගී 18:10–11.) නැතිවිය හැකි අයට උපකාරකිරීමට අපට හැකිවන්නේ කෙසේද?
- ඔවුන්ගේ බැටළුවා සහ මිලය සොයාගත් පසු, එඬේරා සහ ස්ත්‍රිය යන දෙදෙනාම කළේ කුමක්ද? (ලූක් 15:6, 9.) යමෙකු පසුතැවිලිවී, යේසුස්වහන්සේ වෙතට හැරී ආ විට ඔබට කෙසේ හැඟෙන්නේද?
- යමෙකු පසුතැවිලිවූ විට, ස්වර්ගය සහ දේවදූතයන් ප්‍රීතිවන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (ලූක් 15:7, 10.)

2. අකීකරු පුත්‍රයා

- අකීකරු යන්නෙහි අදහස කුමක්ද? (හිතුවක්කාර සහ නාස්තිකාරවීමය)
- තමාගේ උරුමයට අකීකරු පුත්‍රයා කුමක් කළේද? (ලූක් 15:12–13.) "ධර්මිෂ්ඨව ජීවත්වීම" යන්නෙහි අර්ථය ඔබ සිතන අන්දමට කුමක්ද? මේ ක්‍රමයට ජීවත්වීමට සමහර පුද්ගලයන් තීරණයකරන්නේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? තම පුතා ගියවිට, පියාට කුමක් හැඟුනේදැයි ඔබ සිතන්නේද? ඔබගේ පවුලේ යමෙකු අකීකරු පුත්‍රයා මෙන් ක්‍රියා කළේ නම්, ඔබට හැඟෙන්නේ කෙසේද? (පණත් නොතබන පවුල් සමාජිකයන් සිටින ළමයින් ගැන සංවේදී වන්න.)
- මුදල් ඉවරවූ පසු, කෑම ලබාගැනීමට අකීකරු පුත්‍රයා කුමක් කළේද? (ලූක් 15:14–16.)
- "ඔහු සිහි උපදවාගත් විට" යන්නෙහි අර්ථය කුමක්ද? (ලූක් 15;17.) පුත්‍රයාගේ වේදනාව සහ දුක ඔහුට පසුතැවිලිවීමට උපකාරවීම ගැන ඔබ සිතන්නේ කුමක්ද?
- තම පියා වෙතට හැරීඒමට පුතා තීරණය කළේ කුමක් නිසාදැයි ඔබ සිතන්නේද? (ලූක් 15:17–19.) ඔහුගේ පියා කුමන අන්දමේ ස්වාමියෙක්ද? (ලූක් 15:17.)
- තම පුත්‍රයා ගෙදර පැමිණිවිට පියාට හැඟුනේ කෙසේද? (ලූක් 15:20.) තම පුතාට ඔහු කළේ කුමක්ද? (ලූක් 15:22–24.)
- තම බාල සහෝදරයා ගෙදර පැමිණි බව දැනගත්විට, වැඩිමහල් පුත්‍රයාට කුමක් හැඟුනේද? (ලූක් 15:28–30.) පණත්වලට අකීකරුවන පවුලේ සාමාජිකයන්ට නොකඩවා ප්‍රේමකිරීම වැදගත්වන්නේ කුමක් නිසාද?
- වැඩිමහල් සහෝදරයාට පියා පොරොන්දුවූයේ කුමක්ද? (ලූක් 15:31.) පාපයට වැටී පසුව පසුතැවිලිවූ අයට සලකන අන්දම ගැන පියා තැබූවේ කුමන ආදර්ශයක්ද? (ලූක් 15:32.) යමෙකු පසුතැවිලිවී වැරදි දෙයින් හරි දෙයට හැරුනු යමෙක් ඔබ දකින විට, ඔබට කෙසේ හැඟෙන්නේද? පණත් නොතැබූ නමුත් අවංකව කණගාටුවන පුද්ගලයන්ට අප සැලකිය යුතු වන්නේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. අඩු ක්‍රියාකාරීත්වයෙන් යුත් ළමයෙකුට උපකාරකිරීමේ මාර්ග ගැන සිතීමට ළමයින්ට සලස්වන්න. (පිළිතුරු-වලට, මිතුරුවීම, යහපත් ආදර්ශයක් වීම, සභාවේ ක්‍රියාකාරකම්වලට ආරාධනාකිරීම, එක්ව යම් දේවල් කිරීම යනාදිය ඇතුළත්විය හැකිය.)
2. පහත සඳහන් කථාන්තරය කියන්න:

අවුරුදු දහයක් වයසැති ජොසුවා ඩෙනිස් තම පියා සහ තවත් අය සමග පාළුවී ගිය පතලක් පරීක්ෂාකර බැලීමට ගියේය. පතල තුළදී ඔහු ප්‍රවේශම්වූ නමුත්, අනෙක් ළමයින්ගෙන් වෙන්වී, කෑම හෝ වතුරවත් නැතිව අඳුරේ මංමුලා විය. ඔහු නැතිවූ බව අන් අය දැනගත් විට, ඔහු සෙවීමට ඔවුහු වහාම පටන් ගත්හ. ස්වල්ප වෙලාවකට පසු සිය ගණනක් ජනතාව ජොසුවා සෙවීමට පටන් ගත්හ. ඔහුව නිරුපද්‍රිතව සොයාගැනීම පිණිස තවත් දහස් ගණනාවක් නිරාහාරව යාච්ඤා කළහ. සොන අය දවස් පහක් සෙව්ව නමුත්, ඔවුන්ට ඔහුව සම්බ-වුනේ නැත. මෙය ඇසූ පතල ගැන දැන සිටි විශේෂඥයෙක් උදව්කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය. ඔහු පතල ගැන මනාව දැනසිටිය නිසා, වෙනත් අය නොදන්නා ස්ථානයක සිටි ජොසුවා සොයා ගත්තේය. ඔහු ජොසුවා සොයාගත් විට, ඔහුට හැඟුන ප්‍රීතිය විස්තරකිරීම ආරම්භකිරීමට ඔහුට නොහැකි විය. ජොසුවා නිරුපද්‍රිතව

ජීවත්වන බව ඇසූ පතලේ සියලු දෙනා සහ දහස් ගණන් අන් අයද සතුටු කඳුළු හෙළුවෝය (බලන්න “Making Friends: Joshua Dennis—A Treasure of Faith,” *Friend*, නොවැ. 1990, පිටු. 20–22).

ශාරීරිකව නැතිවීම සහ ආත්මිකව නැතිවීම යන දෙක අතර වෙනස සාකච්ඡාකරන්න. ශාරීරිකව නැතිවූ අය මෙන්ම, ආත්මිකව නැතිවූ අයද ගලවාගැනීමට එලෙසම අප මහන්සිවී කටයුතු කළ යුතු බව පහදා දෙන්න.

3. සෙවීමේ සහ සම්භවීමේ ක්‍රීඩාව කරන්න. ඔහු හෝ ඇය නැතිවීමට හැකි ස්ථානයක් ගැන සිතා එය කඩදාසියක ලිවීමට හෝ ගුරුවරයාට රහසින් කීමට ලමයෙකුට කියන්න. ලමයා සිටින තැන තීරණයකර ගැනීමට “ඔව්” හෝ “නැත” යන ප්‍රශ්නය ඇසීමට අනෙක් ලමයින්ට කියන්න. (එය සෙනග ගැවසෙන ස්ථානයක්ද? එය කන්දක් උඩද? එය යම් දෙයක් යටද?). නැතිවූ කෙනෙකු, විශේෂයෙන් ආත්මිකව නැතිවූ කෙනෙකු සොයාගැනීමට අවශ්‍ය කාලය සහ උත්සාවය ගැන තේරුම්ගැනීමට ලමයින්ට උපකාර කරන්න.

4. දහම සහ ගිවිසුම 18:10 කටපාඩම්කිරීමට ලමයින්ට උපකාරවන්න.

## අවසානය

**සාක්ෂිය**

ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ එක් එක් ලමයාට ප්‍රේමකරන බවත්, අප සියලුදෙනාම උන්වහන්සේට වැදගත් බවත් යන ඔබගේ විශ්වාසය ලමයින් සමග බෙදාගන්න. නැතිවූ අය ඔවුන් වෙතට ආපසු ඒමට අප උපකාර කිරීම ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍ය බව අවධාරනය කරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ලූක් 15:11–32 අධ්‍යයනය කිරීමට ලමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනා කරන්න.

# යහපත් සමාරියාගේ උපමා කථාව

20

වෙනි පාඩම

**අරමුණ** සියලුම ජනතාවට ප්‍රේමය දැක්වීමේ ආශාවක් ඇතිකිරීමට එක් එක් ලමයාට උපකාරවත්වීමය

**සූදානම්වීම**

1. ලූක් 10:25–37 සහ මතෙව් 22:34–40 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර කමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම තීරණය කරන්න. (බලන්න "ඔබගේ පාඩම් සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: යොහාන් 14:15, 21; 1 යොහාන් 4:20–21.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. 7-21 පින්තූරය යහපත් සමාරියා (සුභාරංචි කලා පින්තූර මෙවලම 218; 62156), සහ 7-22, ශුද්ධ දේශයේ සිතියම

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ලමයෙක් කැඳවා "(නම), ඔබගේ අසල්වැසියා කවුද?' කියා අසන්න. ලමයින් කිහිපදෙනෙකුගෙන්ම එම ප්‍රශ්නය අසන්න. අප අසල ජීවත්වන යමෙකු අපගේ අසල්වැසියා බවට අප සාමාන්‍යයෙන් සිතන බව පහදා දෙන්න. අපගේ අසල්වැසියා කවුද, අප ඔවුන්ට සැලකිය යුතු අන්දම ගැනද යේසුස්වහන්සේ ඉගැන්වූ දේවල් තේරුම්ගැනීමට මෙම පාඩම අපට උපකාරවත් වන්නේය.

මතෙව් 22:34–40 කියවීමට ලමයෙකුට සලස්වන්න. අන්‍යයන්ට ප්‍රේමකිරීමේ වැදගත්කම ගැන සාකච්ඡාකරන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

යහපත් සමාරියයා සහ ශුද්ධ දේශයේ සිතියම ඇතුලත් පින්තූර පෙන්වන්න. ලූක් 10:25–37 සඳහන් යහපත් සමාරියයා ගැන උපමා කථාව උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා, බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) සිතියමේ සමාරියාව සහ යුදාව ලමුන්ට පෙන්වන්න, අනතුරුව යුදෙව්වරු සහ සමාරියන් අතර තත්වය පහදා දෙන්න. සමාරියන්ට වඩා තමන් වඩා හොඳ බව යුදෙව්වරුන්ට හැඟුනි. සමාරියන්ට ඉතාම අකමැතිවූ නිසා යුදෙව්වරු යෙරුසලමේ සිට ගලීලයට ගමන්කරන විට, සමාරිය මැදින් යෑම වැළැක්වීමට ජෝර්දාන් මිටියාවත මැදින් දිගු මාර්ගයක ඔවුහු යති. මෙම ශුද්ධ ලියවිලි විස්තරය ලමුන් ලවා රඟදැක්වීමට ඔබට අවශ්‍යවනවා ඇත.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ලමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- සදාකාල ජීවනය උරුමකර ගැනීමට අප කුමක් කළ යුතුදැයි යේසුස්වහන්සේ කීසේක්ද? (ලූක් 10:27–28.) මෙම පණත් එතරම් වැදගත් බව ඔබ සිතන්නේ කුමක් හෙයින්ද? (මතෙව් 22:37–39.)
- ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට අපගේ ප්‍රේමය දැක්වීමට අපට හැකිවන්නේ කෙසේද? (යොහාන් 13:34–35; 14:15, 21.)
- ඔබගේ අසල්වැසියා කවුද? ඔබ අසල ජීවත්වන ජනතාව පමණක් බව යේසුස් වහන්සේ එයින් අදහස් කළ බව ඔබ සිතන්නේද?

- යහපත් සමාරියාගේ කථාව උන්වහන්සේ කී විට, කුමන ප්‍රශ්නයකට යේසුස්වහන්සේ පිළිතුරු සපයනසේක්ද? (ලූක් 10:25, 29.)
- යුදෙව් පූජකයා සහ ලෙවියා, තුවාලවූ යුදෙව් මිනිසාට උපකාර නොකළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (ලූක් 10:31–32.)
- තුවාලවූ යුදෙව් මිනිසාට සමාරියා කළේ කුමක්ද? (ලූක් 10:33–35.)
- යුදෙව් මිනිසාට සමාරියෙක් උපකාරකිරීමේ වැදගත්කම කුමක්ද? යහපත් අසල්වැසියෙකුගේ කුමන ගුණාංග සමාරියාට තිබුනේද? අපගේ අසල්වැසියා කවුද කියා තේරුම්ගැනීමට මෙම කථාව අපට උපකාරවත්වන්නේ කෙසේද? වඩාත් හොඳ අසල්වැසියෙකු වීමට අපට හැකිවන්නේ කෙසේද?
- ස්වාමීන්වහන්සේට වඩාත් ප්‍රේම කළේ කුමන තැනැත්තාදැ 'යි ඔබ සිතන්නේද? ඒ මන්ද?
- යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීමෙන් අනෙක් ජනතාවට ප්‍රේමය දැක්වීමට අපට හැකිවන්නේ කෙසේද? අපගේ උපකාරය අවශ්‍ය යමෙකුට අප සැලකිය යුත්තේ කෙසේද? අපට වඩා වෙනස් අයෙකුට? අපට අකරුණාවන්තවූ යමෙකුට?

අවශ්‍ය කෙනෙකුට සේවයකිරීම ගැන හෝ, ඔවුන් හෝ ඔවුන්ගේ පවුලට අන්‍යයන්ගෙන් උපකාර ලැබීම ගැන අත්දැකීම් බෙදාගැනීමට ළමුන්ට කියන්න. කොට්ඨාශයේ කිසිම සාමාජිකයෙකුට ලජ්ජා පමුණුවන අන්දමේ කථා බෙදා නොගැනීම ගැන ප්‍රවේශම්වීමට ළමයින්ට කියන්න.

- අන්‍යයන්ට උපකාර කිරීමෙන් හෝ සේවය කිරීමෙන් ඔබ ප්‍රේමය දක්වන විට, ඔබට හැඟෙන්නේ කෙසේද? ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට වඩාත් සමීපතාවේ හැඟීමක් ඔබට දැනෙනවාද? ස්වර්ගීය පියාණන්වහන්සේට සහ අපගේ අසල්වැසියන්ට අප ඇත්තවශයෙන්ම ප්‍රේමකරනවා නම්, කුමන ආකාරයේ ශ්‍රේෂ්ට ආශිර්වාද අපි උරුමකර ගන්නෙමුද? (ලූක් 10:25–28.)

---

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. පහත සඳහන් ක්‍රියාකාරකම් වෙන වෙනම කඩදාසි කැලිවල ලියන්න. අ සහ ආ කොටස් එම කඩදාසි කැල්ලේම ලියා, ඉන් එක බැගින් එක් එක් ළමයාට දෙන්න. අවට පිහිටි ප්‍රදේශයට අලුතෙන් ළමයෙක් පැමිණ සිටින බව සිතින් සිතාගැනීමට ළමුන්ට කියන්න. මෙම අලුත් ළමයාට අසල්වැසියෙකුට ප්‍රේමය දැක්වීමේ යමක් ඔවුන්ට කළ හැකි බව ඔවුන්ගේ කඩදාසියේ අ කොටසින් ඔවුන්ට කියයි. ස්වර්ගීය පියාණන්වහන්සේට ප්‍රේමය දැක්වීමේ ඒ හා සමාන මාර්ගයක් ආ කොටසින් කියයි. අංක 1 ඇති ළමයාට ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම කියවීමටද, ඉන්පසු අංක 2 යනාදී වශයෙන් කියවීමට කියන්න.

   (1) අ. ඔහු හෝ ඇය නිවසේදී බැහැදකින්න.
   ආ. ප්‍රාථමිකයේ සහ වෙනත් සභා රැස්වීම්වලට යන්න.

   (2) අ. ඔහුව හෝ ඇයව ඔබගේ නිවසට ආරාධනාකරන්න.
   ආ. ඔබගේ නිවස ස්වර්ගීය පියාණන්වහන්සේගේ ආත්මය වැඩසිටීමට හැකි ස්ථානයක් කරන්න.

   (3) අ. ළමයා ගැන යමක් ඉගෙනගන්න.
   ආ. ශුද්ධ ලියවිලි කියවන්න.

   (4) අ. ඔහු හෝ ඇය සමග කථාකරන්න.
   ආ. යාච්ඤාකරන්න.

   (5) අ. ළමයා වෙනුවෙන් යමක් කරන්න.
   ආ. පණත්වලට කීකරුවන්න.

   (6) අ. ඔහුගේ හෝ ඇයගේ පවුලේ අයට යමක් කරන්න.
   ආ. අන් අයට සේවයකරන්න.

(7) අ. ඔබගේ ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට ළමයාට ආරාධනාකරන්න.
ආ. ස්වර්ගීය පියාණන්ගේ ආත්මය ඔබ සමග සිටීමට යාච්ඤාකරන්න.

2. දස පණත කියවන්න (නික්මයාම 20:8–17). මතෙව් 22 යේසුස්වහන්සේ දී තිබෙන පණත් දෙකට ඒවා සමානකරන්න. රටහුණු ලෑල්ලේ එක් පැත්තක ස්වර්ගීය පියාණන්වහන්සේට ප්‍රේමකරන්න යයිද, අනික් පැත්තේ අනායයන්ට ප්‍රේමකරන්න යයිද ලියන්න. දස පණතේ එක් එක් කොටසක් කුමන තීරුව යටට යනවාද කියා ඔබට කීමට ළමයින්ට කියන්න. යොහාන් 14:15, 21 කියවා, ඕනෑම පණතක් තැබීමෙන් ස්වර්ගීය පියාණන්වහන්සේට අපගේ ප්‍රේමය පෙන්වීමට එය උපකාරවන බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න.

3. මතෙව් 22:37–39 කටපාඩම්කිරීමට ළමුන්ට සලස්වන්න.

---

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට ඔබගේ ප්‍රේමයද, සුභාරංචියට ඔබගේ කෘතඥතාවයද ප්‍රකාශකරන්න. අනායයන්ට ප්‍රේමකිරීමේ යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකිරීමට ළමුන්ව දිරිගන්වන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් ලූක් 10:25–37 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනාකරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

# 21
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුෂ්ඨ රෝගීන් දසදෙනෙකු සුවපත් කරනසේක

**අරමුණ**

ඔහුට හෝ ඇයට ලැබෙන ආශිර්වාදවලට ස්වර්ගීය පියාණන්වහන්සේට ස්තුතිකිරීම පිණිස එක් එක් ළමයා දිරිමත් කිරීමය.

**සූදානම**

1. ලූක් 17:12–19 සහ දහම සහ ගිවිසුම යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම් සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. 00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. ළමයෙකු කළ යම් දෙයක් ගැන හෝ ඔහු හෝ ඇය පිළිඹිබුකරන යම්කිසි ගුණාංගයක් ගැන ඔබගේ කෘතඥතාවය පළකරමින්, පංතිය වේලාවේදී භාවිතා කිරීමට එක් එක් ළමයෙකු සඳහා ස්තුතිදීමේ කෙටි සටහනක් එක් එක් ළමයෙකු සඳහා ලියන්න.
4. *ස්වර්ගීය පියාණන්වහන්සේට ස්තුතිකිරීමට සිහිතබාගන්න* යන්න කාඩ් පතක එක් එක් ළමයෙකු සඳහා ලියන්න.
5. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා.
   ආ. දහම සහ ගිවිසුමේ පිටපත් එකක් හෝ ඊට වැඩියෙන්.
   ඇ. 7-23 පින්තූරය, කුෂ්ඨ රෝගීන් දසදෙනා (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 221; 62150).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

එක් එක් ළමයෙකු සඳහා ඔබ සූදානම්කළ ස්තුති සටහන් ළමයින්ට දෙන්න. එම සටහන් ඔවුන් කියෙව්වාට පසු, මිනිසුන් අපට කෘතඥතාවය පළකළ විට, අපගේ හැඟීම් ගැන ඔවුන් සමග සාකච්ඡාකරන්න. යමෙක් ඔබට ස්තුතිකිරීමට විශේෂ උත්සාහයක් දැරූ විට, ඔබට හැඟුන අන්දම විස්තර කරමින් ඔබගේ අත්දැකීම් බෙදාගැනීමට ඔබට අවශ්‍යවනවා ඇත. ළමයින්ර ඇතිවූ ඕනෑම අත්දැකීමක් බෙදාගැනීමට ඔවුන්ට ආරාධනාකරන්න.

**ශුද්ධ ලියවිලි විස්තර**

කුෂ්ඨ රෝගීන් දසදෙනාගේ පින්තූරය පෙන්වමින් ලූක් 17:12–19 සඳහන් කුෂ්ඨ රෝගීන් දසදෙනා යේසුස්වහන්සේ සුවකළ කථාව උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. vii.) කුෂ්ඨ රෝගය භයානක සමේ රෝගයක් බව ළමුන්ට මතක්කරන්න. එය අධික ලෙස බෝවෙන රෝගයක් බව ඒ කාලයේ මිනිස්සු සිතුහ. යේසුස් වහන්සේගේ කාලයේදී කුෂ්ඨ රෝගීන්ට නගරයේ ජීවත්වීමටවත්, වෙනත් මිනිසුන්ට වෙතට ලංවීමටවත් ඉඩ නොතබන ලදී.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනයකරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස්වහන්සේව දුටු විට, කුෂ්ඨ රෝගීන් කළේ කුමක්ද? (ලූක් 17:13.) ඔවුන් යේසුස්වහන්සේ දැන උන්වහන්සේ තුළ විශ්වාස කළේදැයි ඔබ සිතන්නේද?
- සුවවීම පිණිස කුෂ්ඨ රෝගීන්ට කිරීමට යේසුස්වහන්සේ කුමක් කීසේක්ද? (ලූක් 17:14.)

- යේසුස්වහන්සේට ස්තුතිකිරීමට කුෂ්ඨ රෝගීන් කී දෙනෙක් ආපසු පැමිණියේද? (ලූක් 17:15–16.) කුෂ්ඨ රෝගීන් ගැන යේසුස්වහන්සේ කීවේ කුමක්ද? (ලූක් 17:17–19.)
- කුෂ්ඨ රෝගීන් නමදෙනෙක්ම යේසුස්වහන්සේට ස්තුතිකිරීමට ආපසු නොපැමිණියේ කුමක් නිසාදැයි ඔබ සිතන්නේද?
- ඔබ පුද්ගලයන් දහ දෙනෙකුට උදව්කළාට පසු ස්තුතිකිරීමට එක් අයෙකු පමණක් ආපසු පැමිණිය හොත් ඔබට හැඟෙන්නේ කෙසේද?
- කුමක් උදෙසා ස්වර්ගීය පියාණන්වහන්සේට අප ස්තුතිකළ යුතුද? දහම සහ ගිවිසුම 59:7 කියවන්න නැතිනම් ළමයෙකු ලවා කියවන්න. අපට ලැබෙන විශේෂිතවූ ආශිර්වාද වෑවට්ලටස්වර්ගීය පියාණන්වහන්සේට ස්තුතිකි-රීමේ වැදගත්කම කුමක්ද?
- ස්වර්ගීය පියාණන්වහන්සේට අපගේ කෘතඥතාවය ප්‍රකාශකිරීමට අපට හැකිවන්නේ කෙසෙ-ද?

ඔබ සූදානම්කළ කාඩ් පත් එක බැගින් එක් එක් ළමයාට දෙන්න. ස්වර්ගික පියාණන්වහන්සේට ඔවුන්ට ස්තුතිකළ හැකි යම් දේවල් කිරීමට ළමයින්ට ආරාධනාකරන්න. ඔවුන්ගේ පිළිතුරු රටහුණු ලෑල්ලේ සාරාංශ ගතකිරීමට ඔබට අවශ්‍යවනවා ඇත.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය

1. දහම සහ ගිවිසුම 59:7 කටපාඩම් කිරීමට ළමුන්ට උපකාරකරන්න. "ස්වර්ගීය පියාණන්වහන්සේට ස්තුතිකි-රීමට සිහිතබාගන්න" ඔවුන්ගේ කාඩ් පතෙහි පිටුපස මෙම ශුද්ධ ලියවිල්ල ලිවීමට ළමුන්ට සලස්වා දිනපතා ඔවුන්ට පෙනෙන ස්ථානයක මෙම කාඩ් පත තැබීමට ඔවුන්ව දිරිගන්වන්න.
2. *කෘතඥතාවය* යන වචනය හුණුලෑල්ලේ ලියන්න. මෙම වචනයේ එක් එක් අකුරකින් පටන්ගන්නා දේවල් නම්කරමින් ඒවාට කෘතඥවීමට ළමුන්ට සලස්වන්න. අපට තිබෙන සහ තිබුන සියලුම දේවල්වලට අප ස්වාමීන්වහන්සේගෙන් යැපෙන බව අවබෝධකර ගැනීමට ඔවුන්ට උපකාරවන්න.
3. පහත සඳහන් රූප සටහනට සමාන එකක් රටහුණු ලෑල්ලේ අඳින්න:

**කෘතඥතාවය**

| *කියන්න* | *පෙන්වන්න* |
|---|---|
| දෙමව්පියන් | පණත්වලට කීකරුවන්න |
| මිතුරන් | අන්‍යයන්ට සේවයකරන්න |
| කෑම | යාච්ඤාකරන්න |
| ඇඳීම | |

"ඔබට ස්තුතියි" යන්න ස්වර්ගීය පියාණන්වහන්සේට කීමට හැකි විශේස දේවල් නම්කිරීමට ළමුන්ට සලස්වන්න. *කියන්න* යන වචනය යටතේ ඒවා ලැයිස්තුගත කරන්න. ඉන්පසු මෙම ආශිර්වාදවලට ඔවුන්ගේ කෘතඥතාවය උන්වහන්සේට පෙන්වීමට හැකි මාර්ග තීරණයකිරීමට ඔවුන්ට සලස්වන්න.

4. අලංකාර දර්ශන සහ වනජීවී පින්තූර පෙන්වන්න. මැවිල්ල නිරීක්ෂනය කොට, පොළොව සහ එහි ඇති සියලුම දේවල් අප වෙනුවෙන් මැවීම ගැන ස්වර්ගීය පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට අප කෙතරම් කෘතඥවිය යුතුදැයි තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න.

5. දෙමව්පියන්ට, මිතුරෙකුට, අසල්වැසියෙකුට, ගුරුවරයෙකුට, සභානායකයාට, වැනි අයෙකුට ඔබට ස්තුතියි සටහනක් ලිවීම පිණිස එක් එක් ළමයාට කඩදාසි කැල්ලක් සහ පැන්සලක් දී ලිවීමට සලස්වන්න. එම සටහන දීමට ළමුන්ව දිරිගන්වන්න. නැතිනම් එය පිළිගැන්වීමට අවශ්‍ය උපකාර ලබාදෙන්න.

6. මොසායා 2:19–24 කියවා, බෙන්ජමින් රජු කී දේවල් සාකච්ඡාකරන්න. අප වෙනුවෙන් ස්වර්ගීය පියාණන්වහන්සේ කරන සියලුම දේට කිසිම දිනක ඒවාට නැවත ගෙවීමට අපට නොහැකි බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාර කරන්න; අපට දීමට හැකි සියලුම කෘතඥතාවයන් උන්වහන්සේට දීමට සුදුසුය.

---

## අවසානය

**සාක්ෂිය**

ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ කෙරෙහි ඔබට හැඟෙන කෘතඥතාවය ප්‍රකාශකරන්න. ඔවුන්ගේ ගුරුවරයා වීමට ඔබට ලැබුනු අවස්ථාව සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ඔවුන්ට ඉගැන්වීම පිණිස උපකාරවීමට ඔබට ලැබුන වරප්‍රසාදය ගැනද ඔබගේ කෘතඥතාවය පළකරන්න.

**නිවසේ කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම තිරීක්ෂනය කිරීමක් වශයෙන් ලූක් 17:12–19 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# අකරුණාවන්ත දාසයා

22

වෙනි පාඩම

**අරමුණ**

වඩාත් කමාවීමේ අවශ්‍යතාවය ගැන එක් එක් ළමයාට උපකාරවීමය.

**සූදානම**

1. මතෙව් 18:21–35; 6:12, 14–15; සහ දහම සහ ගිවිසුම 58:42 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිල වලින් ඉගැන්වීම," පි 00 vii.)
2. අමතර කියවීම්: එපීස 4:32, දහම සහ ගිවිසුම 64:8–10 සහ James E. Talmage, *Jesus the Christ,* pp. 392–97 (ලබාගැනීමට හැකි නම්).
3. ළමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ: බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

70, 7න් වැඩිකිරීමට ළමුන්ට කියන්න. (ප්‍රශ්නය රටහුණු ලෑල්ලේ ලිවීමට ඔබට හැකිය.)

- පිළිතුර විශාල අංකයක්ද? එතරම් ගණනක් ගණන්කිරීමට ඔබට කොතරම් කාලයක් ගතවෙයිද?

මතෙව් 18:21–22 එක් ළමයෙකුට කියවීමට කියන්න.

කමාවිදීම ගැන වැදගත් පාඩමක් මෙම අංකයෙන් අපට උගනවන බව පහදා දෙන්න. යමෙකුට කමාවිදීමට අප නිතරම කැමතිවිය යුතු බව යේසුස්වහන්සේ අපට ඉගැන්වූසේක. (සාරවත්කිරීමේ 4 වෙනි ක්‍රියාකාරකමද බලන්න.)

ශුද්ධ ලියවිලි විස්තරය

මතෙව් 18:21–35 සඳහන් අකරුණාවන්ත දාසයාගේ විස්තරය උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.) රඟපෑමට මෙය හොඳ විස්තරයක් වනු ඇත. ළමයි රජතුමාගේද, අකරුණාවන්ත දාසයාගේද, ඔහුගේ අසල්වැසි දාසයන් සහ වෙනත් දාසයන්ගේ කොටස රඟපාන විට, ඔබ හෝ එක් ළමයෙකුට එම පද කියවීමට හැකිය.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- තලෙන්ත 10,000ක් ණයවූ දාසයාට රජතුමා පළමුවෙන් කුමක් කිරීමට අදහස් කළේද? (මතෙව් 18:25.) තලෙන්ත යනු විශාල මුදලක් බව පහදා දෙන්න. (බලන්න *Jesus the Christ,* පිටු. 396–97, for more information on talents.)
- රජතුමා ඔහුගේ සිත වෙනස්කර ගත්තේ කුමක් නිසාද? (මතෙව් 18:26.) ඔහුගේ දාසයා ගැන ඔහුට කුමක් හැඟුනේද? (මතෙව් 18:27.) අනුකම්පාවේ හැඟීම් යන්නෙහි අදහස ඔබ සිතන අන්දමට කුමක්ද?
- රජතුමා ණය වෙනුවෙන් කමාව දුන් විට දාසයා කළේ කුමක්ද? (මතෙව් 18:28.) පැන්ස 100ක් (ඉතාම කුඩා ප්‍රමාණයක්) ණයවූ දාසයාගෙන් තලෙන්ත 10,000ක් ණයවූ දාසයා ඉල්ලුවේ කුමක්ද? (මතෙව් 18:29.) තම සහෝදර දාසයාගේ ආයාචනාවලට දාසයා ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (මතෙව් 18:30.) සිදුවූ දෙය රජතුමා දැනගත් පසු, එතුමා කළේ කුමක්ද? (මතෙව් 18:31–34.)

- අපද සමහර විට අකරුණාවන්ත දාසයා මෙන් හෝ රජතුමා මෙන් හෝ වන්නේ කෙසේද? අන්‍යයන්ට ඔබ කමාව දුන් විටදී, හෝ කමාව නොදුන් විට ඔබට හැඟෙන්නේ කෙසේද?
- දාසයන් දෙදෙනාම වූ ණය වල විශාල වෙනසින් අපට ඉගෙනගැනීමට හැකිවන්නේ කුමක්ද?
- අකරුණාවන්ත දාසයා ගැන උපමා කථාව කීමෙන් යේසුස්වහන්සේ ජනතාවට ඉගැන්වීමට උත්සාහ දැරුවේ කුමක්ද? කමාව ලබාගැනීමට අප කුමක් කළ යුතුදැයි යේසුස්වහන්සේ කීසේක්ද? (මතෙව් 18:35.)

කන්ද උඩ දේශනාවේදී කමාව ගැන කථා කළ යේසුස්වහන්සේගේ යාච්ඤාවේ වාක්‍ය කණ්ඩය සිහිපත්කිරීමට හැකිදැයි ලමුන්ගෙන් අසන්න. ඔවුන්ගේ බයිබල්වල මතෙව් 6:12 පෙරළා මෙම පදය එක්ව කියවීමට ලමුන්ට සලස්වන්න. පද 14 සහ 15 ද කියවන්න.

- යමෙක් තමාට අකරුණාවන්ත දෙයක් කළ යම් අවස්ථාවක් ගැන සිතීමට ලමුන්ට කියන්න. එම අකරුණා-වන්ත දෙය ඔවුන්ට හැඟුනේ කෙසේද? ඔවුන් කළේ කුමක්ද? එවැනි අවස්ථාවකදී අපට කිරීමට යේසුස් ක්‍රිස්-තුස්වහන්සේ ඉගැන්වූයේ කුමක්ද? කමාව දීමට පහසුද? කමාව වැඩියෙන් දීමට අපට හැකිවන්නේ කෙසේද? කිසිවෙක් කිසිවෙකුට අහිතක් නොකළ යුතු අතර, යමෙකු ළමයින්ට අහිතක් කරනවා නම්, ඔවුන් ඔවුන්ගේ දෙමාපියන්ට, විශ්වාසය තැබිය හැකි වෙනත් වැඩිහිටියෙකුට හෝ සභානායකවරයාට ඔවුන් කිව යුතුය.
- ඔබගේ මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට යම් පහත් දෙයක් ඔබ කළේ නම්, ඔබට හැඟෙන්නේ කෙසේද? එසේම ඔබ කණගාටුව ප්‍රකාශ කළ හොත්, එම පුද්ගලයා ඔබට කමාව නොදෙන්නේ නම් ඔබට හැඟෙන්නේ කෙසේද?
- අප යම් වැරදි දෙයක් කිරීමෙන් පසු, ස්වාමීන්වහන්සේගෙන් කමාව අයැදි විට, උන්වහන්සේ අපට දෙන බවට කියා තිබෙන්නේ මොනවාද? (බලන්න ධ්ීසගසී 58:42.)
- තමාට විරුද්ධව පව් කළ කෙනෙකුට කී වතාවක් කමාව දිය යුතුදැයි පේතෘස් යේසුස්වහන්සේගෙන් ඇසූ විට, උනවහන්සේ කීවේ කුමක්ද? (මතෙව් 18:21–22.) පේතෘස්ට ඉගැන්වීමට යේසුස්වහන්සේ උත්සාහ කළේ ඔබ සිතන අන්දමට කුමක්ද? (අන් අයට අප කමාව දීමේ අවස්ථාවන්ට සීමාවක් නොතිබිය යුතුය.)

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. එක් එක් ලමයාට කඩදාසියක් සහ පැන්සලක් දෙන්න. අ ආ ඇ ඈ ඉ ඊ සහ උ කඩදාසියේ පහළට ලියා, කමාව ගැන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට ඔවුන්ට සලස්වන්න. ඔව් හෝ නැත, යනුවෙන් සියලුම ප්‍රශ්නවලට පිළිතුරුදිය හැකිය.

   අ. “මම ඔබට කමාව දෙමි, නමුත් ඔබ කළ දෙය මම අමතක නොකරමි,” මෙසේ ඔබ කියන විට ඔබ කමාව දෙනවාද,
   ආ. ඔබට අකරුණාවන්තවූ යමෙකුට අවාසනාවන්ත යමක් සිදුවූ විට, ඔබ සතුටුවන්නේ නම් ඔබ කමාව දී තිබේද?
   ඇ. ඔබගේ සහෝදරයා හෝ සහෝදරිය ඔබට ගැසූ විට ඔබ වික්ෂිප්ත නොවන්නේ නම්, ඔබ කමාව දෙන්නේද?
   ඈ. ඔබට අකරුණාවන්තවූ යමෙකු සමග සමාදානවීමට ඔබට අවශ්‍ය නම් ඔබ කමාව දෙන්නේද?
   ඉ. ඔබට අකරුණාවන්තවූ යමෙකු සමග ඔබ කථාකිරීම නැවැත්තුවා නම්, ඔබ කමාව දෙන්නේද?
   ඊ. ඔබට අකරුණාවන්තවූ අයෙකු වෙනුවෙන් ඔබ නැගී සිටි විට ඔබ කමාව දෙන්නේද?
   උ. ඔබට අකරුණාවණ්තවූ යමෙකු ගැන ඔබ අකරුණාවන්ත ආකාරයට කථාකළා නම්,

   ඔබ කමා ව න්නේනේද? මෙම ප්‍රහේළිකාවට ඔබ පිළිතුරු සාකාච්ඡාකරන විට, කමාදීමේ අර්ථය සහ වැද-ගත්කම ගැන සාකච්ඡාකරන්න.

2. දහම සහ ගිවිසුම 64:8–10 කියවීමට ලමයෙකුට සලස්වන්න. මෙම පද වාක්‍ය කණ්ඩවලට බෙදා, එක් වාක්‍ය කණ්ඩයක් පංතියට කියවීමට එක් එක් ලමයෙකුට සලස්වන්න. පංතිය කණ්ඩායම්වලටද බෙදා, එක් එක් කණ්ඩායම මෙම ශුද්ධ ලියවිල්ලේ අර්ථය සාකච්ඡාකිරීමට ලමුන්ට සැලැස්වීමට ඔබට හැකිවේ. ඔවුන්ගේ අදහස් බෙදාගනිමින්, සියලුදෙනාටම කමාව දීමට අපට අණ දී තිබෙන බව තේරුම්ගැනීමට ඔවුන්ට උපකාර කරන්න.

3. දහම සහ ගිවිසුම 64:10 හෝ මතෙව් 6:14–15 කටපාඩම්කිරීමට ළමයින් දිරිගන්වන්න.

4. කඩදාසියක් පැන්සලක් හෝ ලකුණුකිරීමේ යමක් ළමුන්ට දෙන්න. හතරැස් කොටු හතක් ඔවුන්ගේ කඩදාසිවල ඇඳීමට කියන්න. ඉන්පසු හතේ කොටු කුට්ටම් හයක් වැඩියෙන් ඇඳීමට ඔවුන්ට කියන්න. ඔවුන් ඔවුන්ගේ කඩදාසියේ තිබූ කොටු දස ගුණයකින් වැඩිවූ වාර ගණනක් යමෙකුට කමාවිය යුතු යයි යේසුස්වහන්සේ අපට කී බව ළමුන්ට කියන්න. ඔවුන් අන්‍යයන්ට නිතරම කමාවිය යුතු යයි උන්වහන්සේ ජනතාවට ඉගැන්වූසේක.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස්වහන්සේ ඉගැන්වූ පරිදි කමාවදීමේ වැදගත්කම ගැන සාක්ෂිදරන්න. ඔවුන් කමාව දෙන විට, අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේගෙන් කමාව ලැබීමට ඔවුන් සුදුස්සන් වන බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න.

**නිවසේදී කීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම තිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 18:21–35 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 23 වෙනි පාඩම

# යහපත් බැටළු එඬේරා

**අරමුන** යේසුස්වහන්සේ යහපත් බැටළු එඬේරා බැවින් උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට ලමුන්ට ඉගැන්වීමය.

**සූදානම්වීම**

1. යොහාන් 10:1–18, මාර්ක් 10:13–16, සහ 3 නීෆායි 11:37–38 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ලමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: මතෙව් 19:13–15 සහ ලූක් 18:15–17.
3. ලමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතා හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. මෝර්මන්ගේ පොතක් එක් එක් ලමයා සඳහා.
   ඇ. 7-19 පින්තූරය, යහපත් බැටළු එඬේරා සහ 7-24, ක්‍රිස්තුස්වහන්සේ සහ ලමයි (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම, 216; 62467).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනා කරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම** පුද්ගලයෙකුට තිබෙන යම් යම් වගකීම් ගැන ඔබ කියන්ට යන බව ලමුන්ට පහදාදෙන්න. එම පුද්ගලයා කරන දේවල් ගැන වරකට එක බැගින් ඉඟියක් ඔබ දෙන බව ඔවුන්ට කියන්න. පුද්ගලයා කරන දෙය ඔවුන් දැනගත් බව සිතනවිට, කාමරයේ ඉදිරියට ඔවුන් පැමිණ පිළිතුර ඔබට රහසින් කිව යුතුය. ඔවුන් හරි නම්, ඔවුන් සිටගෙන රැඳී-සිටිය යුතුය. ඔවුන් වැරදි නම්, වාඩිවිය යුතුය. පහත සඳහන් ඉඟි වැනි දේවල් භාවිතාකරන්න:

මම එළිමහනේ වැඩකරමි.
මගේ රැකවරණය යටතේ සිටින අය ගැන මම ඉතාම සැළකිලිමත් වෙමි.
වන සතුන් සහ සොරුන් සමග සමහරවිට මට සටන්කිරීමට සිදුවේ.
මා ඉතා පරීක්ෂාකාරී විය යුතුය.
පැටවුන්ව මා ආරක්ෂාකරගත යුතුවේ.
නැතිවූ අය ගැන මා සොයාබැලිය යුතුවේ.
මා රැකබලාගන්නා අය මගේ හඬ හඳුනන අතර, මා අනුගමනය කරති.
යහපත් ගොදුරු බිම් සහ පිරිසිදු ජලය මගේ රැකවරණය යටතේ සිටින අයට මම සොයමි.
මෙම වගකීම් ඇති සමහර පුද්ගලයන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැන දේවදූතයෝ නිවේදනය කළහ.
මම බැටළුවන් රැකබලා ගනිමි.

එම පුද්ගලයා එඬේරෙකු බව සියලුම ලමයි දැනගත් විට, ඔවුන්ගේ වාඩිවන ස්ථානවලට ආපසු යාමට සලස්වන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සෙ-වූ යහපත් බැටළු එඬේරා ගැන මෙම පාඩමෙන් ඔවුන් ඉගෙනගැනීමට යන බව ඔවුන්ට පහදාදෙන්න.

**ශුද්ධ ලියවිලි විස්තර** යහපත් බැටළු එඬේරාගේ පින්තූරය පෙන්වන්න. යහපත් එඬේරුන් ඔවුන්ගේ බැටළුවන්ට කැපවී සිටින බැවින් උන්-වහන්සේගේ අනුගාමිකයන්ට යේසුස්වහන්සේගේ සම්බන්ධය එඬේරෙකු වශයෙන් සංකේතවත්කරන බව පහදා දෙන්න. බයිබලීය කාලයේදී, රැල රාත්‍රියේදී බැටළු කොටුවට (වෘකයන් රිංගාගැනීම වැළැක්වීම පිණිස කටු වැටක් තබන ලද උස බිත්ති) තුලට දක්කන ලදී. එක් එක් එඬේරෙක් වාර අනුව, විවෘත ඇතුල්වීමේ ස්ථානයේ, ඇත්තවශ-යෙන්ම දොරක් හෝ දොරටුවක් වැනි ස්ථානයේ හරහට දිගාවෙමින් බැටළුවන් ආරක්ෂා කළේය (යොහාන් 10:7, 9).

වන මෘගයෙක් බිත්ති උඩින් පැන ආ විට, අවශ්‍ය නම්, බැටළුවන් ආරක්ෂාකිරීම පිණිස එඬේරා තම ජීවිතය පවා දෙන්නේය. එඬේරුන් උදෑසන තම රැල කැඳවන විට, තම ස්වාමියාගේ කැඳවීමේ හඬ එක් එක් බැටළුවා හඳුනාගන්නේය. බැටළුවන්ගේ ආරක්ෂාව පිණිස ස්වාමියා සරු ගොදුරු බිම්වලට ඔවුන්ට මග පෙන්වන විට, බැටළුවන් ස්වාමියාගේ ලඟින්ම යා යුතුය.

යොහාන් 10:1–6 සඳහන් යහපත් බැටළු එඬේරාගේ උපමා කථාව ළමයින්ට උගන්වන්න, (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත මාර්ග සඳහා, බලන්න" ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. vii.)

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- බැටළුවන් ඔවුන්ගේ එඬේරාව අනුගමනය කරන්නේ කුමක් නිසාද? (යොහාන් 10:4.) "ඔහුගේ හඬ අඳුනති" යන්නෙහි අර්ථය ඔබ සිතන අන්දමට කුමක්ද? අප හඳුනාගත යුතු වන්නේ කාගේ හඬද? ගැලවුම්කරුවාණන්ගේ හඬ හඳුනාගැනීමට අපට හැකිවන්නේ කෙසේද?
- අද සිටින ආත්මික සොරුන් සහ කොල්ලකරුවන් කවුරුන්ද? (යොහාන් 10:1.) (යේසුස් නම්වූ ඔවුන්ගේ එඬේරාගෙන් ඔවුන්ව පිටතට හරවන පුද්ගලයන් හෝ ඊට අනුබල්දීමට හැකි දේවල් ගැන සිතීමට ළමුන්ට උපකාරවන්න.) "සොරුන් සහ කොල්ලකරුවන්" මගින් බැටළුවන් නොමගට හැරවීමට නොහැකිවූයේ කුමක් නිසාද? (යොහාන් 10:8.) නපුරු බලපෑම්වලින් අපව ආරක්ෂාකර ගැනීම පිණිස අපට හැකිවන්නේ කෙසේද? මෙම බලපෑම්වලින් අපව ආරක්ෂාකිරීමට උපකාරකළ හැකි වන්නේ වෙන කාටද? (ශුද්ධාත්මයාණන් වහන්සේ, අනාගතවක්තෘවරයා, දෙමාපියන්, යහපත් මිතුරන්, ගුරුවරුන්, සහ සභානායකවරයා.)
- යේසුස්වහන්සේ යහපත් එඬේරා වන්නේ කෙසේද? (යොහාන් 9:10–11.) යේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරා නම්, අපි කවුරුන් වන්නෙමුද? යේසුස්වහන්සේ යහපත් බැටළු එඬේරා බව දැනගැනීම, උන්වහන්සේව අනුගමනයකිරීමට අපට උපකාර වන්නේ කෙසේද?
- යහපත් බැටළු එඬේරා උන්වහන්සේගේ බැටළුවන්ට ප්‍රේමය පෙන්වන්නේ කෙසේද? (යොහාන් 10:11.) නැවත ගන්නා පිණිස ප්‍රාණය දීමේ බලය යේසුස්වහන්සේට ලැබුනේ කාගෙන්ද? (යොහාන් 10:17–18. උන්වහන්සේගේ මව මැරෙන සුළුවූ බැවින්, මරණයට පත්වීමේ හැකියාව උන්වහන්සේට තිබුනි. ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ පියාණන්වූ නිසා, උන්වහන්සේගේ ප්‍රාණය නැවත ගැනීමට එතුමාට හැකියාව තිබුනි.) "යහපත් බැටළු එඬේරා බැටළුවන් උදෙසා තම ප්‍රාණය දෙන්නේය," අපට හැඟෙන එහි අර්ථය කුමක්ද? (යොහාන් 10:11.)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත් බැටළු එඬේරා වන එක් කරුණක් නම්, එතුමා ස්වේච්ඡාවෙන්ම අපගේ පාපවලට වද වේදනා විඳ, එතුමාගේ ප්‍රාණය අප වෙනුවෙන් පූජාකළ බැවින් බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න. එම නිසා අප සියලුදෙනාටම නැවත මළවුන්ගෙන් නැගිටීමට, පසුතැවිලිවීමට සහ අපගේ පාපවලට කමාව ලබාගැනීමටද හැකියාව ඇත.

යහපත් බැටළු එඬේරා තම බැටළුවන්ව රැකබලාගන්නා මාර්ගයක් පෙන්වන තවත් කථාන්තරයක් ඔබ කීමට යන බව පහදා දෙන්න. ක්‍රිස්තුස්වහන්සේ සහ කුඩා ළමයින්ගේ පින්තූරය පෙන්වන්න. යේසුස්වහන්සේ කුඩා ළමයින්ට ආශිර්වාදකරන කථාන්තරය උගන්වන්න. (බලන්න මාර්ක් 10:13–16.)

- කුඩා ළමයින්ගේ පැමිණීම වැළැක්වීමට යේසුස්වහන්සේගේ ගෝලයන් උත්සාහ දැරුවේ කුමක් නිසාද? (ජෝසෆ් ස්මිත් පරිවර්තනය මතෙව් 19:13.) කුඩා ළමයින්ගේ පැමිණීම වැළැක්වීමට ගෝලයන් උත්සාහ දැරූ විට, යේසුස්වහන්සේ කුමක් කළසේක්ද? (මාර්ක් 10:14.) උන්වහන්සේ ළමයින්ට කමක් කළසේක්ද? (මාර්ක් 10:16.) ඔබ එයින් එක් ළමයෙකු වූවා නම්, ඔබ සිතන අන්දමට ඔබට හැඟෙන්නේ කෙසේද? යේසුස්වහන්සේ අපට ප්‍රේමකරන බව දන්නා බැවින් උන්වහන්සේව අනුගමනයකිරීම වඩා පහසුවන්නේ කෙසේද?
- දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමට අපට අවශ්‍ය නම්, "ලදරුවෙකු මෙන් විය යුතුවීම" අපට අවශ්‍ය බව යේසුස්වහන්සේ කීසේක. (මාර්ක් 10:15; මෝසායා 3:19; 3 නීෆයි 11:37–38). "ලදරුවෙකු මෙන් විය යුතුවීම" යන්නෙහි අර්ථය ඔබ සිතන අන්දමට කුමක්ද? ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීම පිණිස ඔබ කුමන අන්දමේ කෙනෙක් විය යුතුදැයි ඔබ සිතන්නේද? අප ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීම යේසුස්වහන්සේට අවශ්‍යවන්නේ කුමක් නිසාද?

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක්, හෝ අභියෝගයක් මෙන් භාවිතා කිරීමට ඔබට හැකිය.

1. අවම වශයෙන් අඟල් දොළහක් පමණ දිග ලනු කෑල්ලක් එක් එක් ළමයාට දෙන්න. ලනු කෑල්ල මේසයක් මත හෝ පොළොව මත ඔවුන් ඉදිරියේ ඍජුව තබා, එය පැත්තකට තල්ලු කිරීමට උත්සාහදැරීමට ළමයින්ට කියන්න. ඉන්පසුව ඔවුන්ගේ ලනු කෑලි ඔවුන් වෙතට ඇදීමට කියන්න. යහපත් බැටළු එඬේරුන් ඔවුන්ගේ බැටළුවන්ට මග පෙන්වන ආකාරය මෙම අත්දැකීම මගින් විස්තර කරන්න (යොහාන් 10:4.) ඉශ්‍රායෙල්හි බැටළු එඬේරුන් බැටළුවන්ට පෙරටුවෙන් ගමන් කරමින් ඔවුන්ට මග පෙන්වන බව පහදා දෙන්න. වෙනත් සමහර රටවල බැටළු එඬේරා බැටළුවන්ව දක්කාගෙන යයි. අපගේ යහපත් බැටළු එඬේරා වන යේසුස්ව-හන්සේ, මගපෙන්වමින්, උන්වහන්සේව අනුගමනය කිරීමට අපට කියනසේක.
2. ගීතාවලිය 23 කියවා, ළමයින් සග සාකච්ඡාකරන්න.
3. පංතිය කුඩා කණ්ඩායම්වලට බෙදන්න. යේසුස්වහන්සේ අපට පෙන්වූ, නොකඩවාම පෙන්වන, ප්‍රේමයේ මාර්ග ගැන සිතීමට ළමුන්ට සලස්වන්න. (සමහර අදහස් මේවා විය හැකිය, ආදම්ගේ වරදට වන්දි ගෙවීම, අපගේ පව්වලට වද විඳීම, ශුද්ධ ලියවිලි මගින් අපට ශුභාරංචිය ඉගැන්වීම, ආදර්ශයක් වීම, අපට උපකාර අවශ්‍ය විට, උපකාරකිරීම, යනාදියයි). යේසුස්වහන්සේ අපට ප්‍රේමකරන බව දැනගැනීමට මේවා අපට උපකාරවන අන්දම ගැන සාකච්ඡාකරන්න.
4. නිෆායි ළමයින්ට යේසුස්වහන්සේ ආශිර්වාදකරන විස්තරය කියවා සාකච්ඡාකරන්න. (3 නිෆායි 17:12–13, 21–24).
5. ඇදහිල්ලේ පළමු කරුණු තුනෙන් එකක් හෝ සියල්ලම හෝ ළමයින් සමග නැවත බලන්න.
6. යොහාන් 10:11 කටපාඩම් කිරීමට ළමුන්ට උපකාර කරන්න.

## අවසානය

**සාක්ෂිය**

යේසුස්වහන්සේ අප එකිනෙකාට ප්‍රේමකරන බවද, අප උන්වහන්සේව අනුගමනයකිරීම උන්වහන්සේට අවශ්‍ය බවද ගැන සාක්ෂි දරන්න. ඔබගේම ජීවිතය තුල යේසුස්වහන්සේගේ ප්‍රේමය ඔබට හැඟුන බවට හෝ උන්වහන්සේව ඔබ අනුගමනය කිරීමෙන් ඔබට ලැබුන ආශිර්වාද ගැන අත්දැකීමක් බෙදාගන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන්, යොහාන් 10:1–8 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# වැන්දඹු ස්ත්‍රියගේ පඬුර

24

වෙනි පාඩම

| | |
|---|---|
| **අරමුණ** | දසයෙන් කොටස සහ වෙනත් පඬුරු අවංකව ගෙවීමට එක් එක් ළමයා දිරිගැන්වීමය. |

**සූදානම්වීම**

1. මාර්ක් 12:41–44, 3 නිෆායි 24:10, සහ දහම සහ ගිවිසුම 119:4 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න, (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර ඉගැන්වීම්: ලූක් 21:1–4 සහ දහම සහ ගිවිසුම 64:23.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. කාසි දහයක් (හෝ කාසි මෙන් පෙන්වීමට රවුම් දහයක් හුණු ලැල්ලේ අඳින්න).
   ඇ. කඩදාසි සහ පැන්සල් එක් එක් ළමයා සඳහා.

**යෝජිත පාඩම**

**වැඩිදියුණුකිරීම** — ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම — කාසි දහය පංතියට පෙන්වන්න.

- මෙම කාසි ලබාගැනීමට කැමති කවුද?
- මෙම කාසි සියල්ල මා ඔබලාට දුන්නොත් එයින් එකක් මට ආපසු දීමට ඔබලා කැමතිද? ඒ මන්ද? එකක් හෝ දෙකක් නැතිනම් සියල්ල පවා ආපසු මට දීමට ඔබලා කැමතිද?

දසයෙන් එක කොටස ගෙවීමට, එනම් අප උපයන මුදලෙන් දසයෙන් එකක් උන්වහන්සේට නැවත දීමට ස්වර්ගික පියාණන්වහන්සේ අපට අණ කළ බව පහදා දෙන්න. මෙම පොළොවේ උන්වහන්සේගේ කටයුතු ඉදිරියට ගෙන යාමට උපකාරවීමට නිරාහාර පිදුම්, ධර්මදූත අරමුදලට දායකවීම, සහ වෙනත් පරිත්‍යාගකිරීමටද උන්වහන්සේ අපට කීසේක.

පොළොවේ සියල්ලම ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මැවූ බව ළමුන්ට මතක් කරන්න, අපට වැඩකිරීමට සහ සිතීමට හැකිවන අනදමට, ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ ශරීර සහ මනසට ආශිර්වාද කළසේක. මෙම පොළොවේ අපට උපයාගත හැකි හෝ ලබාගත හැකි සියල්ලම උන්වහන්සේගෙන් ලබන දීමනාවය. දසයෙන් කොටස සහ වෙනත් පිදුම් සභාවට දීම මගින් අපගේ කෘතඥතාවය, ඇදහීම, සහ කීකරුකම පෙන්වීම ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍යවේ.

ශුද්ධ ලියවිලි විස්තරය — කනවැන්දඹුවගේ කාසිය ගැන කථාන්තරය ළමයින්ට උගන්වන්න. (මාර්ක් 12:41–44.) (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.) සභාවේ අවශ්‍යතාවයන් සපුරාලීමට උපකාරවීම සඳහා දසයෙන් කොටස ගෙවීමටත්, වෙනත් පරිත්‍යාගයන් කිරීමටත්, ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ නිතර ජනතාවට අණ කළසේක.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න — ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- වස්තුකාරයෝ සභාවේ ගබඩාවට දමන්නේ කුමක්ද? (මාර්ක් 12:41.) කනවැන්දඹුව ගබඩාවට දැමුවේ කුමක්ද? (මාර්ක් 12:42. ශතයක් යනු, ඉතාම කුඩා කාසියක් බව පහදා දෙන්න.) වස්තුකාරයන්ගේ දීමනාවට වඩා කනවැන්දඹුවගේ දීමනාව කෙරෙහි යේසුස්වහන්සේ වඩාත් ප්‍රසන්නවූයේ කුමක් නිසාද? (මාර්ක් 12:43–44.)

- දසයෙන් කොටස වශයෙන් අපට ගෙවීමට ස්වර්ගික පියාණන්වහන්සේ අපට අණ කළේ කොපමණද? (බලන්න ධීසහගී 119:4. "පොළිය" යන්නෙහි අර්ථය අප උපයන මුදල බව පහදා දෙන්න. කඩදාසි සහ පැන්සල් භාවිතා-කරමින් දසයෙන් කොටස ගණන් බලන අන්දම ගැන ළමයින්ට පෙන්වන්න.) අවංක දසයෙන් කොටස ගෙවීම යන්නෙහි අදහස කුමක්ද?

- නිරාහාර පිදුම් වශයෙන් අපට ගෙවීමට ස්වර්ගික පියානන්වහන්සේ කීවේ කොපමණද? ධර්මදූත අරමුදලට අපට ගෙවීමට උන්වහන්සේ කීවේ කොපමණද? දසයෙන් කොටසට නියමිත මුදලක් ගෙවීමට අපට අණ කළ ආකා-රයට මෙන් නොව, නිරාහාර පිදුම් සහ ධර්මදූත අරමුදලට අපට තිබෙන පරිදි අපගේ අවශ්‍යතාවයන් මත ගෙවිය යුතු මුදල අපට තීරණය කළ හැකිය. අපට ත්‍යාගශීලීවීමට පමණක් පියාණන්වහන්සේ කී අතර, අප වැඩියෙන් දෙන තරමට පියාණන් වහන්සේගේ වැඩකටයුතු කිරීමට වැඩියෙන් කැපවෙන බව අපි පෙන්වන්නෙමු.

- ස්වර්ගික පියාණන්වහන්සේගේ වැඩකටයුතු ඉදිරියට ගෙනයාමට උපකාරකිරීමේ වෙනත් මාර්ග මොනවාද? (නික්මයාම 25:1–8; බලන්න ධීසහගී 124:26–27.) දේවමාළිගා ගොඩනැගීමට දායකවීම පිණිස කාලාන්තර-යක් මුළුල්ලේ සාමාජිකයන්ට කියා ඇති බව පහදා දෙන්න. අද මුළු ලොව පුරාම දේවමාළිගා ගොඩනගන අතර, අළුත් දේවමාළිගවක් තනන දිස්ත්‍රික්කයක අප සිටිනවා නම්, එයට දායකවීමෙන් මහත්වූ ආශිර්වාද අපට ලබා-ගැනීමට හැකිවේ.

- දසයෙන් කොටස ගෙවීමට ස්වාමීන්වහන්සේ අපට කියන්නේ කුමක්නිසාද? සම්පූර්ණ දසයෙන් කොටස අප ගෙවනවා නම්, අපට කුමන ආශිර්වාද ලැබෙන්නේද? (3 නීෆායි 24:10.) අප වෙනුවෙන් ස්වර්ගයේ කවුළු විවෘතවෙනවා ඇත., යන්නෙහි අර්ථය කුමක්ද? වෙනත් පිදුම් අප ගෙවන විට, කුමන වර්ගයේ ආශිර්වාද අපි ලබන්නෙමුද?

සභාවේ දොළොස්වෙනි සභාපතිවරයාවූ, සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා-කරන්න:

"අප උන්වහන්සේගේ නීති වලට කීකරුවන විට, අහසේ කවුළු අරින බවට ස්වාමීන්වහන්සේ පොරොන්දුවූසේක. අපට වඩා හොඳ වැටුපක් දීමට උන්වහන්සේට හැකිවේ. මුදල් පරිහරණය කිරීමේදී අපට වඩා හොඳ විචාර බුද්ධියක් දීමට උන්වහන්සේට හැකිවේ. අපට වඩා යහපත් සෞඛ්‍ය තත්වයක් දීමට උන්වහන්සේට හැකිවේ. වඩා හොඳ තත්වයක් අපට ලබාගැනීමට හැකිවන පරිදි වඩා වැඩි අවබෝධයක් දීමට උන්වහන්සේට හැකිය. අපට අවශ්‍ය දේවල් කිරීමට හැකිවන ලෙස අපට උපකාරකිරීමට උන්වහන්සේට හැකිවේ" (*The Teachings of Spencer W. Kimball*, පි. 212).

දසයෙන් කොටස සහ වෙනත් පිදුම් ගෙවීමෙන් අපට ශ්‍රේෂ්ඨ ආත්මික ආශිර්වාද ලැබෙන බව අවධාරණයකරන්න. දසයෙන් කොටසේ නීතියට නිරාහාර පිදුම් සහ ධර්මදූත අරමුදලට ත්‍යාගශීලීව දායකවීමට කීකරුවීම තෝරාගන්නා එක් එක් අවස්ථාවකදීම අපගේ ඇදහීම වඩාත් ශක්තිමත්ව වැඩෙන්නේය.

- ඔබ හෝ ඔබ දන්නා යමෙක් දසයෙන් කොටස සහ වෙනත් පිදුම් ගෙවීම මගින් ආශිර්වාද ලැබුවේ කෙසේද? ඔබගේම අත්දැකීමකින් ආදර්ශයක් ළමයින් සමග බෙදාගනිමින්, ඔවුන්ගේ පිදුම් නිසා ඔවුන් ආශිර්වාද ලත් අවස්ථා ගැන අත්දැකීම් බෙදාගැනීම පිණිස ළමයින්ට ආරාධනාකරන්න.

- අපගේ දසයෙන් කොටස ගෙවිය යුත්තේ කවදාද? (අවුරුද්දේ ඕනෑම වෙලාවක අපට දසයෙන් කොටස ගෙවිය හැකිය. නමුත් ආදායමක් ලැබුන වහාම එය ගෙවීම ඉතාම හොඳය.) දසයෙන් කොටස සහ වෙනත් පිදුම් අප ගෙවිය යුත්තේ කා හටද? (සභානායකයාට හෝ ඔහුගේ උපදේශකවරුන්ටය. සභානායකවරයා දසයෙන් කොටසේ එම මුදල් සභාවේ ප්‍රධාන කාර්‍යාලයට යවන අතර, ස්වාමීන්වහන්සේගේ වැඩකටයුතු ඉතාම හොඳට කරගෙන යාමට ඒවා වැයකරන අන්දම ගැන එහිදී සභානායකයෝ තීරණයකරති. නිරාහාර පිදුම් සහ ධර්මදූත අරමුදල් පළාත්බදව භාවිතා කරයි; වැඩි මුදල සභාවේ ප්‍රධාන කාර්‍යාලයට යවනු ලැබේ.

- අපගේ දසයෙන් කොටස මුදල් භාවිතාකරන්නේ කෙසේද? (සාරවත්කිරීමේ 2 වෙනි ක්‍රියාකාරකම බලන්න. නිරාහාර මුදල් භාවිතාකරන්නේ කෙසේද? (නිරාහාර පිදුම් සභාවේ සුභ සාධක වැඩසටහනට යොදවනු ලැබේ.)

- දසයෙන් කොටසේ ගිවිසුම යනු කුමක්ද? (වසරකට එක් වතාවක් සභානායකයා සමග පවත්වන රැස්වීමකි. අප ගෙවන ලද දසයෙන් කොටස වෙනත් පිදුම්වල වාර්තා නිරීක්ෂණය කිරීම සග අප පූර්ණ දසයෙන් කොටස

ගෙවන්නෙක්ද බව ඔහුට කීමය. අපගේ සියලුම ආදායමෙන් දසයෙන් කොටස අප ස්වාමීන්වහන්සේට ගෙවනවා නම්, පූර්ණ දසයෙන් කොටස ගෙවන්නෙකු බවට අපට ප්‍රකාශකළ හැකිය.)

- දසයෙන් කොටස අප කැමැත්තෙන් ගෙවීමේ වැදගත්කම ඔබ සිතන අන්දමට කුමක්ද? (මොරෝනි 7:6–8.) අපගේ ආදායම කුඩා වුව නමුත්, දසයෙන් කොටස ගෙවීම අපගෙන් තවමත් බලාපොරොත්තුවන්නේද? කුමක් නිසාද?

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න: "ඔවුන්ගේ ආදායම සුළු නිසා දසයෙන් කොටස ගෙවීමට ඔවුන්ට නොහැකි යයි කියන පුද්ගලයෝ සිටිති.….දසයෙන් කොටස ගෙවීමට නොහැකි දිළින්දෝ නොමැත" (*The Teachings of Spencer W. Kimball*, පි. 212).

- වෙනත් පිදුම් ගෙවීම වැදගත්වන්නේ කුමක් නිසාද? සභාවට පරිත්‍යාග කිරීමේදී කනවැන්දුම්යගේ දායකත්වය ආදර්ශයක් අපට භාවිතාකිරීමට හැකිවන්නේ කෙසේද? ඉදිරි අනාගතයේදී අප සතු සියල්ලම සභාවට දීමට අපට කිව හැකි බව තේරුම්ගැනීමට ලමයින්ට උපකාර කරන්න. අප අපගේම අවශ්‍යතාවයන් සපුරාලන අතර දැනට පරිත්‍යාග කිරීමට අපට හැකි ප්‍රමාණයක් ඉල්ලන්නේය.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ- එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. අනුකරන මුදල් බාවිතාකරමින් (ඔබටම සාදාගත හැකිය) ලමයින් පවුලක් මෙන් පෙන්වමින් ඔවුන්ට ඔබ දෙන මුදලින් අය වැයක් සෑදීමට සලස්වන්න. ආහාර, ගෙවල් කුලිය, ප්‍රයෝජනවත් දේවල්, ඇඳුම සහ විනෝදාත්මක දේවලට අය වැය සකස්කිරීමට ඔවුන්ට සලස්වන්න. ඉන්පසුව ලැයිස්තුවේ ප්‍රමුඛස්ථානයට තබමින් දසයෙන් කොටස සහ වෙනත් පිදුම් අයවැයට එකතුකිරීමට ඔවුන්ට කියන්න. පළමුවෙන්ම දසයෙන් කොටස අප නිරන්තරයෙන්ම ගෙවිය යුතු බව ලමයින්ට පහදා දෙන්න. මක්නිසාද එය ස්වාමීන්වහන්සේගේ දසයෙන් එක වන නිසාය.

2. ඔහුගේ හෝ ඇයගේ දසයෙන් කොටස මුදල් භාවිතාකරන ක්‍රමයක් නම්කිරීමට කාමරය වටා යමින් එක් එක් ලමයාගෙන් අසන්න. අවශ්‍ය නම් පහත සඳහන් ලැයිස්තුවෙන් යෝජනා දෙන්න:

    රැස්වීම් ගෘහ, දේවමාළිගා, ආගමික සෙමනේරි, විද්‍යාස්ථාන, ධර්මදූත පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි සහ පවුල් ඉතිහාස මධ්‍යස්ථාන ගොඩනැගීම.

    කොට්ඨාශ සහ ස්ටේක ක්‍රියාකාරකම් සහ ඉගැන්වීමේ අත් පොත් සහ බඩු මුට්ටුවලට ගෙවීම.

    රැස්වීම් ගෘහ සහ වෙනත් ප්‍රයෝජන දේවල් පවත්වාගෙන යාම සඳහා

    ධර්මදූතයන්ට ගමනාගමන සහ වෙනත් දේවල් සපයාදීමට ගෙවීම.

    ප්‍රධාන අධිකාරියේ ගමන් බිමන්වලට සහ වියහියදම් වලට ගෙවීම.

    දේවමාළිගාවේ සහ පවුල් ඉතිහාස කකටයුතු වලට භාවිතාකිරීම පිණිස පරිඝණක සපයාදීම.

    සභාසඟරා මුද්‍රණයකිරීමට උපකාරකිරීම.

    සභාවෙ චන්ද්‍රිකා විකාශන වලට ගෙවීම.

    ශුද්ධ ලියවිලි පරිවර්තනය සහ ප්‍රකාශනය කිරීම්වලට ගෙවීම

3. එක් එක් ලමයාට කඩදාසි කෑල්ලක් සහ පැන්සලක් දී, ජනේලයක් ලඟට හෝ පිටත බැලීමට හැකි ස්ථානයට යාමට සලස්වන්න. මිනිත්තු ස්වල්පයක් ඇතුළත ඔවුන්ට පෙනෙන දේවල් බොහොමයක් නිශ්ශබ්දව ලිවීමට ඔවුන්ට කියන්න. ඔවුන් වාඩිවෙන ස්ථානයට ලමයින් නැවත පැමිණියාට පසු, ඔවුන් දුටු දේවල් නම්කිරීමට ඔවුන්ට කියන්න. අපට තිබෙන සෑමදෙයක්ම ස්වර්ගික පියාණන්වහන්සේ අපට දී තිබෙන බවද, දසයෙන් කොටස සහ පිදුම් ගෙවීම අපගේ ප්‍රේමය සහ කෘතඥතාවය උන්වහන්සේට පෙන්වීමට හැකි එක් මාර්ගයක් බව පහදා දෙන්න.

4. සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් කථාන්තරය කියමින් දසයෙන් කොටස ගෙවීමට අවශ්‍ය ඇදහීම සහ එම නීතියට කීකරුවීම තුළින් ලැබෙන ආශිර්වාද ගැන සාකච්ඡාකරන්න:

"පසුදින දසයෙන් කොටස ගිවිසුමට සූදානම්වෙමින් මගේ පියා සහ මව ඔවුන්ගේ මුදල් ගැන කථා බහ කරනවා, මා තරුණයෙක්ව සිටියදී! එක් අවස්ථාවක මට ඇසිනි. ඩොලර් විසිපහක් පියා බැංකුවට [ණයවී] සිටි අතර, එය එම සතියේදී ගෙවීමට තිබිනි. ඔවුන් දසයෙන් කොටස ගණන්බලන විට, තවත් ඩොලර් විසිපහක් ඔහු ණයවී තිබුනි. ඔහු සෑදූ පිදුරු අදින දොඹකරයක් [පිදුරු ගොඩකට පිදුරු ඔසවා තැබීමට භාවිතාකරන යමක්] ඔහු සතුව තිබින. ඔහු…එය විකිණීමට උත්සාහ දැරූ නමුත් එය අසාර්ථක විය.

"ඔවුන් කළ යුතුව තිබුනේ කුමක්ද—බැංකුවට [ගෙවීම], ඔවුන්ගේ දසයෙන් කොටස පසුව ගෙවීම, නැතහොත් ඔවුන්ගේ දසයෙන් කොටස ගෙවා, ස්වල්ප දිනකින් [බැංකුවට ගෙවීමට] අපේක්ෂා කිරීමද? කාරණය සාකච්ඡා කිරීමෙන් පසු, නිසැකයෙන්ම විවේක ගැනීමට පෙර එක්ව යාච්ඤා කිරීමෙන් පසුව, පසුදින දසයෙන් කොටස ගිවිසුමට සහභාගිවී ඩොලර් විසිපහ ගෙවා පූර්ණ දසයෙන් කොටස ගෙවන්නෙකු වීමට තීරණය කළේය. අසුපි-ටින් ඔහු ගෙදර පැමිණෙන විට, ඔහුගේ අසල්වැසියෙක් ඔහුව නවත්වා මෙසේ ඇසීය, 'ජෝර්ජ්, පිදුරු අදින දොඹකරයක් විකිණීමට ඔබ ලඟ තිබෙනවා මට මතකයි, ඔබ එයට කීයක් ඉල්ලනවාද?'

"ඩොලර් විසිපහක්' යයි පියා කීවේය. 'මා එය දැකලා නැත, නමුත් ඔබ එය තැනූ අන්දම ගැන මා දන්නා නිසා, ඩොලර් විසිපහක් එය වටිනා බව මට සහතිකයයි අසල්වැසියා කීවේය. මිනිත්තුවක් ඉන්න, මම ගෙට ගොස් චෙක්පතක් ලියන්නම්. මට එය අවශ්‍යයි.' මෙම පාඩම මට අමතකවූයේ නැත" (*The Teachings of Ezra Taft Benson,* පිටු. 471–72).

5. පහත සඳහන් කථාන්තරය කියවන්න:

   "මට අවුරුදු පහක් හෝ හයක් පමණ කාලයේදී මගේ විශාල පවුලත් සමග කෑම මේසයේ වාඩිවී අනෙක් අය දසයෙන් කොටස ගැන සාකච්ඡා කරනවා මම අසා සිටියෙමි. දසයෙන් කොටස යනු අප උපයන මුදලෙන් දසයෙන් එකක් බවත් ස්වාමීන්වහන්සේට ප්‍රේමකරන අය විසින් ගෙවන බවත් ඔවුහු මට කීහ.

   "රෑ කෑමෙන් පසු, මා ඉතිරි කළ සුළු මුදල එළියට ගෙන දසයෙන් කොටස වශයෙන් මා ස්වාමීන්වහන්සේට දිය යුතු මුදල ගණන් බැලුවෙමි. අපගේ නිවසෙහි තිබූ දොර ගුළු දැමීමට හැකි එකම කාමරය—නාන කාමරයට—ගොස් මම, නාන බේසම ලඟ දණගැසුවෙමි. උඩට ඔසවා ගත් අත උඩ කාසි තුන හෝ හතර අල්ලාගෙන උන්වහන්සේ එය කරන බව ස්ථිරකරගෙන, එය පිළිගැනීමට ස්වාමීන්වහන්සේට මම කීවෙමි. ටික වේලාවක් මම ස්වාමීන්වහන්සේට කන්නලව් කළ නමුත් මුදල් මගේ අතේම රැඳී තිබුනි. කිසිම පිරිමි ළමයෙකුට මට මෙන් ප්‍රතික්ෂේප කිරීමේ හැඟීමක් නොදැනෙන්ට ඇති. මගේ දෙමාපියන්ගෙන් සහ මගේ වැඩිමහල් සහෝදරයන් සියලුදෙනාගෙන්ම ස්වාමීන්වහන්සේ දසයෙන් කොටස පිළිගත්සේක. මගෙන් පිළිනොගත්තේ කුමක් නිසාද? මා දණින් හිඳ නැගිටි විට සිදුවූ දෙය කිසිවෙකුට කීමට නොහැකි තරම් නුසුදුසු හැඟීමක් මට ඇතිවිය.

   "ස්වල්ප දිනකට පසු පාඩමේ සඳහන් නොවන යමක් ගැන කථාකිරීමට ප්‍රාථමිකයේ ගුරුවරියට හැඟුනු බව ඇය කීවාය. දසයෙන් කොටස උගන්වන අන්දම ඇය උගන්වන විට, මම විස්මිතව වාඩිවී අසා සිටියෙමි. දසයෙන් කොටස ගෙවන අන්දමට වඩා වැඩිය වැදගත් පාඩමක් මම ඉගෙන ගත්තෙමි. මගේ යාච්ඤාව ස්වාමීන්වහන්සේ ඇසූ බවත්, උන්වහන්සේ මට ප්‍රේමකරන බවත්, මම ඉගෙනගත්තෙමි" (Ariel Ricks, "Coins for the Lord," *Ensign,* දෙසැ.1990, පි. 47).

---

## අවසානය

**සාක්ෂිය සහ අභියෝගය**

දසයෙන් කොටස ගෙවීමේ වැදගත්කම ගැන සාක්ෂිදරන්න. ස්වර්ගීක පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ කෘතඥතාවය ප්‍රකාශකිරීමට අපගේ දසයේ කොටස ගෙවීමේ මාර්ගය අපට ඇති වරප්‍රසාදයක් බවට ඔබගේ හැඟීම් බෙදාගන්න. ඔබ දසයෙන් කොටස ගෙවූ විට, ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල ඔබගේ ඇදහීම වැඩිදියුණුවූ විට, ඕනෑම අත්දැකීමක් ගැන බෙදාගන්න. නැතහොත් තවත් සාමාජිකයෙකුට එය බෙදාගැනීමට ආරාධනා කරන්න.

ඔවුන්ට ආදායමක් ලැබුනු ඕනෑම වෙලාවක අවංක දසයෙන් කොටසක් ගෙවීමට, පරිත්‍යාග කිරීමේ ලදුපතක් සහ ලියුම් කවරයක් එක් එක් ළමයාට දෙන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මාර්ක් 12:41–44 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# කන්‍යාවන් දසදෙනාගේ උපමාව

# 25

වෙනි පාඩම

**අරමුණ** යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊ්ම සඳහා ආත්මිකව සූදානම්වීමට එක් එක් ළමයා දිරිමත්කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 25:1–13 සහ දහම සහ ගිවිසුම 45:56–57, 63:53–54 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණය කරන්න. (බලන්න “ඔබගේ පාඩම සූදානම්කිරීම,” පි. 00 vi, සහ “ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම,” පි. 00 vii.)
2. ළමුන්ව සහභාගි කරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර හැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. පහත සඳහන් වචන තීරු:
      කන්‍යාවන් දසදෙනා = සභා සාමාජිකයන්
      තෙල් = ආත්මික සූදානම්වීම
      මනමාලයා = යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
      විවාහය = යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊ්ම
   ඇ. 7-25 පිංතූරය දෙවෙනි ඊ්ම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 238; 62562)

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම පංතිය විනෝද ගමනක් යන බව සිතින් සිතාගැනීමට ළමුන්ට කියන්න.

- විනෝද ගමන සඳහා සූදානම්වීම පිණිස අප කිරීමට අවශ්‍ය කුමක්ද?
- අප කුමක් රැගෙන ගිය යුතුද?

“අප විනෝද ගමනක් යනවා, අප ගෙන යන්නේ ______________,” එක් භාණ්ඩයක් නම්කරමින් කියන්න. තවත් ළමයෙකුට ඔබ කී දෙයම ඇතුළත් කරමින්, එම වාක්‍යයම තවත් භාණ්ඩයක් එකතුකර කීමට සලස්වන්න. එක් එක් ළමයාට කලින් කී සියල්ලමද, වැඩියෙන් එක් භාණ්ඩයක් එකතුකරමින් කාමරය වටේට නොනවත්වා යාමට සලස්වන්න. පංතියේ ප්‍රමාණය අනුව එක් එක් ළමයාට එක් වාරයක් වැඩියෙන් දෙන්න.

අපගේ ජීවිතයේ බොහෝ දේවල්දී සූදානම්වීම වැදගත් කොටසක් බව පෙන්වා දෙන්න.

- විනෝද ගමනක් යෑමට අමතරව අප සූදානම්විය යුතු සමහරක් දේවල් මොනවාද?

පාසලට, කෑමට, පවුල් නිවාස සැන්දෑවකට යනාදිය සඳහා සූදානම්වීම කෙටියෙන් සාකච්ඡාකරන්න. අනාගතයෙ-දී සිදුවීමට යන චමත්කාර ජනක සිද්ධිය සඳහා ආත්මිකව ඔවුන්ට සූදානම්විය හැකි අන්දම මෙම පාඩමෙන් ඔවුන් ඉගෙනගැනීමට යන බව ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවලි විස්තර කන්‍යාවන් දසදෙනාගේ උපමා කථාව ළමයින්ට උගන්වන්න (මතෙව් 25:1–13). (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා, බලන්න “ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම,” පි. 00 vii.) සැඟවුන ආත්මික සත්‍යය ඉගැන්වීම පිණිස පොදු උපකරන සහ අවස්ථාවන් උපයෝගීකර ගනිමින් උපමා මගින් යේසුස්වහන්සේ බොහෝ විට, ඉගැන්වූ බව ළමයින්ට කියන්න. උපමාව අධ්‍යයනය කිරීමෙන් සත්‍ය තේරුම්ගැනීමට කැමති අයට පමණක් උන්වහන්සේ උපමා භාවිතා කළසේක (බලන්න මතෙව් 13:10–17). මෙම උපමාව යේසුස්වහන්සේගේ දෙවෙනි ඊ්මට සමානය. එනම්, පොළොව පාලනය කිරීමට සහස්‍රයේදී මංගල්‍යයක උත්සවශ්‍රීයෙන් ගැලවුම්කරුවාණෝ නැවත පැමිණෙන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න.

පැරණි යුදෙව්වරුන්ගේ මංගල සිරිත් මත කන්‍යාවන් දසදෙනාගේ උපමාව පදනම්වී ඇති බව පහදා දෙන්න. මනමාලයා සහ ඔහුගේ මිතුරෝ මනමාලිය ඇයගේ නිවසින් මනමාලයාගේ නිවසට කැන්දාගෙන යති. මනමාලියගේ මිතුරෝ ඔවුන්ට සම්බන්ධවීම පිණිස මග දෙපස බලා සිටිති. මනමාලයාගේ නිවසට ඔවුන් පැමිණ මංගල්‍යය පිණිස සියලු දෙනාම ඇතුළට යති. සාමාන්‍යයෙන් මෙම මංගල්‍යය සවස් යාමේදී සිදුවන බැවින්, මනමාලිය සහ මනමාලයා එන තෙක් සිටින අය පහන් රැගෙන යති.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත. සුදුසු අවස්ථාවලදී වචන තීරු සහ පින්තූර පෙන්වන්න.

- කන්‍යාවන් දසදෙනා නියෝජනය කරන්නේ කවුද? (මතෙව් 25:1.) මනමාලයාව නියෝජනය කරන්නේ කවුද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.)
- කන්‍යාවන් දසදෙනාම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාස කළ බව අප දන්නේ කෙසේද? (මතෙව් 25:6–7. ඔවුහු මනමාලයා "මුනගැසීම පිණිස පිටතට ගොස්" ඔහු එනතුරු බලාසිටියහ.) යේසුස්වහන්සේ තුල අප විශ්වාසකරන බව අප පෙන්වන්නේ කෙසේද?
- කන්‍යාවන් පස් දෙනෙකුට නුවණ නැත්තියෝ යයි සඳහන් කළේ කුමක් නිසාද? (මතෙව් 25:3.) අනෙක් පස් දෙනා නුවණැති යයි සඳහන් කළේ කුමක් නිසාද? (මතෙව් 25:4.)
- මනමාලයා පැමිණි විට කුමක් සිදුවූනේද? (මතෙව් 25:6–8.) නුවණ නැති කන්‍යාවන් පස්දෙනා එතරම් සූදානම් නොවුනේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? යේසුස්වහන්සේ නැවත පැමිණෙන විට, අපට සූදානම්වීමට හැකිවන්නේ ඔබ සිතන අන්දමට කෙසේද?
- නුවණ ඇති කන්‍යාවන් පස් දෙනා ඔවුන්ගේ තෙල් බෙදා නොගත්තේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (මතෙව් 25:9.) ඔවුන්ගේ තෙල් ස්වල්පයක් අන්‍යයන්ට දීමට ඔවුන්ට නොහැකිවූනේ කුමක් නිසාද? යුදෙව්වරුන්ගේ පහන්වල හැඩය පිට ගැටිය ඇතුළට රවුම්වී තිබෙන බැවින් එක් පහනකින් තව කෙනෙකුට දීමට තෙල් වත්කිරීමට ඉතා අපහසු බව පහදා දෙන්න. (පාඩමේ අග ඇති නිදර්ශනය බලන්න). මෙම උපමාවේ නුවණ ඇති කන්‍යාවන්ගේ තෙල් ඔවුන්ගේ ධර්මිෂ්ඨ ජීවිතය සහ කීකරුකම නියෝජනය කරයි. අපගේම ස්වකීය ජීවිතවලින්, අපගේ කීකරුකමින් සහ ධර්මිෂ්ඨකම් නියෝජනය කරමින්, අප එකිනෙකා අපගේ පහන් පුරවා ගනිමු. අපගේ ධර්මිෂ්ඨ ක්‍රියාවලට ස්වර්ගික පියාණන්වහන්සේගේ ආශිර්වාද අකීකරු අයට දීමට නොහැකිය.
- සූදානම් නොවූ පස් දෙනාට සිදුවූයේ කුමක්ද? (මතෙව් 25:10–12.) සූදානම්වූ පස් දෙනාට සිදුවූයේ කුමක්ද? දෙවෙනි ඊම සඳහා අප දැන්ම සූදානම්වීමේ වැදගත්කම කුමක්ද? අපගේ පහන් තෙල්වලින් පුරවාගැනීමට අපට හැකිවන්නේ කෙසේද?

වැඩිහිටි බෲස් ආර්. මැකොන්කිගේ මෙම උපුටාගැනීම කියවන්න: "උන්වහන්සේගේ පණත් තබමින්ද, උන්වහන්සේගේ නීති අනුව ජීවත්වෙමින්ද, දෙවියන්වහන්සේ මුණගැසීමට පුද්ගලයන් වශයෙන් අපි සූදානම් වන්නෙමු. . . . සුභාරංචිය එහි සදාකාලික පූර්ණත්වයෙන් මෙම අන්තිම දවස්වලදී මෙහි නැවත පිහිටුවා මනුෂ්‍ය පුත්‍රයාගේ දෙවෙනි ඊමට ජනතාවක් සූදානම් කරනවා ඇත" (*The Millennial Messiah*, පි. 572).

මතෙව් 24:36 සහ 25:13 කියවීමට ළමයින්ට සලස්වන්න. මනමාලයා පැමිණෙන නියම හෝරාව කන්‍යාවන් දසදෙනා නොදන්නා සේම, යේසුස්වහන්සේ නැවත පැමිණෙන නියම කාලය අපි නොදන්නෙමු.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙන විට එය කුමක් මෙන වන්නේද? (බලන්න ඕසහගී 45:56–57; 63:53–54.) ආත්මිකව සූදානම්වූ අයට රැස්කර තිබෙන ආශිර්වාද මොනවාද? (බලන්න ඕසහගී 38:30.)

මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් සහ අදාළ කිරීමක් වශයෙන් සාරවත්කරීමේ 2වෙනි ක්‍රියාකාරකම භාවිතාකිරීමට ඔබට හැකිය.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම ගැන ළමුන් දැනුවත්කිරීමට පහත සඳහන් තොරතුරු කෙටියෙන් සාකච්ඡා කරන්න.

   යේසුස්වහන්සේ යෙරුසලමේදී තම ප්‍රේරිතවරුන් හැර ගිය විට, උන්වහන්සේ දෙවෙනිවරට පැමිණෙන බව දේවදූතයෝ ඔවුන්ට කීහ. (ක්‍රියා 1:9–11.)

   දෙවෙනි ඊමේ වේලාව දන්නේ ස්වර්ගික පියාණන්වහන්සේ පමණකි. (මතෙව් 24:36.)

   යේසුස්වහන්සේ බලයෙන් සහ මහිමයෙන් පැමිණ අවුරුදු දහසක් පොළොවේ රජකම් කරනසේක. (බලන්න ධීසහසී 29:11.)

   ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊමට අපි අපව සූදානම් කළ යුතුවෙමු. (බලන්න ධීසහසී 33:17–18.)

   යේසුස්වහන්සේගේ දෙවෙනි ඊමට සූදානම්වී සිටින ධර්මිෂ්ඨයයෝ එම ශ්‍රේෂ්ඨ දිනයේ උන්වහන්සේ සමග සිටිමින් ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමීපයේ සදාකාලයටම ජීවත් වන්නෝය. (බලන්න ධීසහසී 76:62–63.)

2. පාඩම අවසානයේදී පහනක පිටපතක් එක් එක් ළමයාට දෙන්න, නැතිනම් හුණුලැල්ලේ පහනක් අඳින්න. ඔවුන්ගේ පහන්වල යම් යම් දේවල් ලිවීමට ළමුන්ට සලස්වන්න. නැතිනම් ඔවුන්ගේ ආත්මික පහන් තෙල්වලින් පුරවන, ඔබට හුණුලැල්ලේ ලිවීමට හැකි දේවල් නම්කිරීමට සලස්වන්න (සාක්ෂිදැරීම, සුභාරංචිය ඉගෙනගැනීම, අන්අයට සේවයකිරීම, දසයෙන් කොටස ගෙවීම, ශුද්ධාත්මයාණන්ගේ මිත්‍රත්වයට සුදුසු අන්දමට ජීවත්වීම, යාච්ඤාකිරීම, සභා කැඳවීම් ඉටුකිරීම, යනාදිය සමහර අදහස් විය හැකිය). නුවණ ඇති කන්‍යාවන් පස් දෙනා කළ අන්දමට ඔවුන්ගේ පහන්වල තෙල් තිබීම පිණිස ඔවුන්ම ලබාගත යුතු හෝ කළ යුතු දේවල් මේවා බව ඔවුන්ට අවබෝධකර ගැනීමට උපකාර වන්න.

   ළමයි ඔවුන්ගේ පහන්වල ලියූ දේවල්, සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ අදහස් හා සසඳන්න: "අපගේ ජීවිතවල සූදානමේ තෙල් බිඳෙන් බිඳ එකතුවන්නේ ධර්මිෂ්ඨව ජීවත්වීම මගින්ය. සක්‍රමේන්තු රැස්වීම්වලට පැමිණෙන විට, අවුරුදු පතා බිඳෙන් බිඳ අපගේ පහන්වලට තෙල් එකතුවන්නේය. නිරාහාරව සිටීම, පවුලේ යාච්ඤාවෙහවට්, නිවාස ඉගැන්වීම්, ඉන්ද්‍රියන් පිනවීම පාලනය කිරීම, සුභාරංචිය ප්‍රකාශකිරීම, ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීම—කැපවීමේ සහ කීකරුකමේ එක් එක් ක්‍රියා බිංදු වශයෙන් අපගේ ගබඩාවට එකතුවන්නේය. කාරුණික ක්‍රියා, දසයෙන් කොටස සහ පිදුම් ගෙවීම, සදාචාර සිතිවිලි සහ ක්‍රියා, ගිවිසුම තුල සදාකාලයට විවාහවීම,—මධ්‍යම රාත්‍රියේ අපගේ පහන් නිවීයන විට නැවත තෙල් දැමීම පිණිස මේවාද තෙල් වලට වැදගත් දායකත්වයක් ලබාදෙන්නේය" (*Faith Precedes the Miracle*, පි. 256).

   ළමයින් තවමත් සඳහන් නොකළ අපගේ පහන්වලට තෙල් එකතුවීමේ ක්‍රම සාකච්ඡාකර, කැමතිනම් ඔවුන්ගේ ලැයිස්තුවට සමහරක් එකතුකිරීමට සලස්වන්න. ගැලවුම්කරුවාණන් එන තෙක් මෙම දේවල් කල්දැමීමට නොහැකි බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරකරන්න.

3. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පහත සඳහන් උපුටාගැනීම කියවන්න: "කන්‍යාවන් දසදෙනා ස්වර්ග රාජ්‍යයට ඇතුළත්වන අතර, සෑම ආශිර්වාදයකටම හිමිකම් ඔවුන්ට ඇත—ශ්‍රේෂ්ඨ දිනය පැමිණි විට, සූදානම් නොවූ නිසා පස් දෙනෙක් වික්‍රමාන්විත නොවූහ. සියලුම පණත් අනුව ජීවත් නොවූ නිසා, ඔවුහු සූදානම්ව නොසිටියහ. ඔවුන්ගේ වත්මන් ප්‍රතිරූපය මෙන් [අද සූදානම් නැති සාමාජිකයන්] —මෙන් විවාහ මංගල්‍යයට ඇතුලත්වීමට නොහැකිව දොර වැසූ නිසා ඔවුහු අධික ලෙස කළකිරීමට පත්වූහ" (*The Miracle of Forgiveness*, පි. 8).

## අවසානය


**සාක්ෂිය**

ධර්මිෂ්ඨව ජීවත්වීම මගින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම සඳහා සූදානම්වීමේ වැදගත්කම ගැන සාක්ෂිදරන්න. එම ශ්‍රේෂ්ඨ සිද්ධියට සහභාගිවීමට ඔබට සුදුසුකම් ලැබීමේ වැදගත්කම ගැන ළමයින් සමග බෙදාගන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 25:1–13 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.



# තලෙන්ත ගැන උපමාව

# 26
වෙනි පාඩම

| | |
|---|---|
| **අරමුණ** | ඔවුන්ට සහ අන්‍යයන්ට ඔවුන්ගේ තලෙන්ත ප්‍රයෝජනවත්වන අන්දමට භාවිතාකිරීම පිණිස ළමුන්ට ආශාවක් ඇතිකිරීම සඳහා උපකාර කිරීමය. |

**සූදානම්වීම**

1. මතෙව් 25:14–30 සහ දහම සහ ගිවිසුම 60:2–3, 82:3 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. පහත සඳහන් පරිදි එක් එක් දක්ෂතාවය බැගින් ලියූ කඩදාසි කෑලි, "දක්ෂ වයලීන් වාදකයෙකු වීමට ඔබට දක්ෂතාවයක් තිබේ," "මිතුරන් සාදා ගැනීමේ දක්ෂතාවය ඔබට තිබේ," "ඉතා හොඳ කථිකයෙකු වීමට ඔබට දක්ෂතාවය තිබේ," "හොඳ පාපන්දු ක්‍රීඩකයෙකු වීමට දක්ෂතාවය ඔබට තිබේ," "සමාදානයකිරීමේ දක්ෂතාවය ඔබට තිබේ," "හොඳ ධර්මදූතයෙකු වීමට දක්ෂතාවය ඔබට තිබේ," "අන්‍යයන් සතුටු කිරීමේ දක්ෂතාවය ඔබට තිබේ." ළමයින් පංති කාමරයට ඒමට පෙර, කඩදාසි කෑලි ඔතා, නූලකින් බැඳ කාමරයේ ළමයින්ට සොයාගත හැකි ස්ථානයක තබන්න. විශේෂිත ළමයෙකුට ඇති දක්ෂතා ලෙසට එය හැඳින්විය යුතු නොවේ.

**යෝජිස පාඩම් වැඩිදියුණ කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ළමුන් සඳහා විශේෂ පණිවුඩ කාමරය අවට සඟවා තිබෙන බව ඔවුන්ට කියන්න. එක් ළමයෙකුට පණිවුඩය සොයා ශබ්දනගා එය කියවීමට කියන්න. ඉන්පසුව එම දක්ෂතාවය වැඩිදියුණුකර ගැනීමට ඔහු හෝ ඇය කුමක් කළ යුතුදැයි ළමයාගෙන් අසන්න. එක් එක් ළමයෙකුට වාරයක් දෙන අතර, එක් එක් දක්ෂතා පුහුණුකර ගැනීමේ ක්‍රම ගැන සිතීමට පංතියේ ඉතිරි ළමුන් දිරිගන්වන්න. දක්ෂතාවයන් වැඩිදියුණුකර ගැනීමේ වැදගත්කම ගැන මෙම පාඩම ඔවුන්ට උගන්වන බව පහදා දෙන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

25 වෙන පාඩමෙන් උපමාවක අර්ථ නිරූපනය කරන්න. මතෙව් 25:14–30 සඳහන් තලෙන්ත ගැන උපමාව ළමුන්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) උපමාවෙහි තලෙන්ත යනු මුදල් වර්ගයකි. අන්‍යයන්ට ආශිර්වාද කිරීමට සහ උපකාරකිරීම පිණිස අපට වැඩිදියුණුකර ගැනීමට හැකි හැකියාවයන් තලෙන්ත නමින් අපට අදහස් කළ හැකිය.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි විස්තර ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- එක් එක් දාසයෙකුට එක් එක් ප්‍රමාණයේ තලෙන්ත ස්වාමියා දුන්නේ කුමක් නිසාද? (මතෙව් 25:15.) ඔබගේ මිතුරන්ගේ තලෙන්ත, ඔබගේ පවුලේ සාමාජිකයන්ගේ තලෙන්ත ඔබගේ තලෙන්ත වලින් වෙනස්වන්නේ කෙසේද? අප එකිනෙකාට වෙනස්වූ දීමනා ස්වර්ගික පියාණන් වහන්සේ දෙන්නේ කුමක් නිසාද? (බලන්න ධීසහසී 46:12.) උන්වහන්සේ අපට දෙන ලද විශේෂ දීමනාවන් උදෙසා ස්වර්ගික පියාණන්වහන්සේට අපගේ කෘතඥතාවය පෙන්වීමට අපට හැකිවන්නේ කෙසේද? (බලන්න ධීසහසී 46:11.)
- තලෙන්ත පහක් සහ දෙකක් දුන් දාසයන් ඔවුන්ගේ මුදල් වලින් කළේ කුමක්ද? (මතෙව් 25:16–17.) ඔවුන්ගේ මුදල් දෙගුණකර ගන්නේ ඔබ සිතන ආකාරයට කෙසේද? මහන්සිවී වැඩකිරීම අපට ආශිර්වාදයක් වන්නේ කෙසේද?

- එක තලෙන්තයක් ලැබුන දාසයා ඔහුගේ මුදල් වලින් කළේ කුමක්ද? (මතෙව් 25:18.) ඔහු මෙසේ කළේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? (මතෙව් 25:24–25.) සමහර පුද්ගලයන් ඔවුන්ගේ තලෙන්ත වැඩිදියුණු නොකරන්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? ඔවුන්ගේ තලෙන්ත වලින් ඔවුන් කිසිවක් නොකරන්නේ නම්, ඒවාට කුමක් වන්නේද?

- ස්වාමියා නැවත පැමිණ සේවකයන්ට වාර්තාකිරීමට ඔහු කීවිට, තලෙන්ත පහක් දුන් දාසයාට ඔහු කීවේ කුමක්ද? (මතෙව් 25:21.) තලෙන්ත දෙකක් දුන් දාසයාට ඔහු කීවේ කුමක්ද? (මතෙව් 25:23.) තලෙන්ත වැඩිදියුණුකිරීමට උත්සාහ ගන්නා විට, අප ආශිර්වාදිත වන්නේ කෙසේද? යමෙකුගේ තලෙන්ත හෝ හැකියාවන් මගින් ඔබ ආශිර්වාද ලැබුවේ කෙසේද?

- තලෙන්ත පහක් උපයාගත් දාසයාටත්, තලෙන්ත දෙකක් උපයාගත් දාසයාටත්, ස්වාමියා එකම ත්‍යාගය දුන්නේ කුමක් නිසාද? (මතෙව් 25:21, 23.)

- එක තලෙන්තයක් දුන් දාසයාට ස්වාමියා කීවේ කුමක්ද? (මතෙව් 25:26–27.) මෙම දාසයා සමග ස්වාමියා කෝපවූයේ කුමක් නිසාද? තලෙන්තය සැඟවූ බැවින් ස්වාමියා ඔහුට දුන් දඬුවම කුමක්ද? (මතෙව් 25:28, 30.) අපට තලෙන්ත කොපමණ තිබෙනවාද, ඒවා මොනවාද යන්නට වඩා, අපගේ හැකියාවන් සහ තලෙන්ත භාවිතාකරන අන්දම වඩා වැදගත්වන්නේ කුමක් නිසාද?

- දහයක් තිබූ තැනැත්තාට එක් තලෙන්තයක් ස්වාමියා දුන්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? මෙය සාධාරණද? ඒ කුමක් නිසාද? අපගේ තලෙන්ත වඩාත් වැඩියෙන් භාවිතාකරන විට වඩාත් වැඩියෙන් තලෙන්ත අප වැඩිදියුණුකරන බව පහදා දෙන්න. අපගේ තලෙන්ත වලින් ප්‍රයෝජනයක් අප නොගන්නේ නම්, ඒවා අපට අහිමිවනවා ඇත. (බලන්න මතෙව් 25:29; ධ්‍යසහ්‍යී 60:2–3.) තලෙන්ත ස්වල්පයක් තිබෙන සමහර අය එම තලෙන්ත සම්පූර්ණයෙන්ම භාවිතාකරන්නේ නම්, සෑම ආශිර්වාදයක්ම ඔවුන්ට ලැබෙනු ඇත.

- තලෙන්ත ගැන උපමාව කීමෙන් යේසුස්වහන්සේ අපට ඉගැන්වීමට උත්සාහ දරන්නේ, ඔබ සිතන ආකාරයට කුමක්ද? තලෙන්ත, හැකියාවන් සහ ප්‍රස්ථාවන් (උන්වහන්සේගේ සභාවට සම්බන්ධවීම යනාදිය) ස්වාමීන්වහන්සේ අපට දී තිබෙන බව අවබෝධකර ගැනීමට ළමුන්ට උපකාරවන්න. අපගේ ජීවිත වඩාත් යහපත්කර ගැනීමට සහ අන්‍යයන්ට සේවය කිරීම පිණිස මෙම සියල්ල භාවිතා කිරීම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වනසේක. අපගේ තලෙන්ත වැඩිදියුණුකිරීම මගින් අපගේ කෘතඥතාවය පෙන්වීමද උන්වහන්සේට අවශ්‍ය වන්නේය.

- උන්වහන්සේගේ සභාවේ අප සාමාජිකයන් වන නිසා ස්වාමීන්වහන්සේ අපගෙන් බලාපොරොත්තුවන අමතර දේවල් මොනවාද? (බලන්න ධ්‍යසහ්‍යී 82:3.)

- පුද්ගලයන් තමන්ගේ තලෙන්ත සභාවේදී බෙදාගන්නේ කෙසේද? සභාවේ වගකීම් හා පැවරුම් පිළිගැනීමෙන් අපගේ තලෙන්ත හැකියාවන් දියුණුකර ගැනීමට උපකාරවන්නේ කෙසේද? (බලන්න සාරවත්කිරීමේ 5 වෙනි ක්‍රියාකාරකම.

- අපට දෙන ලද දීමනා සහ තලෙන්ත වලින් අප කළ දේ ගැන වාර්තාව අප දිය යුත්තේ කවදාද, කාටද? වාර්තාකිරීමට ඔබට අවශ්‍ය මොනවාද? "යහපත්වූ, විශ්වාසවූ දාසය, ඒ යහපත," (මතෙව් 25:21) ස්වාමීන්වහන්සේ ඔබට මෙසේ කියනවා නම් ඔබට හැඟෙන්නේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. ඔවුන්ට සිතීමට හැකි පුළුවන් තරම් තලෙන්ත නම්කිරීමට ළමයින්ට කියන්න; ඒවා සඳහන්කරන විට හුණුලෑල්ලේ තලෙන්ත ලැයිස්තුගත කරන්න. හොඳ සවන්දෙන්නෙක්, අන්‍යයන්ට ප්‍රේමකරන්නෙක්, ප්‍රියජනක වන්නෙක්, යනාදී විශේෂ චරිත ලක්ෂණ ඇතුලත්කිරීමට ළමුන්ව දිරිගන්වන්න.

2. තමන්ගේම තලෙන්ත ලැයිස්තුවක් සෑදීම පිණිස එක් එක් ළමයාට කඩදාසියක් සහ පැන්සලයක් දෙන්න. පංතියේ අනෙක් අයට ලැයිස්තුව නොපෙන්වීමට ඔවුන්ට කියන්න. පංතියේ අනෙක් සෑම ළමයෙකුටම තලෙන්තුවක් නම්කිරීමට පංති සාමාජිකයන්ට කියන්න. එක් එක් ළමයෙකුගේ තලෙන්ත සඳහන්කරන විට, දැනටමත් නොමැති අනෙක් ළමයින් හඳුනාගත් තලෙන්ත ඔහුගේ හෝ ඇයගේ ලැයිස්තුවට එකතුකිරීමට යෝජනා කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න අසන්න:

- ඔබගේ කඩදාසියේ නොමැති ඔබ ගැන යමක් පංති සාමාජිකයන් නම් කළා නම්, එම තලෙන්තය ඔබට දියුණුකරගත හැකිවන්නේ කෙසේද?
- ඔබ ලියූ යමක් පංති සාමාජිකයන් නම් නොකළේ නම්, එම තලෙන්තය ඔබ වැඩිදියුණුකර ගන්නේ කෙසේද?

ඔහුගේ හෝ ඇයගේ තලෙන්තයක් තෝරාගෙන එය තවදුරටත් දියුණුකරගැනීමට හෝ ඉදිරි සතිය තුල එය භාවිතාකිරීමට එක් එක් ළමයාට අභියෝග කරන්න.

3. සභාපති හීබර් ජේ. ග්‍රාන්ට් ගැන පහත සඳහන් කථාන්තරය බෙදාගන්න:

“මගේම සහ ටිකක් වැඩිමහල් ළමුන්ගේ බේස් බෝල් සමාජයකට මා බැඳුන විට, පළවෙනි නවයේ කණ්ඩායමේ ක්‍රීඩා කළෙමි. [ඉතාම හොඳ ක්‍රීඩකයන්ගේ කණ්ඩායම]; මට වඩා බාල ළමයි දෙවෙනි කණ්ඩායමේද, ඊටත් වඩා බාල අය තුන්වෙනි කණ්ඩායමේද ක්‍රීඩා කළ අතර, මම ඔවුන් සමග ක්‍රීඩා කළෙමි. මෙයට එක කරුණක් වූයේ, එක තලයක සිට අනෙක් එකට බෝලය වීසිකිරීමට මට නොහැකි වීමය. දිවීමට හෝ පිත්තෙන් ගැසීමට මා ශාරීරික ශක්තියෙන් හීනවීම තවත් කරුණක් විය. බෝලය මා ඇහිඳගත් විට, ‘සී සී එය මෙහාට වීසික-රන්න!’ යයි අනෙක් ළමයි කෑගසති.

“මගේ තරුණ සගයෝ මා නිසා බොහෝ විනෝදවූහ. එම නිසාම නමවෙනි කණ්ඩායමේ ක්‍රීඩා කර යුටා පළාතේ ශූරතාව දිනාගන්නා බවට ඉතා සංසුන්ව මම අදිටන්කර ගතිමි.

“...මම ඩොලර් එකක් ඉතිරි කරමින් එය බේස් බෝල් ක්‍රීඩාව උදෙසා තැන්පත් කළෙමි. සභානායක එඩවඩ් ඩී. වූලිගේ ධාන්‍යාගාරය අසල...පැය ගණන් බෝලය වීසිකරමින් පුහුණු උනෙමි. රෑ නිදාගැනීමට නොහැකි තරම් මගේ අත නිතර කකියන්ට විය. මම නිතරම පුහුණුවෙමින් අපගේ කණ්ඩායමේ නමවෙනි දෙවෙනි කණ්ඩායමට ඇතුළත්වීමට අන්තිම වශයෙන් මම සමත් වුනෙමි. පසුව මම වඩාත් හොඳ කණ්ඩායමකට සම්බන්ධවී එහි ප්‍රතිපලයක් වශයෙන් නමවෙනි කණ්ඩායමේ ක්‍රීඩාකර පළාතේ ශූරතාව දිනාගත්තෙමි” (*Gospel Standards*, පිටු. 342–43).

4. පහත සඳහන් උපුටාගැනීම සභාපති හීබර් ජේ. ග්‍රාන්ට්ගේ ප්‍රියතම කියමනකි. එහි අදහස ළමයින් සමග සාකච්-ඡාකර, එය කටපාඩම්කිරීමට ඔවුන්ව දිරිගන්වන්න.

“නොනවත්වාම අප කරගෙන යන දෙය, අපට කිරීමට පහසු වෙනවා ඇත; එහි ස්වභාවය වෙනස් වෙනවා නොවේ, නමුත් එය කිරීමේ අපගේ බලය වැඩිවෙනවා ඇත” (*Gospel Standards*, පි. 355).

5. සභාවේ පුද්ගලයන්ට දී තිබෙන සමහර වගකීම් ගැන සිතීමට ළමයින්ට කියන්න. කඩදාසි කෑල්ලක් සහ පැන්ස-ලයක් ඔවුන්ට දී, වගකීමක් හෝ පැවරුමක් ලිවීමට ඔවුන්ට කියන්න (එක් එක් ළමයාට එකකට වඩා වැඩි-යෙන් දායකවීමට හැකිය). කඩදාසි කෑලි පෙට්ටියකට හෝ ජෝගුවකට දැමීමට සලස්වන්න. ඉන්පසු වාර අනුව පෙට්ටියෙන් කඩදාසි කෑල්ලක් ගැනීමට සලස්වන්න. මෙම පැවරුම හෝ වගකීම ඉටුකිරීමෙන් ඔවුන්ට දියුණුකි-රීමට හැකි තලෙන්ත කුමක්දැයි කීමට කියන්න. කොපමණ වෙනස් තලෙන්ත ළමයින්ට හඳුනාගැනීමට හැකි-වේද කියා බැලීමට සඳහන්කරන ලද තලෙන්ත, හැකියාවන්, හුණුලෑල්ලේ ලැයිස්තුගත කරන්න.

---

## අවසානය

**සාක්ෂිය**

දෙවියන්වහන්සේ අපට දෙන ලද තලෙන්ත අපගේ සහ අන්‍යයන්ගේ ප්‍රයෝජනය උදෙසා අප භාවිතාකරන විට, අපට ලැබෙන ප්‍රීතිය ගැන සාක්ෂිදරන්න. ඔබගේ තලෙන්ත මනා ලෙස භාවිතාකළ අයෙකු වශයෙන් ස්වර්ගික පියාණන්වහන්සේ වෙතට නැවත යෑමට ප්‍රීතිය කෙතරම්ද කියා ළමයි සමග බෙදාගන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂණය කිරීමක් වශයෙන් මතෙව් 25:14–30 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සටහන: සහන සමිතියේ සභාපතිත්වයේ හෝ සභානායකත්වයේ සාමාජිකයෙකු පැමිණ සහන සමිතිය සානුකම්පිත සේවය දෙන ආකාරය ගැන ළමුන්ට කථාකිරීමට සැලැස්වීම, 27 වෙනි පාඩමේ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්වලට අවශ්‍යවේ. මෙම ක්‍රියාකාරකම භාවිතාකිරීමට ඔබට අවශ්‍ය නම්, ඔහු හෝ ඇය කථාකිරීම ඔබට අවශ්‍ය දෙය ගැන කල් ඇතිව එම පුද්ගලයාට පහදා දෙන්න.

27

වෙනි පාඩම

# බැටළුවන් සහ එළුවන් ගැන උපමාව

**අරමුණ** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපව විනිශ්චයකරන කාලය සඳහා අපට සූදානම්වීමට, අන් අයට සේවයකිරීම උපකාරවන බව ලමයින්ට ඉගැන්වීමය.

**සූදානම්වීම**

1. මතෙව් 25:31–46 යාච්ඤාවෙන් කියවන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණය කරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: යාකොබ් 2:17–19; මොසායා 4:16, 26; සහ දහම සහ ගිවිසුම 104:17–18.
3. ලමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. පින්තූරය 7:26, අන්තිම විනිශ්චය (වොෂින්ටන් දේවමාළිගාවේ සිතුවම්), සහ 7-25, දෙවෙනි ඊම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 238; 62562).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

පසුගිය සතියේ යමක් වැඩිදියුණුකර ගැනීමට ඔවුන් කළ දෙයක් පංතිය සමග බෙදාගැනීමට හෝ හැකියාවක් බෙදාගැනීමට ලමයින්ට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම පහත සඳහන් හෝ එයට සමාන අවස්ථාවන් ලමුන්ට කියවන්න (ලමුන්ගේ අත්දැකීම් මත පදනම් කළ ගත් අවස්ථාවන් භාවිතාකරන්න). ඔවුන් කළයුතු දෙය ගැන කුමක් සිතන්නේදැයි ඔවුන්ගෙන් අසන්න:

වතුර ටිකක් ගැනීමට නොහැකි පිපාසය ඇති බාල වයස්කාර ලමයෙක් ඔවුන් දුටු විට

සති ගණනාවක් සභාවට නොපැමිණි ලමයෙකු ගැන ඔවුන් දන්නා විට.

අවශ්‍ය ප්‍රමාණයට කෑම නොමැති කෙනෙක් ගැන ඔවුන් දන්නා විට.

අධික ශීතල අවස්ථාවකි, උණුසුම් කබායක් නොමැති කෙනෙක් ඔවුන් දුටු විට,

අසනීපයක් හෝ ආබාධයක් නිසා දිගු කලක් නිවසේ සිටින කෙනෙක් ගැන ඔවුන් දැනගත් විට.

- යේසුස්වහන්සේට අවශ්‍ය ඔබ කුමක් කිරීමද? මෙවැනි අවස්ථාවලදී ඔබ අන්‍යයන්ට උපකාර කළ යුතු වන්නේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද?

යේසුස්වහන්සේ උන්වහන්සේගේ දෙවෙනි ඊම ගැන පුද්ගලයන්ට ඉගැන්වීමට භාවිතාකළ උපමා දෙකක් ගැන පසුගිය පාඩම් දෙකේදී ඔවුන් ඉගෙනගත් බව ලමයින්ට මතක් කරන්න. මතෙව් 25, තුන්වෙනි උපමාව මෙම පාඩමෙන් උගන්වන අතර, සියලුම උපමා තුනම එක්ව අපට උගන්වන්නේ යේසුස්වහන්සේගේ දෙවෙනි ඊම සහ උන්වහන්සේ අපව විනිශ්චය කරන කාලය සඳහා අපට සූදානම්විය හැකි ආකාරය ගැනය. සූදානම්වීමේ ඉතාම හොඳ එක් මගක් නම්, අන්‍යයන්ට සේවය කිරීමය.

ශුද්ධ ලියවිලි විස්තර අන්තිම විනිශ්චය සහ දෙවෙනි ඊමේ පින්තූර සුදුසු අවස්ථාවලදී පෙන්වමින් මතෙව් 25:31–46 සඳහන් බැටළුවන් සහ එළුවන් ගැන උපමාව ලමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න," ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)

**සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනයකරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස්වහන්සේ නැවත පැමිණෙන විට එය කුමක් මෙන් වේයැයි ඔබ සිතන්නේද?
- උන්වහන්සේ නැවත පැමිණීමේදී, එඬේරුන් බැටළුවන්ගෙන් එළුවන් වෙන්කරන ආකාරයට, යේසුස්වහන්සේ ජාතීන් වෙන්කරන බව උගන්වනසේක. (මතෙව් 25:32.) මෙම උපමාවේ බැටළුවන් නියෝජනය කරන්නේ කවුද? (මතෙව් 25:33–36.) එළුවන් නියෝජනය කරන්නේ කවුද? (මතෙව් 25:33, 41–43.) යේසුස්වහන්සේ බැටළුවන්-ගෙන් එළුවන් වෙන්කරන්නේ කුමක් නිසාද? බැටළුවන් සහ එළුවන් අතර ප්‍රධාන වෙනස කුමක්ද?
- යේසුස්වහන්සේගේ දකුණු අත පැත්තේ සිටින අය උන්වහන්සේට කෑමද, ඇඳුම්ද යනාදිය දුන් බව කීමෙන් උන්වහන්සේ අදහස් කළේ කුමක්ද? (මතෙව් 25:37–40.) "මගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකු" යනු කවරහුද?
- ධර්මිෂ්ඨයන් දුන්නේ කුමන ආකාරයේ සේවයක්ද? (මතෙව් 25:35–37.) ස්වාමීන්වහන්සේගේ බැටළුවන් අතර ගණන් කරනු ලැබීමට අප කිරීමට අවශ්‍ය මොනවාද? එවැනි සේවා ක්‍රියා ඔවුන්ට ඉටුකිරීමට හැකි ක්‍රම ගැන සිතීමට ළමුන්ට උපකාර කරන්න. ඔබ දැක ඇති සේවයේ ආදර්ශ බෙදාගනිමින් ඔවුන් දැක ඇති ආදර්ශ බෙදාගැනීමට ළමුන්ට ආරාධනාකරන්න.
- අන්‍යයන්ට අප සේවයකරන්නේ නම්, අපට ලැබෙන ත්‍යාගය කුමක්ද? (මතෙව් 25:34, 46.) අන්‍යයන්ට සේවය නොකරන අයට සිදුවන්නේ කුමක්ද? (මතෙව් 25:41, 46.)
- අප සෙවයකළ යුත්තේ කාටද? අපගේ සේවයෙන් උපකාර ලබන්නේ කවුරුන්දැයි අප දන්නා අය කවුද? (මතෙව් 25:40; තවද බලන්න මොසායා 4:16.) (බලන්න සාරවත්කිරීමේ ක්‍රියාකාරකම 1.)
- යේසුස්වහන්සේ අන්‍යයන්ට සේවය කළේ කෙසේද? (යේසුස්වහන්සේ රෝගීන් සුවකිරීම, ළමයින්ට ආශිර්වාද-කිරීම, 5,000කට කන්ට දීම, යනාදී සමහර ශුද්ධ ලියවිලි විස්තර නැවත බලන්න. උන්වහන්සේ මේවා කරන විට, එම පුද්ගලයන්ට යේසුස්වහන්සේ දැක්වූ ප්‍රේමය ගැන අවධාරනය කරන්න.) අන්‍යයන්ට සේවය කිරීමේ උන්වහන්සේගේ ආදර්ශය ඔබට උපකාරවන්නේ කෙසේද?
- අපගේ සේවය මගින් අන්‍යයන්ට ආශිර්වාද කිරීමට අපට හැකිවන්නේ කෙසේද? වෙනත් පුද්ගලයෙකුට සේවය-කිරීමෙන් ඔබ ආශිර්වාද ලද්දේ කෙසේද? අන්‍යයන්ට සේවයකරන විට ඔබට හැඟෙන්නේ කෙසේද? ඔබ සේවය-කරන අය ගැන ඔබට හැඟෙන්නේ කෙසේද?

ඔවුන්ගේ ජීවිතවලට මෙම පාඩම අදාළකර ගැනීමට ළමුන්ව දිරිගන්වන පිණිස සාරවත්කිරීමේ 4 වෙනි ක්‍රියාකාරකම ඔබට භාවිතාකිරීමට හැකිය.

---

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. පහත සඳහන් කථාව ළමුන් සමග බෙදාගෙන සාකච්ඡාකරන්න:

   "මගේ ළමා කාලයේ සිහිවටන බොහොමයක් මට ඇත. ඉරුදින රාත්‍රී අහාරය ඉන් එකකි. රෝස්කරන ලද හරක් මස්වල සුවඳින් මුළු කාමරය පිරී යන විට, පිරිමි ළමයි වන අපි මැරෙන තරම් හාමතේ සිටින මෙන් උනන්දුවෙන් මේසය ළඟ වාඩිවී සිටින විට, මව මට මෙසේ කියයි, 'ටොම්, අපි කන්ට ඉස්සරවෙලා, මා සූදානම්කළ මෙම කෑම පිඟාන වීදිය පහත සිටින මහලු බොබ්ට දී, ඉක්මණට ආපසු එන්න,' මම…බොබ්ගේ නිවසට දුව ගොස්, වයස්ගතවූ ඔහුගේ දෙපා දොර ළඟට ඔහුව ගෙනෙන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටිමි. පසුව කෑම පිඟාන මම ඔහුගේ අතට දෙන්නෙමි. පසුගිය ඉරුදින දුන් කෑම පිඟාන පිරිසිදු කොට මට දී මගේ සේවය වෙනුවෙන් ඔහු මට ශත තිහක් පමණ වටිනා රිදී කාසියක් තෑගි කරයි. මගේ පිළිතුර නිතරම එක සමානය: 'මුදල් මට භාරගැනීමට බැරිය, මගේ මව මට තලයි,' එවිට ඔහු…මෙසේ කියයි, 'මගේ දරුවා, ඔබට ඉන්නේ ශ්‍රේෂ්ඨ මවක්, ඇයට ස්තුතියි කියන්න.' …පණිවුඩය දී මා අපසු පැමිණි විට, එම ඉරුදින රාත්‍රී කෑම වැඩියෙන් රස බවද මට මතකය" (Thomas S. Monson, "The Long Line of the Lonely," *Ensign,* පෙබ. 1992, ප. 4).

2. සහන සමිතියේ සභාපතිත්වයේ හෝ සභානායකත්වයේ සාමාජිකයෙකුට පැමිණ සහන සමිතියේ කාරුණික සේවය ලබා දෙන ආකාරය ගැන ළමයින්ට කථාකිරීමට සැලස්වීමට සූදානම්කරන්න. නිරාහාර පිදුම් භාවිතාකරන අන්දමද ඇතුලත් කරමින්, අවශ්‍යතාවයන් ඇති අයට සහාව උපකාරකරන අන්දම පහදා දීමට අමුත්තාට සලස්වන්න.

3. එක් එක් ළමයාට කඩදාසියක් සහ පැන්සලක් දී, ගෙදර අයට හෝ අසල්වැසි අන්‍යයන්ට සේවයකිරීමට හැකි මාර්ග ලැයිස්තුගත කිරීමට කියන්න. මෙම සතියේ අවම වශයෙන් සේවයේ එක් ක්‍රියාවක්වත් ඉටුකිරීමට ළමුන්ට අභියෝග කරන්න.

4. පහත සඳහන් උපුටාගැනීම සාකච්ඡා කරන්න

   "සියලුම මිනිසුන් විනිශ්චය කිරීමට ප්‍රඥාවන්ත සහ සාධාරණ දෙවියන්වහන්සේ කෙනෙක් අසුන්ගෙන සිටිනසේක....දුෂ්ඨයන් කාලයකට සමෘධිමත්විය හැකිය, කැරළිකරුවන් ඔවුන්ගේ වැරදි මගින් ප්‍රයෝජන ලැබිය හැකි නමුත්, කාලය පැමිණිවිට විනිශ්චයාසනයේ 'ඔවුන් එකිනෙකා තම තමන්ගේ ක්‍රියා අනුව,' සියලුම මිනිස්සු විනිශ්චයකරනු ලබන්නෝය' (එළිද. 20:13). කිසිම කෙනෙකුට විපාක වැළැක්විය නොහැක. එම දිනයේදී ඔහුගේ ක්‍රියාවලට දඬුවමෙන් කිසිවෙකුට බේරීමට නොහැක, ඔහු උපයාගත් ආශිර්වාද කිසිවෙකුට නොලැබීයන්නේද නැත. එහි පූර්ණ සාධාරණත්වය තිබෙන බව බැටළුවන්ගේ සහ එළුවන්ගේ උපමාව නැවතත් අපට ස්ථිර කරය" (Spencer W. Kimball, *The Miracle of Forgiveness,* පි. 304–5).

5. පෙට්ටි හෝ භාජන දෙකක් සූදානම්කරන්න. එක් පෙට්ටියක් "බැටළුවන්" වශයෙන්ද, අනෙක් පෙට්ටිය "එළුවන්" වශයෙන්ද නම්කරන්න. "බැටළුවන්" පෙට්ටිය ඔබගේ දකුණු පසින්ද, "එළුවන්" පෙට්ටිය ඔබගේ වම් පසින්ද තබන්න. හොඳ සහ නරක ක්‍රියා යන්න කඩදාසි කැලිවල වෙන් වෙන් වශයෙන් ලියන්න (පැහැදිළි ලෙස පෙනෙන සමහර ක්‍රියා ඇතුළත්කරන්න.) එක් එක් ළමයෙකු එක් එක් ක්‍රියාවක් ලියා එය "බැටළුවෙකුගේ" හෝ "එළුවෙකුගෙ" ක්‍රියාවක්ද කියා තීරණය කිරීමට ළමයින්ට සලස්වා, කඩදාසි කැල්ල සුදුසු පෙට්ටියට දැමීමට සලස්වන්න.

   පහත සඳහන් ලැයිස්තුගතකරන ලද ක්‍රියා හෝ ඔබගේම ඒවා නිර්මානය කරන්න:

   ඔබගේ දෙමාපියන්ට සත්‍යය ප්‍රකාශකිරීම
   ඔබ යම් වැරදි දෙයක් කළ පසු එය පිළිනොගැනීම.
   ඔබගේ සහෝදරයා හෝ සහෝදරිය සමග දබරකිරීම.
   ඔබ යම් කෙනෙකුගේ හැඟීම් රිදෙව්වාට පසු "මට කණගාටුයි" කීම.
   සත්‍යයෙන් කොටසක් පමණක් කීම.

6. මතෙව් 25;40 කටපාඩම්කිරීමට ළමයින්ට උපකාර කරන්න.

---

## අවසානය

සාක්ෂිය

අප අන්‍යයන්ට සේවයකිරීම යේසුස්වහන්සේට අවශ්‍යවන අතර, එසේ කිරීමෙන් අප ආශිර්වාද ලබන බවට ඔබගේ සාක්ෂිය දරන්න. සේවයකිරීමට ඔබට ඇති අවස්ථාවන් ගැන ඔබගේ හැඟීම් ළමයින් සමග බෙදාගන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් මතෙව් 25:35–40 අධ්‍යයනයකරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලාසරුස්ව මරණයෙන් නැගිටුවීම

28
වෙනි පාඩම

| | |
|---|---|
| **අරමුණ** | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බැවින් උන්වහන්සේට මරණය ජයගැනීමට බලය තිබෙන බව තේරුමගැනීමට එක් එක් ළමයාට උපකාරකිරීමය. |

**සූදානම්වීම**

1. යොහාන් 11:1–46 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අත්දම ගැන තීරණය කරන්න (බලන්න "ඔබගේ පාඩම සූදානම් සූදානම්-කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. ලූක් 7:11–17; 8:41–42, 49–56 නිරීක්ෂනය කරන්න.
3. ළමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. අළුතෙන් කැපූ නටුවක් හෝ කොළයක් සහ මැරුණු එකක් (හෝ මේවායේ එක් එක් පින්තූරයක්).
   ඇ. 7-27 පින්තූර, යේසුස්වහන්සේ ලාසරුස්ව මළවුන්ගෙන් නැගිටවීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 222; 62148), සහ යේසුස්වහන්සේ යායීරස්ගේ දියණියට ආශිර්වාද කිරීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 216; 62231).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

අලුතෙන් කපන ලද නටුව හෝ කොළය සහ මැරුණු එක ළමුන්ට පෙන්වන්න. එම දෙකෙහි වෙනස ගැන කථාකිරීමට ළමුන්ට කියන්න.

- මැරුණු නටුවක් අලුතෙන් කපන ලද නටුවක් මෙන් පෙන්වීමට අපට කළ හැකි යමක් තිබෙනවාද?
- අලුතෙන් කපන ලද නටුව පැළෑටියෙන් දැන් කපා වෙන් කළ බැවින් එයට කුමක් වන්නේද?
- මැරුණු දෙයකට නැවත ප්‍රාණය ලබාදීමට බලය ඇත්තේ කාටද?

මරණයෙන් ජයගැනීමේ බලය යේසුස්වහන්සේට තිබෙන බව පහදා දෙන්න. මැරුණු පුද්ගලයන් කිහිප දෙනෙකුට උන්වහන්සේ ජීවය ලබාදුන්සේක.

ශුද්ධ ලියවිලි විස්තරය

යේසුස්වහන්සේ විසින් නායින් නුවර කනවැන්ඹුවගේ පුතා (ලූක් 7:11–17 සහ යායීරස්ගේ දියණිය (ලූක් 8:41–42, 49–56) ජීවත්කිරීමේ විස්තරය කෙටියෙන් නිරීක්ෂනය කරන්න. ඉන්පසු යොහාන් 11:1–46 සඳහන් පරිදි මළාවූ ලාසරුස්ව යේසුස්වහන්සේ විසින් නැවත මළවුන්ගෙන් නැගිටවීම ගැන විස්තරය ළමයින්ට උගන්වන්න. සුදුසු අවස්ථාවේදී පින්තූර පෙන්වන්න (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ලාසරුස්ට අසනීප බවට පණිවුඩය යේසුස්වහන්සේට ලැබුණ විට, බෙතානියට පිටත්වීමට පෙර යේසුස්වහන්සේ කොපමණ කාලයක් බල සිටියේද? (යොහාන් 11:6.) යේසුස්වහන්සේ පැමිණෙන විට, ලාසරුස්ගේ ශරීරය කොපමණ කාලයක් සොහොන්ගෙයි තිබුනේද? (යොහාන් 11:17.) එහි යාමට යේසුස්වහන්සේ එපමණ දිගුකලක්

බලා සිටියේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (එවිට ලාසරුස් මැරුනු බව ප්‍රශ්නයකින් තොරව සියලු දෙනාම දැනගන්නා අතර, ඔහුව නැගිටවීම යේසුස්වහන්සේගේ දිව්‍යමය බලය සහ දූතමෙහෙය ගැන ප්‍රබල සාක්ෂියක් වුනු ඇත [යොහාන් 11:4, 15].)

- යේසුස්වහන්සේ පැමිණි විට මාර්තා සහ මරියා උන්වහන්සේට කීවේ කුමක්ද? (යොහාන් 11:21–22, 32.) ලාසරුස් නැවත නැගිටින බව යේසුස්වහන්සේ මාර්තාට කී විට, ඇය සිතුවේ කුමක්ද? (යොහාන් 11:23–24.) තම සහෝදරයා මළවුන්ගෙන් නැගිටීමට පෙර පවා මාර්තාගේ සාක්ෂිය වූයේ කුමක්ද? (යොහාන් 11:27.)
- ලාරුස්ව නැගිටුවීමට පෙර යේසුස්වහන්සේ ස්වර්ගික පියාණන්ට යාච්ඤා කළේ කුමක් නිසාද? (යොහාන් 11:41–42.) ජනතාව කුමක් තේරුම්ගැනීම යේසුස්වහන්සේට අවශ්‍යවූයේද? (උන්වහන්සේව ස්වර්ගික පියාණන්-වහන්සේ විසින් එවන ලද බවය.)
- යේසුස්වහන්සේ ලාසරුස්ට කීවේ කුමක්ද? (යොහාන් 11:43.) සිදුවූයේ කුමක්ද? ලාසරුස් ඇඳ සිටියේ කුමක්ද? (යොහාන් 11:44.)
- මෙම හාස්කම මරියා, මාර්තා සහ අනෙක් පුද්ගලයන් දුටු විට, ඔබ සිතන ආකාරයට ඔවුන්ට හැඟුනේ කෙසේද? ඔබ එහි සිටියා නම් ඔබට හැඟෙන්නේ කෙසේදැයි ඔබ සිතන්නේද? හාස්කම දුටුවාට පසු මිනිසුන් කළේ කුමක්ද? (යොහාන් 11:45–46.) සොහොන් ගෙයින් පිටතට ලාසරුස් පැමිණෙනවා දැකීමෙන් යේසුස්වහන්සේ කෙරෙහි ඔබගේ විශ්වාසයට එය බලපාන්නේ කෙසේද?
- ලාසරුස්ව මළවුන්ගෙන් නැගිටවීමට යේසුස්වහන්සේට හැකිවූයේ කමක් නිසාද? යමෙක් මළවුන්ගෙන් නැගිටු-වීමට යේසුස්වහන්සේට බලය තිබෙන බව දැනගැනීම නිසා ඔබට හැඟෙන්නේ කෙසේද? යේසුස්වහන්සේ දෙවි-යන්වහන්සේගේ පුත්‍රයා බව දැනගැනීමට මෙම හාස්කම අපට උපකාරවන්නේ කෙසේද?
- මරණය ජයගැනීමට උන්වහන්සේගේ බලය ඔප්පුකිරීමට යේසුස්වහන්සේ පසුව කුමක් කළසේක්ද? (උන්ව-හන්සේ මළවුන්ගෙන් නැවත නැගිටුනසේක. ලාසරුස් මළවුන්ගෙන් නැවත පැමිණි විට, ඔහු තවමත් මැරෙන සුළු බැවින් ඔහු නැවත මැරෙන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර වන්න. මිනිසුන් මළවුන්ගෙන් නැවත නැගිටුන විට ඔවුහු කිසි දිනෙක නොමැරෙන්නෝය. ඔවුහු සදාකාලයටම ජීවත්වන්නෝය.)
- නැවත නැගිටීමද ජීවනයද උන්වහන්සේ බව කීමෙන් යේසුස්වහන්සේ අදහස් කළේ කුමක්ද? (යොහාන් 11:25.) මෙහි අර්ථය අපට හැඟෙන්නේ කෙසේද?

ලාසරුස්ට කළාක් මෙන්, යමෙක් මැරෙන සුළු ජීවිතයට ගෙනඒමේ බලය පමණක් නොව, ඊටත් වඩා වැඩි බලයක් වන සියල්ලන්ම මරණයෙන් අමරණීයත්වයට ඔසවන බලයක් යේසුස්වහන්සේට තිබෙන බව පහදා දෙන්න. පොළොවේ ඉපදුන සෑම පුද්ගලයෙක්ම මළවුන්ගෙන් නැවත නැගිටින්නේය. උන්වහන්සේට කීකරුව, උන්වහන්සේව අනුගමනයකරන අයට සදාකාල ජීවනය ලබාදීමේ බලයද, යේසුස්වහන්සේගේ වන්දිගෙවීම තුලින් තිබේ. මළවුන්ගෙන් නැවත නැගිටීමද, අප එක් එක් කෙනාට සදාකල ජීවනයේ උල්පත උන්වහන්සේය.

අභියෝගය

යේසුස්වහන්සේ ලාසරුස්ව මළවුන්ගෙන් නැගිටවීම ගැන කථාව තවත් යමෙකුට ලබන සතියේදී කීමට ළමුන්ට අභියෝග කරන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. යේසුස්වහන්සේ ලාසරුස්ව මළවුන්ගෙන් නැගිටුවන විට, එහි සිටි මරියා, මාර්තා, ලාසරුස් සහ යුදෙව්වන් මෙන් ඇඟවීමට ළමයින්ට කියන්න. කුමක් සිදුවූවාද, ඔවුන් කුමක් දුටුවාද, ලාසරුස් ගුහාවෙන් එළියට පැමිණෙනවා ඔවුන් දුටු විට ඔවුන්ට හැඟුන දේවල් ගැන ජනතාව සමග සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට වෙනත් ළමයෙ-කුට කියන්න.
2. පහත සඳහන් දේවල් වැනි සිද්ධීන් සඳහන් කඩදාසි කැලි සූදානම් කරන්න. එනම් යේසුස්වහන්සේ දෙවියන්වහන්-සේගේ පුත්‍රයාණන් බව යමෙක් දැකීම, එනම් එම සිද්ධිය විස්තරකරන ශුද්ධ ලියවිලි සමග තවත් කඩදාසි කැලි කිහිපයක් සූදානම්කරන්න:

සිද්ධිය: යේසුස්වහන්සේ ඉපදුනසේක.

ශුද්ධ ලියවිල්ල: දේවදූතයෙක් මෙසේ කීවේය, "මක්නිසාද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැලවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්නේය" (ලූක් 2:11).

සිද්ධිය: යේසුස්වහන්සේව බව්තීස්මකරනු ලැබුවේය.

ශුද්ධ ලියවිල්ල: ආත්මයාණන්වහන්සේ පරෙවියෙක් මෙන් තමන් පිටට බැස ආසේක; "නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය" යයි අහසෙන් හඬක් නික්මුනේය (මාර්ක් 1:9–11).

සිද්ධිය: යේසුස්වහන්සේ මුහුද පිට පයින් යෑම.

ශුද්ධ ලියවිල්ල: ඔරුවේ සිටි යේසුස්වහන්සේගේ ගෝලයෝ මෙසේ කීවෝය, "ඒකාන්තයෙන්ම ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය" (මතෙව් 14:25–27, 32–33).

සිද්ධිය: යේසුස්වහන්සේ ජාත්‍යාන්ධයෙකු සුවපත් කිරීම.

ශුද්ධ ලියවිල්ල: තවද මිනිසා මෙසේ කීවේය, ස්වාමීනි, මම අදහමි ඔබවහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය

සිද්ධිය: පේතෘස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදැරීම.

ශුද්ධ ලියවිල්ල: යේසුස්වහන්සේ කවුරුන්ද කියා ගෝලයන් සිතන්නේදැයි ඔවුන්ගෙන් ඇසූ විට, පේතෘස් උත්තර දෙමින්, "ඔබ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය" යයි කීවේය (මතෙව් 16:13–16).

සිද්ධිය: ජෝසප් ස්මිත්ට තම පළමු දර්ශනය ලැබුනේය.

ශුද්ධ ලියවිල්ල: ස්වර්ගික පියාණන්වහන්සේ මෙසේ කීසේක, මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණන්ය. ඔහුට ඇහුම්කන් දෙන්න!" (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17).

පොළොවේ හෝ මේසයක් මත මුහුණත පහතට සිටින ලෙස කඩදාසි අපිළිවෙලට තබන්න. ළමයෙකුට ඉදිරියට ඒමට සලස්වා කඩදාසි දෙකක් හරවා සුදුසු ශුද්ධ ලියවිලි විස්තර සිද්ධිය සමග සමානකිරීමට සලස්වන්න. කඩදාසි දෙක එක්ව නොයන්නේ නම්, කඩදාසි ආපසු හරවා වෙනත් ළමයෙකුට වාරයක් ගැනීමට සලස්වන්න. එක් එක් ළමයා වාරයක් ලබාගැනීමට පෙර, සියලුම කඩදාසි සමාන කළා නම්, නැවත එම ක්‍රීඩාව කරන්න.

3. යොහාන් 11:25 කඩපාඩම් කිරීමට ළමුන්ට උපකාරවන්න.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවත්, මරණය කෙරෙහි බලය තිබෙන බවටත් ඔබගේ සාක්ෂිය දරන්න. අපට මළවුන්ගෙන් නැවත නැගීටීමටත්, සදාකාල ජීවනය ලබාගැනීමටත් සැලැස්වූ බැවින්, ගැලවුම්කරුවාණන්ට ඔබගේ ප්‍රේමයද, උන්වහන්සේ අපගේ පාපවලට වන්දිගෙවූ බැවින්, ඔබගේ කෘතඥතාවය ප්‍රකාශකරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් යොහාන් 11:39–46 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඥාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# 29
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විජයග්‍රාහී ඇතුල්වීම සහ අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිතර සිහිකිරීමේ මතක්කිරීමක් වශයෙන් හැම සතියකම සක්‍රමේන්තුවට සහභාගිවීමේ වැදගත්කම තේරුම්ගැනීමට එක් එක් ළමයාට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 21:1–11; මාර්ක් 14:12–26; ලූක් 19:29–38; 22:15–20; සහ දහම සහ ගිවිසුම 20:77, 79 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි 00 vii.)
2. අමතර කියවීම්; දහම සහ ගිවිසුම 27 මාතෘකාව, දහම සහ ගිවිසුම 27:2 සහ *සුභාරංචි මූලධර්ම* පරිච්ඡේද 23.
3. ළමුන්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. දහම සහ ගිවිසුමේ පිටපත් කිහිපයක්.
   ඇ. එක් එක් ළමයා සඳහා පැන්සල් සහ කඩදාසි (මනාපය පරිදි).
   ඈ. 7-28 පින්තූර විජයග්‍රාහී ඇතුල්වීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 223; 62173), සහ 7-29, අන්තිම භෝජන සංග්‍රහය (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 225: 62174).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

පංතිය කණ්ඩායම්වලට බෙදා, ඔවුන්ගේ පවුල් බැහැදැකීමට විශේෂ අමුත්තන් එන බැවින් ඔවුන්ගේ නිවෙස්වල කිරීමට තිබෙන දේවල් ගැන සිතීමට ළමුන්ට කියන්න, එනම් ගෙය පිරිසිදුකිරීම, විශේෂ ආහාර සූදානම්කිරීම යනාදියයි, ඔවුන් කරන දේවල් එක් එක් කණ්ඩායමට රඟපෑමට සලස්වා, පංතියේ ඉතිරි අයට ඔවුන් කරන දේවල් අනුමාන වශයෙන් කීමට සලස්වන්න.

- ගැලවුම්කරුවාණන් ඔබගේ නිවසට පැමිණෙනවා නම්, සූදානම්වීම වශයෙන් ඔබ කරන්නේ මොනවාද? ඔවුන් උන්වහන්සේට කොතරම් ගෞරවයක් සහ සැළකිල්ලක් තිබෙනවාද කියා පෙන්වීමට ගැලවුම්කරුවානන්ට විශේෂ පිළිගැනීමක් ජනතාව සූදානම්කරන කාලයක් ගැන මෙම පාඩමෙන් උගන්වන බව ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තර, සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

විජයග්‍රාහී ඇතුල්වීමේ පින්තූරය පෙන්වන්න. යේසුස්වහන්සේ යෙරූසලමට විජයග්‍රාහීව ඇතුල්වීමේ විස්තරය ළමුන්ට උගන්වන්න මතෙව් 21:1–11; ලූක් 19:29–38). ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. vii.)

- යේසුස්වහන්සේ තම නගරයට පැමිණෙන බව ඇසූ ජනතාව කළේ කුමක්ද? (මතෙව් 21:8–9.) යේසුස්වහන්සේ ගැන ඔවුන්ට හැඟුනේ කුමක්දැයි ඔබ සිතන්නේද? ඔබ එහි සිටියේ නම්, ඔබට හැඟෙන්නේ කෙසේද කියා ඔබ සිතන්නේද?
- යේසුස්වහන්සේ සමග ජනතාව යෙරුසලසමට ගමන්කරන විට, "හොසන්නා" යයි ඔවුන් කෑගැසුවේ කුමක් නිසාද? (උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව විශ්වාසකිරීම පෙන්වීමට, යේසුස්වහන්සේට ප්‍රශංසා කරමින් නමස්කාර කිරීම, ඔවුන්ගේ මාර්ගයක් බව තේරුම් ගැනීමට ළමයින්ට උපකාරකරන්න.) ස්වර්ගික පියාණන්ට සහ යේසුස්වහන්සේට අද අප නමස්කාර කරන්නේ කෙසේද? (අප සක්‍රමේන්තු රැස්වීමට පැමිණෙන විට, ශුද්ධ ලියවිලි කියවීම, ගීතිකා ගැයීම, යාච්ඤාකිරීම සහ සක්‍රමේන්තුවට සහභාගිවීම.)

මාර්ක් 14:12–26 සහ ලූක් 22:15–20 සඳහන් අන්තිම රාත්‍රී භෝජනය ගැන ළමුන්ට උගන්වන්න. අන්තිම රාත්‍රී භෝජනය ගැන පින්තූරය පෙන්වන්න. පාස්කුව ආගමික පුද පූජා පැවැත්වීමේ කෑමක්වූ අතර, ජනතාවගේ මුතුන් මිත්තන් මිසරයේ සිටි කාලයේ විනාශකාරී දේවදූතයා ඔවුන්ගේ නිවෙස් පසුකර යන විට, කුළුඳුල් පිරිමි ළමයා නොමැරූ බැවින් එම කාලයේ අවුරුදු පතා එය සිහිකිරීම පිණිස කෑව කෑමක් බව පහදා දෙන්න (බලන්න නික්මයාම 12:21–30).

- මෙම පාස්කු කෑමට අප අන්තිම රාත්‍රී භෝජනය යයි කියන්නේ මන්ද? (ලූක් 22:15–18.) මෙම කෑමේදී යේසුස්වහන්සේ කළේ කුමක්ද? (මාර්ක් 14:22–24.) උන්වහන්සේ මෙය කළේ කුමක් නිසාද? (උන්වහන්සේ පාපයට වන්දිගෙවීමේ වැදගත්කම ඉගැන්වීමටය. නිතර උන්වහන්සේ සහ උන්වහන්සේගේ වන්දිගෙවීම සිහිකිරීම පිණිස උන්වහන්සේ සක්‍රමේන්තුව ස්ථාපිත කළසේක.)
- පාන් නියෝජනය කරන්නේ කුමක් කියා යේසුස්වහන්සේ කීසේක්ද? (මාර්ක් 14:22.) වයින් නියෝජනය කරන්නේ කුමක් කියා යේසුස්වහන්සේ කීසේක්ද? (මාර්ක් 14:22-24. වයින් වෙනුවට අද අපි වතුර පාවිච්චි කරන බව පහදා දෙන්න.) පාන් සහ වතුර යේසුස්වහන්සේගේ ශරීරයේ සහ ලේවල සංකේතයකි, නැතහොත් සිහිපත්කිරීමක් බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න.
- අද අපගේ සක්‍රමේන්තු මෙහෙයට අන්තිම භෝජනය සමානවන්නේ කෙසේද? යේසුස්වහන්සේ පාන් කඩා ආශීර්වාද කර පාන් සහ වයින් බෙදා දුන්නාක් මෙන්, පූජකවරය උසුලන්නන් අද එම වගකීම ඉටුකරන බව ළමයින්ට මතක් කරන්න. ඔවුන්ට ආරෝනික පූජකවරය ලැබෙන විට, සක්‍රමේන්තු මෙහෙය තුළදී සෑසුස්වහන්සේ නියෝජනය කිරීමේ අධිකාරී බලය ලැබෙන බව ඔබගේ පංතියේ පිරිමි ළමයින්ට තේරුම්ගැනීමට උපකාරවීම සඳහා ඔබට මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට හැකිවේ.

සක්‍රමේන්තුව සඳහා වයින් වෙනුවට වතුර පාවිච්චිකරන්නේ කුමක් නිසාද කියා ළමුන්ගෙන් යම් කෙනෙකු ඇසුව හොත්, දහම සහ ගිවිසුම 27:1–2ට ඔවුන්ව යොමුකරන්න.

- දහම සහ ගිවිසුම 20:77, 79 කියවීමට ළමුන්ට සලස්වන්න. මෙම ශුද්ධ ලියවිලි දෙක කුමක්ද? සක්‍රමේන්තු යාච්ඤාවට යේසුස්වහන්සේ වචන එළිදරව්කළ අතර, දහම සහ ගිවිසුමේ ලියා තිබෙන පරිදි පූජකවරුන්ට නැවත කියවීමට උපදෙස් දී තිබෙන බව පහදා දෙන්න.
- සක්‍රමේන්තු යාච්ඤාවට අපි ආමෙන් කියා සක්‍රමේන්තුව භුක්තිවිඳින විට, අප කිරීමට පොරොන්දු වන්නේ මොනවාද? ඒ වෙනුවට ස්වාමීන්වහන්සේ අපට පොරොන්දු වන්නේ මොනවාද? යේසුස්වහන්සේ නිතර සිහිපත්කිරීම අපට වැදගත්වන්නේ කුමක් නිසාද? ගැලවුම්කරුවාණන් නිතර සිහිවීම පිණිස ඔබට කුමක් කළ හැකිද? (බලන්න සාරවත්කිරීමේ 3 වෙනි ක්‍රියාකාරකම.)

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. 6 වෙනි පාඩමේ සඳහන් බව්තීස්ම ගිවිසුම් නැවත බලන්න. සක්‍රමේන්තු යාච්ඤාවේ තිබෙන පොරොන්දු, බව්තීස්ම ගිවිසුම්වලට සමාන බව පහදා දෙන්න. අප සක්‍රමේන්තුවට සහභාගිවීමේදී බව්තීස්ම ගිවිසුම් අපි අළුත් කරන්නෙමු. පහත සඳහන් වචන තීරු ඔබට පෙන්විය හැකිය.

   මම පොරොන්දුවන්නේ
   ක්‍රිස්තුස්වහන්සේගේ නාමය මා වෙතට ගැනීම.
   නිතර උන්වහන්සේ සිහිකිරීම.
   උන්වහන්සේගේ පණත් පිළිපැදීම.

   ස්වාමීන්වහන්සේ මට පොරොන්දුවන්නේ
   උන්වහන්සේගේ ආත්මය නිතර මා සමග සිටීමය.

2. යම්කිසි කරුණක් උදෙසා ඔවුන් තම නම් දී තිබේදැයි ළමුන්ගෙන් අසන්න. අන්‍යයන් උදෙසා ඔවුන් නම් කර ඇති එම පුද්ගලයාගේ නම තිබීම කුමක් වැනිදැයි කථාකිරීමට ඔවුන්ට කියන්න. විශේෂ පවුල් නම් තිබෙන අයට එම නම් තිබීමේ අර්ථය ගැන කථාකිරීමට කියන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ අප සාමාජිකයන්වූ විට, ක්‍රිස්තුස්වහන්සේගේ නම අප වෙත ගැනීමේ අර්ථය ගැන

ළමයින් සමග කථාකරන්න. සභාවේ සාමාජිකයන් වශයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් වන අපගේ ක්‍රියා සුදුසුවිය යුතු බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න.

3. සක්‍රමේන්තු කාලයේදීත්, අපගේ දිනපතා ජීවිතයේදීත්, යේසුස්වහන්සේව සිහිතබාගැනීමට හැකි මාර්ග ලැයිස්-තුගතකිරීමට පංතියට කියන්න. යෝජනාවලට ඇතුළත්විය හැකි දේවල්:

   සක්‍රමේන්තු වේලාවේදී:
      අප උදෙසා එතුමා වද වේදනා විඳ මරණයට පත්වූ අන්දම සිතන්න.
      සක්‍රමේන්තු ගීතිකාවක වචන ගැන සිතන්න.
      යේසුස්වහන්සේගේ ජීවිතය පිළිබඳ කථාන්තර ගැන සිතන්න (විශේෂ කථාන්තර යෝජනාකිරීමට ළමුන්ට සලස්වන්න).
      යේසුස්වහන්සේගේ එක් ඉගැන්වීමක් අනුව ජීවිතය පටන්ගැනීමට හෝ වඩා හොඳට ජීවත්වීම ගැන සිතන්න.
      ඔබගේ බව්තීස්ම ගිවිසුම් ගැන සිතන්න.

   අපගේ දිනපතා ජීවිත තුළදී:
      යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ස්වර්ගික පියාණන්වහන්සේට හැම දිනකම යාච්ඤාකරන්න.
      අපගේ දෙමාපියන්ට කීකරුවන්න.
      පවුලේ සාමාජිකයන්ට කරුණාවන්ත වන්න.
      ශුද්ධ ලියවිලි කියවන්න.
      පණත්වලට කීකරුවන්න.
      ශුද්ධ ස්ථානවලදී ගෞරවනීයවන්න.
      අවශ්‍යතා ඇති අයට උපකාරවන්න.
      අපගේ සභා රැස්වීම්වලට පැමිණෙන්න.

   මෙයින් එක් යෝජනාවක් කඩදාසි කැල්ලක ලියාගෙන සතිය තුළදී සිහිවීමක් මෙන් එය තබාගැනීමට ළමුන්ට කීමට ඔබට හැකිය.

4. පහත සඳහන් ප්‍රශ්න අසමින් සක්‍රමේන්තු ගීතිකාවල අරමුණ ළමයින් සමග සාකච්ඡාකරන්න.

   - සක්‍රමේන්තුව ආශිර්වාද කිරීමට පෙර අප ගීතිකා ගායනාකරන්නේ කුමක් නිසාද?
   - සක්‍රමේන්තු ගීතිකාවෙන් අපට කියන්නේ කවුරුන් ගැනද?

   සෑම සතියකදීම සක්‍රමේන්තු ගීතිකාවේ වචනවලට සවන්දීමට ළමුන් දිරිගන්වන්න. සියලුදෙනාම සවන්දෙමින් යේසුස්වහන්සේ ගැන සිතීමට සක්‍රමේන්තු ගීතිකාවක් පංතිය සමග ගායනාකිරීමට හෝ පටිගතකරන ලද සංගීතයට සවන්දීමට සැලැස්වීමට ඔබට හැකිය.

---

**අවසානය**

| | |
|---|---|
| සාක්ෂිය | යේසුස්වහන්සේ ගැන සහ අප එකිනෙකාට උන්වහන්සේගේ ප්‍රේමය ගැන ඔබගේ සාක්ෂිය දරන්න. උන්වහන්සේව සිහිපත්කිරීමෙන් අපට නිවැරදි තීරණ ගැනීමට උපකාරවන අතර, අපට නැවත උන්වහන්සේ සමග සිටීමට හැකිවන බව අවධාරණය කරන්න. සෑම සතියකම සක්‍රමේන්තුවට ඔවුන් සහභාගිවන වන විට, යේසුස්වහන්සේ ගැන සිතීම-ටත්, ඔවුන් ජීවත්විය යුතු අන්දමට ජීවත්වීමටත් පොරොන්දුවීමට ළමයින්ව දිරිමත්කරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂණයකිරීමක් වශයෙන් මාර්ක් 14:12–26 අධ්‍යයනය කිරීමට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෙත්සෙමනයෙහි සිටීම

# 30
වෙනි පාඩම

**අරමුණ**

උන්වහන්සේගේ වධවේදනා සහ ඔවුන්ගේ පාපවලට වන්දිගෙවූ බැවින්, ඔවුන්ගේ මිදුම්කරුවාණන් වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමය හැඟීම පිණිස ළමයින්ට උපකාරවීමය

**සූදානම්වීම**

1. මතෙව් 26:36–46, ලූක් 22:40–46, යොහාන් 3:16, 15:12–13, මොසායා 3:7, සහ දහම සහ ගිවිසුම 19:15–18 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසුව පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. vi, සහ 'ශුද්ධ ලියවිලි-වලින් ඉගැන්වීම," පි. vii.)
2. අමතර කියවීම්: 2 නිෆායි 9:21–22, ඇල්මා 34:9, දහම සහ ගිවිසුම 76:41–42, සහ සුභාරංචි මූලධර්ම, 12වෙනි පරිච්ඡේදය.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා .
   ආ. පහත සඳහන් වචන තීරු:
      වන්දිගෙවීම යනු කුමක්ද?
      වන්දිගෙවීම අපට අවශ්‍යවන්නේ කුමක් නිසාද?
      අපි සියල්ලන්ම මැරෙන්නෙමු.
      අපි සියල්ලන්ම පව් කරන්නෙමු.
      යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණෝය.
      උන්වහන්සේ පාප රහිත වනසේක.
      මරණය ජයගැනීමට උන්වහන්සේට බලය තිබේ.
   ඇ. පින්තූරය 7-1, යේසුස් නම්වූ ක්‍රිස්තුස්වහන්සේ. (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 240; 62572), සහ 7-30, සහ යේසුස්වහන්සේ ගෙත්සෙමනෙහි යාච්ඤාකිරීම (සුභාරංචි චිත්‍ර මෙවලම 227; 62175).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සක්‍රමේන්තු වෙලාවේදී ඔවුන්ගේ නමස්කාර කිරීම වැඩිදියුණුකර ගැනීමට පසුගිය සතියේ පාඩම උපකාරවූ අන්දම ගැන පංතිය සමග බෙදාගැනීමට ළමයින්ගෙන් කෙනෙකු කැමතිද කියා අසන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පහත සඳහන් අවස්ථාවකට සමාන එකක් ගැන සිතාගැනීමට ළමුන්ට කියන්න (විස්තරාත්මක වන්න, හැකිතරම් සත්‍යවූ අවස්ථාවක් සකස්කරන්න).

ඔබගේ පවුලේ අය ඥාතියෙකු බැහැදැකීමට යන බවක් අඟවන්න. ඔබ ඔබගේ දෙමාපියන්ට අකීකරුවී, ඔබ නොගිය යුතු කාමරයකට ඔබ යයි. ඉතාමත් වටිනා උපකරණයක් ඔබ අතින් කැඩෙයි.

- ඔබට හැඟෙන්නේ කෙසේද?
- අයිතිකරුට ඔබ කියන්නේ කුමක්ද?
- කැඩුණු උපකරණය නැවත තැබීමට ඔබට කළ හැක්කේ කුමක්ද?
- ඒ වාගේ වෙනත් එකක් මිලදී ගැනීමට ඔබට ප්‍රමානවත් මුදලක් නොමැති නම්, ඔබ කරන්නේ කුමක්ද? එයට ඔබ ගෙවන්නේ කෙසේද?

ඔබගේ පියා ඔබට ප්‍රෙමකරන නිසා ඔබට උපකාරකරන බව පහදා දෙන්න. ඔබ අවංකව දුක් වෙනවා නම්, කීකරු නම්, ඔබට හැකි පමණ ගෙවනවා නම්, හිඟ මුදල ගෙවීමට ඔහු ඔබට උපකාරකරන බව ඔහු ඔබට කියනු ඇත.

- ඔබට හැඟෙන්නේ කෙසේද? එහි වටිනාකම ඔබ විසින්ම ගෙවීමට ඔබට හැකිද? ඔබගේ පියා ඔබට උපකාරකිරීම ගැන ඔබට හැඟෙන්නේ කෙසේද?

පොළොවේ ඉපදීම අප තෝරාගත් බැවින් ස්වර්ගික පියානන්වහන්සේ වෙතට නැවත යෑම පිණිස අප එකිනෙකාට උපකාර අවශ්‍ය බව පහදා දෙන්න.

ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේමකරන නිසා, අපට අප වෙනුවෙන් කළ නොහැකි යම්කිසි දෙයක් කිරීමට අපට උපකාරවීමට උන්වහන්සේලාට සැලසුමක් ඇත. මෙම පාඩම එම සැලසුමේ කොටසක් ගැනය; අපගේ පාපවලට ණය ගෙවීම සහ මරණයෙන් ජයගැනීමට යේසුස්වහන්සේ ඉටුකල ශ්‍රේෂ්ඨ පූජාව ගැනය. පාපයට වන්දිගෙවීම යයි මෙම පූජාවට කියනු ලැබේ. යේසුස් නම්වූ ක්‍රිස්තුස්ගේ පින්තූරය පෙන්වන්න.

**කෙටි නිරීක්ෂණයක්**

ඇදහිල්ලේ තුන්වෙනි කරුණ නැවත කියවීමට ලමුන්ට සලස්වන්න. ඉන්පසු පොළොවේ අපගේ ජීවිතයේ අරමුණ නිරීක්ෂ ණයකිරීමට ඔවුන්ට කියා, අපගේ ගැලවීම පිණිස පාපයට වන්දිගෙවීම අවශ්‍යවන්නේ කුමක් නිසාද කියා ඔවුන්ගෙන් අසන්න. මෙම නිරීක්ෂණයට උපකාරයක් වශයෙන් "සූදානම්වීම" කොටසෙහි ලැයිස්තුගතකර තිබෙන වචන තීරු භාවිතාකරන්න.

"වන්දිගෙවීම යනු කුමක්ද?" (වන්දිගෙවීම යනු, අපගේ පාප උදෙසා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වේච්ඡාවෙන්ම වධවේදනා විඳීමේ ක්‍රියාව සහ කුරුසිය මත උන්වහන්සේගේ ජීවිතය දී මරණය ජයගැනීමය.)

"වන්දිගෙවීම අපට අවශ්‍යවන්නේ මන්ද?" (ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම ලමුන්ට මතක්කරන්න. අප පොළොවට පැමිණ මැරෙන සුළු ජීවිතය ලබාගැනීම තෝරාගත්තෙමු. අපගේ භෞතික ශරීර යම් දවසක මැරෙන්නේය.)

"අප සියල්ලෝම මරණයට පත්වේ." (භෞතික මරණයෙන් අපව ගලවාගැනීමටත්, මරණයෙන් නැවත නැගිටුවීම සැලැස්වීමටත් අපට ගැලවුම්කරුවෙකු අවශ්‍ය වන්නේය.)

"අපි සියලුදෙනාම පව් කරන්නෙමු." (ස්වර්ගික පියාණන්වහන්සේ අභිමුඛයට නැවත යාමට පව්කිරීම අපව නුසුදුස්සන් කරයි. පාප උදෙසා අප පසුතැවිලිවූ විට, අපගේ පාප වෙනුවෙන් ණයගෙවීමට මිදුම්කරුවෙකු අපට අවශ්‍ය වන්නේය.)

"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරු සහ මිදුම්කරුවාණෝය.' (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරු සහ මිදුම්කරුවාණන් වීමට ස්වේච්ඡාවෙන් කැමතිවූ බව අවධාරනය කරන්න; අප වෙනුවෙන් ජීවිතය දීමට එතුමා කැමැත්තෙන් සිටිසේක.)

"උන්වහන්සේ පාපයෙන් තොරවූසේක." (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සර්වසම්පූර්ණවූ බැවින්, අපගේ ගැලවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණන් විය හැකි එකම පුද්ගලයා උන්වහන්සේ වනසේක.)

"මරණය ජයගැනීමේ බලය උන්වහන්සේට ඇත." (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පාපයෙන් තොරවූ නිසා සහ දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් බැවින්ද, උන්වහන්සේට මරණය ජයගැනීමට බලය තිබුනි.)

යොහාන් 3;16 පංතිය සමග කියවන්න. ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙම ශ්‍රේෂ්ඨ සැලසුම ලබාදුන් අන්දම ගැන ඔවුන්ගේ හැඟීම් බෙදාගැනීමට ලමුන්ට ආරාධනාකරන්න. ස්වර්ගික පියාණන්ට සහ යේසුස්වහන්සේට ඔබගේ ප්‍රේමයේ හැඟීම් බෙදාගනිමින්, යම්දවසක උන්වහන්සේලා සමග ජීවත්වීමට නැවත යාමට ඔබට කොපමණ ප්‍රේමයක් අවශ්‍යද කියා ඔවුන්ට කියන්න.

**ශුද්ධ ලියවිලි විස්තරය**

යේසුස්වහන්සේ ගෙත්සෙමනෙහි යාච්ඤාකරන පින්තූරය පෙන්වන්න. මතෙව් 26:36–46, ලූක් 22:40–46, සහ දහම සහ ගිවිසුම 19:16–18 සඳහන් යේසුස්වහන්සේ ගෙත්සෙමනෙහි සිටීමේ විස්තරය ලමුන්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. vii.) යේසුස්වහන්සේ තම දූතමෙහෙය තේරුම්ගෙන ලෝකයේ පාප උදෙසා දරුණු වධ-වේදනා විඳිය යුතු කාලය පැමිණ ඇති බව දැනගත් බව පහදා දෙන්න.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ලමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදළාකරගැනීමට උපකාරවනු

ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ගෙත්සෙමෙනි උයනේදී යේසුස්වහන්සේ ස්වර්ගික පියාණන්ට යාච්ඤාකරන විට, උන්වහන්සේ කුමක් කීසේක්ද? (මතෙව් 26:39, 42, 44.) දරුණු වධ-වේදනා විඳ දරාගැනීමට උන්වහන්සේට සිදුවුවත්, ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුමට යේසුස්වහන්සේ කැමතිවූයේ කුමක් නිසාද? (උන්වහන්සේ තම පියාණන්ට ප්‍රේමකරමින් විශ්වාස කළ අතර, උන්වහන්සේ අපටද ප්‍රේමකරනසේක.)
- යේසුස්වහන්සේ ගෙත්සෙමනි උයනේ යාච්ඤාකරන විට උන්වහන්සේට කුමක් සිදුවුනේද? (ලූක් 22:44; මෝසායා 3:7.) යේසුස්වහන්සේව ශක්‍ති-තිමත්කිරීමට පැමිණියේ කවුද? (ලූක් 22:43.)
- යේසුස්වහන්සේ ගෙත්සමනි උයනේ වේදනා වින්දේ කා වෙනුවෙන්ද? (බලන්න ධීසහගී 19:16.) යේසුස්වහන්සේ කුරුසිය මත වේදනා වින්ද නමුත්, උන්වහන්සේ ගෙත්සෙමනි උයනේදී සෑම සිදුරකින්ම ලේ වගුරවමින් විශාල ලෙස වේදනාවින්ද බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න.

වැඩිහිටි මේරියන් ජී. රොම්නිගේ පහත සඳහන් උපුටාගැනීම කියවන්න: “ගැලවුම්කරුවාණන්…මගේ පුද්ගලික පාපවලට ණය ගෙවූසේක. උන්වහන්සේ ඔබගේ පුද්ගලික පාපවලට සහ පොළොවේ වාසයකළ සෑම ජීවත්ව සිටි ආත්මයන්ට හෝ පොළොවේ ජීවත්වන සෑම මැරෙන සුළු කෙනෙක්ගේම පුද්ගලික පාප සඳහාද ණය ගෙවූසේක” (*Improvement Era*, දෙසැ. 1953, පිටු. 942–43).

- යේසුස්වහන්සේගේ වේදනාවිඳීම කෙතරම් විශාලද? (බලන්න ධීසහගී 19:18.)
- මේ අන්දමින් වේදනාවිඳීමට යේසුස්වහන්සේ කැමතිවුනේ කුමක් නිසාද? (යොහාන් 15:12–13.) යේසුස්වහන්සේ ඔබගේ පාපවලට වේදනාවිඳ වන්දිගෙවීම දැනගැනීමෙන් ඔබට ඇතිවන හැඟීම කුමක්ද? වන්දිගෙවීම ගැන අප ස්තුතිවන්ත වන බව යේසුස්වහන්සේට අප පෙන්වන්නේ කෙසේද?
- ක්‍රිස්තුස්වහන්සේගේ වේදනාවිඳීම අපගේ පාපවලට ණය ගෙවීම වෙනුවෙන් අප කුමක් කළ යුතුද? (පසුතැවිලිවීම, බව්තීස්මවීම, අපගේ බව්තීස්ම ගිවිසුම් තැබීම.) යේසුස්වහන්සේගේ වන්දිගෙවීම ස්වර්ගික පියාණන් වෙත නැවත යාමට අපට ඉඩ සලසන්නේ කෙසේද? අප පසුතැවිලි නොවන්නේ නම් කුමක් සිදුවන්නේද? (බලන්න ධීසහගී 19:15–17.)

අපි ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම පිළිගන්නේ අපගේ පාපවලට පසුතැවීමෙන්, බව්තීස්මවී ශුද්ධාත්මයාණන් ලබාගැනීමෙන්, සහ යේසුස්වහන්සේගේ පණත්වලට කීකරුවීම මගින් බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න. අප මේ දේවල් කරන විට, අපගේ පාපවලට කමාව ලැබ පිරිසිදුවීමට අපට හැකිය, එවිට අපට සදාකාලයටම ස්වර්ගික පියාණන් සමග ජීවත්විය හැකිය.

ඇදහිල්ලේ කරුණ — තුන්වෙනි ඇදහිල්ලේ කරුණ, නැවත කියවා, සාකාච්ඡාකර කටපාඩම්කිරීමට ළමුන්ට උපකාරකරන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවකදී නිරීක්ෂනයක්, සාරාංශයක් හෝ අභියෝගයක් වශයෙන් භාවිතාකිරීමට ඔබට හැකිය

1. පහත සඳහන් ඒවාට සමාන ශුද්ධ ලියවිලි ලැයිස්තුවක් සූදානම්කරන්න (නැතහොත් ඒවා හුණුලෑල්ලේ ලිවීමට ඔබට හැකිය), එක් එක් ශුද්ධ ලියවිලි පණිවුඩය වෙනම තීරුවක ලැයිස්තුගතකරන්න. සටහන් කලවම් කරන්න, එවිට එවිට ඒවා අදාල පණිවුඩයට විරුද්ධ නොවනු ඇත. ළමයෙකුට ශුද්ධ ලියවිල්ලක් දෙස බැලීමට සලස්වා, එහි ඇතුලත් පණිවුඩය තීරණයකර, අදාළ පණිවුඩයට ශුද්ධ ලියවිල්ලේ සිට ඉරක් ඇඳීමට කියන්න. සෑම ළමයෙකුටම වාරයක් දෙන්න.

   මතෙව් 16:21 යේසුස්වහන්සේගේ පරිත්‍යාගය අවශ්‍යවිය.)

   යොහාන් 3:16 (යේසුස්වහන්සේ පොළොවට පැමිණියේ ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රේමකරන නිසාය.)


   යොහාන් 10:17–18 (තම ශරීරය දීමට සහ එය නැවත ගැනීමට බලය යේසුස්වන්සේට ඇත.)

   1 පේතෘස් 1:19–20 (අපගේ ගැලවුම්කරුවාණන් වීමට යේසුස්වහන්සේව ස්වර්ගයේ පටන් තෝරාගෙන තිබින.)

   1 යොහාන් 1:7 (යේසුස් ක්‍රිසතුස්වහන්සේගේ වන්දිගෙවීම අප පසුතැවිලිවන්නේ නම් අපගේ පාප වලින් අපව පිරිසිදු කරයි. )

දහම සහ ගිවිසුම 20:29 (අපට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි ගැලවීම ලැබිය හැක්කේ අපි අපගේ පාපවලට පසුතැවිලිවී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන විශ්වාසය තබා, බව්තීස්මවූ විට පමණි.)

2. පහත සඳහන් කථාව කැමති ලෙස සටහන යොදාගෙන ළමුන්ට කියන්න.



හුදකලාව පාරේ ගමන්කරන මිනිසෙක් ඉතා ගැඹුරු වළකට වැටී පිටතට ඒමට නොහැකිවිය. ඔහු කළ කිසි දෙයකින් පලක් නොවී, තමා විසින්ම පිටතට යාමට ඔහුට නොහැකි විය. මිනිසා උපකාර ඉල්ලා කෑ ගැසූ අතර, එමගින් යන කරුනාවන්ත කෙනෙකුට එය ඇසී වල තුලට ඉනිමගක් දැමීය. මෙමගින් ඔහුට පිටතට ඒමට හැකිවී තම නිදහස නැවත ලබාගැනීමට හැකිවිය.

අපි වලේ සිටි මිනිසාට සමානය. පව්කිරීම වලකට වැටීමට සමානය. අප විසින්ම පිටතට ඒමට අපට නොහැකිය. මග යන්නෙකුට මිනිසාගේ උපකාර ඉල්ලා කෑ ගැසීම ඇසුන ලෙස, ගැලවීම සඳහා උපකාර ස්වර්ගික පියාණන්වහන්සේ එතුමාගේ ඒක ජාතක පුත්‍රයාණන් එවූසේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම වල තුලට ඉනිමගක් දැමීමට සමාන කළ හැකිය; එමගින් පිටතට යාමට අපට උපකාර ලබාදෙයි. වල තුල සිටි මිනිසාට ඉනිමග දිගේ නැගීම අවශ්‍යවන ලෙස, වල තුලින් පිටතට පැමිණ, වන්දිගෙවීම අපගේ ජීවිත තුල ක්‍රියාකිරීමට අපි අපගේ පාපවලට පසුතැවිලිවී, සුභාරංචි මූලධර්ම සහ නියෝගවලට කීකරුවිය යුතු වෙමු. මෙලෙස, අප හැකි සියල්ල කිරීමෙන් පසු, අපට ස්වර්ගික පියාණන් සමීපයට යාමට සුදුසුවීම සඳහා වන්දිගෙවීම අපට හැකියාව ලබාදෙයි.

3. මොසායා 14:3–5 සහ ඇල්මා 7:11–12 කියවන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, වන්දිගෙවීම තුලින්, අපගේ පව්වලට වේදනා වින්දා පමණක් නොව අපගේ වේදනා, රෝගාබාධ, සහ දුක්වලටද වේදනා වින්දසේක. අප පොලොව මත අත්දකින වේදනාවන් සියල්ල එතුමාට ඉතා හොඳින් අවබෝධ වනසේක. එතුමාගේ ප්‍රේමය සහ දයාව තුලින් උන්වහන්සේ අපගේ ප්‍රශ්න සහ අභියෝගවලට උපකාර කරනසේක.

4. යොහාන් 3:16 කටපාඩම් කිරීමට ළමුන්ට උපකාර කරන්න.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කර සහ මිදුම්කරුවාණන් බවට ඔබගේ සාක්ෂිය දරන්න. පාපය සහ මරණය පරාජය කොට නැවත වරක් උන්වහන්සේලා සමඟ ජීවත්වීමට මාර්ගය සැලැස්වූ බැවින් යේසුස්වහන්සේට සහ ස්වර්ගික පියාණන්ට ඔබගේ ප්‍රේමය සහ කෘතඥතාවය පළ කරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් මතෙව් 26:36–46 සහ දහම සහ ගිවිසුම 19:16–18 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පාවාදීම, අල්ලාගැනීම සහ නඩු විභාගය

31

වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔහුගේ හෝ ඇයගේ සාක්ෂිය වික්‍රමාන්විත කිරීමේ එක් එක් ළමයාගේ වගකීම ශක්තිමත් කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 26:14–16, 47–27:31 සහ ලූක් 22:47–23:25 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණය කරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. ළමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. පහත සඳහන් වචන සහ වාක්‍ය කණ්ඩ කාඩ් පත්වල වෙන වෙනම ලියන්න: *දෙවියන්වහන්සේගේ පුත්‍රයා, ගැලවුම්කරුවාණන්, දිව්‍යමය, සම්පූර්ණ, සියල්ලෙන් බලවත්, ප්‍රේමවන්ත, මැවුම්කරුවාණන්, ගුරුවරයා, සුවකරන්නා, කෙළගැසුවේය, පාවාදීම, බොරු චෝදනා කළහ, තැලුවේය, (ගැසීම), පහරදුන්හ, කසපහර දුන්නේය, (කසයෙන් තැලූහ) බැඳ දැමුවේය, සමච්චල් කළහ, කටු ඔටුන්නක් දැමූහ, මරණයට වරදකරු කළහ.*
4. අවශ්‍ය උපකරණ:
   - අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   - ආ. ටේප් හෝ කාඩ්පත් පෙන්වීමේ යම් ක්‍රමයක්.
   - ඇ. 7-31 පින්තූරය, යේසුස්වහන්සේගේ පාවාදීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 228; 62468), සහ 7-32, පේතෘස්ගේ ප්‍රතික්ෂේප කිරීම (සුබාරංචි චිත්‍ර පින්තූර මෙවලම 229; 62177).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ඔබ සූදානම්කළ කාඩ්පත් මිශ්‍ර කොට, මුහුණත පහතට සිටින සේ මේසයක් මත හෝ බිම තබන්න. මෙම කාඩ්පත් සමහරක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විස්තරකරන අතර, උන්වහන්සේගේ ජීවිත කාලයේ අවසානය ලඟාවූ විට, උන්වහන්සේට කළ දේවල් අනෙක් ඒවා විස්තරකරන බව ළමුන්ට පහදා දෙන්න. වාර අනුව කාඩ්පත් තෝරාගැනීමට ළමුන්ට සලස්වා, ඒවා කියවා, ගොඩවල් දෙකෙන් එකකට දැමීමට සලස්වන්න. යේසුස්වහන්සේව විස්තරකරන වචන පළවෙනි ගොඩට ඔවුන් දැමිය යුතු අතර, උන්වහන්සේගේ ජීවිතයේ අවසානය ලඟාවන බව කියන වචන අනෙක් ගොඩට දැමිය යුතු බව කියන්න.

ගෙත්සමෙනි උයනේ සිදුවූ සිද්ධීන් කෙටියෙන් නැවත බලා, යේසුස්වහන්සේ ගෙත්සෙමනෙහි යාච්ඤාව අවසන් කළ විගසම සිදුවූ සිද්ධීන් ගැන මෙම පාඩමෙන් ළමයින් ඉගෙන ගන්නා බව ඔවුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

යේසුස්වහන්සේගේ පාවාදීම, අල්ලාගැනීම සහ නඩු විභාගය ගැන විස්තරය ළමුන්ට උගන්වන්න (මතෙව් 26:14–16, 47–27:31 සහ ලූක් 22:47–23:25). (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) යේසුස්වහන්සේට කළ දේවල් විස්තරකරන වචනවලට සවන්දීමට ළමුන්ට කියන්න. මෙම චෝදනාවලින් ආරක්ෂාවීමට යේසුස්වහන්සේට බලය තිබූ නමුත් වන්දිගෙවීම සම්පූර්ණකර පොළොවේ උන්වහන්සේගේ දූතමෙහෙය ඉටුකිරීම පිණිස, වදවේදනා දරාගැනීම එහි කොටසක් බව උන්වහන්සේ දැනසිටිය බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න (බලන්න මෝසායා 15:5).

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස්වහන්සේව පාවාදුන්නේ කවුද? (මතෙව් 26:14–16.) යූදස් උන්වහන්සේව පාවාදුන්නේ කෙසේද? (මතෙව් 26:48.) යූදස්ට කුමක් සිදුවුනේද? (මතෙව් 27:3–5.)
- යේසුස්වහන්සේව ආරක්ෂාකිරීමට පැමිණි ප්‍රේරිතවරුන්ව උන්වහන්සේ නැවැත්වූයේ කුමක් නිසාද? (මතෙව 26:51–54.); ලූක් 22:49–51.) තුවාලවූ මිනිසාගේ කණ යේසුස්වහන්සේ සුව කළ විට, ගෝලයන් ඉගෙනගත් පාඩම ඔබ සිතන අන්දමට කුමක්ද? ප්‍රේරිතයන් ඉවතට දුවගොස් යේසුස්වහන්සේව අත්හැරියේ කුමක් නිසාදැයි ඔබ සිතන්නේද? (මතෙව් 26;56.) ඔබ එතැන සිටියානම් ඔබ කුමක් කරන්නේයයි ඔබ සිතන්නේද?
- යේසුස්වහන්සේගේ නඩුවිභාගයේදී තම විරුද්ධකාරයන්ට උන්වහන්සේ පිළිතුරු නුදුන්නේ කුමක් නිසාද? (මතෙව් 26:62–63; 27:12–14; ලූක් 23:9.) (සාරවත් ක්‍රියාකාරකම 3 බලන්න.) එතුමා දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ ක්‍රිස්තුස්ද, නැතහොත් යුදෙව්වරුන්ගේ රජ්ජුදැයි එතුමාගෙන් ඇසූවිට, එතුමා පිළිතුරු දූන් බව පහදා දෙන්න (බලන්න මතෙව් 26:63–64; 27:11). උන්වහන්සේගේ අනන්‍යතාවය ප්‍රතික්ෂේප නොකළ අතර, නැතහොත් ගැලවීමට යේසුස්වහන්සේ උත්සාහ නොකළ බව පෙන්වා දෙන්න. පොළොවේ උන්වහන්සේගේ දූතමෙහෙය සම්පූර්ණකිරීම පිණිස උන්වහන්සේව කුරුසියේ අණගැසිය යුතු බව යේසුස්වහන්සේ දැනසිටිසේක.
- යේසුස්වහන්සේට ජනතාව කළ දේ සඳහන් යොමුවීමේ ක්‍රියාකාරීත්වයේ වචන ලැයිස්තුවේ විස්තරයට නැවත යොමුවන්න. මෙම වචන ඔබ කියවන විට, ඔබට හිතෙන්නේ කුමක්ද? යේසුස්වහන්සේට ජනතාව කළ භයානක දේවල් ගැන ඔබට හැඟෙන්නේ කෙසේද? ඔබ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසකරන බැවින් හෝ ඔබ සභාවට යන නිසා යම් අවස්ථාවක යමෙකු ඔබට අකරුණාවන්ත වූයේද? ඔබ කළේ කුමක්ද?
- යේසුස්වහන්සේව දැනසිටීම ගැන පේතෘස් කී වතාවක් ප්‍රතික්ෂේප කළේද? (ලූක් 22:54–60.) පේතෘස් මෙය කළේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? ඔහු එය කළේ යැයි අවබෝධකර ගත් විට, ඔහුට හැඟුනේ කෙසේද? (ලූක් 22:61–62.) ඒ වන විට පේතෘස් ශුද්ධාත්මයාණන්ගේ දීමනාව නොලැබ සිටිය බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවන්න. පසුව සභාවේ සභාපතිවරයාවූ පේතෘස් ශ්‍රේෂ්ඨ මිනිසෙකුවූ අතර, තම සාක්ෂිය වෙනුවෙන් ජීවිතය දූන් කෙනෙකි. අප මුහුණදෙන කුමන අභියෝගයක් වුවත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අපගේ සාක්ෂිය නොසැලෙන ශක්තිමත් එකක් කරගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (සාරවත්කිරීමේ 5වෙනි ක්‍රියාකාරීත්වය බලන්න.)

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. ඔවුන් විශේෂයෙන්ම අගයකරන යේසුස්වහන්සේගේ යහපත්කම් හෝ ගුණාංගයන් නම්කිරීමට එක් එක් ළමයාට කියන්න.
2. ඇදහීමේ කරුණුවල පළමුවැන්න සහ තුන්වැන්න නැවත බලන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය බව සහ එතුමාගේ දූතමෙහෙයේ වැදගත්කම ගැන ඇදහිල්ලේ මෙම කරුණු අපට සිහිපත්කරන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න.
3. පහත සඳහන් වචන සළකුණු මත තබන්න. කයාපස්, *පිලාත්, සහ හෙරෝද්.* මෙම සළකුණු ළමුන් තුන්දෙනෙකුට දී, මෙම එක් එක් පාලකයාට රටෙහි වගකීම් වෙන් වශයෙන් තිබුන බව පහදාදෙන්න. කාමරයේ ස්ථාන තුනක පාලකයන්ට සිටගැනීමට සලස්වා, ළමයි තුන්දෙනා පහත සඳහන් කථා කියවන විට, පංතියේ අනෙක් අයට ඔවුන්ව බැහැදැකීමට සලස්වන්න. එසේ නැතිනම් ළමයි තුන්දෙනාට ඔවුන්ගේ කොටස් කියවීම සඳහා පංතිය ඉදිරියේ සිටගැනීමට සලස්වන්න:

   *කයාපස්:* මගේ නම කයාපස්ය, මා යුදෙව්වරුන්ගේ උත්තම පූජකයාය. එනම් යුදෙව්වරුන්ගේ ආගමික නායකයා මමය, යේසුස්ව මරණයට පත්කිරීමට මට අවශ්‍යවූ නමුත්, රෝම නායකයාගේ අනුමැතිය ගැනීම මට අවශ්‍යවූ බැවින්, මම ඔව පිලාත් වෙතට යැව්වෙමි.

   *පිලාත්:* මගේ නම පොන්තියස් පිලාත්ය, මා රෝම අණ්ඩුකාරයාය, එනම් යුදාහි දේශපාලක නායකයා මාය. මා විසින් යේසුස්ව මරණයට පත්කිරීම යුදෙව්වරුන්ට අවශ්‍යවූ නමුත්, ඔහු ගැන කිසිම වරදක් සොයාගැනීමට මට නොහැකිවිය. මම ඔහුව හෙරෝද් වෙත යැව්වෙමි.

*හෙරෝද්:* මගේ නම හෙරෝද්ය. මා යුදෙව්වරයෙක් වන අතර, රෝමවරු මා ගලීලය මත රජකමට පත්කළහ. යේසුස් වැඩුන පළාතේ රජු මා බැවින්, පිලාත් යේසුස්ව මා වෙතට එව්වේය. යේසුස් නම්වූ මේ මනුෂ්‍යයා දැකීමට මම බොහෝ උනන්දුවෙන් සිටියෙමි. ඔහු ගැන මා අසා ඇති අතර, හාස්කමක් ඔහු සිදුකරනවා දැකීමට මට අවශ්‍යව තිබූ නමුත්, මා සමග කථාකිරීම හෝ මගේ ප්‍රශ්නවලට පිළිතුරුදීම හෝ ඔහු ප්‍රතික්ෂේප කළේය. මම ඔහුව පිළාත් වෙතට ආපසු යැව්වෙමි.

*පිලාත්:* මෙම මනුෂ්‍යයා මරණයට පත්කිරීමට තවමත් මට කරුණක් සොයාගැනීමට නොහැකිව නමුත්, ජනතාව එයට බලකරති. අවසානයේදී යේසුස් ගැන වරදක් සොයාගැනීමට මට නොහැකිවූ බව ජනතාවට කීමේ උත්සාහයෙන් පලක් නොමැති නිසා, ඔහු රැගෙන ගොස් කුරුසියේ ඇණගැසීමට මම ජනතාවට ඉඩහැරියෙමි.

ළමයින් තුන්දෙනා ඔවුන්ගේ ආසනවලට නැවත ගියාට පසු, මෙම එක් එක් මිනිසා ලඟට ගොස් ඔවුන් විසින් ප්‍රශ්නකිරීමට භාජනයවීම නිසා, යේසුස්වහන්සේට කුමක් හැඟෙන්ට ඇත්දැයි සාකච්ඡා කරන්න.

4. ළමයින්ට මුහුණදීමට අපහසුවිය හැකි පහත සඳහන් අවස්ථාවන් වැනි සමහරක් කොළ කෑලිවල ලියන්න. (ඔබගේ පංතියට සුදුසු අවස්ථාවන් භාවිතාකරන්න.)

   සභාවට යාම නිසා යමෙකු ඔබට සිනහසෙයි.

   මත්ද්‍රව්‍ය ටිකක් ගැනීමට හෝ දුම්වැටියක් බීමට ඔබට කීමට යමෙක් උත්සාහගනියි.

   ඔබගේ පාසලේ ළමයෙක් වෙනත් ළමයෙකුට අවමන්කරනු ඔබ දකියි.

   සාමාජිකයන් නොවන ඔබගේ මිතුරෝ ඔබගේ විශ්වාසයන් ගැන පැහැදිළිකිරීමට ඔබට කියති.

   ඔබගේ පාසලේ ළමයෙක් ඔහු හෝ ඇයව ප්‍රශ්නයකින් ගලවාගැනීමට බොරුවක් කීමට ඔබට කියයි.

   කඩදාසි කෑල්ලක් තෝරා එය කියවීමට වාර අනුව ළමුන්ට සලස්වන්න. හැම අවස්ථාවක්ම සාකච්ඡා කොට කළ යුතු හරි දෙය කුමක්ද කියා තීරණයකිරීමට පංතියට ඉඩදෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අපගේ සාක්ෂියෙහි ස්ථිර සිටීමට ඇතැම් අවස්ථාවලදී අපහසු වුවත්, එසේ කිරීමෙන් අපට මහඟු ආශිර්වාද ලැබෙන බව අවධාරනය කරන්න.

5. යේසුස්වහන්සේව විස්තරකරන කාඩ් පතක් හෝ දෙකක් එක් එක් ළමයාට දෙන්න (යේසුස්වහන්සේව විස්තර-කරන වෙනත් වචන හෝ වාක්‍ය කණ්ඩ ඔබට භාවිතාකිරීමට හැකිය). ඔවුන්ගේ කාඩ්පත්වල වචන ඔවුන් කියවූ විට ඔවුන්ට සිතුන දේවල් ගැන ඔබට කීමට ළමයින්ට කියන්න. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවද, ගැලවුම්කරුවාණන් බවද, මිදුම්කරුවාණන් බවද ඔවුන් ඇත්තවශයෙන්ම දන්නවාද යන්න ඔවුන්ගේ මනසින් තීරණයකිරීමට ඔවුන්ට කියන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන මෙම දැනීම සහ සාක්ෂිය මගින් ඔවුන් ආශිර්වාද ලැබූ අන්දම විස්තර කිරීමට ළමුන්ට ආරාධනා කරන්න.

---

**අවසානය**

| | |
|---|---|
| සාක්ෂිය | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය භාවය ගැන ඔබගේ සාක්ෂිය දරමින් මෙම සාක්ෂිය ඔබට කෙතරම් වැදගත්ද යන්න ළමුන් සමග බෙදාගන්න. අපට මලවුන්ගෙන් නැවත නැගිට සදාකාල ජීවනය ලබාගැනීම පිණිස වධවේදනා විඳ මරණයට පත්වීමට යේසුස්වහන්සේ තුල තිබූ කැමැත්ත ගැන ඔබගේ කෘතඥතාවය පළකරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන්, මතෙව් 26:47–54 අධ්‍යයනයකිරීමට ළමුන්ට සලස්වන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. |

# 32
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේව කුරුසියේ ඇණගැසීම සහ භූමදානය

**අරමුණ**

යේසුස්වහන්සේ අප උදෙසා මරණයට පත්වූ බැවින්, අප නැවත ජීවත්වන බවට එක් ළමයාගේ සාක්ෂිය ශක්තිමත්-කිරීමය

**සූදානම්වීම**

1. මතෙව් 27:32–66, ලූක් 23:26–56, සහ යොහාන් 10:17–18, 19:13–42 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම් සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. vii.)
2. අමතර කියවීම්, මාර්ක් 15:20–47.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. මෝර්මන්ගේ පොතේ පිටපතක්.
   ඇ. පින්තූර 7-33, කුරුසියේ ඇණගැසීම (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 230; 62505); සහ 7–34, යේසුස්වහන්සේගේ භූමදානය (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 231; 62180); සහ 7-35, යේසුස්වහන්සේගේ සොහොන් ගෙය (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 232; 62111).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පහත සඳහන් කථාන්තරය ළමුන් සමග බෙදාගන්න:

ශීත ඍතුවේ, ශීතල දිනයක වොෂින්ටන් ඩීසී හි පාලමක හැපී, අයිස් මිදුනු පොටෝමැක් ගඟට අහස් යාත්‍රාවක් කඩා වැටින. බොහෝ පුද්ගලයන් මරණයට පත්වූ නමුත්, අහස් යානයෙහි වලිගයෙහි එල්ලී සිටි මිනිසුන් හයදෙනෙ-කුට හෙලිකොප්ටරයක සිටි අය විසින් ජීවිත ආරාක්ෂක උපකරණයක් වීසිකරන ලදී. ජලය ඉතා ශීතලවූ අතර, අහස්යාත්‍රාවේ එල්ලී සිටීම ඉතා අසීරුවිය. ජීවිත ආරක්ෂය අල්ලාගෙන, ආරක්ෂිතව ගැලවී යාමට තම වාරය පැමි-ණීමට පෙර, ඔවුන්ව මරණයට පත්වෙයැයි මේ මිනිස්සු බියට පත්වූහ.

ආරක්ෂකයන් ජීවිත ආරක්ෂක උපකරණය පහත් කරන සෑම අවස්ථාවකම එක් පුද්ගලයෙක් එය තවත් අයෙකුට යොමු කළේ, එම පුද්ගලයා පළමුවෙන් බේරීයාම පිණිසය. අනෙක් සියලු දෙනාම බේරාගන්නා තෙක් ඔහු එය කළ අතර, ඔහුට තව දුරටත් අල්ලාගෙන සිටීමට නොහැකිවිය. ඔහු ගෙනයාමට හෙලිකොප්ටරය පැමිණෙන විට, ඔහු ලිස්සා වතුරට වැටුනි. කිසිවෙකු ඔහු බේරාගැනීමට පෙර ඔහු මියගියේ ය.

- මෙම පුද්ගලයා ජීවිත ආරක්ෂකය වෙනත් කෙනෙකුට යොමුකරමින් සිටියේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? මෙම පුද්ගලයා බේරාගත් එක් අයෙකු ඔබ වී නම්, ඔබට කෙසේ හැඟෙන්නේද?

මෙම පුද්ගලයා කළ පරිදි, අන්‍යයන් වෙනුවෙන් ඔබගේ ජීවිතය දීමට අවශ්‍ය ධෛර්යයය සහ ප්‍රේමය ගැන ඔබගේ අදහස් ප්‍රකාශකරන්න.

කුරුසිය මත යේසුස්වහන්සේගේ වේදනාව සහ වධවිදීම ගැන මෙම පාඩමෙන් ඔවුන් ඉගෙනගන්නා බව ළමුන්ට පහදා දෙන්න. උන්වගන්සේගේ අපට ඇති මහත් ප්‍රේමය නිසා, ජීවත්වූද, ජීවත්වන්නාවූද සෑම පුද්ගලයෙකු උදෙසාම උන්වහන්සේ කැමැත්තෙන්ම සිය ජීවිතය දුන් නිසා ඔවුහු නැවත ජීවත්වන්නෝය.

**කෙටි නිරීක්ෂනය**

ආදම් උයනේදී තහනම් ගෙඩිය අනුභව කළ බැවින්, ආදම් සහ ඒව ඔවුන්ටම සහ ඔවුන්ගෙන් පැවත එන්නන්ව පත් කළ තත්වය ගැන ළමුන්ට මතක් කරන්න. ආදම් සහ ඒව වරදට වැටීම නිසා, ඔවුන්ගේ ශරීර මැරෙන සුළු බවට

පත්විය. ඔවුන්ගේ ජීවිත යම්දිනෙක මරණයට පත්වන බව මෙහි අදහසවේ. ආදම් සහ ඒවගෙන් පැමිණෙන බැවින් අපද ඔවුන් මෙන් මරණයට ගොදුරු වන්නෙමු.

භෞතික මරණය ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුමෙහි කොටසක් බවත්, ස්වර්ගික පියාණන්වහන්සේගේ මහත්වූ දයාව නිසා මරණය ජයගැනීම පිණිස උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්වූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එතුමා එවූ බවට සාක්ෂි දරන්න. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම කරණකොටගෙන, අප සියලු-දනාම භෞතික මරණයෙන් ගලවනු ලැබුවේය. අප මරණයට පත්වන නමුත්, අපි මරණයෙන් නැවත නැගිටින්නෙමු (බලන්න යොහාන් 3:16–17; හීලමන් 14:15).

කලින් පාඩමේ එන යේසුස්වහන්සේගේ වධවිඳීම, පාවාදීම, සිරකරනු ලැබීම සහ නඩුවිභාගය කෙටියෙන් නිරීක්-ෂණය කරන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

මතෙව් 27:32–66. සඳහන්, යේසුස්වහන්සේ කුරුසියෙහි ඇණගැසීම සහ භූමදානය ගැන විස්තරය ළමුන්ට කියවන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම,” පි. 00 vii.) ලූක් 23:34, 39–43 සහ යොහාන් 19:19–22, 25–27, 34, 39 ද බලන්න. සුදුසු අවස්ථාවලදී පින්තූර පාවිච්චිකරන්න.

මෙම පාඩමේ කරුණු ඉගැන්වීමට ඔබට උපකාරවනු පිණිස පහත සඳහන් ලැයිස්තුවට යොමුවීමට ඔබට අවශ්‍යවනු ඇත.

1. කිරේනියේ සීමොන් යේසුස්වහන්සේගේ කරුසිය ඔසවාගෙන ගියේය (මතෙව් 27:32).
2. සොරුන් දෙදෙනෙකු අතර කුරුසිය මත යේසුස්වහන්සේව එල්ලන ලදී (මතෙව් 27:33–38; ලූක් 23:32–33).
3. පිලාත් නාම පත්‍රයක්ද ලියා කුරුසිය මත්තෙහි තැබීය (යොහාන් 19:19–22).
4. යෙසුස්වහන්සේට නින්දාකරන ලදී (මතෙව් 27:39–44).
5. යේසුස්වහන්සේ සොරා සමග කථාකළසේක (ලූක් 23:39–43).
6. තම මෑණියන්ව රැකබලා ගැනීමට යේසුස්වහන්සේ යොහාන්ට කීසේක (යොහාන් 19:25–27).
7. දේශය මුළුල්ලෙහි අන්ධකාරයක් විය (මතෙව් 27:45–46).
8. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මරණයට පත්වූසේක (මතෙව් 27:50–56). රෝම හේවායෝ උන්වහන්සේගේ ඇලයට ඇන්නෝය (යොහාන් 19:34).
9. යේසුස්වහන්සේගේ ශරීරය සොහොන් ගෙයක තබන ලදී (මතෙව් 27:57–61; යොහාන් 19:38–42).
10. සොහොන් ගෙය ආරක්ෂාකිරීමට රැකවලුන් යවන ලදී (මතෙව් 27:62–66).

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කර විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනු ඇත.

- යේසුස්වහන්සේගේ නඩු විභාගයෙන් පසුව, පිලාත් කුමක් කළේද? (මතෙව් 27:26.) *කසපහර* යනු කුමක්ද? (කසයෙන් තැලීමය.) *කුරුසිපත්කිරීම* යනු කුමක්ද? (අත් සහ පය කුරුසියට තබා ඇණගැසීම හෝ බැඳ දමා මරණයට පත්කිරීමය.) කුරුසිපත්කිරීම යනු සාමාන්‍යයෙන් වහලුන්ට සහ ඉතාම තීව අපරාධකරුවන්ට වෙන්කර ඇති සෙමෙන් සහ වේදනා සහිත මරණයක් බව පහදාදෙන්න.
- යේසුස්වහන්සේව කුරුසියේ ඇණගැසූ ස්ථානය හඳුන්වන නම් දෙක කුමක්ද? (මතෙව් 27:33; ලූක් 23:33.)
- යේසුස්වහන්සේව ඇණගැසුවේ කවුරුන් සමගද? (මතෙව් 27:38; ලූක් 23:33.)
- හේවායන් යේසුස්වහන්සේට බොන්ට දුන්නේ කුමක්ද? (27:34.) විනාකිරි සහ තිත්ත අරළු ඉව මැරීමට හෝ වේදනාව අඩුකිරීමට උපකාරවන බෙහෙතක් බව පහදා දෙන්න. වන්දි ගෙවීමේ වැඩකොටස නිමකරන තෙක් පූර්ණ සිහියෙන් සිටීමට උන්වහන්සේට අවශ්‍යවූ බැවින් එම මිශ්‍රනය බීම යේසුස්වහන්සේ ප්‍රතික්ෂේපකළ බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාර කරන්න.

- කවුරු වෙනුවෙන් කමාවීමට යේසුස්වහන්සේ ස්වර්ගික පියාණන්ට කීසේද්ද? (ලූක් 23:34, යේසුස්වහන්සේව කුරුසියේ ඇණ ගැසූ හේවායින්ට ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ එම පදය යොමුවෙයි.) යේසුස්වහන්සේ හේවායින්ට කමාවීදීම ඔබ සිතන අන්දමට වැදගත්වන්නේ කුමක් නිසාද? අප කමාවිදීමේ වැදගත්කම කුමක්ද? අන්‍යයන්ට කමාව දුන් විට, අපට ආශිර්වාද ලැබෙන්නේ කෙසේද?
- යේසුස්වහන්සේව කුරුසිය මත එල්ලූ විට, උන්වහන්සේට කවටකම් කරමින් (අපහාස කළ) සමහර අය කවුද? (මතෙව් 27:39–44.) ඔවුන් උන්වහන්සේට කී සමහර දේවල් මොනවාද? යේසුස්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (1 නිෆායි 19:9.) නින්දා සහගත දේවල් පුද්ගලයන් අපට කී විට, අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද?
- සොරුන් දෙදෙනා යේසුස්වහන්සේට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (ලූක් 23:39–43.) පසුතැවීම පටන්ගැනීම පෙන්වීමට දෙවෙනි සොරා කුමක් කීවේද? (ලූක් 23:40–42.) යේසුස් වහන්සේගේ පිළිතුර වූයේ කුමක්ද? (ලූක් 23:43.)
- කුරුසියේ වධවේදනා විඳින අතර, යේසුස්වහන්සේ උන්වහන්සේගේ මවට ප්‍රේමය දැක්වූයේ කෙසේද? (යොහාන් 19:25–27.) යේසුස්වහන්සේ ගැන මෙට අපට උගන්වන්නේ කුමක්ද?
- කොපමණ කාලයක් දේශය අන්ධකාරයෙන් වැසී තිබුනේද? (මතෙව් 27:45.) යේසුස්වහන්සේ මොරගසා කීවේ කුමකද? (මතෙව් 27:46.) දෙවියන්වහන්සේ ඇත්තවශයෙන්ම උන්වහන්සේගේ පුත්‍රයා අත්හැරියේද? යේසුස්වහන්සේ උන්වහන්සේ විසින්ම පාපය සහ මරණය ජයගැනීම නිමකිරීමට හැකිවන පරිදි ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය මොහොතකට ඉවතට ගත් බව පහදා දෙන්න.
- “යේසුස්වහන්සේ ආත්මය හළසේක” යන්නෙහි අර්ථය කුමකද? (මරණයට පත්වීමට යේසුස්වහන්සේට තිබූන එකම මාර්ගය නම්, එතුමාගේ ශරීරයෙන් ආත්මය හැරයාමට ඉඩදීමය. උන්වහන්සේගේ කැමැත්තෙන්ම ජීවිතය දුන් බව ශුද්ධ ලියවිලි සනාථ කරයි; එය එතුමාගෙන් නොගන්නා ලදී.) යොහාන් 10:17–18 කියවීමට ලමුන්ට සලස්වන්න. යේසුස්වහන්සේ තම ජීවිතය දීමට කැමැතිවූනේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?
- යේසුස්වහන්සේ මරණයට පත්වන අවස්ථාවේ සිදුවූ හාස්කම් සිද්ධීන් මොනවාද? (මතෙව් 27:51–53.) “දෙකඩව ඉරුනේය” යන්නෙහි අදහස කුමක්ද? (බාගෙට ඉරුනේය.) සියයකට මූලාදෑනියා (රෝම හේවා කණ්ඩායමේ නිලධාරියෙක්) මෙම සිදුවීම දුටු විට කුමන සාක්ෂියක් පිරිනැමූවේද? (මතෙව් 27:54.)
- අරිමාතියේ යොසෙප් නම් කවුද? (මතෙව් 27:57.) ඔහු කුමක් කළේද? (මතෙව් 27:58–60.)
- පිලාත්ට කරන්ට කියා ඵරිසිවරු කීවේ කුමක්ද? (මතෙව් 27:62–66.) සොහොන් ගෙය ආරක්ෂාකිරීමට ඔවුන්ට අවශ්‍යවූයේ මන්ද? ඔවුන්ගේ උත්සාහයෙන් වෙනසක් නොවූයේ කුමක් නිසාද? මිනිසුන්ගේ බලය සහ ස්වාමීන්වහන්සේගේ බලය ගැන මෙයින් අපට උගන්වන්නේ කුමක්ද?

සාරාංශ සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ආදම් සහ ඒවා පාපයට වැටීමද, ගැලවුම්කරුවෙකුගේ අවශ්‍යතාවයද යන දෙක අතර සම්බන්ධය ලමුන්ට තේරුම් ගැනීමට උපකාරවන පිණිස පහත සඳහන් ප්‍රශ්න ඔබට භාවිතාකිරීමට හැකිවේ.

- ආදම් සහ ඒවා ආදම් උයනේදී ස්වර්ගික පියාණන්වහන්සේගේ එක් පණතක් කඩකළේ කෙසේද? (යහපත සහ නපුර දැනගැනීමේ ගසෙන් ගෙඩියක් ඔවුහු කෑහ.) මෙම පණත කැඩීමෙන් ඇතිවූ ප්‍රතිඵලය කුමක්ද? (උයනෙන් පිටවීමට ඔවුන්ට සිදුවිය. ඔවුන් මැරෙන සුලු බවට පත්වී දරුවන් ලැබීමේ හැකියාව ලැබිනි. ඔවුන් සහ ඔවුන්ගෙන් පැවතෙන සියලු දෙනාම මරණයට ගොදුරු විය. මෙය ස්වර්ගික පියාණන්ගේ සැලසුමේ කොටසක් විය.)
- අප මැරුනු විට අපගේ ශරීරවලට සහ ආත්මවලට කුමක් වන්නේද? (ආත්මය ශරීරයෙන් වෙන්වී ආත්ම ලොවට යයි; ශරීරය, ආත්මයක් නොමැති නිසා අප්‍රානික වන බැවින් සාමාන්‍යයෙන් පොළොවෙහි වළලනු ලැබේ.) අපගේ ශරීර සහ ආත්ම නැවත සම්බන්ධකිරීමට අපට කුමක් කළ හැකිද? (කිසිවක් නැත; මක්නිසාද අප මැරෙන සුලු බැවින්ය. අපගේ ශරීර සහ ආත්ම නැවත සම්බන්ධකිරීමට අපට සතුව බලයක් නැත.)
- මෙම අයහපත් තත්වය ජයගැනීම පිණිස අපට මග සැලැස්වූයේ කවුද? අපව ගලවාගැනීමට හැකි එකම එක තැනැත්තා යේසුස්වහන්සේ වූයේ කෙසේද? (එතුමා පාපයෙන් තොරය; ස්වර්ගික පියාණන්වහන්සේගේ මාංශ-යෙහි ඒක ජාතක පුත්‍රයාණන් වන බැවින්, මරණය ජයගැනීමට බලය තිබුනේය.) ඔබට සහ ඔබගේ පවුලට මලවුන්ගෙන් නැවත නැගිටීමට උපකාරකිරීමට යමෙකු සිටින බව දැනගැනීමෙන් ඔබට හැඟෙන්නේ කෙසේද?

**සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. සිතියමක හෝ රටහුණු ලෑල්ලේ පහත සඳහන් ශුද්ධ ලියවිලි ලැයිස්තුගත කරන්න. කුරුසියේ එල්ලී සිටින විට, යේසුස්වහන්සේගේ වාර්තාගත ප්‍රකාශනයක් එක් එක් ශුද්ධ ලියවිල්ලක අඩංගුවන බව ළමුන්ට කියන්න. ළමුන් ලවා මෙම ප්‍රකාශන කියවා යේසුස්වහන්සේට මෙම දේවල් කීමට හෝ කිරීමට උපකාරවූ බලය හෝ චරිත ගුණාංග මොනවාද කියා කීමට කියන්න.

   ලූක් 23:34 (එතුමා දයාවන්තය, කමාව දෙන සුළුය.)
   ලූක් 23:43 (ඉදිරියට වෙන දේවල් කීමට එතුමාට බලය තිබුනේය.)
   යොහාන් 19:26–27 (තම මවට ප්‍රේමය හා සැලකීම එතුමාට තිබින.)
   මතෙව් 27:46 (මතෙව් 27:46 (තම පියාණන් කෙරෙහි විශ්වාසය එතුමා ප්‍රකාශ කළසේක.)
   ලූක් 23:46 (ස්වර්ගික පියාණන්ගේ කැමැත්තට එතුමා යටත්වූසේක.
   යොහාන් 19:30 (ස්වර්ගික පියාණන්වහන්සේගේ කැමැත්ත උන්වහන්සේ සම්පූර්ණ කළසේක.)

2. යේසුස්වහන්සේගේ මරණය සහ භූමදානය ගැන විස්තරයේ සඳහන්වන මෙම පුද්ගලයන් කණ්ඩායම් ගැන රටහුණු ලෑල්ලේ ලැයිස්තුගතකරන්න. එක් එක් පුද්ගලයෙකු හෝ කණ්ඩායම් ගැන ඔවුන්ට මතක දේවල් මොනවාද කියා ළමුන්ගෙන් අසන්න. එක් එක්කෙනා ගත් කොටස් හඳුනාගැනීමට ළමුන්ට උපකාරවන්න.

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ
   පිලාත්
   කිරේනියේ සීමොන්
   හේවායින්
   කවටකම් කරන්නන්
   සොරුන් දෙදෙනා
   මරියා, යේසුස්වහන්සේගේ මව
   ප්‍රේමවන්ත යොහාන්
   සියයකට මූලාදෑනියා
   අරිමාතියේ යොසෙප්

3. ඇඳහිල්ලේ දෙවෙනි කරුණ සාකාච්ඡාකොට කටපාඩම්කිරීමට ළමුන්ට උපකාරවන්න.

**අවසානය**

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වෙමින්, අප වෙනුවෙන් කළ ශ්‍රේෂ්ඨ පූජාවට ඔබගේ කෘතඥතාවය ප්‍රකාශ කරන්න. උන්වහන්සේ අපට ඇති ශ්‍රේෂ්ඨ ප්‍රේමය නිසා අප මළවුන්ගෙන් නැවත නැගිට නැවත ජීවත්වන බවට සාක්ෂිදරන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් මතෙව් 27:34–50 අධ්‍යයනයකිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 33
වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බැවින් අප සියලුදෙනාම මළවුන්ගෙන් නැගිටින බව එක් එක් ළමයාට තේරුම්ගැනීමට උපකාරවීමය.

**සූදානම්වීම**

1. මතෙව් 27:52–53; 28:1–15; ලූක් 24; යොහාන් 20; ක්‍රියා 1:3, 9–11; සහ 1 කොරොන්ති 15:5–6, 22 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: මාර්ක් 16.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා
   ආ. පහත සඳහන් එක් වචනයක් හෝ වාක්‍ය කණ්ඩයක් ලියන ලද කඩදාසි කැලි: *භණ්ඩරෙදි, සුවඳ ද්‍රව්‍ය, උයන, භේවායින්, පර්වතය.*
   ඇ. 7-35 පින්තූර, යේසුස්වහන්සේගේ සොහොන්ගෙය (62111); 7-36, මරියා සහ මළවුන්ගෙන් නැගිටි ස්වාමීන්වහන්සේ (ශුභාරංචි චිත්‍ර මෙවලම 233; 62186); සහ 7-37, මළවුන්ගෙන් නැගිටි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (ශුභාරංචි චිත්‍ර මෙවලම 239; 62187).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

"සූදානම්වීම" කොටසේ ලැයිස්තුගතකර තිබෙන කඩදාසි කැලි භාජනයකට දමා, වාර අනුව කඩදාසි කැලි තෝරාගැනීමට ළමුන්ට සලස්වන්න. ලැයිස්තුගතකර තිබෙන දෙය විස්තර කිරීමට ඔවුන්ට කියා එම වචනය හෝ වාක්‍ය කණ්ඩය යේසුස්වහන්සේගේ භූමදානයට සම්බන්ධවන අන්දම ඔබට කීමට ඔවුන්ට හැකිදැයි ඔවුන්ගෙන් අසන්න. එක් එක් ළමයෙකුට වාරයක් ලබාගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් තරම් වචන හෝ වාක්‍ය කණ්ඩ භාවිතාකරන්න.

යේසුස්වහන්සේ කුරුසියේ ඇණ ගසා, භූමදාන කළාට පසු ඉරුදින උදෑසන යයි සිතින් සිතාගැනීමට ළමයින්ට කියන්න. යේසුස්වහන්සේගේ මරණය නිසා දුක්වන, ගෝලයන් සමග ඔවුන් සිටින බව සිතාගැනීමට ඔවුන්ට සලස්වන්න. රෝම පාලනයෙන් යේසුස්වහන්සේ ඔවුන්ව බේරාගෙන උන්වහන්සේගේ රාජ්‍යය බලයෙන් සහ මහිමයෙන් පොළොවෙහි පිහිටුවනවා ඇතැයි ඔවුහු බලාපොරොත්තුවූහ.නමුත් දැන් එතුමා මරණයට පත්වී ඇත. එම ඉරුදින උදෑසන යෙරුසලමේ සිදුවූ දෙය ඔබ සාකච්ඡාකිරීමට යන බව ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

මතෙව් 27:52–53, 28:1–15, ලූක් 24, සහ යොහාන් 20 සඳහන් පරිදි සුදුසු අවස්ථාවලදී පින්තූර භාවිතාකරමින්, යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමේ විස්තරය ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00vඩීඩී.) උන්වහන්සේ මළාට පසුව නැවත එතුමා ජීවත්වන බව ගෝලයන්ට කිහිප වතාවක්ම යේසුස්වහන්සේ කී නමුත්, එතුමාගේ අනුගාමිකයන්ට එහි අදහස ඇත්තවශයෙන්ම තේරුම්ගැනීමට නොහැකිවිය. මෙයට පෙර කිසිදිනෙක කිසිවෙකු මළවුන්ගෙන් නොනැගිටි නිසා, යේසුස්වහන්සේ නැවත ජීවත්වන්නේ කෙසේද කියා ඔවුහු තේරුම් නොගත්තෝය. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බව දේවදූතයන් කියනවා ගෝලයන්ට ඇසුනත්, නැවත නැගිටි ස්වාමීන්වහන්සේ ඔවුන් දුටුවත්, සිදුවූ දෙය ඔවුන්ට අවබෝධකර ගැනීමට තවමත් අපහසු විය.

සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධවූ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ඉරුදින උදැසන මග්දලාවේ මරියා සහ අනිකුත් ස්ත්‍රීන් සොහොන් ගෙය වෙත පැමිණියේ කුමක් නිසාද? (මාර්ක් 16:1.) සොහොන් ගෙය වෙත ස්ත්‍රීන් ගිය විට, ඔවුන් දුටුවේ කවුද? (ලූක් 24:4.) දේවදූතයන් ස්ත්‍රීන්ට කීවේ කුමක්ද? (ලූක් 24:5–6.) මළවුන්ගෙන් නැවත නැගිටීම යන්නෙහි අර්ථය කුමක්ද? (නැවත කිසි දිනෙක වෙන් නොවන පරිදි ආත්ම ශරීරය, මාංශ ඇටවලින් යුත් ශරීරයක් සමග නැවත සම්බන්ධවීමය.)
- හිස්වූ සොහොන ස්ත්‍රීන් දුටුවිට ඔවුන් කළේ කුමක්ද? (ලූක් 24:8–12.) දේවදූතයන් ස්ත්‍රීන්ට කියන ලද විස්තරය, ගෝලයන් විශ්වාස නොකළේ මන්ද? (ලූක් 24:11; යොහාන් 20:9.) මෙම ප්‍රවෘත්තිය ඇසූ එක් ගෝලයෙකු ඔබ වූවා නම් ඔබ කුමක් සිතනවාදැයි ඔබ සිතන්නේද?
- පේතෘස් සහ අනෙක් ගෝලයා සොහොන් ගෙට ගිය විට ඔවුන් සොයා ගත්තේ කුමක්ද? (යොහාන් 20:3–7.) "අනෙක් ගෝලයා" සමහර විට යොහාන් විය හැකි හැකි බව පහදා දෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව ඔවුන් විශ්වාස කළේ කුමක් නිසාද? (යොහාන් 20:8.)
- යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව දේවදූතයන් මරියාට කී පසුවත් ඇය තවමත් දුක්වූයේ කුමක් නිසාද? (යොහාන් 20:11–13.) යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව මරියාට දැනගැනීම පිණිස සිදුවූයේ කුමක්ද? (යොහාන් 20:14–16.) උන්වහන්සේව අත නොගැසීමට යේසුස්වහන්සේ ඇයට කීවේ කුමක් නිසාද? (යොහාන් 20:17.)
- යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි දිනයේ, තවත් මළවුන්ගෙන් නැගිටිවනු ලැබුවේ කවුද? (මතෙව් 27:52–53.) ඔබගේ පවුලේ මළවුන්ගෙන් නැගිටින්නේ කවුද? මළවුන්ගෙන් නැගිටින වෙනත් අය කවුද? (1 කොරොන්ති 15:22.)
- හිස්වූ සොහොන ගැන පහදා දීමට උත්තම පූජකයන් නිර්මානය කළ කථාව කුමක්ද? (මතෙව් 28:11–15.) ඔවුන් දේවදූතයන් දුටුව නමුත්, මෙම කථාව කීමට භේවායින් කැමතිවූනේ කුමක් නිසාද? (මතෙව් 28:12, 15.)
- යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි දිනයේ ගෝලයන් එම්මාවුස් නම් ගමකට යද්දී, ඔවුන් සමග ගමන් කළේ කවුද? (ලූක් 24:13–16.) ඔවුන් ගමන්කරන අතර මිනිසුන් තුන්දෙනා කථා කළේ කුමක් ගැනද? (ලූක් 24:17–27.) යේසුස්වහන්සේ සමග ඔවුන් කථාකරන විට, මෙම ගෝලයන්ගේ හදවත් තුළ ඇතිවූ හැඟීම් මොනවාද? (ලූක් 24:32.) ඔවුන්ගේ හදවත් දැවීමට හේතුවූයේ මොනවාද? (ශුද්ධාත්මයාණන්වහන්සේ.) ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයන්ට ආත්මයාණන්වහන්සේගේ පෙළඹවීම් ලැබුනේ කෙසේද?
- උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි දින හවස් යාමේ යේසුස්වහන්සේ කුමක් කළේද? (ලූක් 24:36–48.) යේසුස්වහන්සේ ඔවුන්ට ප්‍රකාශවන විට, ගෝලයන් දොර වසා තිබුනේ කුමක් නිසාද? (යොහාන් 20:19.) ගෝලයන් යේසුස්වහන්සේව දුටු විට, ඔවුන් ප්‍රතික්‍රියා කළේ කෙසේද? (ලූක් 24:37.) උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව උන්වහන්සේගේ ගෝලයන්ට ඔප්පුකිරීමට යේසුස්වහන්සේ කළේ කුමක්ද? මළවුන්ගෙන් නැගිටි ශරීරයක් ගැන ගෝලයන් ඉගෙනගත්තේ කුමක්ද? (ලූක් 24:39–43.)
- යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව තෝමස් විශ්වාස නොකළේ මන්ද? (යොහාන් 20:24–25.) තෝමස් යේසුස්වහන්සේව දුටුවේ කොපමණ කලකට පසුද? (යොහාන් 20:26) යේසුස් වහන්සේ තෝමස්ට ප්‍රකාශවූ විට, උන්වහන්සේ ඔහුට කීවේ කුමක්ද? (යොහාන් 20:29.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම නිසා ඔබගේ සාක්ෂිය ශක්තිමත්වන්නේ කෙසේද?
- උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටාට පසු, යේසුස්වහන්සේ ප්‍රකාශවූයේ තවත් කාහටද? (මතෙව් 28:9; 1 කොරොන්ති 15:6.) (යේසුස්වහන්සේ මලවුන්ගෙන් නැගිට ප්‍රකාශවූ සියල්ල නැවත බැලීමට සාරවත්කිරීමේ පළවෙනි ක්‍රියාකාරකම ඔබට භාවිතාකිරීමට හැකිය.)
- උන්වහන්සේ නැවත නැගිට්ටාට පසු, තම ගෝලයන් සමග යේසුස්වහන්සේ කොපමන කාලයක් සිටිය සේක්ද? (ක්‍රියා 1:3.)

- යේසුස්වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබුවේ කෙසේද? (ක්‍රියා 1:9–11.) සිදුවූ දෙය ජනතාවට පහදා දීමය පැමිණියේ කවුද? යේසුස්වහන්සෙ-ගේ දෙවෙනි ඊ්ම ගැන මෙම විස්තරය අපට උගන්වන්නේ කුමක්ද?

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ ඊ්ට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. එක් එක් ළමයෙකුට පහත සඳහන් ඉඟියක්දී, ඔහුට හෝ ඇයට එය පංතියට කියවීමට සලස්වන්න. එක් එක් ඉඟියකට පිළිතුරු අනුමාන වශයෙන් කීමට පංතියේ සාමජිකයන්ට සලස්වහන්න. ඔවුන් පිළිතුරු නොදන්නේ නම්, ප්‍රශ්න අසන ළමයාට සටහන් දීමට සලස්වන්න. එවිට ශුද්ධ ලියවිලි වලින් පිළිතුරු සොයාගැනීමට ළමයින්ට හැකිවේ.

   උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටාට පසු, යේසුස්වහන්සේව ප්‍රකාශවූ පළමු තැනැත්තා මමය. මා කවුද? (මග්දලායේ මරියා. යොහාන් 20:1, 16.)

   යේසුස්වහන්සේ අපට ප්‍රකාශවූසේක. අපි උන්වහන්සේගේ පාද ඇල්ලුවෙමු. අප කවුද? (අනික් ස්ත්‍රීන්. මතෙව් 28:5–9.)

   හිස්වූ සොහොනට ඇතුල්වූ ප්‍රථම ප්‍රේරිතවරයා මමය. මා කවුද? (පේතෘස්. යොහාන් 20:6)

   පේතෘස් සමග හිස්වූ සොහොනට දිවූ ප්‍රේරිතයා මමය. මා දුටු විට, යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට ඇති බව මම විශ්වාස කළෙමි. මා කවුද? (යොහාන්. යොහාන් 20:8.)

   මමත්, මාගේ මිතුරාත් එම්මාවුස් නම් ගමකට යද්දී යේසුස්වහන්සේ සමග අපි ගමන්කළ නමුත්, උන්වහන්සේව හඳුනාගැනීමට නොහැකිවිය. මා කවුද? (කෙලයෝපස්. ලූක් 24:18.)

   දොරවල් වසන ලද කාමරයක අප එක්රැස්ව සිටියදී යේසුස්වහන්සේ අපට ප්‍රකාශවූසේක. අප කවුද? (ගෝලයින්. යොහාන් 20:19.)

   යේසුස්වහන්සේ පළමුවෙන්ම ඔවුන්ට ප්‍රකාශවන විට, මම අනිත් ප්‍රේරිතයන් සමග නොසිටියෙමි. මගේම ඇස්වලින් එතුමා දැක, අත් සහ පාදවල ඇණ සළකුණු දකින තෙක් යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව මම විශ්වාස නොකළෙමි. මා කවුද? (තෝමස්. යොහාන් 20:24.)

   දේවදූතයන් දොර වෙතින් පර්වතය පෙරළන විට, අපි එහි සිටියෙමු. අප දුටු දෙය ගැන බොරු කීමට උත්තම පූජකවරු අපට බොහෝ මිළ දුන්හ. අප කවුද? (රෝම භේවායෝ. මතෙව් 28:12.)

2. යේසුස්වහන්සේ මරණයට පත්වූ දින, ගෝලන්ට ඇතිවූ හැඟීම් ගැන කියන වචන ලියන්න—වේදනාව, දුක, මනස්තාපය, අධෛර්‍යය යනාදිය—හුණුලැල්ලේ තීරුවක ලියන්න. එම වචනවල විරුද්ධාර්ථ වචන යෝජනාකිරීමට ළමුන්ට සලස්වන්න. ප්‍රීතිය, සතුට, බලාපොරොත්තුව, ඇදහීම යනාදිය—වෙනත් තීරුවක ලියන්න. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව අවබෝධකරගත් විට, සමගරවිට මෙම හැඟීම් ගෝලයන්ට ඇතිවූ බව පහදාදෙන්න. අප එක් එක්කෙනාට මළවුන්ගෙන් නැගිටීමේ බලාපොරොත්තුවේ අර්ථය කුමක්ද කියා සාකච්ඡා කරන්න.

3. ප්‍රාථමික සභාපතිත්වයේ අනුමැතිය ඇතිව, ආදරවන්තයෙකුව මරණයට පත්වූ, සබාවේ සාමාජිකයෙකුව යාච්ඤාවෙන් තෝරා, ඔහුට හෝ ඇයට මළවුන්ගෙන් නැගිටීමේ අර්ථය කුමක්දැයි ළමුන් සමග බෙදාගැනීමට ආරාධනා කරන්න.

## අවසානය

**සාක්ෂිය**

ගැලවුම්කරුවාණන් මළවුන්ගෙන් නැගිටීම සහ එහි වැදගත්කම ගැන ඔබගේ හැඟීම් ප්‍රකාශකරන්න. උයනෙ-දී යේසුස්වහන්සෙ-ගේ වධ වේදනා, උන්වහන්සේගේ මරණය සහ උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම යන්න, පොළොවේ සිදුවූ ඉතාමත් වැදගත් දෙය බවට සාක්ෂි දරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් ලූක් 24 අධ්‍යයනයකිරීමට ළමුන්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# මාගේ බැටළුවන් පෝෂණය කරපන්න

34

වෙනි පාඩම

**අරමුණ**

අනාගතයන්ට සුභාරංචිය තේරුම්ගෙන ඒ අනුව ජීවත්වීමට උපකාර කිරීමෙන් යේසුස්වහන්සේට ප්‍රේමය දැක්වීම ගැන ළමුන්ට ඉගෙනගැනීම පිණිස උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. යොහාන් 21:1–17 සහ මාර්ක් 16:15 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි ළමුන්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්-කිරීම," පි. (00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. (00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. ඔබගේ පංතියට බැඳී සිටින එක් එක් ළමයෙකු සඳහා බැටළුවෙකුගේ පින්තූරයක් කපන්න. (පාඩම අවසානයේ ඇති නිදර්ශනය බලන්න), සෑම ළමයෙකුගේම නම කපාගත් පින්තූරයේ ලියන්න. (නැතහොත් ළමයින්ගේ නම් වෙන වෙනම කඩදාසිවල ලියන්න.) කපාගත් පින්තූර පංතිය වටේ දැමීමට පෙර, ළමුන්ට ඒවා බලාගැනීමට හැකිවේ.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් සහ අළුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. පින්තූර 7-38, යෙ-සුස්වහන්සේ සහ මසුන් මරන්නන් (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 210; 62138).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

කාමරය වටා බලා එහි ඇති වෙනසක් ගැන ඔබට කීමට ළමුන්ට කියන්න. ඔවුන් දකින බැටළුවන් විසිරී ඇති බවද, ඔහුගේ හෝ ඇයගේ නම ඇති බැටළුවා සොයාගන ඔබ ලඟට ගෙන ඒමෙන්, බැටළුවන් එක් රැස්කිරීමට එක් එක් ළමයාට උපකාර කිරීමට හැකි බව ඔවුන්ට කියන්න. කපන ලද බැටළුවන්ගේ පින්තූර ඉතිරිවී ඇති නම්, එම වෙනත් බැටළුවන් ගැන පසුව පාඩමේදී ඔබ සඳහන් කරන බව පහදා දෙන්න.

රඟදැක්වීමට ඔබ සමග සහභාගිවීමට එක් ළමයෙකුට ආරාධනා කරන්න. ඔහුගේ හෝ ඇයගේ සම්පූර්ණ නමින් ළමයාට කථාකරමින් අසන්න, "(නම), අපගේ ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඔබ ප්‍රේම කරනවාද?" පිළිතුර දුන්නාට පසු මෙසේ කියන්න," උන්වහන්සේගේ බැටළුවන් පෝෂණයකරන්න." ළමයාගේ නම සහ මෙම ප්‍රශ්නය තවත් දෙවතාවක් කියමින්, එක් එක් පිළිතුරකට පසු මෙසේ කියන්න," උන්වහන්සේගේ බැටළුවන් පෝෂණයකරන්න" එකම ප්‍රශ්නය ඔබ අසන විට ඔහුට හෝ ඇයට කෙසේ හැඟුනේදැයි ළමයාගෙන් අසන්න. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි පසු, පේතෘස්ට යේසුස්වහන්සේ සමග එක එයට සමාන අත්දැකීමක් තිබුන බව පහදා දෙන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

යොහාන් 21:1–17 තිබේරියස් (හෝ ගලීලයේ) මුහුද ලඟදී උන්වහන්සේගේ ගෝලයන්ට යේසුස් වහන්සේ ප්‍රකාශවීම ගැන විස්තරය ළමුන්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි-වලින් ඉගැන්වීම," පි. (00 vii.) සුදුසු අවස්ථාවලදී පින්තූරය භාවිතාකරන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- පේතෘස් සහ අනෙක් ගෝලයෝ තිබේරියස් මුහුද ලඟ කුමක් කරමින් සිටියෝද? (යොහාන් 21:3.) කිසිම මාළුවෙක් අල්ලාගැනීමට ඔවුන්ට නොහැකිව සිටින විට, ප්‍රේරිතයන්ට කිරීමට යේසුස්වහන්සේ කුමක් කීසේද? (යොහාන්

21:5–6.) දැල මසුන්ගෙන් පිරී තිබෙන විට, එතුමා යේසුස්වහන්සේ බව යොහාන් අවබෝධකරගත්තේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (යොහාන් 21:6–7.) පේතෘස් කුමක් කළේද? (යොහාන් 21:7.) පේතෘස් මෙය කළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (එතුමා යේසුස්වහන්සේ යයි ඔහු දැනගත් විට, එතුමා වෙතට ළඟාවීම පිණිස ඔහුට ඉවසිල්ලක් නැතිවිය.)

- යේසුස්වහන්සේ පේතෘස්ගෙන් ඇසූ ප්‍රශ්නය කුමක්ද? 21:15.) යේසුස්වහන්සේ මෙම ප්‍රශ්නය පේතෘස්ගෙන් තුන් වතාවක්ම ඇසුවේ කුමක් නිසාද? එම ප්‍රශ්නයම තුන් වතාවක් යේසුස් වහන්සේ පේතෘස්ගෙන් ඇසූවිට පේතෘස්ට හැඟුනේ කුමක්ද? (යොහාන් 21:17.) යේසුස්වහන්සේ මැරී මළවුන්ගෙන් නැගිට ඇති බැවින් පේතෘස්ට තිබූ වගකීම් මොනවාද?

- මාගේ බැටළුවන් පෝෂණය කරපන්න" යයි යේසුස්වහන්සේ කී විට උන්වහන්සේ අදහස් කළේ කුමක්ද? උන්වහන්සේගේ බැටළුවන් කවුද? (ස්වර්ගික පියාණන්වහන්සේගේ සියලුම දරුවන්ය.) උන්වහන්සේගේ බැටළුවන්ට කැවීමට යේසුස්වහන්සේට අවශ්‍යවූයේ මොනවාද? (සුභාරංචියේ සත්‍යයන්ය.) උන්වහන්සේගේ ප්‍රේරිතයන්ට කිරීමට යේසුස්වහන්සේ කීවේ මොනවාද? (මාර්ක් 16:15.)

සුභාරංචිය දේශනාකිරීමට තම ප්‍රේරිතයන්ට යේසුස්වහන්සේ අණකළ අතර, නැවත මසුන් ඇල්ලීමට නොගොස් මෙම වැඩකටයුතු නොකඩවා පවත්වාගෙන යෑමට උන්වහන්සේට අවශ්‍යවූ බව මෙම සාකච්ඡාවෙන් පෙන්වාදෙන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. දැන් සභාවේ සභාපති පේතෘස් වන අතර, සභාවට මග පෙන්වමින්, සියලුම උත්සාහයෙන් යේසුස්වහන්සේගේ සුභාරංචිය පැතිරවීම මෙහෙයවීමට ඔහුගේ වගකීම වෙයි.

- යේසුස්වහන්සේගේ බැටළුවන් පෝෂණයකරන එඬේරුන් අද අපට සිටිනවාද? ඔවුන් කවුද? (සාරවත්කිරීමේ 2වෙනි ක්‍රියාකාරකම බලන්න.)

කපන ලද බැටළුවන්ගේ පින්තූර තවමත් කාමරය අවට ඇති නම්, ඒවා එකතුකොට ඉදිරියට ගෙන ඒමට එක් ළමයෙකුට සලස්වන්න. කපන ලද බැටළුවන්ගේ සඳහන් නම් ඇති සමහර ළමයින්ට සුභාරංචියෙන් පෝෂණයකිරීම පිණිස උපකාරවීම සඳහා එඬේරුන් අවශ්‍යවී ඇති බව පහදා දෙන්න.

- යේසුස්වහන්සේගේ බැටළුවන්ව පෝෂණයකිරීම පිණිස අපට එඬේරුන් වීමට හැකිවන්නේ කෙසේද? (යහපත් ආදර්ශ තැබීමෙන්, සාමාන්‍යයෙන් පංතියට නොපැමිණෙන අයව බැහැදැක පාසලේදී ඔවුන් සමග මිතුරුවීම, සුභාරංචිය සහ සභාව වෙනුවෙන් නැගී සිටීම, අවශ්‍යතා ඇති අයට සේවයකිරීම යනාදියවේ.) සුභාරංචි මූලධර්ම වඩා හොඳට තේරුම්ගැනීමට පවුල් සාමජිකයන්ය සහ මිතුරන්ට උපකාරකිරීමට අපට හැකිවන්නේ කෙසේද? අන්‍යයන්ට උපකාර කිරීමෙන් යේසුස්වහන්සේට අපගේ ප්‍රේමය පෙන්වන්නේ කුමක් නිසාද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් ලෙස ඔබට භාවිතාකිරීමට හැකිය.

1. විශාල සිතියමක උඩ කොටසේ *මගේ බැටළුවන් පෝෂණය කරපන්න,* කියා ලියන්න. (නැතිනම් හුණුලෑල්ල පාවිච්චිකරන්න.) උන්වහන්සේගේ බැටළුවන්ව පෝෂණයකිරීම මගින් යේසුස්වහන්සේට ඔවුන්ගේ ප්‍රේමය පෙන්වීමේ ක්‍රම ළමයින් සමග සාකච්ඡා කරන්න. ඔවුන්ගේ යෝජනා සිතියමේ හෝ හුණුලෑල්ලේ ලියන්න. අවශ්‍ය නම් පහත සඳහන් යෝජනා භාවිතාකරන්න:

   සභාවට පැමිණීමෙන්, සදාචාරාත්මක වචන භාවිතාකිරීමෙන්, පණත් වලට කීකරුවීමෙන්, අවංක කමින්, යාච්ඤාවෙන්, ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීමෙන්, ඔබ ඉගෙනගන්නා දෙය අනුව ජීවත්වීමෙන්ද, දෙමාපියන්ට සහ රටේ නීතියට කීකරුවීමෙන් යහපත් ආදර්ශයක්වන්න.

   සාමාජිකයන්ට සහ සාමාජික නොවන අයට සාක්ෂිය දරන්න.

   අන්‍යයන් පරීක්ෂාවට ගොදුරුවූ විට, හරි දෙය තෝරාගැනීමට ඔවුන්ට උපකාරකරන්න.

   සුභාරංචිය නොදන්නා ජනතාවට එය ගැන කථාකරන්න.

   යාච්ඤාවෙන් සහ ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීමෙන් ස්වාමීන්වහන්සේට ළංවීමට වර්ධනයවන්න.

එක් එක් ලමයාට කඩදාසියක් සහ පැන්සලයක් දී මෙසේ ලිවීමට කියන්න, "______________________ මගින් මම යහපත් එඬේරෙකු වන්නෙමි." යහපත් එඬේරෙකු වීමට ඔවුන් සැලසුම්කරන ආකාරය ලියා, මෙම වාක්‍ය සම්පූර්ණකිරීමට ලමයින්ට කියන්න.

2. සමහර සභා කැඳවීම් වන සභා නායකයා, ගුරුවරයා, ස්ටේක් සභාපති, නිවාස ගුරුවරයා, ධර්මදූතයා, අනාගතවක්තෘවරයා, ප්‍රේරිතවරයා, ප්‍රාථමික සභාපතිවරයා, යනාදිය හුණුලැල්ලේ ලැයිස්තුගත කරන්න. එක් එක් ලමයෙකුට එක් කැඳවීමක් තෝරාගැනීමට කියා, ගැලවුම්කරුවාණන්ගේ බැටළුවන් පෝෂණයකිරීම පිණිස එම පුද්ගලයා උපකාරකරන අන්දම ගැන කියන්න. ගුරුවරුන්, මිතුරන් හෝ පවුලේ සාමාජිකයන් සුභාරංචිය ගැන වැඩියෙන් ඉගෙනගැනීමට උපකාරවූ අත්දැකීම් බෙදාගැනීමට ලමයින්ට කියන්න. ඔබට ඇතිවූ අත්දැකීමක් බෙදාගැනීමට ඔබට හැකිවේ.

3. සභාවේ අනෙක් සාමාජිකයන් ශක්තිමත්කිරීමට ලමයින්ට උපකාරවිය හැකි පහත සඳහන් හෝ ඒ හා සමාන අවස්ථාවන් කඩදාසි කැලිවල ලියන්න. එක් කඩදාසි කැල්ලක් තෝරාගෙන නිශ්ශබ්දව කියවා අවස්ථාව රඟදැක්වීමට ලමයෙකුට කියන්න. එම අවස්ථාව කුමක්දැයි අනුමාන වශයෙන් ලමයින්ට කීමට සලස්වා, එවැනි අවස්ථාවකදී යේසුස්වහන්සේගේ බැටළුවන් ඔවුන් පෝෂණයකරන අන්දම ගැන සාකච්ඡා කරන්න. එක් එක් ලමයෙකුට වාරයක් දෙන්න.

   ඔබගේ පංතියේ සමහර ලමයි පාඩම වෙලාවේදී අනෙක් ලමයින්ට බාධා කරති.

   ඔබගේ සමහර මිතුරන්ට නරක චිත්‍රපටයක් බැලීමට අවශ්‍යව ඇත.

   වෙළඳ සලකින් මිළ නොගෙවා පැණිරස කෑමක් ගැනීමට ඔබගේ මිතුරෙක් ඔබට බලකරයි.

   ඔබගේ කණ්ඩායමේ අයෙකුට අනෙක් අයට බියර් බීමට හෝ වෙනත් ආකාරයකින් ප්‍රඥාවේ වචනය කඩකිරීමට අවශ්‍යව ඇත.

4. ඔහුගේ හෝ ඇයගේ මිත්‍රයෙකුව ඔබ සිටින විට සුභාරංචිය තුල වැඩීමට හෝ එය හොඳින් දැනගැනීම පිණිස උපකාරකිරීමට එය හොඳ අවස්ථාවක් බව පහදා දෙන්න. මිතුරෙකු තුල ලමයින් කැමති කුමන දේවල්ද, එම ගුණාංග වැඩිදියුණුකර ගැනීමට ඔවුන්ට හැකිවන්නේ කෙසේද යනාදිය ගැන කථාකරන්න.

   සුපරීක්ෂාකාරීව සිතීමෙන් සහ සූදානමින්, ඔබ අගයකරන ඔවුන් තුල තිබෙන සමහර ගුණාංග කෙටි සටහනකින් ලමයෙකුට කියන්න. ඔවුන්ගේ මිතුරෙකු වීමට ඔබ කැමති කරුණු පෙන්වා දෙන්න.

5. පහත සඳහන් ශුද්ධ ලියවිලි අද අපට අදාළවන අන්දම ගැන පහදා දීමට ලමයින්ට සලස්වන්න:

   මතෙව් 24:14
   මතෙව් 28:19–20
   ඉගැන්වීම සහ ගිවිසුම 4:1–4
   ඉගැන්වීම සහ ගිවිසුම 15:6
   ඉගැන්වීම සහ ගිවිසුම 31:3–5

---

## අවසානය


**සාක්ෂිය**

අන්‍යයන්ට සුභාරංචිය ගැන ඉගෙනගැනීමට සහ යේසුස්වහන්සේට ලංවෙමින් වර්ධනයවීම පිණිස උපකාරකිරීම සභාවේ සාමාජිකයන් වශයෙන් අප එකිනෙකාට වගකීමක් තිබෙන බවට සාක්ෂි දරන්න. ඔවුන් සමග සුභාරංචිය බෙදාගැනීමට ඇති හැකියාව ගැන ඔබගේ හැඟීම් ලමයින් සමග බෙදාගන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයකිරීමක් වශයෙන් යොහාන් 21:1–17 කියවීමට ලමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.



මගේ බැටළුවන් පෝෂණය කරපන්න

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය

# 35
වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය ගැන තේරුම්ගැනීම පිණිස ළමයින්ට උපකාරවීමය

ගුරුවරයාට සටහනක්: යේසුස්වහන්සේගේ මැරෙන සුළු ජීවිතයෙන් පෙර, මැරෙන සුළු ජීවිතය, මැරෙන සුළු ජීවිතයට පසු ජීවිතය ගැන මෙම පාඩම විශ්ලේෂනයකි. යේසුස්වහන්සේගේ දූතමෙහෙය වඩාත් සම්පූර්ණව ළමයින්ට තේරුම්ගැනීමට උපකාරවීම මෙයින් අදහස්කරනු ලැබේ. පාඩම විශ්ලේෂනයක් බැවින් ප්‍රශ්න සන්කීර්න වන්නේය. ඔබ මේවා සාකච්ඡාකරන විට, වඩාත් විශේෂිත හෝ විස්තර සහිත වෙනවාට වඩා ගැලවුම්කරුවාණන්ගේ මෙහෙයේ එක් එක් කොටසක විශේෂිතවූ දේවල් කෙරෙහි යොමුවීම ඉතාම හොඳ විය හැකිය.

**සූදානම්වීම**

1. මෝසෙස් 1:33, 39; 4:2; ලූක් 24:27; යොහාන් 3:16; 15:9–13; 1 කොරොන්ති 10:4; මොසායා 13:33; 3 නිෆායි 11:7–10; ඊතර් 3:14; ඉගැන්වීම සහ ගිවිසුම 138:30; සහ ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. (00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. (00 vii.)
2. අමතර කියවීම්: සුභාරංචි මූලධර්ම 3, 11 සහ 43 පරිච්ඡේද.
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා
   ආ. වචන තීරු, (පහත සඳහන් සිතියම බලන්න).
   ඇ. 7-1 පින්තූරය, යේසුස් නම් ක්‍රිස්තුස් (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 240; 62572).

සටහන: පහත සඳහන් සිතියමට සමාන එකක් පාඩම වෙලාවේදී ඔබට සම්පූර්ණකළ හැකිය. (නැතහොත් කරුණු හුණුලෑල්ලේ ලිවීමට ඔබට හැකිය). "යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය" යන්න පෙන්වන්න. ඉන්පසු ප්‍රධාන ශීර්ෂ තුන මාතාකාව යටින් තබන්න. යේසුස්වහන්සේගේ දූතමෙහෙයේ කරුණු ඔබ සාකච්ඡාකරන විට, සුදුසු ශීර්ෂයට වචන තීරුවක් තැබීමට ළමයෙකුට සලස්වන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය

| ක්‍රිස්තුස්වහන්සේගේ මැරෙන සුළු ජීවිතයට පෙර | ක්‍රිස්තුස්වහන්සේගේ මැරෙන සුළු ජීවිතය | මරණින් පසු ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය |
|---|---|---|
| අපගේ ගැලවුම්කරුවාණන් වීමට ස්වේච්ඡාවෙන් කැමතිවූසේක | ශුභාරංචිය ඉගැන්වූසේක | ආත්ම ලෝකය බැහැදුටුවූසේක |
| පොළොව මැවූසේක | රෝගීන් සුව කළසේක | මළවුන්ගෙන් නැගිටිසේක |
| පරණ ගිවිසුමේ යෙහෝවා වහන්සේය | උන්වහන්සේගේ සභාව සංවිධානය කළසේක | නිෆායිට්වරුන් බැහැදුටුවූසේක |
| අනාගතවක්තෘවරුන්ට එළිදරව් දුන්සේක | අපගේ පාවලට වන්දිගෙවූසේක | අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මාර්ගයෙන් උන්වහන්සේගේ සභාව අප වෙනුවෙන් සංවිධානය කළසේක |
| | අප වෙනුවෙන් මරණයට පත්වූසේක | සභාවේ වර්තමාන නායකයන්ට එළිදරව් දෙනසේක |
| | | අපට ප්‍රේමකරමින් උපකාරකරනසේක |
| | | නැවත පැමිණෙනසේක |

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ඔවුන් කවුද කියා විස්තරකරන හැකි තරම් බොහෝ වචන නම්කිරීමට ළමුන්ට සලස්වන්න. එනම්, පුත්‍රයා, දුව, මුණුබුරා, ශිෂ්‍යයා, සොකර් ක්‍රීඩකයා යනාදිය. හුණුලැල්ලේ මේවා ලැයිස්තුගත කරන්න. හුණුලැල්ලේ වෙනත් තීරුවක (නැතහොත් වචන තීරු භාවිතාකරන්න). යේසුස්වහන්සේට අදාළ නම් භාවිතාකරන්න. ළමුන්ට නුපුරුදු වචනවලින් පටන්ගන්න, එනම්, ආදර්ශකයා, විනිශ්චයකාරයා, පර්වතය, මැදිහත්කාරයා, යනාදී වශයෙනි. ඉන්පසු ඔවුන් වැඩි වශයෙන් දන්නා නම් වන, ගැලවුම්කරුවා, මිදුම්කරුවා, මැවුම්කරුවා යනාදී වශයෙනි. මෙම වචන යොමුවන්නේ කාටද කියා ඔවුන් දන්නා විට ඔවුන්ගේ අත් එසවීමට ළමුන්ට සලස්වන්න.

ශුද්ධ ලියවිලි විස්තර

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පින්තූරය පෙන්වන්න. උන්වහන්සේ පොලොවේ සිටියදී පමණක් නොව උන්වහන්සේගේ උපතට පෙරද, උන්වහන්සේගේ මරණය සහ මළවුන්ගෙන් නැගිටීමට පසුවද, යේසුස්වහන්සේ බොහෝ පුදුමාකාර දේවල් අප වෙනුවෙන් කර ඇති බව පහදා දෙන්න. අප වෙනුවෙන් ස්වර්ගීය පියාණන්වහන්සේගේ ගැලවීමේ සැලසුම සම්පූර්ණකිරීම පිණිස යේසුස්වහන්සේ මෙම දේවල් කළ බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. එයට අප ගැලවීමේ සැලසුම යයි කියනු ලැබේ. මක්නිසාද ස්වර්ගීගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමග නැවත සදාකාලය ජීවත්වීමට අපට යෑමට හැකිවන්නේ එය කරණකොට ගෙන සහ යේසුස්වහන්සේගේ උපකාරය මගින්ය. (බලන්න මොසෙස් 1:39). යොහාන් 3:16 ශබ්දනගා ළමයින්ට කියවීමට සලස්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම,” පි. (00 vii.)

සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි අධ්‍යයනයකරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද එම මූලධර්ම ඔවුන්ගේ ජීවතෙවලට අදාලකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමුන් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනු ඇත.

- යේසුස්වහන්සේ පොළොවෙහි උපදින්නට පෙර, උන්වහන්සේ කළ සමහර දේවල් මොනවාද?
- අපගේ ගැලවුම්කරුවාණන් වීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වූයේ කවුද? (ඉතර් 3;14; මෝසෙස් 4:2.) අපගේ ගැලවුම්කරුවාණන් වීමට යේසුස්වහන්සේව තේරුවේ කවුද? (යොහාන් 3:16; ආබ්‍රහම් 3:27.)

- පොළොව මැව්වේ කවුද? යේසුස්වහන්සේ පොළොව මැව්වේ කවදාද? (උත්පත්ති 1:1; මෝසෙස් 1:33.)
- යෙහෝවාවහන්සේ, නැතහොත් පරණ ගිවිසුමේ ස්වාමීන්වහන්සේ කවුද? මෝසෙස් සහ ආබ්‍රහම් යන පරණ ගිවිසුමේ අනාගතවක්තෘවරුන්ට එළිදරව් දුන්නේ කවුද? මෝසෙස් සහ අනෙකුත් සියලුම අනාගතවක්තෘවරු සාක්ෂිදැරුවේ කවුරුන් ගැනද? (ලූක් 24:27; මොසායා 13:33.)
- උන්වහන්සේ පොළොවේ සිටිනවිට, යේසුස්වහන්සේ කුමක් කළේද? යේසුස්වහන්සේගේ පොළොවේ මෙහෙය ගැන ඔවුන්ට මතක ඇති බොහෝ දේවල් ලැයිස්තුගත කිරීමට සලස්වන්න. අප වෙනුවෙන් යේසුස්වහන්සේ මෙම දේවල් කළේ කුමක් නිසාද? (යොහාන් 15:9, 11.)
- යේසුස්වහන්සේ මියගිය පසුව එතුමා කළේ කුමක්ද? (1පේතෘස් 3:18–20; ධ්‍ර්‍රසහගී 138:30; උන්වහන්සේ ආත්ම සිරගෙය බැහැදුටුසේක.) යේසුස්වහන්සේ මරණයෙන් නැගිට්ටාට පසු උන්වහන්සේ කළේ කුමක්ද? (3 නිෆායි 11:7–10, 27:8: අමෙරිකාවේ නිෆායිට්වරු බැහැදැක, උනවහන්සේගේ ශරීරය ඔවුනට පෙන්වූසේක; ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17: සත්‍යය නැවත පිහිටුවීමට ජෝසෆ් ස්මිත්ව බැහැදුටුසේක; ධ්‍ර්‍රසහගී 115:4: උන්වහන්සේගේ සභාව අප වෙනුවෙන් සංවිධානය කළසේක.)
- අප එකිනෙකාට යේසුස්වහන්සේ අද උපකාරකරන්නේ කෙසේද? (ආමෝස් 3:7; මතෙව් 28:20.) (සාරවත්කිරීමේ 2වෙනි ක්‍රියාකාරකම බලන්න.)
- අප සියලුදෙනාම බලාගෙන සිටින්නේ කුමන ශ්‍රේෂ්ඨ සිද්ධියක් උදෙසාද? උන්වහන්සේගේ දෙවෙනි ඊම ගැන යේසුස්වහන්සේ එළිදරව්කර තිබෙන්නේ කුමන අනාවැකි සහ පොරොන්දුද? (මතෙව් 24:30–31; ධ්‍ර්‍රසහගී 29:11.)
- අප වෙනුවෙන් උන්වහන්සේ කළ සියලුම දේවලට යේසුස්වහන්සේට අපගේ කෘතඥතාවය පෙන්වීමට අපට හැකිවන්නේ කෙසේද? (යොහාන් 15:10, 12.) යේසුස්වහන්සේට ඔවුන්ගේ කෘතඥතාවය පෙන්වීම සඳහා ඔවුන්ට තැබිය හැකි පනත් ගැන සිතීමට ළමුන්ට උපකාරවන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. යේසුස්වහන්සේට බොහෝ පදවි නාමයන් සහ කාර්‍යභාරයන් තිබුනේය. මෙම පදවි නාමයන් සමහරක් තෝරාගෙන සාකච්ඡාකරන්න.
2. යේසුස්වහන්සේ අපට ප්‍රේමකරන අතර සභාවට අද මගපෙන්වන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. සභාවේ පස්වෙනි සභාපතිවරයා වන සභාපති ලොරෙන්සෝ ස්නෝ, සෝල්ට් ලේක් දේවමාළිගාවේදී යේසුස්වහන්සේව දුටු පහත සඳහන් කථාන්තරය කියන්න:

   එක් සැන්දෑවක සභාපති ස්නෝගේ මිනිපිරියක් සෝල්ට් ලේක් දේවමාළිගාවේදී ඔහුව බැහැදැකීමට පැමිණියාය. ඇය යෑමට සූදානම්වූ විට සභාපති ස්නෝ ඇයව කොරිඩෝව ලඟට ඇය පසුපස ගියේය. ඔහු ක්ෂණයකින් මෙසේ කීවේය, මොහොතක් ඉන්න ඇලී, මට ඔබට කීමට යමක් තිබෙනවා, "සභාපති වුඩ්රෆ් මරණයට පත්වූ අවස්ථාවේ, හරියටම මෙම ස්ථානයේදී යේසුස්වහන්සේ මට ප්‍රකාශවූසේක." ඔහු තවත් පියවරක් ගෙන ඔහුගේ වම් අත දිගුකරමින්, "එතුමා හරියටම මෙම ස්ථානයේ පොළොවෙන් අඩි තුනක් පමණ ඉහළින් සිටගෙන සිටිසේක. ඝන රන් පිඟානක් මත එතුමා සිටගෙන සිටින්නාක් මෙන් පෙණුනි." යයි කීවේය. අනතුරුව ගැලවුම්කරුවාණන්ගේ පෙනීම සහ ලක්ෂණ කඩාය ගැන සභාපති ස්නෝ විස්තර කළේය. (බලන්න LeRoi C. Snow, "An Experience of My Father's," *Improvement Era,* සැප්තැ. 1933, පි. 677.)

3. යේසුස්වහන්සේ උන්වහන්සේගේ මැරෙන සුළු මෙහෙයේදී කළ දේවල් නැවත බැලීමට ඔවුන්ට උපකාරවීම පිණිස පහත සඳහන් හෝ එයට සමාන ශුද්ධ ලියවිලි සෙවීමට ළමුන්ට සලස්වන්න.:

   මතෙව් 5:2 (ශුභාරංචිය ඉගැන්වීය)<br>
   මතෙව් 14:14 (රෝගීන් සුවකිරීම)<br>
   මාර්ක් 3:114 (එතුමාගේ සභාව සංවිධානයකිරීම)<br>
   2 නෆෝයි 2:6–7 (අපගේ පාපවලට වන්දිගෙවා අප වෙනුවෙන් මරණයට පත්වීම)<br>
   මතෙව් 28:6–7 (මළවුන්ගෙන් නැගිටීම)

**අවසානය**

| | |
|---|---|
| සාක්ෂිය | අපට කළ සහ අප වෙනුවෙන් කරගෙන යන බොහෝ දේවල් වලට යේසුස්වහන්සේට ඔබගේ කෘතඥතාවය ගැන සාක්ෂිදරන්න. යේසුස්වහන්සේ පොළොවේ සිටි කාලය ගැන වැඩියෙන් අධ්‍යයනයකිරීමට ඔබට ලැබුනු අවස්ථාට ඔබ කෙතරම් කෘතඥවනවාද කියා ළමයින්ට කියන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම තිරීක්ෂණයකිරීමක් වශයෙන් යොහාන් 15:9–13 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. |

# පෙන්තකෝස්ත දිනය

# 36
වෙනි පාඩම

**අරමුණ** ශුද්ධාත්මයාණන්වහන්සෙගේ දීමනාව සහ ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම් හඳුනාගන්නා අන්දම ගැන තේරුම්ගැනීමට එක් එක් ළමයාට ඉගෙනගැනීම පිණිස උපකාරකිරීමය

**සූදානම**

1. ක්‍රියා 2:1–24, 32–33, 36–47 සහ යොහාන් 14:25–27 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම" පි. (00 vii.)
2. අමතර කියවීම්: ශුභාරංචි මූලධර්ම, පරිච්ඡේද 7 සහ 21.
3. ළමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. හුණුකූරු සහ හුණුලෑල්ලක්
   ඇ. 7-39 පින්තූරය, පෙන්තකෝස්ත දිනය.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

යොමුවීමේ ක්‍රියාකාරකම්

යේසුස්වහන්සේ තම ප්‍රේරිතයන් සමග සිටින විට, බොහෝ දේවල් උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ බව ළමයින්ට උගන්වන්න. ඔවුන් සමග උන්වහන්සේට නිතර සිටීමට නොහැකි උන්වහන්සේ දැනගත් බැවින් ඔවුන්ට උපකාරකිරීම පිණිස විශේෂ දීමනාවක් එවන බවට උන්වහන්සේ පොරොන්දුවූසේක?

පහත සඳහන් ඉඟි ළමයින්ට කියවන්න. දීමනාව කුමක්ද කියා ඔවුන් දන්නා බව සිතන විට, ළමුන්ට නැගිටිනට සලස්වා පිළිතුර ඔබගේ කනට කොඳුරන්ට කියන්න. ශුද්ධාත්මයාණන් නිවැරදිව ඔවුන් හඳුනාගත්තා නම්, ඔවුන්ට සිටගෙන සිටීමට සලස්වන්න.

මම සත්‍යය උගන්වමි.
මම මගපෙන්වන්නෙමි.
මම සැනසීම දෙන්නෙමි.
යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන මම සාක්ෂිදරමි.
සාමාන්‍යයෙන් ඔබගේ මනසට හෝ හදවතට මම කථාකරන්නෙමි.
මම දේව ශීර්ෂයේ සාමාජිකයෙකු වෙමි.
මම ආත්ම පුද්ගලයෙක්මි, නමුත් භෞතික ශරීරයක් නොමැත.

*ශුද්ධාත්මයාණන්වහන්සේ* යන්න හුණුලෑල්ලේ ලියන්න. යොහාන් 14:25–27 ළමයින් සමග කියවන්න. ශුද්ධාත්මයාණන් අපට කරන දේවල් කුමක්ද යනු තේරුම්ගැනීමට ළමුන්ට උපකාරවීම පිණිස ලැයිස්තුගතකරන ලද ඉඟි නැවත බලන්න.

*පෙන්තකෝස්ත* යන්න හුණුලෑල්ලේ ලියන්න. පනහ යන්න අර්ථය ඇති ග්‍රීක වචනයෙන් *පෙන්තකෝස්ත* යන්න පැමිණ ඇති බව පහදාදෙන්න. පෙන්තකෝස්ත යුදෙව්වරුන්ගේ උත්සවයක් වන අතර සෑම වර්ෂයකම පාස්කුවෙන් දවස් පනහකට පසු එය පවත්වනු ලැබේ. අන්තිම රාත්‍රී භෝජනයේදී තම ප්‍රේරිතවරුන්ට යේසුස්වහන්සේ සක්‍රමේන්තුව දුන් අතර, එය සිදුවූනේ පාස්කු මංගල්‍ය කාලයේදීය. උන්වහන්සේගේ ගෝලයන්ට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලැබුනේ අන්තිම රාත්‍රී භෝජනයෙන් දවස් පනහකට පසුවය. *ශුද්ධාත්මයාණන්ගේ දීමනාව* කියා හුණුලෑල්ලේ ලියන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

(ක්‍රියා 2:1–24, 32–33, 36–47) සඳහන් පෙන්තකෝස්ත දිනයේ විස්තරය ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) පෙන්තකෝස්ත දිනයේ පින්තූරය සුදුසු අවස්ථාවේදී පෙන්වන්න.

සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි විස්තර සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි විස්තර ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන් හට පෙන්තකෝස්ත දිනයේදී ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණියේ කෙසේද? (ක්‍රියා 2:1–4.)
- අන්‍ය භාෂාවලින් කථාකිරීමටද, පුද්ගලයන් කථාකළ වෙනත් භාෂා තේරුම්ගැනීමටද ගෝලයන්ට හැකියාව දුන්නේ කුමක්ද? (ක්‍රියා 2:4.) සභාවේ අද ධර්මදූත කටයුතුවලදී ශුද්ධාත්මයාණන්ගේ මෙම ආත්මික දීමනාව උපකාරවන්නේ කෙසේද? (බොහෝ ධර්මදූතයන්ට වෙනත් භාෂාවන් ඉගෙනගැනීමට උපකාරවීම මගින්ය. ධර්මදූතයා භාෂාව හොඳට කථා නොකළත් මුණගැසෙන්නන්ට සුභාරංචි පණිවුඩය තේරුම්ගැනීමට අන්‍යභාෂාවේ දීමනාව උපකාරවේ.)
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේව කුරුසියේ ඇණගසා, මළවුන්ගෙන් නැගිටි බවට පේතෘස් සාක්ෂි දැරූ විට, ජනතාවගේ සිත් තුළට අනින ලද ස්වභාවයක් ඇති කළේ මන්ද? (ක්‍රියා 2:33, 36–37. ශුද්ධාත්මයාණන්වහන්සෙය්.) අනින ලද සිත් ඇතිවීම යන්නෙහි අර්ථය කුමක්ද? (පසුතැවීමේ හෝ ශෝකයේ තියුණු හැඟීම් ඇතිවීම.) අප කරන ලද දේවල්වලට ශෝකයේ හැඟීමක් ඇතිවීම පිණිස ශුද්ධාත්මයාණන් අපට උපකාරකරන්නේ කෙසේද?
- අප කුමක් කළ යුතුදැයි දැනගැනීම පිණිස ශුද්ධාත්මයාණන් අපට උපකාර වන්නේ කෙසේද? සාමයේ හැඟීම් හෝ යම් දෙයක් හරි යයි දැනගැනීම, ශුද්ධ ලියවිලි හෝ වෙනත් විෂයන් ගැන පැහැදිළි අවබෝධයක් ලැබීම, ප්‍රශ්නයක පිළිතුරු ශුද්ධ ලියවිලි මගින් සොයාගැනීම, ඔබට උපකාරවන කථාවක් හෝ පාඩමක් සභාවේදී ඇසීම, යනාදිය මගින් ශුද්ධාත්මයාණන් ඔවුන්ගේ බොහෝ වෙනස්වූ ආකාර මගින් උපකාරකරන බව ජනතාවට හැඟෙන බව ළමයින්ට තේරුම් ගැනීමට උපකාරවන්න. ඔබගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්ගේ හැඟීමක් ඇතිවූ අත්දැකීමක් සුදුසු යයි ඔබට හැඟෙනවා නම් එය බෙදාගැනීමට ඔබට අවශ්‍යවනවා ඇත.
- ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගැනීමට ජනතාව කිරීමට අවශ්‍ය දෙය ගැන පේතෘස් කීවේ කුමක්ද? (ක්‍රියා 2:38.) ශුද්ධාත්මයාන්ගේ දීමනාව ලබාගැනීමට අප කිරීමට අවශ්‍ය දේ කුමක්ද?
- ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ඔබලාගෙන් කී දෙනෙකුට දී ඇත්ද? බව්තීස්මයට පෙර ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම් ඇතිවීමට හැකි බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න; කෙසේවෙතත් අපගේ බව්තීස්මයට පසු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ස්ථිරවූ විට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව අපට ලැබේ. අප ධර්මිෂ්ඨ නම්, ශුද්ධාත්මයාණන් අපගේ නිරන්තර මිතුරෙකු වීමේ අයිතිවාසිකම ශුද්ධාත්මයාණන්ගේ දීමනාව අපට ලබාදෙයි (බලන්න ඕසහගි 121:45–46).
- ආත්ම 3,000ක් බව්තීස්මවූවාට පසු, ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම නොකඩවා ඔවුන්ට ලබාගැනීම පිණිස ඔවුන් කළ සමහර දේවල් මොනවාද? (ක්‍රියා 2:42–47.) (ශුද්ධ ලියවිලිවලින් පිළිතුරු සොයාගැනීමට ළමයින්ට සලස්වා හුණුලැල්ලේ ඒවා ලැයිස්තුගතකිරීමට ඔබට හැකිවේ.)
- ශුද්ධාත්මයාණන්වහන්සේ අප සමග සිටීම පිණිස අප කළ යුතුවන්නේ කුමක්ද? (පසුතැවිලිවී, බව්තීස්මවන්න, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගන්න, ධර්මිෂ්ඨව ජීවත්වන්න. ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම පතා යාච්ඤාකරන්න, නිශ්ශබ්දව යාච්ඤාකරන්න. සවන්දෙන්න, පැමිණෙන පෙළඹවීම් අනුගමනයකරන්න.)

පහත සඳහන් උපුටාගැනීම ළමයින් සමග බෙදාගන්න:

"සැමවිටම උන්වහන්සේගේ ආත්මයෙන් ඔබට ආශිර්වාදකරන පිණිස ස්වර්ගික පියාණන්වහන්සේට යාච්ඤාකරන්න.... ශුද්ධාත්මය ස්ට...ස්වර්ගික පියාණන්වහන්සේගෙන් දීමනාවකි.... හරි දෙය කිරීමට නිශ්චලතාවයේ සියුම් හඬින් එතුමා ඔබට කොඳුරනසේක. ඔබ යහපතක් කළ විට, ඔබට යහපත් හැඟීමක් ඇතිවන්නේය. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කථාකරන්නේ ඒ ආකාරයෙන්ය. ශුද්ධාත්මයාණන් පුදුමාකාර මිතුරෙකි. ඔබට උපකාරකිරීමට එතුමා නිතරම එහි සිටිනසේක" (Ezra Taft Benson, Conference Report තුළිනි, අප්‍රේ. 1989, පි. 103; හෝ *Ensign,* මැයි 1989, ප. 82).

ඔවුන්ට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයෙකුට ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීමේ හැඟීමේ අත්දැකීමක් බෙදාගැනීමට ළමයින්ට ආරාධනාකරන්න. ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම්වලට සවන්දීමටත්, එම පෙළඹවීම් අනුගමනයකිරීමට උත්සාහ දැරීමටත් ළමයින් දිරිගන්වන්න. (සාරවත්කිරීමේ 6වෙනි ක්‍රියාකාරකම බලන්න.)

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් වශයෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. සභාවේ එකොළොස්වෙනි සභාපතිවරයාවූ සභාපති හැරල්ඩ් බී. ලී ගැන පහත සඳහන් කථාව බෙදාගන්න:

   "මට අවුරුදු අටක් හෝ එයටත් වඩා බාල කාලයක බොහෝ ඈත ගොවිපළකට මගේ පියා මාව ගෙනයන ලදී. ඔහු වැඩකරන විට, කුඩා පිරිමි ළමයෙක් කරන දේවල් සමග කාර්‍ය බහුල වුනෙමි. ග්‍රීෂ්ම දූවිලි සහිත දිනයක්වූ ඒදින මහන්සිවන තෙක් මම ක්‍රීඩා කළෙමි. වැටට එපිට කඩා වැටුනු පැලක් දුටු අතර එය කෙරෙහි මම ඉතාම උනන්දු ශීලී වුනෙමි. කඩාවැටුනු මෙම පැල මගේ මනසින් මාළිගාවක් මෙන් සිතා එය ගවේශනයකිරීමට කැමතිවී, වැට ලඟට ගොස් නැග පැලට යාමට පටන් ගත්තෙමි. මෙම ඉතාම වැදගත් දෙය කියමින් මා වෙතට හඬක් පැමිණියේය, 'හැරල්ඩ් ඒ පැත්තට යන්න එපා' මගේ නම කියන්නේ කවුද කියා බැලීමට මම වටපිට බැලුවෙමි. මගේ පියා ගොවිපළේ අනිත් පැත්තේ ඉතා දුරින් සිටියි. මා කරන දෙය ඔහුට නොපෙනුනේය. පෙනෙන හරියක කථාකිරීමට කෙනෙක් නැත. මට නොපෙනෙන කෙනෙකු මට එහි නොයෑමට අනතුරු අඟවන බව එවිට මට අවබෝධවිය. එහි ඇත්තේ කුමක්දැයි මා කිසිදිනෙක නොදන්නා අතර අපගේ දර්ශනයෙන් එපිට අපට කථාකිරීමට හැකි අය සිටින බව මුල් අවධියේම මම ඉගෙන ගත්තෙමි" (*Conference Report* කුලිති, Mexico Area Conference 1972, පිට. 48–49).

2. පහත සඳහන් එක් එක් සටහනක් වෙන වෙනම කඩදාසි කෑලිවල ලියන්න. භාජනයකින් කඩදාසි ඇදගැනීමට ළමයින්ට සලස්වන්න. කඩදාසියේ ලැයිස්තුගතකර තිබෙන සටහන් බැලීමට ළමයෙකුට සලස්වා ශුද්ධාත්මයාණන් ගැන එම පදය කියන්නේ කුමක්ද කියා කීමට සලස්වන්න.

   යොහාන් 14:26 (සැනසිලිදායකයාණන් යයි ශුද්ධාත්මයාණන්වහන්සේට කියනු ලැබේ; එතුමා අපට සියල්ල උගන්වමින් සියල්ල සිහිපත්කිරීමට උපකාරකරනසේක.)

   යොහාන් 15:26 (ශුද්ධාත්මයාණන්වහන්සේ සත්‍යතාවයේ ආත්මයාණන්වහන්සේය; ක්‍රිස්තුස්වහන්සේ ගැන එතුමා සාක්ෂිදරනසේක.)

   යොහාන් 16:13 (ශුද්ධාත්මයාණන්වහන්සේ මුළු සත්‍යය කරා අපට මගපෙන්වන අතර පැමිණෙන්ට තිබෙන දේ අපට ප්‍රකාශකරනසේක.)

   ක්‍රියා 4:31 (දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථාකිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උපකාරකරනසේක,)

   ක්‍රියා 5:32 (දෙවියන්වහන්සේට කීකරුවන අයට උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ව දෙනසේක.)

   ගලාති 5:22 (ආත්මයාණන්ගේ ඵල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, මෘදුකම, යහපත්කම, සහ විශ්වාසවන්තකම යන මේවාය.)

3. පහත සඳහන් උපුටාගැනීම කියවන්න: එක් එක් ළමයෙකුට පිටපතක් සෑදීමට ඔබ කැමතිවෙනවා ඇත.

   "බව්තීස්මයෙන් පසුව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පුද්ගලයෙකු ස්ථිරකිරීමේ කෙටි නියෝගයේදී ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ඔහු ලබන්නේය. ඉන්පසු මිනිසුන්, ස්ත්‍රීන්, කුඩා දරුවන්, පවා ඔවුන්ගේ මුළු ජීවිතකාලය තුළදීම ඔවුන්ගේ ජීවිතවලට මගපෙන්වීම පිණිස ආනුභාසම්පන්න මගපෙන්වීම්—පුද්ගලික එළිදරව් ලැබීමේ අයිතිවාසිකම තිබේ!" (Boyd K. Packer, "Personal Revelation—Available to All," *Friend*, ජූනි, 1990, මුල් පිටුවේ ඇතුලත).

4. එක් එක් ළමයෙකු වෙනුවෙන් පහත සඳහන් අත් පත්‍රිකා සාදන්න:

   මා ධර්මිෂ්ඨව ජීවත්වන්නේ නම්, මට ඉවසීමෙන් මඟපෙන්වමින්, මා සනසමින්, මා ආරක්ෂාකරමින්, අනතුරු ගැන මා දැනුවත්කිරීම, සත්‍යය ගැන මට සාක්ෂිදැරීම යනාදියේදී ශුද්ධාත්මයාණන්ගේ දීමනාවට මට උපකාර කළ හැකිය.

5. ඔවුන්ට සිතාගැනීමට හැකි ශුද්ධාත්මයාණන්ට කියන බොහෝ නම් හඳුනාගැනීමට ළමුන්ට කියන්න. ළමයි ඒවා ගැන නොසිතන්නේ නම්, පහත තිබෙන නම් සඳහන් කරන්න: ශුද්ධාත්මයානන්වහන්සේ, දෙවියන්වහන්සේගේ ආත්මය, ස්වාමීන්වහන්සේගේ ආත්මය, සැනසිලි දායකයාණන්වහන්සේ, සහ ආත්මයානන්වහන්සේය.

---

**අවසානය**

| | |
|---|---|
| සාක්ෂිය | යේසුස්වහන්සේ අප එක් එක්කෙනාට ප්‍රේමකරන බැවින් අපට උපකාරයට, ඉගැන්වීමට, සැනසීමට සහ මගපෙන්-වීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව අපට ලැබීමට සලස්වා ඇති බවට සාක්ෂිය දරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම තිරීක්ෂනයක් වශයෙන් ක්‍රියා 2:1–8, 36–41 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

# පේතෘස් ප්‍රේරිතවරයා

37
වෙනි පාඩම

**අරමුණ**

පේතෘස් මෙන් ඔවුන්ටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ශක්තිමත් සාක්ෂියක් වර්ධනයකර ගැනීමට ළමයින්ට උපකාරවීමය.

**සූදානම්වීම**

1. මතෙව් 4:18–19; 14:22–33; 16:13–17; 17:1–9; ලූක් 22:31–34, 54–62; ක්‍රියා 3:1–9; 4:6–20; 5:12–42; සහ ඇල්මා 32:21 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි.00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ: බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයෙකු සඳහා.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

පහත සඳහන් කථා ඔබ කියවන විට, සවන්දීමට ළමයින්ට කියන්න.

කථාව 1: උන්වහන්සේව ඉක්මණින්ම මරණයට පත්කරන බව යේසුස්වහන්සේ කී විට, එක් මිනිසෙක් මෙසේ කීවේය, "ඔබ සමග හිරගෙටත්, මරනයටත් දෙකටම යාමට මම සූදානම්ව සිටිමි" (ලූක් 22:33). යේසුස්වහන්සේව අල්ලාගෙන විභාගකිරීමට ගෙනයන විට සෙනගත් සමග මෙම මිනිසාද ගියේය, ස්ත්‍රියක් පැමිණ මෙම මිනිසාද යේසුස් සමග සිටියේ යයි කී විට, මෙසේ කියමින් මිනිසා එය ප්‍රතික්ෂේප කළේය, "මම ඔහු නාඳුනමි." සුළු වේලාවකට පසු තවත් මිනිසෙක් මෙසේ කීවේය, "නුඹත් ඔවුන්ගේ කෙනෙකි," යේසුස්වහන්සේ දැනගත් නමුත් මිනිසා එය ප්‍රතික්ෂේප කළේය. තුන්වෙනි වතාවේ යමෙක් ඔහු පෙන්වා, යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු යයි කී විට, නැවත වරක් මිනිසා, "මනුෂ්‍යය, නුඹ කියන දේ නොදනිමි"යි කීවේය. (බලන්න ලූක් 22:54–62.)

කථාව 2: දිනක් මිනිසෙක් සහ ඔහුගේ මිතුරා මව්කුස පටන් කොරවූ මිනිසෙක් විසින් නවත්වන ලදී. මිනිසා කොර මිනිසාට මෙසේ කීවේය, "නාසරීය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නැගිට ඇවිදපන්න," කියා ඔහුගේ දකුණු අත අල්ලා ඔහු නැගිට්ටෙවුවේය. කොර මිනිසා එකිනෙහිම සුවය ලබා, ඇවිදිමින්ද, පනිමින්ද, දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්ද" දේවමාළිගාවට ගියේය. උත්තම පූජකයන් මෙය ඇසූ විට, කොර මිනිසා සුවය ලැබූයේ කුමන බලයකින්දැයි ඔවුහු ඇසූහ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලයෙන් යයි කොර මිනිසාව සුවකළ මිනිසා කීවේය. මෙය කීමෙන් ඔහු සිරගෙට දැමීමට හෝ මරණයට පත්කිරීමට පවා හැකි බව දැන දැනත්, ඔහු එසේ කීවේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නොඉගැන්විය යුතු යයි පූජකයෝ මිනිසාට අණ කළහ. නමුත් බොරු යුදෙව් පූජකයන්ට කීකරුවනවාට වඩා, දෙවියන්වහන්සේට කීකරුවීම වඩාත් වැදගත්බව කියමින් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නොකඩවා උගන්වන බවඔහු කීවේය. (බලන්න ක්‍රියා 3:1–9; 4:6–20.)

මෙම කථාන්තර දෙකේම සඳහන්වූ මිනිසා පේතෘස් බව පහදා දෙන්න. ඇණගැසීමට මොහොතකට පෙර, පේතෘස් යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කළත්, ඔහු තවමත් ඉගෙනගනිමින් වර්ධනය වන්නේය. යේසුස්වහන්සේ අල්ලාගත් විට, පේතෘස් බියවිය. පේතෘස් කොර මිනිසා සුවපත්කරන විට, ඔහුට ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබී යේසුස්වහන්සේ කෙරෙහි වඩා ශක්තිමත් සාක්ෂියක් තිබුනේය. ඔහුට කුමක් වුවත් හරිදෙය කිරීමට මෙය ඔහුට ශක්තිය දුන්නේය.

- සාක්ෂිය යනු කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාවේ සත්‍යතාවය ගැන පුද්ගලික දැනීමය.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ළමයින්ගේ සාක්ෂි ශක්තිමත් කිරීමට මෙම පාඩම උපකාරවන බව පහදා දෙන්න.

ශුද්ධ ලියවිලි විස්තර සහ සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

පේතෘස් ගැන පහත සඳහන් විස්තර ළමයින්ට උගන්වා ඒවා එකින් එක සාකච්ඡා කරන්න. ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනු ඇත.

1. පේතෘස් යේසුස්වහන්සේව අනුගමනය කළේය (මතෙව් 4:18–19).

   - උන්වහන්සේ කවුද කියා යේසුස්වහන්සේ කීවාට පසු පේතෘස් යේසුස්වහන්සේව අනුගමනය කළේ ඔබ සිතන අන්දමට කුමක් හෙයින්ද? යේසුස්වහන්සේව අනුගමනයකිරීමට පේතෘස්ට පරිත්‍යාග කිරීමට තිබුනේ කුමක්ද? යේසුස්වහන්සේව අනුගමනයකිරීමට අපට පරිත්‍යාග කිරීමට ඇත්තේ කුමක්ද? ගැලවුම්කරුවාණන් අනුගමනය කිරීමෙන් අපට ආශිර්වාද ලැබුනේ කෙසේද?

2. යේසුස්වහන්සේ සහ පේතෘස් මුහුද පිට පයින් ගියහ (මතෙව් 14:22–33).

   - යේසුස්වහන්සේට මුහුද පිට ඇවිදීමට හැකිවුනේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (මතෙව් 14:25.) යේසුස්වහන්සේ වෙතට පේතෘස්ට ඇවිදීමට හැකිවුනේ කුමක් නිසාද? (මතෙව් 14:28–29.)
   - පියවරවල් ස්වල්පයක් ගත්තාට පසු පේතෘස්ට සිදුවූයේ කුමක්ද? (මතෙව් 14:30–31.) පේතෘස්ගේ විශ්වාසය සසලවුනේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? පේතෘස්ගේ විශ්වාසය සසලවූ විට, යේසුස්වහන්සේ උපකාර කළේ කෙසේද? (මතෙව් 14:31.) අපගේ ඇදහිල්ල ඇතැම්විට දුර්වලවන්නේ කුමක් නිසාද? අපගේ ඇදහිල්ල ශක්තිමත්කර ගැනීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උපකාරකරන්නේ කෙසේද? (ශුද්ධාත්මයාණන්, අපගේ දෙමාපියන් සහා නායකයන්, යහපත් මිතුරන්, සහ ශුද්ධ ලියවිලි යනාදිය මගින්ය.)

   ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට අණකරන දේවල් අප කරන සෑම අවස්ථාවකම අප ඇදහීම පුහුණුකරන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. අප ඇදහීම පුහුණුකර එක් එක් අවස්ථාවකම අපගේ ඇදහීම ස්වල්ප වශයෙන් වඩා ශක්තිමත් වන්නේය. අපද පේතෘස් මෙන් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අනුගමනයකිරීමට අපගේ ඇදහීම භාවිතාකළ යුතුය. එවිට අපගේ සාක්ෂි ශක්තිමත්වීමට අපගේ ඇදහීම උපකාර වන්නේය.

3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවට පේතෘස් සාක්ෂි දැරුවේය (මතෙව් 16:13–17).

   - යේසුස්වහන්සේ කවුදැයි කියා පේතෘස් කීවේ කුමක්ද? (මතෙව් 16:16.) පේතෘස් මෙය දැනගත්තේ කෙසේද? (මතෙව් 16:17. ආත්මයාණන් මගින්ය.) පේතෘස් මෙන් අපටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අපගේ සාක්ෂි ප්‍රකාශකිරීමට හැකිවන්නේ කෙසේද?

4. පේතෘස් යෙසුස්වහන්සේ සමග අන්වෙසක් ගත් කන්ද මත සිටියේය. (මතෙව් 17:1–9; බලන්න "සාරාංශ සාකච්ඡාව සහ සහ අදාළකිරීමේ ප්‍රශ්න" පාඩම 15. පි. 0051).

   - අන්වසක් ගත් කන්දේදී යේසුස්වහන්සේට කුමක් සිදුවූවේද? (මතෙව් 17:2.) යේසුස් වහන්සේ සහ පේතෘස්, යාකොබ් සහ යොහාන් වෙතට ප්‍රකාශවුනේ කවුද? (මතෙව් 17:3.) ගෝලයන්ට ඇසුනේ කාගේ හඬද? (මතෙව් 17:5.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පේතෘස්ගේ සාක්ෂිය මෙම අත්දැකීම නිසා ශක්තිමත්වූයේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?

5. පේතෘස් සහ යොහාන් කොරවූ මිනිසෙකු සුවකළ බැවින්, සිරගෙට දමන ලදී (ක්‍රියා 3:1–9; 4:6–20; 5:12–42).

   පේතෘස් සහ යොහාන් කොරවූ මිනිසෙකු සුවකිරීමේ කථාව ළමයෙකුට කීමට සලස්වන්න. ක්‍රියා 5:12–42න් කථාවේ ඉතිරි කොටස කියන්න.

   - පේතෘස් සහ යොහාන් සිරගෙයින් බේරුනේ කෙසේද? (ක්‍රියා 5:19.) ඔවුන්ට කිරීමට දේවදූතයා කීවේ කුමක්ද? (ක්‍රියා 5:20.) දේශනාකිරීම නිසා සිරගෙයි දැමීමට පසු, එයම කිරීම පිණිස නැවත යාම ගැන ඔබට හැඟෙන්නේ කෙසේද? හරි දෙය කිරීමට පේතෘස්ට සහ යොහාන්ට ශක්තිය ලැබුනේඔබ සිතන අන්දමට කෙසේද?

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන උගන්වන නිසා අප කිසිදිනෙක සිරගත නොකරන බව තේරුම් ගැනීමට ළමුන්ට උපකාරවන්න. නමුත් වෙනත් මාර්ගවලින් අපව පරීක්ෂාවට පමුණුවනවා ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන

ඔබගේ සාක්ෂිය නිසා ඔබගේ ජීවිතය තුළදී ඔබව පරීක්ෂාවට ලක්කරනු ලැබුවහොත් කෙසේ වන්නේද? (බලන්න සාරවත්කිරීමේ 4වෙනි ක්‍රියාකාරකම.)

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පේතෘස්ගේ සාක්ෂිය වර්ධනයවූයේ කෙසේද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ශක්තිමත් සාක්ෂියක් අපට අවශ්‍යවන්නේ කුමක් නිසාද? මෙම සාක්ෂිය අපට ලබාගැනීමට හැකිවන්නේ කෙසේද? අපගේ සාක්ෂි වර්ධනයකර ගැනීම පිණිස අපට උපකාරකළ හැකිවන්නේ කෙසේද? (ශුද්ධ ලියවිලි කියවීම, උන්වහන්සේ ගැන වැඩියෙන් ඉගෙනගැනීම, පණත් තැබීම, යාච්ඤාකිරීම, ශුද්ධාත්මයාණන් වහන්සේට සවන්දීම, සභාවට පැමිණීම යනාදියවේ.)

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. පහත සඳහන් දේවල් දැනගැනීම සාක්ෂියට අඩංගුවන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න:

    ස්වර්ගික පියාණන්වහන්සේ ජීවමාන බවද, අපගේ ආත්මවල පියාණන් බවද.
    යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගීය පියාණන්වහන්සේගේ පුත්‍රයා සහ අපගේ ගැලවුම්කරුවාණන් බවද.
    පසු-දවස්වලදී ස්වාමීන්වහන්සේ ශුභාරංචිය නැවත පිහිටුවූයේ අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් මගින් බවද.
    මෝර්මන්ගේ පොත දෙවියන්වහන්සේගේ වචනය වන අතර, ශුභාරංචියේ පූර්ණත්වය එහි අඩංගුවන බවද.
    යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව සත්‍යයයේ එකම සභාව බවද..
    අනාගතවක්තෘවරුන් සහ ප්‍රේරිතවරුන් විසින් අද අපට මගපෙන්වන බවද.

    මෙම සත්‍යයන් ගැන සාක්ෂියක් අපට ලබාගත හැකි මාර්ග සාකච්ඡා කරන්න.

2. ඇදහිල්ලේ නමවන කරුණ පහදාදී, එය කටපාඩම් කිරීමට ළමයින්ට උපකාරවන්න.

3. ගැලවුම්කරුවාණන් සමග පේතෘස්ට තිබූ අත්දැකීම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔහුගේ සාක්ෂිය වැඩිදියුණු වූ බව සිතීමට ළමුන්ට සලස්වන්න. (5,000කට කන්ටදීම, රෝගීන් සුවකිරීම, යායීරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටුවීම, යනාදියයි.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව අප අපම දැනගැනීමට හැකිවන්නේ කෙසේද? (ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීමෙන්, යාච්ඤාකිරීමෙන්, පණත්වලට කීකරුවීමෙන් යනාදියෙනි.)

4. සභාව ප්‍රතික්ෂේප කිරීමට හෝ යම් වැරදි දෙයක් කිරීමට වෙනත් මිනිසුන් අප ලවා කිරීමට උත්සාහදරන ක්‍රම නම්කිරීමට ළමයින්ට සලස්වන්න. එවැනි පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ප්‍රමාණවත් ශක්තියක් ලබාගන්නා අන්දම ගැන සාකච්ඡා කරන්න. අවශ්‍ය නම් පහත සඳහන් නිදර්ශන භාවිතාකරන්න:

    ඔවුන්ට සභා රැස්වීම්වලට නොපැමිණීමට යමෙකු උත්සාහ දැරීම.
    ඔවුන්ට ප්‍රඥාවේ වචනය කැඩීම පිණිස යමෙකු උත්සාහකිරීම.
    යමෙකු ඔවුන් ලවා බොරු කීමට උත්සාහදැරීම.
    ඔවුන්ගේ දසයෙන් කොටසේ මුදල් වියදම්කරවීමට යමෙකු උත්සාහදැරීම.

    පේතෘස් මෙන් ශක්තිමත්වීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පුද්ගලික සාක්ෂියක් අප ලබාගත යුතු බව අවධාරණය කරන්න.

5. සභාවේ හයවෙනි සභාපතිවරයාවූ සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්, ඔහුගේ තරුණ කාලයේදී ධර්මදූත මෙහෙයෙන් පසු නැවත නිවසට පැමිනෙන සිද්ධිය ගැන පහත සඳහන් කථාන්තරය ගැන කියන්න:

    "දිනක් ජෝසෆ් එෆ්. ස්මිත් සහ ඔහුගේ සහායකයා කෙටි දුරක් ගමන්කොට ඔවුන්ගේ කූඩාරම ගැසූවාට පසු, බීමත් මිනිසුන් කණ්ඩායමක් අසුන් පිට නැගී, කූඩාරම තුලට පැමිණ, ඔවුන්ගේ මාර්ගයෙන් පැමිණෙන ඕනෑම කෙනෙකු මරණ බවට තර්ජනය කරමින්, සාපකරමින්ද, දිවුරමින්ද, පැමිණියෝය. ජෝසෆ්ගේ සමහර සහකාරයන්, මිනිසුන් එන බව ඇසූනු විට, වදුලේ පහළින් නොපෙනී ගියහ. මෙම මිනිසුන් කණ්ඩායම යන තෙක් ඔවුහු එහි සිටියහ. මෙම මිනිසුන් එහි එන විට ජෝසෆ් එෆ්. ස්මිත් කූඩාරමට ටිකක් ඈතින් ගිනි මෙලවීමට දර එකතුකරමින් සිටියේය. ඔහු ඔවුන් දුටු විට, පලමුවෙන් ඔහුට සිතුනේ සැඟවීමට තැනක් සෙවීමය. ඉන්පසු මෙම සිතුවිල්ල ඔහුට පැමිණියේය. 'මෙම මිනිසුන් වෙතින් මා පැන යා යුත්තේ කුමක් නිසාද?' එම සිතිවිල්ලත් සමගම

අත්වල දර පුරවාගෙන එඩිතරව කූඩාරමට පැමිණියේය. එක් මිනිසෙක් ඔහුගේ තුවක්කුව වැඩිහිටියා වෙතට එල්ලකරමින්, ශබ්දනගා, තරහෙන්, හඬනගමින් මෙසේ ඇසුවේය, ‘ඔබ මෝර්මන් වරයෙක්ද?’

“ජෝසෆ් එෆ්. ස්මිත් මොහොතකටවත් පැකිලුනේ නැත. එම මිනිසාගේ ඇස් දෙස බලමින්, මෙසේ පිළිතුරු දුන්නේය, ‘ඔව් මහත්මයා, පාට කළ බූල් මෙන්, සම්පූර්ණයෙන්ම මම පක්ෂපාත වෙමි.’

කිසිම බයක් නැතිව ඔහු උත්තර දීමෙන් එම මිනිසා සම්පූර්ණයෙන්ම පුදුමයට පත් කළේය. මිනිසා ජෝසෆ් එෆ්. ස්මිත්ගේ අත තදින් අල්ලාගෙන මෙසේ කීවේය, ‘හොඳයි, කිසිම දිනක මට මුණගැසුන ඉතාම ප්‍රසන්න මිනිසා ඔබය! යන්න තරුනයා, තමා සහ තමාගේ විශ්වාසය කෙරෙහි නැගී සිටින මිනිසෙකු දැකීම ගැන මම සතුටුවෙමි’” (Joseph Fielding Smith, *The Life of Joseph F. Smith*, පිටු. 188–89).

6. ක්‍රියා 5:29 කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරකරන්න.

---

## අවසානය

**සාක්ෂිය**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අප වැඩියෙන් ඉගෙනගනිමින් ශුද්ධාත්මයාණන්ගේ සාක්ෂියට සවන්දෙන විට, අපගේ ජීවිතය පුරාම යේසුස්වහන්සේ ගැන සාක්ෂි නොකඩවාම වැඩෙන බවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔබගේ සාක්ෂිය දරන්න. සැකයත්, ප්‍රශ්නත් අපට තවමත් තිබිය හැකිය. නමුත් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරමින්, යාච්ඤා-කරමින්ද, පනත් තැබීමෙන්ද අපගේ සාක්ෂි වඩාත් ශක්තිමත්වන බව පහදා දෙන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 16:13–17 සහ ක්‍රියා 5:29–32 අධ්‍යයනය කිරීමට ළමයින්ට සලස්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# බාර්ණබස්, අනනියස්, සහ සප්පිරා

38
වෙනි පාඩම

**අරමුණ**

සිතින්. වචනයෙන් සහ ක්‍රියාවෙන් අවංකවීමට තෝරාගැනීම පිණිස එක් එක් ලමයාව දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 4:32–5:10 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න “ඔබගේ පාඩම් සූදානම්කිරීම,” පි. 00 vi, සහ “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම,” පි. 00 vii.)
2. අමතර කියවීම්: *සුභාරංචි මූලධර්ම,* පරිච්ඡේද 31.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකර ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ: බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පහත සඳහන් කථාන්තරය ලමුන්ට කියා, ඔවුන් චාලි නම්, ඔවුන් කරන්නේ කුමක්ද කියා තීරණයකිරීමට ඔවුන්ට කියන්න.

“එක් තරුණ පිරිමි ලමයෙක් තම මිතුරන් සමග බේස් බෝල ක්‍රීඩාකරන විට, ඔහුගේ මවගේ හඬ ශබ්දය පැහැදිළිව චාලි, චාලි! යයි කථා කළාය. එකෙනෙහිම ඔහු පිත්ත බිම තබා, කමිසය සහ තොප්පිය ඇහිඳගෙන ගෙදර යාමට පටන්ගත්තේය.

“‘දැන්ම යන්ට එපා; ක්‍රීඩාව ඉවරකරන්න!’ කියමින් අනෙක් ක්‍රීඩකයෝ කෑගැසුවෝය.

“‘මං දැන්ම යන්ම ඕනැ, ඇය කථාකරන විට ගෙදර එන බව මා අම්මාට කීවා,’ යි චාලිගේ ප්‍රතිචාරය විය.

“‘ඔබට ඇසුනේ නැති විධියට ඉන්න,’ යයි අනෙක් පිරිමි ලමයි කීහ.

“‘නමුත් මට ඇසුනා,’ යයි චාලි කීවේය.

“‘ඔබට ඇසුන බව ඇය දන්නේ නැහැ,’

“‘නමුත් මං එය දන්නවා මට යන්න ඕනැ.’

“‘අන්තිමට එක් ලමයෙක් මෙසේ කීවේය, `අනේ ඔහුට යන්න දෙන්න, ඔහුගේ සිත ඔබට වෙනස්කරන්න බැහැ. අම්මාගෙන් අසන්නේ නැතිව ඔහුට කිසි දෙයක් කරන්න බැහැ. ඔහු එවැනි බබෙක්, ඇය කථාකරනු ඇසුන විගස ඔහු දුවනවා’” (N. Eldon Tanner, in Conference Report, ඔක්තෝ. 1977, පි. 65; හෝ *Ensign,* නොවැ. 1977, පිටු 43–44).

- ඔබ කරන්නේ කුමක්ද?

අප සියලුදෙනාම දිනපතාම අවංකවීම සහ අවංක නොවීම අතර තෝරාගැනීමේ අවස්ථාවලට මුහුණදෙන බව පහදාදන්න. බාර්ණබස්, අනානියස්, සහ සප්පිරා විසින් කළ තෝරාගැනීම්වල ප්‍රතිඵල ගැන සිතීමට ලමුන්ට කියන්න.

**ශුද්ධ ලියවිලි විස්තරය**

ක්‍රියා 4:32–5–10න් බාර්ණබස්, අනානියස්, සහ සප්පරොගේ විස්තර ලමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම,” පි 00 vii.) සත්‍යය කථාකිරීමට සහ අප කරන සියලුම දේ ගැන අවංකවීමට ඉගෙනගැනීමෙන් අපටද යේසුස් වහන්සේ මෙන් වීමට ඇති එකම මාර්ගය බව පෙන්වා දෙන්න.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනු ඇත.

- සෑම කෙනෙකුටම අවශ්‍ය දේ ඔවුන්ට ලබාගැනීම පිණිස සභාවේ සාමාජිකයන්ට කිරීමට සභාවේ නායකයන් කීවේ කුමක්ද? (ක්‍රියා 4:34–35.) ඔබට ඇති සියලුම දේ බෙදාගැනීම ගැන ඔබට හැඟෙන්නේ කෙසේද?
- ඔහු කළ දේවල් කෙරෙහි බාර්නබස් අවංකවූයේ කෙසේද? (ක්‍රියා 4:36–37.) අවංකවීම යනු ඔබ සිතන අන්දමට කුමක්ද? (සත්‍යය කථාකිරීම, සොරකම් නොකිරීම, වංචා නොකිරීම, නොරැවටීම යනාදියයි.) ඔබ සම්පූර්ණයෙන්ම අවංක නම් ඔබට හැඟෙන්නේ කෙසේද?
- අනානියස් සහ සප්පිරා වංකවූයේ කෙසේද? (ක්‍රියා 5:1–2.) සප්පිරා ඇයගේ සැමියා සමග බොරුකීවේ කුමක් නිසාද? (ක්‍රියා 5:1–2, 7–8.) ඇය අවංකව සිටියා නම් කුමක් සිදුවීමට තිබුනාද?
- පුද්ගලයෙකු වංකවූ විට, එයින් රිදෙන්නේ කාටද? අනානියස් සහ සප්පිරා මෙන් අපගේ වංකකමේ ක්ෂණික ප්‍රතිඵල අප නොදැක්කත් අප අපටම රිදවන්නේය. අපගේ වංකකම නිසා අනෙක් අයටද අප රිදවනවා ඇත.
- ඔබ වංකවන්නේ නම්, එහි ප්‍රතිඵල මොනවාද? ඔබ අවංක නම් එහි ප්‍රතිඵල මොනවාද? අවංකකමේ හෝ වංකකමේ ප්‍රතිඵල ගැන පුද්ගලික නිදර්ශනයක් බෙදාගන්න. අවංකවීම නිතර පහසු දෙයක් නොවූවත් අවස්ථාවන් කුමක් වූවත්, අප අවංකවිය යුතු බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරවන්න. අවංකවීමේ ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමට ළමයින්ට ආරාධනාකරන්න.
- ඔබ නිතර ඇත්ත කියනවාද කියා දන්නේ කවුද? අවංකවීම මගින් ස්වර්ගීය පියාණන් වෙතට අප වඩාත් සමීපවවන්නේ කෙසේද?
- අන්‍යයන් අවංකවීම පිණිස උපකාරවීමට අපට කුමක් කළ හැකිද?
- ඔබගේ දෙමාපියන්ට අවංකවීමේ වැදගත්කම කුමක්ද? (ඔවුහු ඔබ කෙරෙහි විශ්වාසය තබන්නෝය. දෙමාපියන් ඔබ කෙරෙහි විශ්වාසය තැබීම ඔබට අවශ්‍යවන්නේ කුමක් නිසාද? ඔබගේ දෙමාපියන්ගෙන් ඔබ කෙරෙහි විශ්වාසය ලබාගන්නේ කෙසේද? සමහරවිට සත්‍යය කීමට ධෛර්‍යය අවශ්‍යවන්නේ කුමක් නිසාද? (සාරවත්කිරීමේ 6වෙනි ක්‍රියාකාරකම බලන්න.)
- සියලුදෙනාම අවංක නම් ලෝකය වෙනස් වෙන්ට තිබූනේ කෙසේද?

සභාවේ දහතුන්වෙනි සභාපතිවරයා වන එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් උපුටාගැනීම කියවන්න:

"අවංකවන්න, බොරු නොකියන්න, සොරකම් නොකරන්න, වංචා නොකරන්න. . . .

ආදරවන්ත ළමයිනි, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ ඔබලා මෙම කාලයේදී පොළොවට එව්වේ ඔබලා උන්වහන්සේගේ ඉතාම වික්‍රමාන්විත ළමයින් බැවින්ය. ලෝකයේ අද බොහෝ දුෂ්ටකම් පවතින අතර, ඔබ ඇදහිලිවන්තව සහ කීකරුව සිටින බව උන්වහන්සේ දැනගත්සේක" (Conference Report තුලිනි, අප්‍රේ. 1989, පි. 103; හෝ *Ensign,* මැයි 1989, පිටු. 82–83).

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වූවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. දහතුන්වෙනි ඇදහිල්ලේ කරුණ නැවත බලා ළමයින්ට තේරුම්ගැනීමට සහ කටපාඩම්කිරීමට උපකාරවන්න.
2. *නිවස, පාසල, අසල්වැසි පෙදෙස* කියා හුණු ලෑල්ලේ ලියන්න. එක එක අවස්ථාවන්වලදී ඔවුන්ට අවංකව කටයුතුකිරීමට හැකි ක්‍රම ගැන සිතීමට ළමුන්ට සලස්වන්න. ළමයින් සිතන අදහස් සාකච්ඡාකරන්න.
3. අවංක සහ වංක යන වචන හුණුලැල්ලේ ලියන්න. වැඩිහිටි මාර්වින් ජේ. ඈෂ්ටන්ගේ පහත සඳහන් ප්‍රකාශය බෙදාගන්න: "'බොරුව ඕනෑම සංනිවේදනයකින් තවත් කෙනෙකුට දෙන්නේ රැවටීමේ අදහසිනි.' . . . වචන නොමැතිව හෝ කථානොකර හෝ බොරුවක් සාර්ථකව සංනිවේදනය කළ හැකිය. සමහරවිට හිස වැනීමෙන් හෝ නිශ්චලතාවයෙන් රැවටීමට හැකිය" (Conference Report තුලිනි, අප්‍රේ. 1982, පි. 10; හෝ *Ensign,* මැයි

1982, පි. 9) පහත සඳහන් එක් අවස්ථාවක්ම සාකච්ඡාකොට, එයට ගැලපෙන හොඳම මාතෘකාවද, එය කුමක් නිසාද කියා තීරණයකිරීමට ළමයින්ට සලස්වන්න.

සත්‍යය කථාකිරීම
ඔබගේ වැඩකටයුතු කිරීම
සම්පූර්ණ සත්‍යය නොකියා අතුත් නොමග යැවීම
ඔබ වැරදි යමක් කළ විට එය පිළිගැනීම
රැවටීම
බොරුකීම
සොරකම්කිරීම
සත්‍යය බාගෙට කීම
ඉල්ලාගත හෝ නැතිවූ භාණ්ඩ ආපසු දීම
පොරොන්දු තැබීම

4. එක් එක් ළමයෙකුට සලකුණක් කර, සමහරවිට පළිහක හැඩයට මේ ආකාරයෙන් කීමට සලස්වන්න. “සත්‍යයට සහ අවංකකමට මම නැගී සිටිමි.” සත්‍යය කීමට ඉලක්ක තැබීමට සහ ඔවුන් කරන සියලුම දේවල් අවංකව කිරීමට ළමයින්ට ආරාධනා කරන්න. ඔවුන්ගේ අත්සන් යට ඔවුන්ට අත්සන් තැබීමට ළමයින්ට සලස්-වන්න.

5. හුණුලෑල්ලේ හෝ කඩදාසි කැල්ලක ඉනිමගක් ඇඳ, *අවංක ඉනිමග* කියා ලකුණු කරන්න. කඩදාසිවලින් සරල රූපයක් සාදා හෝ ඉනිමග යට රූපයක් අඳින්න. පහත සඳහන් අවස්ථාවන් භාවිතාකරමින් එක් එක් අවස්ථාවකදීම, ඔවුන්ට තැබිය හැකි සියලුම තෝරාගැනීම් නම්කිරීමට ළමයින්ට සලස්වන්න. ඉන්පසු ඉතාම හොඳ තේරීම කුමක්දැයි තීරණයකිරීමට ඔවුන්ට කියන්න. ඉතාම හොඳ තේරීම අවංකකම නම්, රූපය ඉනිමගේ (හෝ රූපය වෙතින් ඉරක් ඇඳීමට) එක් පියවරක් එසවීමට ළමයෙකුට සලස්වන්න. ඉතාම හොඳ තේරීම අවංකකම බව පෙන්වාදෙන්න. ඉර ඉනමග දිගේ මුදුනටම ගෙනයාමට හැකිතරම් අවස්ථාවන් භාවිතාකරන්න.
   අ. මිතුරෙකුගේ නැතිවූ ක්‍රීඩා භාණ්ඩයක් ඔබ සොයාගත්විට.
   ආ. මුදල් සමග පසුම්බියක් ඔබ සොයාගත්විට.
   ඇ. යමෙකුට අයත් දෝසි මල්ලක් මේසය උඩ තිබේ. කිසිවෙක් කාමරයේ නැත.
   ඈ. මුදල් ගෙවා ඇතුල්වීමේ ක්‍රියාකාරීත්වයකට ඔබ යයි. ඇතුල්වන ස්ථානයේ මෙසේ සඳහන් සලකුණක් තිබේ, “අවුරුදු අටෙන් අඩු ළමයින්ට ඇතුල්වීම නොමිලේ.”
   ඉ. වෙළඳ සැලක ලිපිකරුවා ඔබට ඉතිරි මුදල් වැඩියෙන් දෙයි.
   ඊ. පරීක්ෂණයකදී ඔබගේ පිළිතුරු ඔහුට හෝ ඇයට පිටපත්කරගැනීමට ඔබගේ මිතුරෙක් ඔබෙන් ඉල්ලයි.
   උ. යමෙකු ගැන අකරුණාවන්ත කථාවක් යමෙක් ඔබට කියයි.
   ඌ. යම් නියමිත වේලාවකදී ඔබ ගෙදර පැමිණෙන බව ඔබගේ දෙමාපියන්ට පොරොන්දුවූ නමුත්, ඔබ දිගු කලක් රැඳීසිටීම ඔබගේ මිතුරාට අවශ්‍යවේ.

6. ළමයින්ට රඟදැක්වීම පිණිස පහත සඳහන් ඒවාට සමාන අවස්ථාවන් කිහිපයක් සාදන්න. එම අවස්ථාවන් ළමයින්ගේ දෙමාපියන් සමග අවංක හෝ වංකවීම තෝරාගන්නා අවස්ථාවන් විය යුතුය.
   අ. ඔබගේ කුඩා සහෝදරයා ඔබ බලාගැනීම ඔබගේ මවට අවශ්‍යව ඇත. ඒ වෙනුවට ඔබට කියවීම අවශ්‍යව ඇත. ඔබට ගෙදර වැඩ තිබෙන ඇයට කීමෙන්, ඔහු බලාගැනීමට ඇය බලාපොරොත්තු නොවන බව ඔබ දන්නේය.
   ආ. මව ගෙදර නොමැති විටදී, ඇයගේ ප්‍රියතම බඳුනක් වැරදීමකින් ඔබ අතින් කැඩුනි.
   ඇ. සෙනසුරාදා තිබෙන ව්‍යාපෘතියකට ඔබ ඔබගේ පියාට උපකාරකරන බවට ඔබ පොරොන්දුවූ නමුත්, ඔබ පැමිණිය යුතු ක්‍රියාකාරකමක් ඔබගේ මිතුරන් සැලසුම්කර ඇත.

7. හතරවෙනි ඇදහිල්ලේ කරුණ නැවත බලන්න.

---

## අවසානය

සාක්ෂිය

අවංකවීමේ වැදගත්කම ගැන ඔබගේ සාක්ෂිය දරන්න. අප කරන සියල්ලක් කෙරෙහිම අප අවංකවුව හොත්, සමා-දානයේ හැඟීමක් ශුද්ධාත්මයාණන්වහන්සේ අපට දෙනසේක.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ක්‍රියා 4:32–5:10 අධ්‍යයනයකිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 39
වෙනි පාඩම

# සෙත්පන් වේද සාක්ෂිකාරයෙකු සේ මැරුම්කෑම

**අරමුණ** දේව ශීර්ෂය ගැන වඩා වැඩි දැනුමක් එක් එක් ලමයාට ලබාගැනීමට උපකාරවීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 6, 7:54–60, සහ දහම සහ ගිවිසුම 130:22–23 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: ක්‍රියා 7:1–53 සහ ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුන ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. දහම සහ ගිවිසුමේ පිටපතක්.
   ඇ. 7-40 පින්තූරය, පළමු දර්ශනය (ෂුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 403; 62470).

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම** ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම — *වේදසාක්ෂිකරු* කියා හුණුලෑල්ලේ ලියන්න. පංතියට ඉදිරියට ඒමට ලමයෙකුට සලස්වන්න.

- (ලමයාගේ නම), වේදසාක්ෂිකාරයෙකු වීමට ඔබ කැමතිද?
- වේදසාක්ෂිකාරයෙකු යන්න ඔබලා කවුරුත් හෝ දන්නවාද?

වේදසාක්ෂිකාරයෙකු යනු, යම් දෙයක් ගැන තදින්ම විශ්වාසකරන පුද්ගලයෙකු වන අතර, එහි සාක්ෂියක් වශයෙන් ඔහුගේ හෝ ඇයගේ ජීවිතය පූජාකරන කෙනෙකු බව පහදාදෙන්න.

මෙම පාඩම ස්වර්ගික පියාණන්වහන්සේ, යේසුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ශක්තිමත් සාක්ෂියක් තිබුන බැවින් එම සාක්ෂිය නිසා මැරුම් කෑ මිනිසෙකු ගැනය.

ශුද්ධ ලියවිලි විස්තරය — ක්‍රියා 6 සහ 7 සඳහන් සෙත්පන්ගේ විස්තරය ලමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)

සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න — ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි විස්තර සටහන් අධ්‍යයනයකරන්න. ලමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ප්‍රේරිතවරුන්ට උපකාරවීම පිණිස මිනිසුන් සත්දෙනෙකු ඔවුන් කැඳවූයේ කුමක් නිසාද? (ක්‍රියා 6:1–4.) මෙම මිනිසුන් සත්දෙනා කැඳවූයේ කෙසේද? (ක්‍රියා 6:3, 5–6.) ප්‍රේරිතවරුන් "මිනිසුන් මත අත් තැබුවේ" කුමක් නිසාද? (යම් වගකීම් ඉටුකිරීම පිණිස, යේසුස් ක්‍රිස්තුස්වහන්සෙ-ගෙන් ප්‍රේරිතවරුනට ලැබුන අධිකාරී බලය ඔවුහු ඔවුන්ට දුන්හ. පූජකවරය ලබන සියලුදෙනා අත්තැබීම මගින් පත්කරන ලදී.)
- ප්‍රේරිතවරුන්ට උපකාරවීමට සහ ජනතාවට සේවයකිරීම පිණිස සෙත්පන්ට උපකාරවූ ගුණාංග මොනවාද? (ක්‍රියා 6:5, 8.) ජනතාවගේ ජීවිතවලට ඔවුන් ආශිර්වාද කළේ කෙසේද?
- යුදෙව් නායකයන් සෙත්පන්ව මන්ත්‍රන සභාවක් ඉදිරියට ගෙනගියේ කෙසේද? (ක්‍රියා 6:9–12.) සෙත්පන් කළා යයි ශුද්ධස්ථානයේ නායකයන් කළ බොරු චෝදනා මොනවාද? (ක්‍රියා 6:13–14. *දේව අපහාසය* යනු

දෙවියන්වහන්සේට සහ පූජනීය දේවල්වලට අපහාස සහ අගෞරව වන ආකාරයට කථාකිරීම යනු පහදා දෙන්න.) සෙත්පන් දේව අපහාසය වන ආකාරයට කථාකළේ යයි ඔවුන් සිතුවේ කුමක් නිසාද?

- මන්ත්‍රන සභාවේ සමාජිකයන්ට සෙත්පන් කථාකරන විට ඔහුගේ මුහුණට කුමක් සිදුවුනේද? (ක්‍රියා 6:15.)

මන්ත්‍රන සභාවට සෙත්පන් කී දේවල් කෙටියෙන් නැවත වසේතර කරන්න (ක්‍රියා 7:1–53). ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන්වහන්සේගේ ආශිර්වාද පහදා දෙමින් සාක්ෂිදැරූ බව අවබෝධකර ගැනීමට ලමයින්ට උපකාරවන්න. ජනතාව දෙවියන්වහන්සේට අකීකරුවූ බවද, අනාගතවක්තෘවරුන්ට පීඩාකර මැරූ බවද, මෙසියස්වහන්සේව ප්‍රතික්ෂේපකර මරණයට පත්කළ බවද ඔහු කීවේය.

- සෙත්පන් ස්වර්ගය දෙස බැලූ විට ඔහු දුටුවේ කවුද? (ක්‍රියා 7:55.) ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ ගැන සෙත්පන් සාක්ෂදරන විට ඔහු සමග සිටියේ කවුද? (ශුද්ධාත්මයාණන්වහන්සේ.
- සෙත්පන් අවට සිටි පුද්ගලයන් ඔහු දුටු දර්ශනය දුටුවාද? (ක්‍රියා 7:57–59.) ඔවුන් ඔහුට ගල්හසන විට සෙත්පන් කීවේ කුමක්ද? (ක්‍රියා 7:59–60). ඔහුව මැරුව ජනතාවට කමාව දීමට සෙත්පන්ට හැකිවූයේ ඔනබ සිතන අන්දමට කුමක් නිසාද?

පළමු දර්ශනයේ පින්තූරය පෙන්වන්න.

- ස්වර්ගීය පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව එයට සමාන දර්ශනයකින් දුටුවේ වෙන කවුද? (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17.)
- ස්වර්ගික පියාණන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන අපට කුමක් ඉගෙනගත හැකිද? (දේවශීර්ෂයේ සාමාජිකයන් ගැන ලමයින්ට ඉගෙනගැනීමට උපකාරවීම පිණිස සාරවත්කිරීමේ 4 සහ 5වෙනි ක්‍රියාකාරකම් ඔබට භාවිතාකිරීමට හැකිය.)
- ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජීවත්වන බව අපට දැනගැනීමට හැකිවන්නේ කෙසේද? ශුද්ධාත්මයාණන්ගේ මිත්‍රත්වයට සුදුස්සන් වීමට අප කළ යුත්තේ කුමක්ද? අප පණත්වලට කීකරුවන විට, ශුද්ධාත්මයාණන් මගින් ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සාක්ෂියක් ලබාගැනීමට අපට හැකිවේ.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් වශයෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. යොහාන් 17:20–21 කියවා, ස්වර්ගීය පියාණන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ අරමුණින් " එක් අයෙකු" බව සාකච්ඡාකරන්න. එක් අරමුණක් සඳහා කටයුතුකරන පියෙක්, මවක් සහ ලමයි ගැන ආදර්ශයකට ඔබට යොමුවිය හැකිය.

   අපගේ යාච්ඤාවල ඇති දේව ශීර්ෂයේ කාර්යභාරය ගැන ඔබට පැහැදිළිකළ හැකිය: අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ස්වර්ගික පියාණන්ට යාච්ඤාකරන්නෙමු, එවිට පිළිතුරු පැමිනෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුලින්ය.

2. ස්තේපන් වැනි නිර්භීත, ඇදහිලිමත් මිනිසුන් පවා, ඔවුන් තුලවූ ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන තිබූ සාක්ෂිය නිසා මරණයට පත්කළ බව පහදාදෙන්න. පහත සඳහන් ශුද්ධ ලියවිලි ආදර්ශ යොදාගන්න:

   ජෝසෆ් ස්මිත් ඔහුගේ දර්ශනය ගැන අන්‍යයන්ට කී විට, ඔහුට පීඩාකොට පසුව ජෝසෆ් සහ ඔහුගේ සහෝදරයා වන හයිරම්ව වේද සාක්ෂිකරුවන් මෙන් මරණයට පත්කරන ලදී.

   සභාවේ මුල් අවධියේදී බොහෝ ගෝලයන්ව සහ ප්‍රේරිතවරුන්ව පීඩාකොට, සමහරු වේද සාක්ෂිකරුවන් ලෙස මරන ලදී (ක්‍රියා 12:2), ප්‍රේතුස් මාක් සහ මතෙව්ද, වේද සාක්ෂිකරුවන් මෙන් මැරූ බවට ගතානුගතිකව පිළිගනු ලැබේ.

   මෙම භක්තිමත් පුද්ගලයන්ගේ ආදර්ශ මගින් ලමයින්ට ඉගෙනගැනීමට හැකි කුමක්දැයි ඔබට කීමට ඔවුන්ට සලස්වන්න.

3. ඇදහිල්ලේ පස්වෙනි කරුණ නැවත බලන්න. මුල් කාලයේදී ප්‍රේරිතවරුන්ට උපකාර පිණිස සෙත්පන්ව කැඳවූ ආකාරයටම, අද සභාවේ නායකයන් සභාවේ තනතුරුවලට ජනතාව කැඳවති. පුද්ගලයෙකුට කැඳවීමක් ලැබුන විට, ඔහු හෝ ඇය මත අත් තබා තිළයට වෙන්කොට විශේෂිත වගකීම් ඉටුකිරීමට අධිකාරීබලය දෙනු ලැබූ බව පහදාදෙන්න.තරුණ මිනිසුන් සහ තරුණ ස්ත්‍රීන් පූජකවර සභාපතිත්වයේ ගණපූර්ණයේ හෝ තරුණ කාන්තා පංතිවල සේවයකරන විට, ඔවුන්ව කැඳවා එම ආකාරයෙන්ම ඔවුන්ව තිළවලට වෙන්කරන බව පහදාදෙන්න.

4. දහම සහ ගිවිසුම 130:22–23. කියවා සාකච්ඡාකරන්න. ස්වර්ගික පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට මාංශයෙන් සහ ඇටවලින් යුත් මහිමාන්විත ශරීර තිබෙන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාරකරන්න. අපගේ භෞතික ශරීර ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස 'වහන්සේගේ ස්වරූපයෙන් තිබේ. මාංශයෙන් හෝ ඇටවලින් යුත් ශරීරයක් නොමැති, ශුද්ධාත්මයාණන්වහන්සේ ආත්මික පුද්ගලයෙකි.

5. පහත සඳහන් වචන තීරු පෙන්වන්න, නැතිනම් රටහුණු ලෑල්ලේ ලියන්න:

   දේවශීර්ෂය
   ස්වර්ගික පියාණන්වහන්සේ:
   යේසුස ක්‍රිස්තුස්වහන්සේ:
   ශුද්ධාත්මයාණන්වහන්සේ

   දේවශීර්ෂයේ සාමාජිකයන්ව විස්තරකරන පහත සඳහන් ප්‍රකාශන වෙන වෙනම කඩදාසි කැලිවල ලියන්න. "මාංශයෙන් සහ ඇටවලින් යුත් ශරීරයක් ඇත" යන්නට කඩදාසි දෙකක් ඔබට අවශ්‍ය බව සටහන් කරගන්න.

   ස්වර්ගික පියාණන්වහන්සේ:
   අපගේ ආත්මවල පියාණන්ය
   යේසුස් වහන්සේගේ මැරෙන සුළු ශරීරයේ පියාණන්ය
   මාංශ සහ ඇටවලින් යුත් මහිමාන්විත ශරීරයක් ඇත
   උන්වහන්සේට අපි යාච්ඤා කරන්නෙමු

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ:
   අපගේ ගැලවුම්කරු සහ මිදුම්කරුවාණන්ය
   ලෝකය මැවූසේක
   මැරෙන සුළු මවක් සිටියාය

   ශුද්ධාත්මයාණන්වහන්සේ:
   ආත්මික පුද්ගලයෙකි
   ස්වර්ගීය පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ ගැන සාක්ෂිදරනසේක
   සියල්ලෙහි සත්‍යය එළිදරව් කරනසේක (මොරෝනි 10:5)
   අපගේ නිරන්තර සහකාරයා විය හැකිය

   ඔබ සූදානම්කරන ලද එක් කඩදාසි කැල්ලක් තෝරාගෙන දේව ශීර්ෂයේ එක් එක් සාමාජිකයාගේ කාර්‍යභාරය නැවත බැලීමට ළමයින්ට සලස්වන්න. එක් එක් ළමයාට ප්‍රකාශය ශබ්දනගා කියවීමට සලස්වා එය යොමුවන්නේ කුමන දේව ශීර්ෂයටද කියා තීරණයකර, සුදුසු මාතෘකාව යට එම ප්‍රකාශය තබන්න.

6. "ජෝසෆ් ස්මිත්ගේ පළමු යාච්ඤාව" (*ගීතිකා,* අංක. 26).

---

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | දේවශීර්ෂය කෙරෙහි ඔබගේ දැනීම සහ සාක්ෂිය දරමින්, මෙම දැනීම ඔබ ලබාගැනීම කෙතරම් වැදගත්ද කියා ළමයින්ට කියන්න. ස්වර්ගීය පියාණන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේට ඇති ඔබගේ ප්‍රේමය ළමයින් සමග බෙදාගන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයක් වශයෙන්, ක්‍රියා 7:54–60, සහ දහම සහ ගිවිසුම 130:22–23 අධ්‍යයනය කිරීමට ළමයින්ට යෝජනාකරන්න<br><br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. |

# පේ්‍රතුැස් සහ කොරනේලියස්

40

වෙනි පාඩම

**අරමුණ**

ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගේ සියලුම ලමයින්ට පේ්‍රමකරන අතර, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය ඉගෙනගැනීමේ අවස්ථාව ඔවුන් සියලුදෙනාටම සලස්වාදීම උන්වහන්සේට අවශ්‍ය බව තේරුම්ගැනීමට එක් එක් ලමයෙකුට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 10:1–11:18 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනය කර, ශුද්ධවූ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න “ඔබගේ පාඩම් සූදානම්කිරීම ප. 00 vi, සහ “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම,” පි. 00 vii.)
2. ලමයින්ට සහභාගිවීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා සහ සාරවත් ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක්, එක් එක් ලමයෙකු සඳහා
   ආ. 7-41 පින්තූරය, (එබැවින් නුඹලා ගොස්, ශුභාරංචි චිත්‍ර මෙවලම 235; 62494).

**යෝජිත පාඩම**
**වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

පහත සඳහන් නම් රටහුණු ලෑල්ලේ ලියන්න: *කොරනේලියස්, දේවදූතයා, පේ්‍රතුැස්.*

මෙම පුද්ගලයන් තුන්දෙනාගේ පහත සඳහන් විස්තර එකින් එක ලමයි තුන්දෙනෙකුට කියවීමට සලස්වන්න. විස්තරකරන පුද්ගලයා කවුද කියා ඔවුන් දැනගත විට, ඔවුන්ගේ අත් එසවීමට ඉතිරි ලමයින්ට කියන්න.

මම පණිවුඩකරුවෙක්මි. දෙවියන්වහන්සේගේ පණිවුඩ ලබාදීමට අමතරව, මම උගන්වමින්, ආශිර්වාද කරමින්, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට අණකරන ඕනෑම දෙයක් කරමි. මා ගෙනා විශේෂ පණිවුඩයක් ගැන අද ඔබලා ඉගෙනගන්නේය. (මම දේවදූතයෙක් වෙමි)

යේසුස්වහන්සේව අනුගමනය කිරීමට උන්වහන්සේ මාව කැඳවන විට, මම ගලීලයේ මුහුදේ මසුන් අල්ලන්නෙක්ව සිටියෙමි. සියලුදෙනාටම ශුභාරංචිය ඉගෙනගැනීමට මාර්ගය විවෘතවූ මට ලැබුනු දර්ශනයක් ගැනඅද ඔබලා ඉගෙනගන්නවා ඇත. මම (පේ්‍රතුැස්) වෙමි.

මම රෝම හේවා කණ්ඩායම් පුද්ගලයන් 50 සිට 100කට අණදෙන මුලාදෑනියෙක්මි. සභාව තුලට පැමිණි (යුදෙව්වෙකු නොවන) පළවෙනි අන්‍ය ජාතිකයා මමය. අද පාඩමේදී මගේ බව්තීස්මය ගැන ඔබ ඉගෙනගන්නවා ඇත. මම (කොරනේලියස්) වෙමි.

ශුද්ධ ලියවිලි විස්තර

10:1–11:18 සඳහන් පේ්‍රතුැස් සහ කොරනේලියස්ගේ කථාව ලමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම,” ප. 00 vii.)

සාකච්ඡා සහ
අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ, ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- ස්වාමීන්වහන්සේගෙන් කොරනේලියස්ට දර්ශනය ලැබීමට සහ බව්තීස්මයක් ලැබීමට සුදුසුවූයේ කුමක් නිසාද? (ක්‍රියා 10:2.) සභාවේ භක්තිමත් ඇදහිලිවන්තයෙකු වීමට ඔබට හැකිවන්නේ කෙසේද?
- කොරනේලියස්ට දේවදූතයාගේ පණිවුඩය වූයේ කුමක්ද? (ක්‍රියා 10:3–6.)
- පේ්‍රතුැස් දර්ශනයකින් දුටුවේ කුමක්ද? (ක්‍රියා 10:28.) මෙම දර්ශනය ඔහුව වියවුල් කලේ කුමක් නිසාද? (අපවිත්‍ර යයි සලකන ලද යම් යම් මස් වර්ග ඉශ්‍රායෙල්වරුන්ට නොකෑ යුතු බවට ස්වාමීන්වහන්සේ අනකර තිබූසේක.

[බලන්න ලෙවී 11].) මෙම දර්ශනය පේතෘස් පළමුවෙන් පිළිගත්තේ කෙසේද? (ක්‍රියා 10:14.) ඔහුගේ සිත වෙනස් කලේ කුමක්ද? (ක්‍රියා 10:15.)

- කොරනේලියස්ට පේතෘස් ශුභාරංචිය ඉගැන්වීම ස්වභාවික දෙයක් නොවූයේ කුමක් නිසාද? (ක්‍රියා 10:28.) මේ වන තෙක් ප්‍රේරිතවරුන් ශුභාරංචිය ඉගැන්වූයේ යුදෙව් ජනතාවටය. යුදෙව් ජනතාවට පමණක් ශුභාරංචිය ඉගැන්විය යුතු යයි සභාවේ බොහෝ ජනතාව සිතූහ. කොරනේලියස් යුදෙව්වෙකු නොවීය. අවසානයේදී ඔහුගේ දර්ශනයෙහි අර්ථය පේතෘස් අවබෝධකර ගත්තේය. (ක්‍රියා 10:34–35.) ශුභාරංචිය අද ඉගැන්විය යුත්තේ කාටද? (සියලුදෙනාටම.
- පේතෘස්ට සවන්දීමට කොරනේලියස් සහ ඔහුගේ සියලුම මිතුරන් සහ ඥාතීන් එක් රැස් කලේ ඔබ සිතන ආකාරයට කුමක් නිසාද? (ක්‍රියා 10:24–27.) ඔබේ පවුල සහ මිතුරන් සමග බෙදාගැනීමට ඔබට අවශ්‍ය ශුභාරංචි මූලධර්ම සමහරක් මොනවාද?
- ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරක් සෙවීම පිණිස කොරනේලියස් කලේ කුමක්ද? (ක්‍රියා 10:30.) නිරන්තර යාච්ඤාවෙන් ඔබ හෝ ඔබගේ පවුල ලැබූ අත්දැකීම් මොනවාද? ප්‍රශ්නයකට පිළතුෙරක් සෙවීමට උපකාරවීම පිණිස ස්වාමීන්වහන්සේ ඔබට උපකාර කලේ කෙසේද?
- පේතෘස් සත්‍යය කථාකල බව ජනතාව දැනගත්තේ කෙසේද? (ක්‍රියා 10:44–45.) ශුද්ධාත්මයාණන්වහනසේ අප වෙතට සත්‍ය සාක්ෂිදැරීම පිණිස අප කළ යුතුවන්නේ කුමක්ද? (මොරෝනි 10:4–5.)
- පේතෘස් අන්‍ය ජාතීන්ට උගන්වනු ඇසූ විට අනෙක් ගෝලයන් සහ ප්‍රේරිතවරුන් සිතුවේ කුමක්ද? (ක්‍රියා 11:2–3.) මෙම ක්‍රියාව පේතෘස් විස්තර කලේ කෙසේද? (ක්‍රියා 11:4, 17.) පේතෘස්ගේ දර්ශනය ගෝලයන් සහ ප්‍රේරිතවරුන් පිළිගත්තේ කෙසේද? (ක්‍රියා 11:18.) උන්වහන්සේගේ දරුවන්ට ස්වර්ගික පියාණන්ගේ ප්‍රේමය ගැන මෙය ඔබට උගන්වන්නේ කුමක්ද? (5 වෙනි සාරවත් කිරීමේ ක්‍රියාකාරකම බලන්න.)
- ස්වර්ගීය පියාණන්ගේ සමහර ළමයින්ට ශුභාරංචිය ඉගැන්වීමට ඔබට හැකිවන්නේ කෙසේද? දැනට ධර්මදූතයන් වෙමින් පූර්ණකාලීන දූතමෙහෙයක සේවයකිරීමට සූදානම්වීමේ ක්‍රම ගැන සිතීමට ළමයින්ට උපකාරවන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. ක්‍රියා 10:36–43, කුඩා කණ්ඩායම් වශයෙන් ළමයින්ට කියවීමට සලස්වා, කොරනේලියස්ට, ඔහුගේ පවුලට සහ මිතුරන්ට පේතෘස් ඉගැන්වූ දේවල් ගැන ලැයිස්තුවක් සෑදීමට කියන්න. එක් එක් කණ්ඩායමක් එම ලැයිස්තුව කියවන විට, එම කරුණු රටහුණු ලෑල්ලේ හෝ විශාල කඩදාසික ලියන්න. ළමයින්ට අතපසුවූ යම් කරුණු ඇත්නම් ඒවා පුරවන්න.

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියලුදෙනාගේම ස්වාමීන්වහන්සේය (36 වෙනි පදය).

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේව බව්තීස්මකරන ලදී. (37 වෙනි පදය).

   ශුද්ධාත්මයෙන් සහ බලයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ආලේපකරන ලදී (38 වෙනි පදය).

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත්කම් කළසේක 938 වෙනි පදය).

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රෝග සුවකලසේක (38වෙනි පදය).

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මරණයට පත්කරන ලදී (39 වෙනි පදය).

   තුන් වෙනි දවසේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මලවුන්ගෙන් නැගිටිසේක (40 වෙනි පදය).

   දෙවියන්වහන්සේ විසින් නියමකරන ලද බවට සාක්ෂි දැරීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පේතෘස්ට අණ කළසේක (42 වෙනි පදය).

   සියලුම අනාගතවක්තෘවරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂි දැරූහ (43 වෙනි පදය.)

   උන්වහන්සේ කෙරෙහි අදහාගෙන බව්තීස්මවන අයට ඔවුන්ගේ පාපවලට කමාව ලැබෙන්නේය (43 වෙනි පදය.)

2. ඔබගේ ප්‍රාථමික සභාපතිනියගේ අවසරය ඇතිව, ස්වර්ගීය පියාණන්වහන්සේගේ සියලුම දරුවන්ට ඉගැන්වීමේ වැදගත්කම පහදාදෙන අත්දැකීම් බෙදාගැනීම පිණිස ආපසු පැමිණි ධර්මදූතයෙකුට පංතියට ආරාධනාකරන්න.

3. වැඩිහිටි හොවඩ් ඩබ්ලිව්. හන්ටර්ගේ උපුටාගැනීමකින් තෝරාගත් පහත සඳහන් ප්‍රකාශනය කියවන්න:

ස්වර්ග රාජ්‍යයෙහි වැඩසිටින අපගේ පියාණන්ට කුඩා ලමයි වටින්නේය. ඔවුන් කොතැනක ජීවත්වුවත්, කුමන ආකාරයකින් ඇන්දත්, කුමන ආකාරයකින් පෙනුනත්, උන්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරන අතර, එක සමාන මුදු මොලොක් රැකවරණය ලබාදෙයි. කළු අයට, රැළිවූ හිසකෙස් ඇති ෆීජිවරුන්ට සහ කරුණාවන්ත තද පාට ඇඳුම් අඳින සැමොවාවේ ලමයින්ට උන්වහන්සේ ප්‍රේමකරනසේක. ජපන් රටේ ලමයින්ට උන්වහන්සේ ප්‍රේම කරනසේක. පාසලේදී එක සමාන ඇඳුම් අඳින ඉංග්‍රීසි කුඩා පිරිමි ලමයින්ට සහ ගැහැණු ලමයින්ට උන්වහන්සේ ප්‍රේම කරනසේක. හිරු එළියෙන් පාටවුන දකුණු අමෙරිකාවේ සහ ලැමනයිට් ලමයින්ට උන්වහන්සේ ප්‍රේමකරති. සැමතැනකම සිටින උන්වහන්සේගේ ලමයින්ට අපගේ පියාණන්වහන්සේ ප්‍රේම කරනසේක. නින්දට යාමට කාලය පැමිණි විට, සියලු දේශවල ආදරවන්ත දෙමාපියෝ ඔවුන්ගේ ලමයින් සමග යාච්ඤාකිරීමට දණගසති. ඇල්ප්ස්හි උස්වූ, පුළුන් වැනි කුරුළු පිහාටුවලින් තැනූ ඇඳක් හෝ පැලක පාළොවේ කුඩා පැදුරක විය හැකිය. නමුත් ස්වර්ගික පියාණන්ට ඒ සියල්ල ඇසෙන අතර තේරුම්ගන්නාසේකමය. (බලන්න මිතුරා ඔක්. 1971, ප. 10.)

4. නොයෙක් නොයෙක් රටවල්වල, වෙනස් වෙනස් ගතානුගතික පුරුදු ජනතාව අතර තිබුනත්, අප එක සමාන වන්නේ ස්වර්ගික පියාණන්වහන්සේ අප සියලුදෙනාටම ප්‍රේමකරමින්, අප සියලුදෙනාම උන්වහන්සේ වෙත පැමිණීම උන්වහන්සේට අවශ්‍යවීම නිසා බව, ලමයින්ට තේරුම්ගැනීමට උපකාරවන්න.

වෙනත් රටවල කරන හෝ දකින දේවල් ගැන ලමයින්ට හුරුකිරීම පිණිස, පහත සඳහන් හෝ එයට සමාන දේවල් සමග සමාන වන ක්‍රීඩා සෙල්ලම් කරන්න.

ඔබ ධර්මදූත සේවයේ යෙදෙනවා නම්, ඔබ සේවය කිරීමට කැමතිම ස්ථානය සමාන කරන්න.

මිනිසුන් අඳිනවා දැකීම

| | |
|---|---|
| ලේස් | ස්කොට්ලන්තය |
| ලී සපත්තු | හවායි |
| කිල්ට්ස් | ජපානය |
| කිමෝනාව | ඕලන්දය |

මෙක්ෂිකෝව

| | |
|---|---|
| කෑම එන්චිලාදා | එක්සත් ජනපදය |
| සච්බ්‍රටන් | නෝර්වේ |
| ඇපල් පුඩිම | ප්‍රංශය |
| ක්‍රීපිස් | ජර්මනිය |
| හෙරින් අච්චාරු | මෙක්සිකෝව |

පෙනුම

| | |
|---|---|
| කඳුකරය | ඉතාලිය |
| බිග්බෙන් | ඕස්ට්‍රේලියාව |
| පීසාහි එල්ලෙන කුළුන | කැනඩාව |
| කැන්ගරු | එංගලන්තය |

5. පේත්‍රුස්ගේ දර්ශනයට සමාන දෙයක් 1978 දී සිදුවූ බව පහදාදෙන්න. එනම් සියලුම සුදුසු පිරිමින්ට සහ පිරිමි ලමයින්ට පූජකවරය ලැබී, ඔවුන්ගේ පවුල්වලට දේවමාළිගා ආශිර්වාද ලැබීමේ එළිදරව්වක් සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ට ලැබීමය. (බලන්න නිළ ප්‍රකාශනය—දහම සහ ගිවිසුම 2)

---

**අවසානය**

| | |
|---|---|
| සාක්ෂිය | දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සියලුම දරුවන්ට ප්‍රේමකරන අතර, අපට ශුභාරංචිය ඉගැන්වීම, බව්තීස්මවීම සහ අපගේ ගිවිසුම් තැබීමෙන් උන්වහන්සේ සමග අපට නැවත ජීවත්වීමට හැකි බවට ඔබගේ සාක්ෂිය දරන්න. ශුභාරංචිය ගැන ඔබගේ දැනීම සහ ඔබගේ බව්තීස්මය ගැන ඔබගේ කෘතඥතාවය ප්‍රකාශකරන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ක්‍රියා 10:36–43 සහ 11:15–18 අධ්‍යයනය කිරීමට ලමයින්ට යෝජනා කරන්න.<br><br>අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න. |

41


වෙනි පාඩම

# අපගේ දිව පාලනයකිරීමට යාකොබ් අපට උගන්වයි

**අරමුණ** ඔවුන් කියන සහ සිතන දේවල් පාලනයකිරීම පිණිස ලමයින්ට ඉගෙනගැනීමට උපකාර කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 5:33–37, යාකොබ් 1:26, 3:2–13, 5:12, 1 පේතෘස් 3:10, නික්මයාම 20:7, සහ මොසායා 4:30 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න “ඔබගේ පාඩම සූදානම්කිරීම” පි. 00 vi සහ “ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම” පි. 00 vii.)
2. ලමයින්ව සහභාගිකරවීමට හැකි සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. කඩදාසි කැලි කිහිපයක් ත්‍රිකෝනාකාරයට කපන්න. පහත සඳහන් එක් එක් වචනයක් හෝ වාක්‍ය කණ්ඩයක් ත්‍රිකෝනය මත පහතට සිටින සේ ලියන්න: *ඔිපාදූප, බොරු සාක්ෂි, බොරු දබරකිරීම්, දිවීරීම, ස්වාමීන්වහන්-සේගේ නාමය නිකරුනේ ගැනීම, කෝපයෙන් යුත් වචන.* පහත සඳහන් එක් එක් වචනයක් හෝ වාක්‍ය කාණ්ඩයක් ත්‍රිකෝනය මත ඉහළට සිටින සේ ලියන්න: *කාරුණික වචන, අගයකිරීම්, සදාචාර සම්පන්න වචන, සත්‍යය, යාච්ඤාව, සමාදානකිරීම.*




4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අළුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. ටේප් (හෝ ඒ හා සමාන යමක්) ත්‍රිකෝන භූණු ලැල්ලට සම්බන්ධකිරීම සඳහා.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනා කරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුකිරීම

ඔබගේ පංතියේ ලමයින් කුඩා කණ්ඩායම්වලට බෙදා, අශ්වයෙක්, බයිසිකලයක්, ඇවිදීමට ගෙන යන බල්ලෙක්, රථයක් බෝට්ටුවක් වැනි හෝ එවැනි වෙනත් දේවල් පාලනය කරන ආකාරය රඟදැක්වීමට එක් එක් කණ්ඩායමට සලස්වන්න. කණ්ඩායම කරන දෙය අනුමාන වශයෙන් කීමට අනික් ලමයින්ට සලස්වන්න.

- මේවා යමෙකුට පාලනයකර ගැනීමට නොහැකි වුවහොත් කුමක් විය හැකිද?

ඔවුන් සමග නිතර තිබෙන යමක් පාලනයකර ගැනීමට ලමයි මෙම පාඩමෙන් ඉගෙනගන්නා බව පහදාදෙන්න. එය ඔවුන්ගේ ශරීරයේ කොටසකි. නමුත් ඒවා ඔවුන්ගේ අත් හෝ කකුල් නොවේ.

- ඔබ සිතන ආකාරයට එය කුමක් වෙයිද?

යාකොබ් 3:3–5 ශරීරයේ මෙම කොටස ගැන සවන්දීමට ලමයින්ට කියන්න.

- අපගේ දිව ගැන මෙම ශුද්ධ ලියවිල්ල අපට කුමක් කියනවාද?

ශුද්ධ ලියවිලි විස්තරය

මතෙව් 5:33–37, යාකොබ් 1:26, 3:2–13, සහ 1 පේතෘස් 3:10 සඳහන් විස්තරය ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.) රළුවචන බස් කීම යනු, යමෙක් රළුවචන හෝ දැලේ දා ගැනීමට උත්සාහකිරීම බව පහදාදෙන්න. දිව ශරීරයේ කුඩා කොටසක් වූවත්, එය පාලනය කිරීමට ඔවුන් මහත්සීවී කටයුතු කල යුතු බව ළමයින්ට තේරුම් ගැනීමට උපකාර කරන්න.

සාකච්ඡාව සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- අපගේ දිව යටත්කර ගැනීම යන්නෙහි තේරුම කුමක්ද? (යාකොබ් 1:26.) අපට අපගේ දිව යටත්කර ගැනීමට හැකි නම්, අපට අපගේ මුළු ශරීරයම යටත්කර ගැනීමට හැකිවන්නේ කෙසේද? (යාකොබ් 3:2.)
- ස්වභාවික උල්පත මිහිරි දියත් තික්ත දියත්, කරදියත් මිරිදියත් නිකුත්රීමට නොහැකි මන්ද? (යාකොබ් 3:11–12.) අත්තික්කා ගහේ ඔලීව ඵලවත්, මිද්‍රික වැලේ අත්තික්කා ඵලවත් හටගැනීමට නොහැකි යයි යාකොබ් කී විට, ඔහු අදහස් කළේ කුමක්ද? (යාකොබ් 3:12.) මෙම නිදර්ශන වලින් අපට ඉගැන්වීමට ඔහු උත්සාහ දරන්නේ කුමක්ද? (යාකොබ් 3:10.)
- අප අකරුණාවන්ත දේවල් කීමට හෝ සැර පරුෂ අන්දමට කථාකිරීමට පටන්ගත් විට, අපට කුමක් වන්නේද? අප කියන යහපත් දේවලට මෙය බලපාන්නේ ඔබ සිතන ආකාරයට කෙසේද?
- අප කුමක් සහ කෙසේ කථාකළ යුතුද යන්න ගැන යේසුස්වහන්සේ අපට දී තිබෙන පනත් මොනවාද? (මතෙව් 5:33–37.) මෙම පණත් අප පැබීම වැදගත් යයි ඔබ සිතන්නේ කුමක් නිසාද?

සාමාන්තර ඉරක් හුණුලැල්ලේ අඳින්න. මුහුණත පහතට සිටින සේ ත්‍රිකෝණ මේසය මත තබා එක් එක් ළමයෙකුට එක බැගින් තෝරාගැනීමට සලස්වා එය කියවා, කතිරය උඩ අතට ඇත්නම්, ඉරේ මුදුනට අලවා, කතිරය පහතට ඇත්නම්, ඉරේ පහළට අලවන්න. ("සූදානම්වීම" බලන්න කොටසෙහි නිදර්ශනය බලන්න.)

- ළමයා ඉර මත ත්‍රිකෝණය තබන විට, එක් එක් වචනය සාකච්ඡා කරන්න. ඉරට උඩින් තිබෙන දේවල් කීම ශුභවාදී බවද, ඉරට යටින් තිබෙන දේවල් අශුභවාදී වන්නේ කුමක් නිසාද යන්න සාකච්ඡා කරන්න. යමෙකුට හෝ යමෙකු ගැන කරුණාවන්ත යමක් ඔබ කී විට, ඔබට හැඟෙන්නේ කෙසේද? ශුභාසිංසනයක් ඔබ යමෙකුට දුන් විට ඔබට හැඟෙන්නේ කෙසේද? අන්‍යයන් ගැන යහපත් දේවල් අප කියන විට, අප ගැනම යහපත් හැඟීම් අපට ඇතිවන්නේ කුමක් නිසාද?
- ස්වාමීන්වහන්සේ ගැන අප කථාකළ යුතු අන්දම ගැන දස පණත අපට කියන්නේ කුමක්ද? (නික්මයාම 20:7.) ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ ගැන පමණක් ගෞරවනීය අන්දමට අප කථාකිරීමේ වැදගත්කම කුමක්ද? වඩාත් වැඩියෙන් ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ මෙන් වීමට මෙම පණත පැබීම අපට උපකාරවන්නේ කෙසේද? (8වෙනි පාඩමේ සභාපති ස්පෙනසර් ඩබ්ලිව්. කිම්බල්ගේ කථාව ඔබට නැවත කීමට හැකිය.)
- අපගේ දිව සහ අපගේ ක්‍රියා පාලනයකර ගැනීමට අපට හැකිවන්නේ කෙසේද? අප කියන සහ කරන දේවල් තීරණයකරන්නේ අපගේ සිතිවිලි සහ හැඟීම් බව ළමයින්ට තේරුම් ගැනීමට උපකාරවන්න. අපගේ සිතිවිලි පාලනයකර ගැනීමෙන් අප කියන දේවල් පාලනයකර ගැනීමට අපට හැකිවේ. අපගේ සිතිවිලි පාලනයකර ගැනීමට අපට හැකිවන්නේ කෙසේද? පහත සඳහන් යෝජනා සාකච්ඡා කරන්න:

  ඔබගෙන්ම අසන්න, "මෙම අවස්ථාවේදී යේසුස්වහන්සේට අවශ්‍ය මා කුමක් කිරීමද?"
  ප්‍රියතම ශුද්ධ ලියවිල්ලක් ගැන සිතන්න.
  ප්‍රාථමික ගීතයක් හෝ ගීතිකාවක් ශබ්දනගා හෝ ඔබගේ සිතින් ගායනාකරන්න, නැතහොත් මුමුනන්න.
  පිහිට පතා යාච්ඤාකරන්න.
  ඔබ දෙවියන්වහන්සේගේ ළමයෙකු බව සිහිතබාගන්න.
  ඔබගේ දෙමාපියන්ට අවශ්‍ය ඔබ කළ යුතු කුමක්ද කියා සිතන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. ජෝසෆ් ස්මිත් ගැන පහත සඳහන් කථාව කියන්න (හොඳින් කියවීමට හැකි යමෙකුට කථාව කැසට් පටයක වාර්තාකිරීමට කීමට ඔබට හැකිය):

   ජෝසෆ් ස්මිත් වරදක් කළ බව ඔවුන්ට කිසිම විටක ඔප්පුකිරීමට නොහැකි වුවත්, ඔහුට අකමැති මිනිසුන් විසින් ඔහුව සිරගෙට දමනු ලැබීය. එක් රාත්‍රියක ඔහු සහ තවත් මිනිසුන් කිහිපදෙනෙක් ශීතල පීඩාකාරී සිරගෙයක් තුල ඔවුන්ගේ මැණික් කටු වටා දම්වැලෙන් බැඳ රළු පොළොවේ නිදාගැනීමට සැලැස්සුවෝය. ඔවුන් නිදාගැනීමට උත්සාහ දැරූ නමුත්, රැකවලුන්ගේ කථාවේ ශබ්දය නිසා නොහැකිවිය. සභාවේ සාමාජිකයන්ට ඔවුන් කළ භයානක දේවල් ගැන දිව්රමින් ඔවුහු එකිනෙකාට කීහ.

   මෙම භයානක කථාවට සවන්දුන්නාට පසු, එකවරටම ජෝසෆ් ස්මිත් නැගී සිට මිනිසුන්ට මෙසේ කීවේය, නිශ්ශබ්දවන්න. . . .යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් මම තුඹලාට දොස් පවරන අතර, නිශ්ශබ්දවීමට අණකරමි; එවැනි භාෂාවක් ඇසීමට මම තව මොහොතකවත් ජීවත් නොවෙමි. රැකවල්ලු ඔවුන්ගේ ආයුධ බිම තබා ඔහුගෙන් කමාව ඇයදූහ. රාත්‍රී ඉතිරි කාලයේදී ඔවුහු නිශ්ශබ්දව සිටියහ. (බලන්න Parley P. Pratt, *Autobiography of Parley P. Pratt*, පිටු. 209–11.)

   - ඔබ ලඟ සිටින යමෙකු දිව්රමින් හෝ අසභ්‍ය කතාවක් කියනවා නම්, ඔබට කළ හැකි වන්නේ කුමක්ද?

2. දිග නූලකට මුද්දක් හෝ කුඩා බටයක් තබා නූලේ අග ගැටගසන්න. නූල අල්ලාගෙන පංතියේ සමාජිකයන්ට රවුමකට සිටීමට සලස්වන්න. රවුමේ මැද සිටීමට එක් ලමයෙකු තෝරාගන්න. මුද්ද හෝ බටය අතින් අතට යැවීමට අනෙක් ලමුන්ට සලස්වන්න. "නවත්වන්න" යයි ඔබ කියන විට, මැද ඉන්න ලමයා ගැන යම්කිසි හොඳ දෙයක් කීමට මුද්ද ඇති ලමයාට සලස්වන්න. ලස්සන දෙයක් කී ලමයා සමග මැද සිටින ලමයාට ස්ථාන මාරුකර ගැනීමට සලස්වා, ක්‍රීඩාව දිගටම කරගෙන යන්න. මැද සිටීමට සෑම ලමයාටම අවස්ථාවක් ලැබෙන තෙක් එය කරගෙන යන්න. සෑම ලමයෙක් ගැනම ශුභවාදී ප්‍රකාශයක් එකතුකිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. අප යහපත් දේවල් කී විට හැඟෙන අන්දමද, අප ගැන යහපත් දෙයක් කී විට, අපට හැඟෙන අන්දම ගැනද කථාකරන්න. (මෙම ක්‍රියාකාරකමට ඔබගේ පංතිය කුඩා වැඩි නම් එක් එක් ලමයා අනෙක් ලමයා ගැන යහපත් දෙයක් කීමට සලස්වන්න.)

3. ගොවිපලක විසූ තරුණ පිරිමි ලමයෙක් ගැන සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් කියන ලද පහත සඳහන් කථාවේ එක් නරක සිතිවිල්ලක් කුඩා යකඩ කූඤ්ඤයකට සමාන කරන්න:

   එක් දිනක් තරුණ පිරිමි ලමයෙකු වශයෙන් ගොවිපලේ සිට පැමිණෙන විට යකඩ කූඤ්ඤයක් ඔහුට හමුවිය. (කූඤ්ඤයක් පෙනෙන ආකාරය ගැන පහදා දෙන්න.) රෑ කෑමට ඔහු ප්‍රමාද නිසා දැවමඩුවේ තැබිය යුතු එම කූඤ්ඤය එහි තබනවා වෙනුවට ගෙනගොස් ඉදිරිපස ගේට්ටුව ලඟ ඔහුගේ පියා වවන ලද කුඩා වොල්නට් පැළයක අතු දෙකක් අතර ඔහු එය තැබුවේය. කූඤ්ඤය පසුව ගසෙන් රැගෙන මඩුවෙ- තැබීමට ඔහු අදහස් කළ නමුත්, එය ඔහු කිසි දිනෙක නොකළේය. කූඤ්ඤය එහි අවුරුදු ගණනක් තිබුන අතර, එය ඉතා විශාල ගසක් වන තුරු, එය වටා ගස වැඩුනේය.

   අවුරුදු ගණනකට පසු ශීත ඍතුවේ රැයක ශීතල තද වැස්සකදී විශාල ගසේ ප්‍රධාන අතු තුනෙන් එකක් කඩා වැටුනේය. ගසේ ඉතිරි කොටසේ සමබරතාවය නැතිවූ බැවින්, එයද කඩා වැටුනේය. කුණාටුව අවසන්වන විට, ගසේ එක අත්තක්වත් ඉතිරිවූනේ නැත.

   පසුදා උදෑසන ගොවියා—වියපත් පිරිමි ලමයා—එළියට ගිය විට, විනාශවූ වොල්නට් ගස දුටුවේය. "ඩොලර් දාහකට එය සිදුවුනා නම් මට කමක් නැත යයි ඔහු සිතුවේය. මිටියාවතෙහි තිබූ ලක්ෂනම ගස එය විය."

   එහි තවමත් තිබූ කූඤ්ඤය ගැන ගොවියාට අමතකවී තිබුනි. ගස උසට වැඩුනත් කූඤ්ඤය එය දුර්වල කළේය. සාමාන්‍යයෙන් කුණාටුවට ඔරොත්තුදීමේ හැකියාව ගසට තිබුනත්, අවුරුදු ගණනකට පෙර එහි තබන ලද කූඤ්ඤය නිසා තිබිය යුතු අන්දමේ ශක්තියක් ගසට නොතිබුනේය. ගස වැටී කැඩී යාමට කූඤ්ඤය හේතුවිය. (බලන්න Samuel T. Whitman, "Forgotten Wedges," උපුටාගැනීම Spencer W. Kimball, Conference Report තුලිනි, අප්‍රේ. 1966, පිටු. 70–71.)

- අයහපත් සිතිවිලි කුඤ්ඤයක් මෙන් වන්නේ කෙසේද? අප තුල අයහපත් සිතිවිලි තිබෙන විට, අපගේ මනසෙහි ගැඹුරටම ක්‍රියාකිරීමට ගසෙහි කුඤ්ඤය මෙන් එයට හැකිවන අතර, එය අපට මහත් ප්‍රශ්නයක් විය හැකිය. අයහපත් සිතිවිලි අප වහාම ඉවත්කළ යුතුය.

4. හිතෝපදේශ 23:7 සාකච්ඡාකරන්න. ඔවුන්ට වේදනාව හෝ තරහ ඇතිවූ විට දහයට ගනන්කිරීම යනාදිය වශයෙන් ඔවුන්ට කෝපය පාලනයකර ගැනීමට හැකි ක්‍රම සාකච්ඡාවට ඇතුල්කරන්න.

---

## අවසානය

**සාක්ෂිය**

ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට අප කළ යුතු එක් දෙයක් නම්, අපගේ දිව පාලනයකිරීමට ඉගෙනගැනීම බව සාක්ෂිදරන්න. ඔබට හෝ ඔබ දන්නා යමෙකුට අයහපත් දෙයට වඩා යහපත් දේ කීම ස්වාමීන්වහන්සේට ලඟාවීමට උපකාරවූ ගැන අත්දැකීමක් බෙදාගන්න. ලබන සතියේදී ඔවුන් කියන දේවල් පාලනයකර ගැනීමට උත්සාහ දැරීමට ළමුන්ට දිරිගන්වන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් යාකොබ් 3:3–10 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# 42
වෙනි පාඩම

# සාවුල්ගේ හැරී ඒම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට සම්පූර්ණයෙන්ම හැරී ඒමට එක් එක් ලමයා දිරිමත්කිරීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 7:57–60, 8:1–3, 9:1–30, 26:9–23, සහ මොසායා 5:2 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ලමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන-දම ගැන තීරණයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: ක්‍රියා 22:3–21.
3. ලමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ලමයා සඳහා.
   ආ. වතුර පිරවූ වීදුරුවක්.
   ඇ. 7-42 පින්තූරය, පාවුළු දමස්කයට යන මාර්ගයෙහි.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.

හිත යොමුකිරීමේ ප්‍රශ්න

වතුර වීදුරුව ලමයින්ට පෙන්වන්න.

- වතුර උණුවෙන වට කුමක් සිදුවන්නේද? (එය වාෂ්පවලට වෙනස්වේ.)
- වතුර ශීතලවන විට කුමක් සිදුවන්නේද? (එය අයිස්වලට වෙනස්වේ.)

වතුර අයිස්වලට හෝ වාෂ්පවලට වෙනස්වන විට අප එයට කියන්නේ "හැරීම" කියා බව පහදා දෙන්න. එය මුල්ම වතුරවලින් වෙනස්ය.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වෙතට ජනතාව හැරී එන්නේ කෙසේද? ඔවුන් හැරී ආ විට, ඔවුන්ගේ ජීවිත වෙනස්වන්නේ කෙසේද?

*හැරීඒම* යන වචනය හුණුලැල්ලේ ලියන්න. මෙම පාඩම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වෙතට එක් එක් මිනිසෙක්ගේ හැරී ඒම ගැන බව පහදා දෙන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

ක්‍රියා 9:1–20 සඳහන් පරිදි යේසුස් ක්‍රිතුස්වහන්සේගේ සභාව වෙතට සාවුල්ගේ හැරීමේ විස්තරය ලමයින්ට උගන්-වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා, බලන්න "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) මෙම සාවුල් ඉශ්‍රායෙල්හි පළමු රජතුමා නොවන අතර, ශ්‍රේෂ්ඨ ධරමදූත පාවුල් නම් වූයේ මෙම මිනිසා බව ලමුන්ට තේරුම්ගැනීමට උපකාරකරන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනයකරන්න. ලමුන්ට ශුද්ධ ලයෙවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ලමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- සභාවේ සාමාජිකයන්ට සාවුල් හිංසා පීඩා කළේ කෙසේද? (ක්‍රියා 7:57–60; 8:1–3; 9:1–2.) ඔහු ගැන සභාවේ සාමාජිකයන්ට හැඟෙන්ට ඇත්තේ කෙසේද? ඔබගේ විශ්වාසයන් මත යමෙකු ඔබට හිංසා පීඩා කරන්නේ නම්, ඔබට හැඟෙන්නේ කෙසේද? මෙය අපට යමෙකු කරන විට, අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? ඔවුන්ගේ

විශ්වාසයන් කෙරෙහි යමෙකු සිනහවට ලක්කිරීම හෝ අකරුණාවන්තවූ අත්දැකීම් ඔවුන්ට ඇත්නම් ඒවා බෙදාගැනීමට ලමුන්ව දිරිගන්වන්න.

- ඔහුගේ පාපවලට පසුතැවිලිවීම අවශ්‍ය බව සාවුල්ට අවබෝධකර ගැනීමට උපකාරවන පිණිස දමස්කයට යන අතරමගදී කුමක් සිදුවූයේද? (ක්‍රියා 9:3–6.) ඔහුගේ දර්ශනයේදී සාවුල් කථා කළේ කා සමගද? (ක්‍රියා 9:5.) පසුතැවීම අපට අවශවන විට එය දැනගැනීමට ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට උපකාරවන්නේ කෙසේද? (ශුද්ධාත්මයාණන්ගේ හැඟීම්ද, දෙමාපියන්ගෙන්, අනාගතවක්තෘවරුන්ගෙන් සහ ශුද්ධ ලියවිලින් මගපෙන්වීම මගින්ය.)

- කටුවලට පයින්ගැසීම" යන්නෙහි අර්ථය කුමක්ද? (ක්‍රියා 9:5.) සතුන් දක්කාගෙන යාමට මිනිසුන් භාවිතාකරන තියුණු කටුවකි. සතුන්ට අණින විට බොහෝ අවස්ථාවලදී උන් එයට පයින් ගසන අතර කටුව ඔවුන්ට වඩාත් වේදනාව ගෙනදෙයි. මෙම ක්‍රියා වෙනත් කිසිවෙකුටත් වඩා ඔහුටම වේදනා දෙන බව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සාවුල්ට කියනසේක. සත්‍යයට විරුද්ධව අප කථාකරන විට, වැඩියෙන්ම පීඩා විඳින්නේ අපය.) සත්‍යයට විරුද්ධව සටන් කිරීමේදී යමෙකුට වේදනා ඇතිවන්නේ කෙසේද? හැකි නම් ඔබගේම අත්දැකීමකින් සුදුසු නිදර්ශනයක් දෙන්න.

- පසුතැවිලිවී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරීම පිණිස සාවුල් කළේ කුමක්ද? අපගේ පව්වලට පසුතැවිලි වීමට අප කළ යුත්තේ කුමක්ද? පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න (ඒවා හුණු ලෑල්ලේ ලැයිස්තුගත කිරීමට ඔබට හැකිය.)

  ඔහ ඔහුගේ පාප හඳුනාගත්තේය. (ක්‍රියා 9:6.)
  පාපය උදෙසා ඔහු නිරාහාරව සිටිමින් යාච්ඤා කළේය. (ක්‍රියා 9:9, 11.)
  ඔහු බව්තීස්ම වූවේය. (ක්‍රියා 9:18.)
  ඔහු කළ වැරදි නිවැරදිකර ගැනීමට ඔහු උත්සාහ කළේය. (ක්‍රියා 9:20.)
  ඔහු වෙනස්වී නැවත කිසි දිනෙක ජනතාවට හිංසා නොකළේය.

  සාවුල් හදවත තුලින් දුෂ්ටයෙකු නොවූ බව පහදා දෙන්න. ඔහුව රවටන ලදී. පසුතැවිලිවී බව්තීස්මවීමට ඔහුට අවශ්‍යවිය.

- අප වැරදි යමක් කළ විට, පසුතැවිලිවීමේ වැදගත්කම කුමක්ද? පසුතැවිලි වීමෙන් අපට හැඟෙන්නේ කෙසෙ-ද?

- අනානියස්ට ස්වාමීන්වහන්සේ කුමක් කී සේක්ද? (ක්‍රියා 9:10–12.) (මෙම අනානියස් වංචාව නිසා මරණයට පත්වූ අනානියස් නොවන බව පහදා දෙන්න. ස්වාමීන්වහන්සේ කී දෙය කිරීමට අනානියස් භයවූයේ කුමක් නිසාද? (ක්‍රියා 9:13–14.)

- "තෝරාගන්නා ලද භාණ්ඩයක් " යයි සාවුල්ට ස්වාමීන්වහන්සේ කීවේ කුමක් නිසාද? (ක්‍රියා 9:15–16.) ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍යවූ සාවුල් කළ යුතු වැදගත් දේවල් මොනවාද? (ක්‍රියා 26:16, 18.) ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍ය අප කළ යුතු වැදගත් දේවල් විය හැක්කේ මොනවාද? මෙම දේවල් ඉගෙනගැනීමට ඔබට හැකිවන්නේ කෙසේද?

- සාවුල්ට ඔහුගේ ඇස් පෙනීම අහිමිවූයේ කෙසේද? (ක්‍රියා 9:8; 22:11.) අනානියස් සාවුල්ට ආශිර්වාද කළ විට, කුමක් වූයේද? (ක්‍රියා 9:17–18.)

- සාවුල්ගේ හැරීමෙන් පසු ජනතාවද, ගෝලයන්ද ඔහු දේශනාකළ දේවල් විශ්වාස නොකළේ කුමක් නිසාද? (ක්‍රියා 9:21, 26.) සාවුල්ට රට හැරයාමට සිදුවූයේ කුමක් නිසාද? (ක්‍රියා 9:23, 29–30.)

- අපගේ පව්වලට අප පසුතැවිලි වන විට, ස්වර්ගික පියාණන්වහන්සේ කරන්නේ කුමක්ද? (ඩීසහගී 58:42.) පසුතැවිලිවී යේසුස්වහන්සේ අනුගමනය කිරීමට උත්සාහදරන අන්‍යයන්ට උපකාරකිරීමට අපට හැකිවන්නේ කෙසේද?

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාවුල්ගේ සාක්ෂිය කුමක් වූයේද? (ක්‍රියා 9:20; 26:22–23.) යේසුස් ක්‍රිස්තුස්ව-හන්සේගේ ශුභාරංචිය වෙතට අප සත්‍ය වශයෙන්ම හැරී ඇති බව අප දැනගන්නේ කෙසේද? (මොසායා 5:2.)

සභාවේ දහතුන්වෙනි සභාපතිවරයා වන සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් උපුටාගැනීම සාකච්ඡා කරන්න: "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසයෙන් සහ ආත්මයාණන් වහන්සේ අප කෙරෙහි [ක්‍රියාකිරීමෙන්] පමණක් මෙම ප්‍රබල වෙනස අපට ඇතිවූ විට, අප අලුත් පුද්ගලයෙක් වැනිය. . . .පාපයේ ජීවිත ඔබ අමතක කර

ඇත…තවද ඔබ පවිත්‍රවී ඇත. ඔබගේ පරණ ජීවිත මාර්ගයට නැවත යාමට ඔබට [කිසිම ආශාවක්] නැත. ඔබ ඇත්තවශයෙන්ම අලුත් පුද්ගලයෙකි" (*The Teachings of Ezra Taft Benson*, පි. 470). (සභාපති බෙන්සන් විස්තරකළ අත්දැකීම ලැබීමට ළමුන්ට අභියෝගකිරීම පිණිස සාරවත්කිරීමේ 1වෙනි ක්‍රියාකාරකම ඔබට භාවිතාකිරීමට හැකිය.)

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන් සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. බොරුකීම, රැවටීම, තරහවීම, නරක වචන භාවිතාකිරීම, සහ ඔවුන්ගේ දෙමාපියන්ට අකීකරුවීම යනාදිය එම වයසේ ළමයින්ට පසුතැවිලිවීමට අවශ්‍යවන දේවල් නම්කිරීමට ළමයින්ට කියන්න. ඒවා සඳහන්කරන විට එම දේවල් හුණුලෑල්ලේ ලියන්න. ඔබ ළමයින්ට ප්‍රහේළිකාවක් දෙන්ට යන බව කියන්න. ලැයිස්තුවේ එක් එක් කරුණක් ඔබ පෙන්වාදෙන විට, "මෙය ගැන මා පසුතැවිලි විය යුතුදැය" ඔවුන්ගෙන්ම ඇසීමට ළමයින්ට සලස්වන්න. එක් එක් ප්‍රශ්නයට නිශ්වලව "ඔව්" හෝ "නැත" යනාදී වශයෙන් පිළිතුරුදීමට සලස්වන්න. පසුතැවිලිවීමට සාවුල් ගත් පියවරවල් නැවත බලන්න.

2. "පසුතැවිලිවී දෙවියන්වහන්සේ වෙත හැරෙන්න" ක්‍රියා (26:20) වාක්‍ය කණ්ඩයේ එක් එක් අකුර වෙන වෙනම කඩදාසි කෑලිවල හෝ අල්මාරියේ හතරැස් කොටුවල ලියන්න. එම කඩදාසි මුහුණත පහතට හරවා පිළිවෙලට මේසය මත තබන්න. හෝඩියේ අකුරු අනුමාන වශයෙන් කීමට වාර අනුව ළමුන්ට කියන්න. වාක්‍ය කණ්ඩයට අයිති අකුරක් අනුමාන වශයෙන් කී විට, එය හරවන්න. පසුතැවිලිවී දෙවියන්වහන්සේ වෙතට හැරුණු විට, අප හැරී ඇති බව පහදාදෙන්න.

3. ඇදහිල්ලේ හතරවෙනි කරුණ සාකච්ඡාකොට කටපාඩම්කරන්න.

4. ඔහු හෝ ඇය ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසයෙන් පසුතැවිලිවී, බව්තීස්මය ලැබ, යමෙකුගේ ජීවිතය වෙනස්වීමේ අත්දැකීමක් පංතියට කීමට ප්‍රාථමික සභාපතිත්වයේ අනුමැතිය ඇතිව ලඟදී හැරී ආ අයෙකු හෝ පෙරළා පැමිණි ධර්මදූතයෙකුට ආරාධනාකරන්න. ශුභාරංචියේ ඉගැන්වීම් අනුව ජීවත්වෙන විට, ලැබෙන සතුට සහ ප්‍රීතිය ගැන ඔහුගේ හෝ අයගේ හැඟීම් බෙදාගැනීමට එම පුද්ගලයාට සකස්වන්න.

5. බෙදී යන පාරක් සහිත පින්තූරයක් හුණුලෑල්ලේ ඇඳීමට ළමයෙකුට කියන්න. එක් පාරක් උඩින් ඔහුට හෝ ඇයට යාමට අවශ්‍ය නගරයක නම ලිවීමට වෙනත් ළමයෙකුට සලස්වන්න.

   - ඔබ වැරදි තැනින් හැරීගොස් වැරදි පාරට පිවිසියේ නම්, ඔබ කුමක් කරන්නෙහිද?
   - ඔබ සිටින තැනින් නගරයට පිවිසෙන්ට ඔබට හැකිද?
   - ඔබට අවශ්‍ය නගරයට යාමට ඔබ දැන් කුමක් කළ යුතුද?
   - හරි මාර්ගයට නැවත පැමිණීම පසුතැවිලිවීම නම් වන්නේ කෙසේද?

## අවසානය

**සාක්ෂිය**

අපගේ ජීවිත තුල පසුතැවීමේ වැදගත්කම ගැනද, යේසුස් ක්‍රිස්තුස්වහන්සෙ-ගේ ශුබාරංචිය වෙතට සත්‍ය වශයෙන්ම හැරීමේ වැදගත්කම ගැනද ඔබගේ සාක්ෂිය දරන්න. ශුභාරංචිය කෙරෙහි ඔබගේ ප්‍රේමය බෙදාගන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනයක් වශයෙන් ක්‍රියා 9:1–20 අධ්‍යනයකිරීමට ළමයින්ට ආරාධනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන පාවුල් සාක්ෂිදරයි

43
වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන වික්‍රමාන්විතව සාක්ෂිදැරීමේ අවශ්‍යතාවයක් ඇතිවීමට එක් එක් ළමයාට උපකාරවීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 13:2–4; 14; සහ 16:16–34 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳින් ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. පාඩම අවසානයෙහි සඳහන්වී තිබෙන ප්‍රහේළිකාවේ පිටපත් සූදානම්කරන්න. කෑලි වෙන්කර කපාගැනීමට පෙර, *වික්‍රමාන්විත* යන වචනය ලොකු අකුරින් එය හරහා ලියන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා
   ආ. කඩදාසි කෑල්ලක් සහ පැන්සලයක් එක් එක් ළමයා සඳහා.

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ප්‍රහේළිකා කෑලි ළමුන් අතර බෙදන්න. ප්‍රහේළිකාවේ එක් එක් වචනයක අර්ථය සාකාච්ඡාකර, කෑලි එකට සකස්කිරීමට සලස්වන්න. තවත් වචනයක් සොයාගැනීම පිණිස කෑලි හරවා ප්‍රහේළිකාවට නැවත එකතුකිරීමට සලස්වන්න. *වික්‍රමාන්විත* යන වචනය හුණුලෑල්ලේ ලියන්න.

- *වික්‍රමාන්විත* යන වචනයේ අදහස කුමක්ද? වික්‍රමාන්විත යන වචනය විස්තරකිරීමට උපකාරවන බව පහදාදෙන්න.
- ප්‍රහේළිකාවේ ඔබට මතක තිබෙන වචන මොනවාද? *වික්‍රමාන්විත* යන වචනය යටින් වචන ලියන්න. නැතිනම් ප්‍රහේළිකා කෑලි පෙන්වන්න.

ශුද්ධ ලියවිලි විස්තර

ශුභාරංචිය වෙතට සාවුල්ගේ හැරීම කෙටියෙන් නැවත බලා, සාවුල්ගේ නම පාවුල් යනුවෙන් වෙනස් කළ බව ළමයින්ට කියන්න. යේසුස්වහන්සේගේ අනුගාමිකයන්ට හිංසා පීඩා කිරීම පාවුල් නවත්වා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වික්‍රමාන්විත ප්‍රේරිතවරයෙකු සහ ධර්මදූතයෙක් වූයේය.

ක්‍රියා 13:2–4; 14 සඳහන් පාවුල් සහ බාර්ණබස්ගේ ධර්මදූත අත්දැකීම් ගැන විස්තරයද, ක්‍රියා 16:16–34 සඳහන් පාවුල් සහ සීලස් හිරගෙදරදී ලබාගත් අත්දැකීමේ විස්තරයද ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) පාවුල්, බාර්නබස් සහ සීලස්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ ශුභාරංචිය ගැන වික්‍රමාන්විතව සාක්ෂිදැරීමේ ක්‍රම වලට සවන්දීමට ළමයින්ට කියන්න.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, තම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- පාවුල්ට සහ බාරණබස්ට කිරීමට ස්වාමීන්වහන්සේ කැඳවූ වැඩය කුමක්ද? (ක්‍රියා 13:2–4.)

- පාවුල් සහ බාර්ණබස් ලුස්ත්‍රාවෙහි කොර මිනිසාව සුවකළාට පසු, ජනතාව සිතුවේ ඔවුන් කවුරුන් කියාද? (ක්‍රියා 14:11–12.) (සියුස් සහ හේර්මීස් ජනතාව නමස්කාර කළ බොරු දෙවිවරු බව පහදාදෙන්න. ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔවුහු දැන නොසිටියහ.) පාවුල් සහ බාරණබස් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ජනතාවට ඉගැන්වීමට උත්සාහකළේ කුමක් නිසාද? (ක්‍රියා 4:14–17.)
- අන්තියෝකියේ සහ ඉකෝනියේ යුදෙව්වරුන් පාවුල්ට සැලකුවේ කෙසේද? (ක්‍රියා 14:19.) එතරම් නරක අන්දමට ඔහුට සැලකුවත්, ශුභාරංචිය නොකඩවාම ඔහු දේශනා කලේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද
- අශුද්ධ ආත්මය ඇය වෙතින් දුරු කරමින් පාවුල් සහ සීලස් ස්ත්‍රියක් සුවකිරීම මකිදෝනියාවේ සමහර මිනිසුන් වියවුල් වූයේ කුමක් නිසාද? (ක්‍රියා 16:19.) මෙම මිනිසුන් පාවුල් සහ සීලස්ට කලේ කුමක්ද? (ක්‍රියා 16:20–23.)
- පාවුල් සහ සීලස් සිරගෙදර සිටියදී ඔවුන් කළේ කුමකද? (ක්‍රියා 16:25.) ඔවුන් දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් ප්‍රශංසා ගායනා කලේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? ඔබ සිතන අන්දමට ඔවුන්ගේ ක්‍රියා අනෙකුත් සිරකරුවන්ට බලපෑවේ කෙසේද?
- භූමිකම්පාව මගින් සිරගෙදර දොරවල් විවෘතවූ විට, පාවුල් සහ සීලස් සිරගෙදර රැඳී සිටියේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද? (ක්‍රියා 16:27–31.) සිරගෙයි මුලාදෑනියාට සහ ඔහුගේ පවුලට ඔවුන්ගේ ක්‍රියා ආශිර්වද වූයේ කෙසේද? (ක්‍රියා 16:32–34.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදැරීමට සහ අන්‍යයන්ට ඉගැන්වීමට අපට තිබෙන්නේ කුමන වර්ගයේ අවස්ථාවන්ද?
- ක්‍රියා 14:3 සහ 16:18, 25, 31 ළමයින්ට කියවීමට සලස්වන්න. ඔහු කුමන ස්ථානයකට ගියත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි පාවුල්ගේ සාක්ෂිය වික්‍රමාන්විත බව මෙම ශුද්ධ ලියවිලි පෙන්වන්නේ කෙසේද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අපට ශක්තිමත් සාක්ෂි තිබෙන බව වෙනත් පුද්ගලයන්ට දැනගැනීමට අපට සැලැස්විය හැකිවන්නේ කෙසේද?
- යේසුස්වහන්සේ කෙරෙහි වික්‍රමාන්විතව සාක්ෂිදැරීමට අප උත්සාහකරන විට, අපට මුහුනදීමට සිදුවිය හැකි සමහර අභියෝග මොනවාද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔවුන්ට ශක්තිමත් සාක්ෂි තිබෙන බව අන්‍යයන්ට පෙන්වීම පිණිස මෙම සතියේදී ඔවුන්ට කළ හැකි විශේෂිතවූ දේවල් සිතීමට ළමුන්ට අභියෝගකරන්න. අවම වශයෙන එක අදහසක්වත් ලියා එම කඩදාසිය ඔවුන්ට නිතර පෙනෙන ස්ථානයක තැබීමට සලස්වන්න. ප්‍රහේළිකාවේ වචන ඔවුන්ගේ කඩදාසිවල ලියාගැනීමට කීම ඔබට අවශ්‍ය විය හැකිය.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. පහත සඳහන් වචනතීරු සූදානම්කරන්න. නැතිනම් ඒවා හුණුලෑල්ලේ ලියන්න:

    යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන නිර්භීතව සාක්ෂිදැරුවේය
    "ජීවමාන දෙවියන්වහන්සේ ගැන ඉගැන්වූයේය"
    යාච්ඤාකරමින් දෙවියන්වහන්සේට ප්‍රසස්ති ගී ගැයූහ
    සිරගෙයි රැඳී සිටිමින් මුලාදෑනියා ගලවාගත්තේය
    "ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසකිරීමට" මුලාදෑනියාට ඉගැන්වූයේය.

    පහත සඳහන් ශුද්ධ ලියවිලි සටහන් වෙන වෙනම කඩදාසි කෑලිවල ලියන්න: ක්‍රියා 14:3, ක්‍රියා 14:15, ක්‍රියා 16:25, ක්‍රියා 16:28, ක්‍රියා 16:31.

    වචනතීරු පෙන්වා ශුද්ධ ලියවිලි සටහන් ළමයින් අතර බෙදන්න. වරකට එකක් බැගින් ශුද්ධ ලියවිලි කියවීමට ළමුන්ට සලස්වා, එයට ගැලපෙන එක් එක් වචනතීරුව කුමක්ද කියා තීරණය කරන්න. ඔහු කොතැනක සිටියත්, කුමක් කළත්, පාවුල් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වික්‍රමාන්විත සාක්ෂිකරුවෙකු බව පහදා දෙන්න.

2. ප්‍රහේළිකා කෑලිවල වචන නැවත වරක් කියවා, මෙම අංශවලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන වික්‍රමාන්විතව සාක්ෂිදැරීමට ඔවුන්ට හැකිවන අන්දම ගැන සාකච්ඡාකිරීමට ළමයින්ට සලස්වන්න. පහත සඳහන් ඒවාට සමාන

අවස්ථාවන් කඩදාසි කැලිවල ලිවීමට ඔබට අවශ්‍යවෙනවා ඇත. ඉන්පසු එක එක් ලමයෙකුට එකක් තෝරාගෙන, ඔහු හෝ ඇය එම අභියෝගයට මුහුණදෙන අන්දම ගැන කීමට සලස්වන්න.

සබත් දිනයේ පිහිනීමට ඔබ නොයන නිසා, ඔබගේ එක් මිතුරෙක් ඔබට විහිළු කරයි.

සභාවේ ප්‍රමිතීන්ට නොගැලපෙන චිත්‍රපටයක් බැලීමට ඔබට ආරාධනාකරනු ලැබේ.

ඔබගේ සමහර මිතුරෝ අශීලාචාර විහිළු සහ කථාන්තර කීමට පටන් ගනිති.

වෙළඳ සැලකදී ඔබගේ මිතුරෙක් මුද්දක් ඔහුගේ හෝ ඇයගේ සාක්කුවේ දමාගෙන ඔබටද එසේම කිරීමට දිරිගන්වයි.

ඔබගේ පංතියේ එක් සාමාජිකයෙක් සභාවේ දහම ගැන වැරදි ප්‍රකාශ කරයි.

පරීක්ෂණයකදී වෙනත් කෙනෙකුගේ උත්තර පත්‍ර දෙස බැලීමට ඔබ පෙළඹයි.

3. පාවුල් සහ සීලස් සිරගෙදර කථාව රඟදැක්වීමට ලමයින්ට සලස්වන්න. ඉන්පසු පාවුල්, සීලස්, සිරගෙයි සිටි මිනිසුන් සහ ඔහුගේ පවුලේ අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනකරන ආකාරය පෙන්වීමට ඔවුන්ට සලස්වන්න. ඔවුන්ව සිරගෙට දැමුවේ කුමක් නිසාද, එහිදී සිදුවූයේ කුමක්ද යන්න පාවුල්ගෙන් සහ සීලස්ගෙන් අසන්න. පාවුල් සහ සීලස් යාච්ඤාකරමින්ද, ගායනාකරමින්ද, සිටිනවිට භූමිකම්පාවක් ඇතිවී සිරගෙයි දොරවල් ඇරුනවිට සිරගෙයි සිටි අනෙක් මිනිසුන්ට කෙසේ හැඟුනේදැයි අසන්න. සිරගෙයි දොරවල් ඇරී තිබීමද ඔහු සහ ඔහුගේ පවුල බව්තීස්මවීම ගැනද, සිරගෙයි මුලාදැනියාට කෙසේ හැඟුනේදැයි අසන්න.

---

**අවසානය**


සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඔබගේ ස්වකීය සාක්ෂිය දරන්න. යෝග්‍ය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන ඔබ විකුමාන්විතව සාක්ෂිදැරූ විට ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට ආශිර්වාදකළ අවස්ථාවක් බෙදාගන්න.

නිවසේදී කියවීමට යෝජිත දේ

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ක්‍රියා 16:16–34 අධ්‍යයනයකිරීමට ලමුන්ට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න.




විකුමාන්විත ප්‍රහේලිකාව

# 44
වෙනි පාඩම

# පාවුළු නම් ධර්මදූතයා

**අරමුණ**

ධර්මදූතයෙකු වී අන් අය සමග ශුභාරංචිය බෙදාගැනීමට දැන්ම සූදානම්වීමට එක් එක් ළමයෙකු දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. ක්‍රියා 22:17–30; 23:10–24, 31–33; and 26:1–2, 22–29 යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම් සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: ක්‍රියා 19:26 (සම්පූර්ණ විස්තර සඳහා.)
3. ළමයින්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. යොමුවීමේ ක්‍රියාකාරකමේ විස්තරකර තිබෙන සිතියම (හෝ ඔබට එය හුණුලෑල්ලේ ඇඳිය හැකිය)

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**


ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

පළමු පාඩමෙන් පාවුල් ගැන ඔවුන්ට මතක ඇති දේවල් කුමක්දැයි ළමයින්ගෙන් අසන්න. (ඔහුගේ නම සාවුල් යයි වෙනස්කර ඇති බව මතක්කරන්න.) ධර්මදූතයෙකු වීමට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ විශේෂ සාක්ෂිකරුවෙකු වීමට ස්වාමීන්වහන්සේ විසින් පාවුළුව කැඳවා ඇති බව ළමයින්ට මතක්කරන්න. (බලන්න ක්‍රියා 13:2; 20:24) ඔහුගේ ජීවිතයේ ඉතිරි කාලය තුළදී ඔහු ධර්මදූත සේවයෙහි යෙදුනේය.

පාවුළු හැරී ආ විට, යෙරුසලමේ සහ අවට ප්‍රදේශවල යුදෙව්වරු සමහරෙක් පමණක් යේසුස්වහන්සේ ගැන අසා තිබුනි. පාවුළුගේ ධර්මදූත ගමන් හතරේදී බොහෝ රටවල යුදෙව් ජනතාවට සහ අන්‍ය ජාතීන් වෙතට (යුදෙව් ජාතියට අයිති නොවූ අය) ඔහුව ගෙන ගියේය. මෙම අන්‍ය ජාතීහු ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන දැන නොසිටියෝය. ඔවුහු බොරු දෙවිවරු සහ රූප වන්දනා කළහ. පාවුළු ගිය සෑම තැනකදීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය ඔහු දේශනා කළේය.

පහත සඳහන් එකට සමාන රූපයක් හුණුලෑල්ලේ හෝ සිතියමක අඳින්න.



- ධර්මදූතයෙකු වීමට පාවුල් සූදානම් වූයේ කෙසේද?

*පාවුල්ගේ සිට ධර්මදූතයෙකු* වෙතට මගපෙන්වන පියවරවල ලමයින්ගේ ප්‍රතිචාර ලියන්න. පසුතැවිලිවිය, යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කළේය, බව්තීස්මවිය, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලැබුවේය, ශුභාරංචිය ඉගෙනගත්තේය, ශුභාරංචිය අනුව ජීවත්වූයේය යනාදී අදහස් ඇතුලත්කිරීමට වගබලාගන්න.

ශුද්ධ ලියවිලි විස්තරය

පාවුල්ගේ තුන්වෙනි ධර්මදූත ගමනට පසු, ඔහුට සිදුවූ දෙය ගැන විස්තරය ළමුන්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, “ශුද්ධ ලියවිලි වලින් ඉගැනවීම,” පි. 00 vii.) මෙය යෙරුසලමට පාවුළුගේ අන්තිම ගමන බවද, ඔහු එහි සිටින විට, යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ යුදෙව්වරුන්ට ඔහුව මැරීමට අවශ්‍යවූ බව පහදා දෙන්න. ඔහු රෝම පුරවැසියෙකු බැවින්, ආරක්ෂාව පතා යෙරුසලමේ සහ කයිසාරියේ සිටි රෝම නායකයන් වෙතට ඔහු හැරුනේය. ඔහුව රෝම සිරකාරයෙකු කරමින් ඔවුන් ඔහුට ආරක්ෂාව සලසාදී, අනතුරුව විනිශ්චය පිණිස ඔවුන් ඔහුව රෝමයට යවන ලදී. (රෝමයට පාවුල්ගේ ගමන ගැන විස්තරය 45වෙනි පාඩමේදී උගන්වනු ලැබේ.) ඔහුගේ සියලුම විනිශ්චයන් වලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදැරීමට පාවුල් සියලුම අවස්ථාවන් වලදී උත්සාහ දැරීය.

සාකච්ඡා සහ අදාලකරේමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමුන්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- යුදෙව්වරුන් පාවුළු සමග අමනාපවූයේ කුමක් නිසාද? (ක්‍රියා 22:17–21.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස නොකළ ජනතාවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් ලැබූ දර්ශනයක් ගැන පාවුල් සාක්ෂිදරමින් සිටිය බව ළමයින්ට තේරුම්ගැනීමට උපකාරවන්න. පාවුල්ට හිරිහැර නොකළේ කුමක් නිසාද? (ක්‍රියා 22:24, 29.)

- ඔහු ගැන සාක්ෂි දීමට නැවතත් යුදෙව්වරුන් ඉදිරියට යෑමට අධිපතියා පාවුල්ට ඉඩහැරියේය. නමුත් ඔහුගේ සාක්ෂිය නිසා යුදෙව්වරු නැවතත් ඔහුව මැරීමට උත්සාහ දැරුවෝය. (ක්‍රියා 23:10.) ඔහුට පීඩා පමුණුවන මේ අවස්ථාවේදී ධෛර්‍යය සහ ඇදහිල්ල පාවුල් පෙන්වූයේ කෙසේද? පාවුල්ගේ තත්වයෙහි ඔබ සිටියා නම්, ඔබට කෙසේ හැඟෙනවා ඇද්ද?

- ස්වාමීන්වහන්සේ පාවුල්ව සැනසුවේ කෙසේද? (ක්‍රියා 23:11.0 ඔහුව නොමරන බව දැනගත් විට, පාවුල්ට කෙසේ හැඟුනේද කියා ඔබ සිතන්නේද? ස්වාමීන්වහන්සේ අදත් ධර්මදූතයන් සනසමින් ආශිර්වාදකරන්නේ කෙසේද?

- පාවුල්ව මැරීමට යුදෙව්වරුන් කුමන්ත්‍රනය කළේ කෙසේද? (ක්‍රියා 23:14–15.) මෙම කුමන්ත්‍රනයෙන් පාවුල්ව ගලවාගත්තේ කවුද? (ක්‍රියා 23:16.) යුදෙව්වරුන්ගෙන් බේරීමට අධිපතියා පාවුල්ට උපකාර කළේ කෙසේද? (ක්‍රියා 23:22–24.) ස්වාමීන්වහන්සේ පාවුල්ව ආරක්ෂා කළේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?

පෙස්තුස් අලුත් ආණ්ඩුකාරයා වන තෙක් පිලික්ස් නමවූ රෝම ආණ්ඩුකාරවරයා අවුරුදු දෙකක් කයිසාරියේ සිරකරුවෙකු මෙන් පාවුල් තැබූ බව පහදා දෙන්න. රෝමයේ විනිශ්චා කිරීමට පාවුල් ඉල්ලා සිට, රෝමයට යෑමට පෙර, ඔහුගේ හැරීමේ කථාව සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිය පෙස්තුස්ට සහ අග්‍රිපා රජුට ඔහු කීවේය.

- අග්‍රිපා රජුට කථාකිරීම ගැන පාවුල්ට හැඟුනේ කෙසේද? කුමක් නිසාද? (ක්‍රියා 26:1–3.) රජතුමාට සහ පෙස්තුස්ට ඔහු ඉගැන්වූයේ කුමකද? (ක්‍රියා 26:22–23.)

- පාවුල්ගේ සාක්ෂියට පෙස්තුස් ප්‍රතික්‍රියා කළේ කෙසේද? (ක්‍රියා 26:24.) අග්‍රිපා රජු ප්‍රතික්‍රියා කළේ කෙසේද? (ක්‍රියා 26:28.) අග්‍රිපා රජුට ක්‍රිස්තියානුකාරයෙකු වීමට පාවුල්ගේ සාක්ෂිය සම්පූර්ණයෙන්ම පිළිනොගැනීමට ඔහුට තිබුනු කරුණු මොනවාද? ශුභාරංචිය පිළිගැනීමෙන් වැළකී සිටීමට අද ජනතාවට තිබෙන සමහර දේවල් මොනවාද?

- රජතුමාට සහ ආණ්ඩුකාරයාට දේශනාකිරීමට පාවුල්ට ධෛර්‍යය දුන්නේ කුමක්ද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේට විශේෂ සාක්ෂිකරුවෙකු වීමට පාවුල්ව කැඳවා තිබූ අතර, උන්වහන්සේ ගැන සාක්ෂි දැරීමට සෑම අවස්ථාවකින්ම ප්‍රයෝජනය ගත් බව ළමුන්ට මතක් කරන්න. යේසුස් වහන්සේ ගැන ඔබගේ සාක්ෂිය අන්‍යයන් සමග බෙදාගැනීමට හැකිවන්නේ කුමන අවස්ථාවලදීද? ධර්මදූතයෙකු වීමට ඔබට දැන්ම හැකිවන්නේ කෙසේද?

සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන උපුටාගැනීම සාකච්ඡාකරන්න:

"ප්‍රාථමිකයේ පිරිමි ළමයිනි, ස්වාමීන්වහන්සේට පූර්ණකාලීන දූතමෙහෙයක සේවයකිරීමට සැලසුම් කොට ඉදිරියට යන්න. තරුණ ගැහැණු ළමයිනි, ඔබව කැඳවුවහොත්, දූතමෙහෙයේ සේවයට සූදානම්වන්න" (in Conference Report, අප්‍රේ. 1989, පි. 104; හෝ *Ensign,* මැයි 1989, ප. 82).

"ඔව්…දැන්ම සූදානම්වන්න [ඔබට අවුරුදු නමය, දහය, හෝ එකොළහ වන විට]. ශාරීරිකව, මානසිකව, සාමාජීය සහ ආත්මිකව ඔබම සූදානම්වෙන්න. අධිකාරීබලයට නිතර කීකරුවන්න. තවමත් නොකළා නම්, ඔබගේ දූතමෙ-හෙය වෙනුවෙන් ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භකරන්න. ඔබගේ දසයෙන් කොටස ගෙවන්න. අධ්‍යයනයෙන් සහ යාච්ඤාව තුළින් ශුභාරංචිය ගැන සාක්ෂියක් සොයන්න" (Conference Report තුළිනි, අප්‍රේල් 1985, පි. 49; හෝ *Ensign,* මැයි 1985, පි. 37).

- ශුභාරංචිය බෙදාගැනීමට සූදානම්වීම පිණිස දැනටමත් ඔබ ගෙන තිබෙන පියවරවල් මොනවාද? අනාගතයේදී ඔබට ගතහැකි පියවරවල් මොනවාද?

*පාවුල්* යන ස්ථානයේ *ඔබ* යන වචනය ලියා, ක්‍රියාකාරීත්වයට යොමුවීමේ භාවිතාකර තිබෙන සිතියමට සමාන එකක් හෝ හුණුලෑල්ලේ වෙනත් රූපයක් අඳින්න. ඔබගෙන් ධර්මදූතයෙකු වෙතට මගපෙන්වන පියවරවල් මත ළමයින්ගේ ප්‍රතිචාර ලියන්න. යේසුස්වහන්සේ තුළ ඇදහීම, බව්තීස්මවීම, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගැනීම, පූජකවරය ලැබීම, (පිරිමි ළමයි), ශුභාරංචිය ඉගෙනගැනීම, ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීම, සභාවට යෑම, නිවසේ-දී, පාසලේදී හෝ ඔබ සිටිනා ඕනෑම තැනකදී ශුභාරංචිය අනුව ජීවත්වීම යනාදී අදහස් ඇතුලත්කිරීමට වගබලා-ගන්න.

- ස්වාමීන්වහන්සේ සඳහා වඩා හොඳ ධර්මදූතයෙකු වීම පිණිස දැනට ඔබට දියුණුකර ගැනීමට හැකි දක්ෂතා සහ හැකියාවන් මොනවාද?

- ශුභාරංචිය ඉගැන්වීමේ සූදානමක් වශයෙන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කිරීමේ විශේෂිත වැදගත්කම කුමක්ද?

ඔබට හෝ ඔබ දන්නා යමෙකුට ශුභාරංචිය බෙදාගැනීමේදී සූදානම්ව සිටීම උපකාරවූ අන්දම ගැන නිදර්ශන බෙදා-ගන්න. ඔවුන්ට හෝ ඔවුන්ගේ පවුලේ අයට ශුභාරංචිය ගැන අන්‍යයන්ට ඉගැන්වීමේ අවස්ථාවන් ගැන අත්දැකීම් බෙදාගැනීමට ළමුන්ව දිරිගන්වන්න. ඔබගේ පංතියේ හැරී ආ පුද්ගලයන් සිටිනවා නම් ධර්මදූතයන් හෝ වෙනත් අය ඔවුන්ට ශුබාරංචිය උගන්වා, සාක්ෂියක් ලබාගැනීමට උපකාරවූ අන්දම ඔවුන්ට බෙදාගැනීමට සැලැස්වීමට ඔබට අවශ්‍යවනවා ඇත.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ, නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. එක් එක් ළමයාට කඩදාසි කැල්ලක් සහ පැන්සලයක් දී, තරප්පු කිහිපයක් ඇඳීමට කියන්න. ඔවුන්ගේ නම යටින්ද, *ධර්මදූතයා* යන්න උඩින්ද ලිවීමට සලස්වන්න. ධර්මදූතයන් වීමට සූදානම්වීම පිණිස ඔවුන් ගෙන ඇති පියවරවල් සහ ඉදිරියට ගන්නා පියවරවල් ලිවීමට සලස්වන්න.

2. දහම සහ ගිවිසුමේ 84:88 සඳහන් ධර්මදූතයන්ට ස්වාමීන්වහන්සේගේ පොරොන්දුවේ පිටපතක් එක් එක් ළමයාට සාදන්න. ළමයින් සමග මෙම පොරොන්දුව සාකච්ඡා කොට, ඔවුන්ගේ නිවාසවල එය ප්‍රදර්ශනයකිරීමට ළමුන්ව දිරිගන්වන්න.

---

## අවසානය

**සාක්ෂිය**

ශුභාරංචිය ඉගැන්වීමට දැන් පටන්ම ළමයි සූදානම්වීම ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍ය බවට සාක්ෂි දරන්න. යේසුස් ක්‍රිතුස්වහන්සේගේ ශුභාරංචිය අනුව දිනපතාම ජීවත්වීම මෙය කිරීමට ඉතාම හොඳ එක් ක්‍රමයක් බවට ඔබගේ හැඟීම් ප්‍රකාකරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ක්‍රියා 23:10–24, 31–33 අධ්‍යයනය කිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

# රෝමයට පාවුල්ගේ ගමන

**45**
වෙනි පාඩම

**අරමුණ**

ශුද්ධාත්මයාණන් කරණකොටගෙන පැමිණෙන ආත්මයේ දීමනා ගැන එක් එක් ළමයාට වඩා වැඩියෙන් ඉගෙනගැ-නීමට උපකාරකිරීමය

**සූදානම්වීම**

1. ක්‍රියා 27:1–28:9, 1 කොරොන්ති 12:1–11, සහ ඇදහිල්ලේ කරුණු 1:17 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යනයකර ශුද්ධ ලියවිලි ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අත්දම ගැන තීරණයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: *සුභාරංචි මූලධර්ම,* 22වෙනි පරිච්ඡේදය.
3. ළමුන්ව සහභාගිකරවීමට හැකි, පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකට ගැනීමට උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ අලුත් ගිවිසුමක් එක් එක් ළමයා සඳහා.
   ආ. අනගි මුතුඇටය හෝ ඇදහිල්ලේ කරුණු පිටපතක් එක් එක් ළමයා සඳහා.

**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**ක්‍රියාකාරීත්වයට යොමුවීම**

නිවාඩු දිනයකට හෝ උපන් දිනයකට ඔබට ලැබුනු විශේෂිත ත්‍යාගයක් ගැන ළමයින්ට කියන්න. ඉන්පසු ඔවුන්ට ලැබුනු ත්‍යාග ගැන කථාකිරීමට ළමයින්ට කියන්න.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයන්වූ විට, අපට ලැබෙන්නේ කුමන දීමනාවද? (ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව.)

ශුද්ධාත්මයාණන් ගැන ඔවුන් දන්නා දේවල් ගැන කීමට ළමුන්ට ඉඩදෙන්න. ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම සහ මෙහෙයවීම ලැබීමට අමතරව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ එක් එක් සාමාජිකයෙකුට වෙනත් ආත්මික දීමනා වලට අයිතිවාසිකම් ඇත. අනගි මුතු ඇටයෙහි සඳහන් ඇදහිල්ලේ කරුණු සෙවීමට ළමයින්ට සලස්වන්න. හත්වෙනි ඇදහිල්ලේ කරුණ ළමයින් කියවන විට, හෝ ගායනාකරන විට, එහි සඳහන් ආත්මික දීමනා හුණුලෑල්ලේ ලියන්න. අන්‍යයන්ට උපකාරකිරීම පිණිස භාවිතාකිරීමට හැකිවූ ඔහුට දෙන ලද දීමනා ස්වල්පයක් සොයාගැනීම පිණිස රෝමයට පාවුල්ගේ ගමනෙහි විස්තරයට සවන්දීමට ළමයින් දිරිගන්වන්න.

**ශුද්ධ ලියවිලි විස්තරය**

රෝමයට යන ගමනේදී පාවුල් සිරකරුවෙකුවූයේ කුමක් නිසාද කියා ළමයින්ට මතක්කිරීම පිණිස පසුගිය සතියේ පාඩම කෙටියෙන් නැවත බලන්න. ඉන්පසු ක්‍රියා 27:1–28:9 සඳහන් රෝමයට පාවුල්ගේ ගමනෙහි විස්තරය ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලි වලින් ඉගැන්වීම," පි. 00 vii.)

ශුද්ධ ලියවිලි විස්තර ඔබ උගන්වා නිම කළ පසු, රෝමයට පාවුල් ඔහුගේ ගමන නොනවත්වා ගිය අතර, නිවසකට සීමාවී සිර අඩස්සියේ සිටි නමුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය දේශනාකරමින් අවුරුදු දෙකක් ඔහු එහි ගත කළ බව පහදා දෙන්න.

**සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න**

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට පහත සඳහන් ප්‍රශ්න සහ හුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි සටහන් ඉතාම හොඳට තේරුම් ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාළකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින් ශුද්ධ ලියවිලි ගැන මනා දැනීමක් ලබාගැනීමට ඔවුන්ට උපකාරවනවා ඇත.

- නැවේදී පාවුල් ජනතාවට අනතුරු ඇඟවූයේ කුමක් ගැනද? (ක්‍රියා 27:10.) ඔහු මෙය දැනගත්තේ කෙසේද? ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුට එය එළිදරව් කළසේක.) සියයකට මුලාදෑනියා විශ්වාස කළේ කවුද? (ක්‍රියා 27:11.) හරි කවුද? (ක්‍රියා 27:14, 20.) අනාගතවක්තෘවරයා අපට යමක් ගැන අනතුරු ඇඟවූ විට, අප කළ යුත්තේ කුමක්ද? කුමක් නිසාද?

- නැව විනාශවේ යයි ඔවුන් සිතූව විට, නැවේ සිටි ජනතාවට හැඟුනේ කුමක්දැයි ඔබ සිතන්නේද? පාවුල් ඔවුන්ට කීවේ කුමක්ද? (ක්‍රියා 27:21–22.) ඔවුන් ජීවත්වෙන බවත් නිරුපද්‍රිතව රෝමයට පැමිණෙන බවත්, පාවුල් දැනසිටියේ කෙසේද? (ක්‍රියා 27:23–25.)

- නැවට කුමක් වූයේද? (ක්‍රියා 27:40–41.) නැව විනාශවූ විට සිරකරුවන්ට කුමක් කිරීමට හේවායින්ට අවශ්‍ය වූයේද? කුමක් නිසාද? (ක්‍රියා 27:42.) සියයකට මුලාදෑනියා එය වැළැක්වීමට ඔවුන් සමග කථා කළේ කුමක් නිසාද? (ක්‍රියා 27:43.) පාවුල් කෙරෙහි සියයකට මුලාදෑනියාගේ ආකල්පය වෙනස්වූයේ කුමක් නිසාද? (ක්‍රියා 27:11, 14, 21, 25, 31, 43.)

- ගින්නක් මොළවන විට පාවුල්ට කුමක් වූයේද? (ක්‍රියා 28:3.) අනෙක් අය පාවුල් මැරෙන තෙක් බලාසිටියේ කුමක් නිසාද? (ක්‍රියා 28:4–6.) සර්පයා කැමෙන් පාවුල්ව ආරක්ෂාකර ගත්තේ කුමක් නිසාද?

- රෝගීව සිටි අයට පාවුල් කළේ කුමක්ද? (ක්‍රියා 28:8–9.) මෙය කිරීමට පාවුල්ට හැකියාව තිබුනේ කුමක් නිසාද? (සුවකිරීමේ දීමනාව පාවුල්ට තිබුනේය. ඔහුට පූජකවර බලය තිබුන අතර, ඔහු ප්‍රේරිතවරයෙක්ද වූයේය. එබැවින් ස්වාමීන්වහන්සේ ඔහුට දෙන ලද දූතමෙහෙය ඉෂ්ඨකිරීම පිණිස ශ්‍රේෂ්ඨ ආත්මික දීමනා ඔහුට දෙනු ලැබුවේය. අන් අයට උපකාරකිරීම සඳහා ආත්මික දීමනා භාවිතාකිරීමේ වැදගත්කම ගැන අවධාරනය කරන්න.)

- ඉදිරියට වන දේවල් දැකීමේ හැකියාව සහ රෝගීන් සුවකිරීමේ හැකියාව පාවුල්ට ලැබුනේ කෙසේද? (පාවුල් බව්තීස්ම ලබා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ සාමාජිකයෙකු ලෙස ස්ථිරකරනු ලැබූ නිසා, විශේෂිතවූ ආත්මික දීමනාවලට ඔහු සුදුසුකම් ලැබුවේය.)

සභාවේ සියලුම සාමාජිකයන්ට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව තිබෙන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න. 1 කොරොන්ති 12:7–11 කියවීමට සලස්වන්න. මෙම දීමනා සාකච්ඡාකොට, අන්‍යයන්ට ආශිර්වාදකිරීම පිණිස සභාවේ සෑම සාමාජිකයෙකුටම දීමනාවක් දී තිබෙන බව අවධාරනය කරන්න.

- රෝමයට ඔහුගේ ගමනේදී පාවුල් භාවිතාකළ දීමනාව කුමක්ද? ස්වර්ගික පියාණන් වහන්සේ ආත්මික දීමනා අපට දෙන්නේ කුමක් නිසාද? (1 කොරොන්ති 12:7; ධර්මසහ 46:9, 12, 26.)

- අපට දී තිබෙන ආත්මික දීමනා හඳුනාගැනීමට අපට හැකිවන්නේ කෙසේද? (අපගේ විශේෂිත දීමනා කුමක්ද කියා දැනගැනීමට අපට නිරාහාරව යාච්ඤාකිරීමට හැකිය. ආදිපීතෘ ආශිර්වාදයෙහිදී එය අපට කියනු ලැබේ. අපගේ ජීවිතකාලය තුළදීම පණත්වලට කීකරුවෙමින් අන්‍යයන්ට සේවයකරන විට, අප අපගේ දීමනා හඳුනාගන්නෙමු.)

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත්, පාඩමේ ඕනෑම අවස්ථාවකදී හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් භාවිතාකිරීමට ඔබට හැකිය.

1. 1 කොරොන්ති 12:7–10 සඳහන් එක් එක් ආත්මික දීමනා කඩදාසි කැලිවල වෙන වෙනම ලියන්න. ත්‍යාගයක් ඔතන ආකාරයට එය ඔතා, පෙට්ටියක තබා එක් එක් ළමයෙකුට කඩදාසි කැල්ලක් ගන්ට සලස්වා කුමන ත්‍යාගයක් ලැබුනේද කියා කීමට සලස්වන්න. එක් එක් ත්‍යාගයක් කෙටියෙන් විස්තර කරන්න.

2. පංතිය කුඩා කණ්ඩායම්වලට බෙදන්න. එක් එක් කණ්ඩායමට පහත සඳහන් හෝ වෙනත් සුදුසු ශුද්ධ ලියවිලි සටහන් දෙන්න. ආත්මයාණන්ගේ කුමන දීමනාවක් පෙන්නුම් කරන්නේද කියා තීරණයකොට ඔවුන්ගේ අදහස් පංතිය සමග බෙදාගන්න.

   ක්‍රියා 3:1–8 (පේතෘස් සහ යොහාන් කොරවූ මිනිසෙකු සුව කළහ). සුවකිරීමේ දීමනාව.

   ක්‍රියා 14:8–10 (පාවුල් කොර මිනිසෙකු සුව කළේය). සුවකිරීමේ දීමනාව.

   මාර්ක් 5:25–34 (ස්ත්‍රියක් යේසුස්වහන්සේගේ සළුවට අතගැසුවාය). සුවවීමේ ඇදහිල්ල.

ලූක් 2:25–26, 34–38 (සිමියොන් සහ ආනා යේසුස්වහන්සේ ගැන අනාවැකි කීහ.) අනාවැකි කීමේ දීමනාව. අනාවැකි කීමේ දීමනාව සාකච්ඡාකරන අතර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධ බොහෝ දේවල්, එනම් උපත, දූතමෙහෙය, මරණය සහ මළවුන්ගෙන් නැගිටීම යනාදිය අනාවැකි දීමනාව ඇති අය මගින් මතුවට වෙන දේවල් කියන ලද බව පහදා දෙන්න.

ක්‍රියා 9:1–20 (යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය වෙතට පාවුල් හැරී ආවේය). යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව දැනගැනීමේ දීමනාව.

ක්‍රියා 2:4–18 (පෙන්තකෝස්ත දිනයේදී ගෝලයෝ ශුද්ධාත්මයාණන්වහන්සේව ලැබුවෝය.). අන්‍ය භාෂාවන් කථාකිරීමේ දීමනාව සහ අනාවැකි කීමේ දීමනාව.

- මෙම එක් එක් දීමනාවක් අපගේ ජීවිතවලට ආශිර්වාදිත වන්නේ කෙසේද?

3. ආත්මික දීමනා අනුකරනය කිරීමට සාතන් උත්සාහ ගන්නා බව පහදා දීමට ඔබ කැමති වනවා ඇත. උදාහරණයක් ලෙස, මෝසෙස් සහ ආරොන්ගේ හාස්කම්, අනුකරනය කිරීමට පාරෝවාගේ මාළිගාවේදී මන්ත්‍රකාරයන්ට හැකිවිය. (නික්මයාම 7:10–13). අප රැවටීමට නොහැකිවන පිණිස, ආත්මයානන් අප සමග සිටීමට, අප ධර්මිෂ්ඨව ජීවත්විය යුතු බව පහදා දෙන්න. අපගේ ජීවිතවලට ආශිර්වාදකිරීම පිණිස ශුද්ධාත්මයාණන්ගේ දීමනා මගින් ආත්මික දීමනා අපට දී තිබෙන බව ළමුන්ට මතක් කරන්න. (බලන්න *ශුභාරංචි මූලධර්ම* 22වෙනි පරිච්ඡේදය)

4. ඇදහිල්ලේ හත්වෙනි කරුණ කටපාඩම්කිරීමට ළමයින්ට උපකාරවන්න.

5. පහත සඳහන් එක් කථාවක් කියන්න:

ජේන්ගේ දීමනාව

"එක් උදෑසනක ජේන් ග්‍රෝවර්, ටැනර් සීයා, සහ ඔහුගේ මිනිබිරියද, කැළෑ ගූස් බෙරීස් ඇහිදීම පිණිස අයිඕවා, කවුන්සිල් බලෆ්හි පුරෝගාමීන්ගේ කඳවුරින් පිටත්ව ගියහ. සීයාට ඉක්මණින්ම මහන්සි දැණුන බැවින්, විවේක ගැනීමට ආපසු කරත්තයට ගියේය. නමුත් ගැහැණු ළමුන්ට කොළපාට පැණි බේරෙන බොහෝ බෙරීස් ලැබුන බැවින් ඔවුන්ගේ කුඩා පුරවාගැනීමට එහි නතරවූහ.

"එකෙණෙහිම උදෑසන නිසලතාවය බිඳිමින් අශීලාචාර හූ හඬක් ඇසුනි. වාහනය වෙතට දිව එන අතර, ඉන් දියානුවන් කණ්ඩායමක් සීයාගේ ඇඳුම් ඉරනවා දුටු ගැහැණු ළමයි බියට පත්වූහ. සීයාගේ ඔරලෝසුව සහ පිහිය ඔවුන් රැගෙන අශ්වයන් පළවාහැරීමට ඔවුහු උත්සාහ දැරූහ.

"එක් ඉන්දියානුවෙක් ගැහැණු ළමයාව තදින් අල්ලාගත් විට, ඇය භයවී කෑ ගසන්ට පටන් ගත්තාය; තවත් කෙනෙක් ජේන්ව තදින් අල්ලාගෙන ඔවුන් සමග ඇදගෙන යාමට උත්සාහ කළේය. ගැලවීමට දඟලන ඇය පිහිට පතා කෙටි ප්‍රබල යාච්ඤාවක් කළාය.

"එකෙනෙහිම ඇය කිසිදා නොදත් සියල්ල අභිබවා යන බලයක් ජේන් අත්දුටුවාය. නිසල සියුම් හඬකින් ඇ කථාකිරීමට පටන්ගත් විට, ඉන්දියානුවරු ඔවුන් අල්ලාගත් අය මුදවා සවන්දීමට පටන් ගත්හ. සම්පූර්ණයෙන්ම පුදුමයකට මෙන් මෙම තරුණ ගැහැණු ළමයා ඔවුන්ගේ භාෂාවෙන් කථාකරනවා ඔවුන්ට ඇසුනි. ශ්‍රේෂ්ඨ ආත්මය සිහිපත්කිරීමට ඔවුන්ට ආයාචනා කළ අතර, ඔවුන්ගේ සුදු ජාතික මිතුරන්ට හිංසාකිරීම උන්වහන්සේට අවශ්‍යා නොවුන බව ඔවුන්ට කීවාය. සීයා සහ කුඩා ගැහැණු ළමයා කථාකර ගැනීමට නොහැකිව පුදුමවී සිටියහ. ඔවුන්ගේ කණ්ඩායමේ කිසිවෙක් මෙම නුපුරුදු භාෂාව දැන නොසිටියහ. මෙහිදී ජේන් ඇයගේ මුළු ජීවිත කාලයේදීම දන්නා ලෙසට පහසුවෙන් සහ අධිකාරී බලයෙන් කථා කළාය. ඉන්දියානුවරු හිස වනා ඔවුන් ගත් ඔරලෝසුව සහ පිහිය ආපසු දුන්හ. ඉන්පසු ඔවුන් සියලු දෙනාටම අතට අත්දී, නිහඬව යන්ට ගියහ" (Lucile C. Reading විසින් නැවත කියන ලදී, "Shining Moments," *Children's Friend,* ජූලි 1941, පි. 41).

- ජේන් ග්‍රෝවර්ට ලැබුනේ කුමන ආත්මික දීමනාවක්ද? (අන්‍ය භාෂාවෙන් කථාකිරීමේ දීමනාව) ඉන්දියන්වරුන්ට ඔවුන්ගේ භාෂාවෙන් කථාකිරීමට ඇයට හැකිවූයේ කුමක් නිසාද? (ස්වර්ගික පියාණන්වහන්සේගේ පිහිට පතා ඇය යාච්ඤා කළාය; ඇය දීමනාව සෙව්වාය.)

ජෝන්ගේ සුවකිරීම

"අවුරුදු එකොළහක් වයසැති ජෝන් රූතුෆ් [සභාවේ සභානායකවරයෙකුවූ] ඕලන්දයේ රොටර්ඩෑම්හි ජීවත්වූයේය. පාසලට සහ පල්ලියට යමින් ඔහුගේ මිතුරන් සමග ක්‍රීඩාකරමින්, පිරිමි ලමයෙකු විනෝදවන සියල්ලක් කරමින්, වරක් ඔහු සතුටින් ජීවත්වූයේය. අනතුරුව කිසිම අනතුරු ඇඟවීමක් නැතිව වේදනාකාරී ඇස් රෝගයකින් ඔහුට පෙනීම අහිමිවිය. පාසලට යාමටවත්, කියවීමටවත් තවදුරටත් ඔහුට නොහැකිවිය. මිතුරන් සමග ක්‍රීඩාකිරීමට පවා ඔහුට හොඳට පෙනුනේ නැත. සෑම දිනයක්ම අන්ධකාරයෙන් සහ වේදනාවෙන් පිරී ගියේය.

"[සභාවේ හයවෙනි සභාපතිවරයා වන] සභාපති ජෝසෆ් එෆ්. ස්මිත් ඔවුන්ව බැහැදැකීමට ඕලන්දයට එන බව පසු-දවස්වල ශුද්ධවන්තයන්ට දැනගන්නට ලැබුනි. ජෝන් මේ ගැන දිගුකාලයක් තිස්සේම සිතා, පසුව ඔහුගේ මවට ඔහු මෙසේ කීවේය, 'පොලොවේ සිටින කිසිම මිනිසෙකුට වඩා මහත් බලයක් අනාගතවක්තෘවරයාට තිබේ. එම රැස්වීමට ඔබ මා එක්ක යනවා නම්, මගේ ඇස් දෙස බැලීමට ඔහුට හැකිවේ. මා සුවය ලබන බව මම විශ්වාස කරමි.'

"ඊලඟ ඉරුදින රැස්වීම අවසානයේදී කුඩා දේවස්ථානයේ පිටුපසට සභාපති ස්මිත් යමින්, ජනතාවට සුභපතමින්, එක් එක්කෙනා සමග අතිනත ගත්තේය. ඔවුන්ගේ ආදරවන්ත නායකයා සමග කථාකිරීමට අනායයන් සමග යාම පිණිස රූතුෆ් සහෝදරිය ජෝන්ගේ ඇස් වෙළා බැඳ, ඔහුට උපකාර කළාය.

"සබාපති ස්මිත් අන්ධ ලමයාව අතින් අල්ලාගෙන ඉතාම මෘදු මොලොක් ලීලාවෙන් වෙළුම් පටිය ඔසවා වෙ-දනාවෙන් පිරි ජෝන්ගේ ඇස් තුල බැලුවේය. අනාගතවක්තෘවරයා ජෝන්ට ආශිර්වාදකර, ඔහුට නැවත පෙනෙන බවට පොරොන්දු වූයේය.

"ගෙදර පැමිණ වෛද්‍යවරයා ඇයට කී පරිදි, ඔහුගේ ඇස් සේදීම පිණිස ජෝන්ගේ මව ඔහුගේ ඇස් වෙතින් වෙළුම් පටිය ඉවතට ගත්තේය. ඇය එසේ කරන විට, ජෝන් ප්‍රීතියෙන් කෑ ගැසුවේය. 'අහා, අම්මා, මගේ ඇස් හොඳයි. මට දැන් හොඳට පේනවා—දුරත් පේනවා, මට දැන් කිසිම වේදනාවක් දැනෙන්නේ නැත!'" ("President Smith Took Him by the Hand," *Friend,* අගෝ. 1973, පි. 36).

- ජෝන් රූතුෆ්ට ලැබුනේ කුමන ආත්මයේ දීමනාවක්ද? (සුවවීමේ ඇදහිල්ල.) ජෝන්ට සුවවීමට උපකාරවූයේ කුමක්ද? (සුවවීමේ දීමනාව ඔහු සෙවූ අතර, ඔහු සුවකිරීමට අනාගත වක්තෘවරයාගේ දීමනාව කෙරෙහි ඔහුට ඇදහිල්ල තිබින.)

---

## අවසානය

**සාක්ෂිය**

ස්වර්ගික පියාණන්වහන්සේ අපට දී තිබෙන ආත්මික දීමනා අප සියලුදෙනාටම තිබෙන බවට සාක්ෂිදරන්න. ඔබට දී තිබෙන දීමනාවලට ඔබගේ කෘතඥතාවය බෙදාගන්න. සුදුසු නම්, ඔබට දෙන ලද ආත්මයේ දීමනාවක් භාවිතාකිරීම ගැන පුද්ගලික අත්දැකීමක් බෙදාගන්න. (නැතිනම් පුද්ගලික අත්දැකීමක් බෙදාගැනීමට වෙනත් යමෙකුට ආරාධනා-කරන්න.) ඔවුන්ට දී තිබෙන ආත්මික දීමනාවන් සොයාගනිමින්ද, භාවිතාකරමින්ද, යහපතකිරීම පිණිස ඔවුන්ගේ හැකියාවන් ගැන හැඟීමට ලමයින්ට උපකාර කරන්න.

**නිවසේදී කියවීමට යෝජිත දේ**

නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් ක්‍රියා 28:1–11 අධ්‍යයනය කිරීමට ලමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනා කරන්න.


# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙනසේක

46
වෙනි පාඩම

**අරමුණ** ගැලවුම්කරුවාණන්ගේ නැවත ඊමේ සලකුණු සමග ළමයින්ව හුරු පුරුදුකිරීමට සහ උන්වහන්සේව මුණගැසීමට ඔවුන්ට සූදානම්වීම පිණිස ඔවුන්ව දිරිගැන්වීමය

**සූදානම්වීම**

1. යෙසායා 63:1–4; මලාකි 4:1; මතෙව් 24:3, 23–51; ක්‍රියා 1:9–11; සහ එළිදරව් 20:4 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න. ඉන්පසු පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරනයකරන්න. (බලන්න, "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi, සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)
2. අමතර කියවීම්: මතෙව් 24:4–22 සහ දහම සහ ගිවිසුම 45:16–75, 88:87–101.
3. ළමයින්ව සහභාගිකරවා ගැනීමට හැකි පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකර ගැනීමට උපකාරවන සාකාච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
4. අවශ්‍ය උපකරණ:
   - අ. බයිබලය මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම පිටපත් ස්වල්පයක්.
   - ආ. අත්තික්කා කොල හතරක්, (පහත සඳහන් නිදර්ශනය බලන්න) පාට කඩදාසි වලින් කපා හෝ හුණුලෑල්ලේ ලියන ලද පහත සඳහන් එක් එක් වචනයක් හෝ වාක්‍ය කණ්ඩයක් එක් එක් කොළවල ලියන්න, *බොරු ක්‍රිස්තුස්ලා, ඉශ්‍රායෙල් එකතුවීම, පාලුවීම, ස්වර්ගික සුදම.*
   - ඇ. කඩදාසියක හෝ හුණුලෑල්ලේ අඳින ලද අත්තික්කා ගසක අතුවල කටුසටහනක්.
   - ඈ. ටේප් පටි හෝ වෙනත් අලවන ජාතියක්.
   - ඉ. 7-3 පින්තූරය, යේසුස්වහන්සේගේ උපත ශුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 200; 62116); 7-25, පින්තූරය, දෙවෙනි ඊම (62562); 7-43, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට නැගීම, (සුභාරංචි චිත්‍ර පිනතූර මෙවලම, 236; 62497); සහ වත්මන් අනාගතවක්තෘවරයාගේ පින්තූරයක්.



**යෝජිත පාඩම් වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

යේසුස්වහන්සේගේ උපත සහ දෙවෙනි ඊමේ පින්තූර පෙන්වන්න.

- මෙම පින්තූර දෙක නියෝජනය කරන්නේ පොළොවේ ඉතිහාසයෙහි කුමන වැදගත් සිද්ධීන්ද?
- බෙත්ලෙමෙහි යේසුස්වහන්සේගේ උපත නිවේදනය කළේ කුමන ලකුණුද? (දේවදූතයන් ගායනාකිරීම, අලුත් තාරකාවක් පෙනීම, අමෙරිකාවෙහි අන්ධකාරයක් නොමැති රාත්‍රියක් යානදිය වේ.)
- යේසුස්වහන්සේ උපදින විට ඔබ බෙත්ලෙහෙමෙහි සිටියා නම් ඔබට කුමක් හැඟෙන්නේද?
- යේසුස්වහන්සේ නැවත පොළොවට පැමිණෙන විට, එක කුමක් මෙන් වන්නේදැයි ඔබ සිතන්නේද?

ගැලවුම්කරුවාණන් නැවත පොළොවට පැමිණෙන විට, "ස්වාමීන්වහන්සේගේ මහා භයානක දවස" වන බව පහදා දෙන්න (මලාකි 4:5). ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිනෙන විට, බොහෝ හාස්කම් වන අතර, උන්වහන්සේ ගැලවුම්කරුවාණන් බව පොළොවේ සියලු ජනයා දැනගනු ඇත. ධර්මිෂ්ඨ අයට ප්‍රීතිදායක අවස්ථාවක් වන්නේය. මක්නිසාද ඔවුහු පොළොවේ ජීවත්වන්නෝය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ රජකම් කරනසේක. සාමය එහි පවතින්නේය. වැරදි දේවල් කිරීමට ඔවුන්ව පරීක්ෂාවට දැමීමට සාතන්ට නොහැකි වන්නේය. යේසුස්වහන්සේ පැමිනෙන විට, අධර්මිෂ්ඨ අය බියවන අතර, දුක්වන්නෝය. මක්නිසාද ඔවුන් පසුතැවිලි නොවූ නිසා, ඔවුන් විනාශවනු ඇත (බලන්න මලාකි 4:1).

ශුද්ධ ලියවිලි විස්තරය

මතෙව් 24:3, 23–51 සඳහන් ගැලවුම්කරුවාණන්ගේ දෙවිනි ඊම ගැන ශුද්ධ ලියවිලි විස්තරය ළමයින්ට උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.)

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලියවිලි ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකර ගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න. ළමයින් සමග පංතියේදී සටහන් කියවීම මගින්, ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් ලබාගැනීමට ඔවුන්ට උපකාර වනවා ඇත.

- උන්වහන්සේ නැවත පැමිණෙන බව එතුමාගේ ගෝලයන්ට යේසුස්වහන්සේ කී විට, උන්වහන්සේගේ නැවත පැමිණීම කුමක් මෙන් විය හැකිදැයි එතුමා විස්තර කළේ කෙසේද? (මතෙව් 16:27; ලූක් 21:27.) පළමු වතාවේ උන්වහන්සේ පොළොවට පැමිණීමාර්ගයට වඩා මෙය වෙනස්වන්නේ කෙසේද?
- උන්වහන්සේගේ මරණයෙන් සහ මලවුන්ගෙන් නැගිටීමට පසු, යේසුස්වහන්සේ නැවත පැමිණෙන බව ගෝලයන් තේරුම්ගත් පසු ඔවුන්ට දැනගැනීමට අවශ්‍යවූයේ කුමක්ද? (මතෙව් 24:3.) දෙවෙනි ඊම ගැන දැනගැනීමට ගෝලයන්ට අවශ්‍යවූයේ කුමක් නිසාද? දෙවෙනි ඊම ගැන අප ඉගෙනගැනීමේ වැදගත්කම කුමක්ද? උන්වහන්සේගේ සභාවේ සාමාජිකයන්ට නැතහොත් තෝරාගත් අයට උන්වහන්සේගේ ඊමට පෙර, ලකුණු හඳුනාගැනීම නිසා ඔවුන් නොරැවටී උන්වහන්සේ මුණගැසීමට සූදානම්වීම යේසුස්වහන්සේට අවශ්‍ය බව පහදා දෙන්න.
- උන්වහන්සේගේ දෙවෙනි ඊම ගැන යේසුස්වහන්සේ අපට ලකුණු දී තිබෙන්නේ කුමක් නිසාද? (මතෙව් 24:31, 33.) උන්වහන්සේගේ දෙවෙනි ඊම අත්තික්කා ගසකට සමාන කළේ කුමක් නිසාද? (මතෙව් 24:32.) (අත්තික්කා ගසෙහි හිස් අතු පෙන්වන්න, නැතිනම් කටු සටහනක් හුණුලෑල්ලේ අඳින්න. සාකච්ඡාවේ ඉතිරි කාලයේදී, සුදුසු අවස්ථාවේදී අත්තික්කා කොළ පෙන්වන්න.)
- බොරු ක්‍රිස්තුවරු නැතහොත් බොරු අනාගතවක්තෘවරු යනු කුමක්ද? (මතෙව් 24:23–24. සත්‍ය ඇති බවට අයිතිවාසිකම් කියමින්, ක්‍රිස්තුස්වහන්සේගේ සභාවෙන් ජනතාව නොමගට යැවීමට උත්සාහ දරන ජනයා සහ ආගම්ය.)
- බොරු ක්‍රිස්තුස්වරුන්ට සහ බොරු අනාගතවක්තෘවරුන්ට කුමක් කිරීමට හැකිද? (මතෙව් 24:24.) තෝරාගත් අයට (ධර්මිෂ්ඨයන්ට) රැවටීමෙන් වැළකී සිටීමට හැකිවන්නේ කෙසේද? (එපීස 4:11–14; 2 තිමොති 3:15–17.)

ජීවමාන අනාගතවක්තෘවරයාට නිතර සවන්දෙමින් රැවටීමෙන් වැළකී සිටීමට අපට කියන දේවල් කරමින්, ඔහුව අනුගමනය කළ යුතු බව අවධාරනය කරන්න. සභාවේ හතරවෙනි සභාපතිවරයාවූ සභාපති විල්ෆෝඩ් වුඩ්රෆ් මෙසේ කීවේය, "මට හෝ සභාවේ සභාපතිවරයා මෙන් නැගී සිටින වෙනත් ඕනෑම මිනිසෙකුට ඔබව නොමගට යැවීමට ස්වාමීන්වහන්සේ කිසිම දිනක අවසර නොදෙනසේක" (බලන්න 1වෙනි නිළ ප්‍රකාශනය—දහම සහ ගිවිසුම).

- උන්වහන්සේ පමිණිවිට, සත්‍යවූ ක්‍රිස්තුස්වහන්සේදැයි අප දැනගන්නේ කෙසේද? උන්වහන්සේ පැමිණෙන්නේ කෙසේද? (යෙසායා 63:1–4; මතෙව් 24:26–27; 26:64; ක්‍රියා 1:9–11.)
- ඉශ්‍රායෙල් එක්රැස්කිරීම යනු කුමක්ද? (යෙරමියා 32:37; 1 නිෆායි 10:14.) ධර්මිෂ්ඨයන්ව සභාවට එක්රැස්කිරීම පිණිස ධර්මදූතයන් උපකාරකරන්නේ කෙසේද? (මතෙව් 24:14.) ඉශ්‍රායෙල් යයි නම්කරන දෙවියන්වහන්සේගේ තෝරාගත් ජනතාව ලොව පුරා ජීවත්වන බව පහදා දෙන්න. යේසුස්වහන්සේ නැවත පැමිනෙන්ට පෙර, ශුභාරංචිය ඉගැන්වීමට ධර්මදූතයන් ලොව පුරා යනු ඇත. සත්‍යය පිළිගෙන බව්තීස්මවන අය සයෝනයේ ස්ටේකයට එක්රැස්වන්නෝය. අපේ කොට්ඨාශයේ (හෝ ශාඛාවේ) සාමාජිකයන් දූතමෙහෙයන්හි සේවය කරන්නේ කුමන රටවලද?
- *පාළුකරය* යන්නෙහි අදහස කුමක්ද? (විනාශය, ආපදාව, ව්‍යසනය, දුක) උන්වහන්සේ පැමිනෙන්ට පෙර සිදුවේයයි යේසුස්වහන්සේ කියා තිබෙන විනාශය කුමක්ද? (මතෙව් 24:6–7, 12,.) කුමන විනාශයක් ගැන ඔබ දැක හෝ අසා තිබේද?
- දෙවෙනි ඊමට පෙර ක්ෂණයකින්ම දකින්ට ලැබෙන ස්වර්ගික පුදුම මොනවාද? (මතෙව් 24:29.)
- යේසුස්වහන්සේ නැවත පැමිණෙන විට, පොලොව පවිත්‍රවන්නේ කෙසේද? (මලාකි 4:1.) යේසූවහන්සේ පොලොවේ රජෙකු මෙන් පාලනය කරන්නේ කොපමණ කාලයක්ද? (එළිදරව් 20:4.)

සභාවේ දෙවනි සභාපතිවරයාවූ සභාපති බ්‍රිගම් යන්ගේ පහත සඳහන් උපුටාගැනීම සාකච්ඡා කරන්න:

"එතුමා [යේසුස්වහන්සේ] පොලොවෙන් පාපය සහ එහි භයානක ප්‍රතිඵල පහකරන අතර, සෑම ඇසකින්ම කඳුළු පිසදැමීමද, දෙවියන්වහන්සේගේ ශුද්ධවූ සියලු කඳු මත පීඩා හෝ විනාශ කිසිවක් ඇති නොවන්නේය" (*Journal of Discourses තුලින්,* 11:124).

- දෙවෙනි ඊම සිදුවන්නේ කවදද? (මතෙව් 24:36, 42.) යේසූවහන්සේගේ පැමිණීමට අප සූදානම්විය යුත්තේ කුමක් නිසාද? අපට සූදානම් විය හැක්කේ කෙසේද? (මතෙව් 24:42–44.) යේසුස්වහන්සේ පැමිණිවිට, සූදානම් නොවූ අයට කුමක් සිදුවන්නේද? (මතෙව් 24:48–51.)

යේසුස්වහන්සේ තම පැමිණීම ගැන අපට ලකුණු දී තිබෙන බැවින්, එය ලඟාවීම අප හඳුනාගෙන සූදානම්වීම ගැන අවධාරනය කරමින් සාරාංශගත කරන්න. අප සූදානම්ව සිටී නම්, බිය නොවිය යුතු යයි ස්වාමීන්වහන්සේ කී බව පහදා දෙන්න. (බලන්න ධීසහගි 38:30.)

සභාවේ දහතුන්වෙනි සභාපතිවරයාවූ සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් උපුටාගැනීම කියවන්න:

"මෙම ලකුණු සහ පුදුමයන් ඉෂ්ටවන කාලයක අප ජීවත්වන බව අපි අවධාරනය කරන්නෙමුද? මෙම අනාවැකි බොහොමයක් ඉටුවීම දකින අය අතර අපිද වන්නෙමු. . . . උන්වහන්සේගේ පැමිණීමේ දවස සහ පැය අප නොදන්නා නමුත්, මෙය ගැන අපට ස්ථිර හැඟීමක් ඇත: එනම් ස්වාමීන් වහන්සේගේ මහත්වූ දිනයට අප අසන්නව සිටින බවය!" (*The Teachings of Ezra Taft Benson*, පි. 20).

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් බාවිතාකිරීමට ඔබට හැකිය.

1. පහත සඳහන් ප්‍රකාශනයේ පිටපතක් එක් එක් ළමයෙකු සඳහා සාදනන. ප්‍රකාශනය බෙදාදී පංති සමාජිකයන්ට පැන්සලය බැගින් දෙන්න. පළවෙනි තීරුවේ වාක්‍ය කණ්ඩයේ සිට දෙවෙනි තීරුවේ නිවැරදි අවසානයට ඉරක් අඳිමින් ප්‍රකාශනයේ අවසානය ප්‍රකාශනයේ පටන්ගැන්ම සමග සමානකිරීමට ඔවුන්ට සලස්වන්න. ඔවුන් නොදන්නා ප්‍රකාශනයට සටහන් බැලීමට ළමයින්ට සැලැස්වීම සඳහා ඔබට අවශ්‍ය වෙනවා ඇත.

දෙවෙනි ඊම

| | |
|---|---|
| ස්වර්ගික පියාණන්වහන්සේ පමණක් දන්නාසේක | ඉරට වඩා දීප්තිමත්ව පෙනෙනු ඇත (ඩීසහගී 133:49). |
| යේසුස්වහන්සේ පැළඳ සිටිනු ඇත | ස්වර්ගයෙන් එනවා ඇත (ක්‍රියා 1:11). |
| බොරු ක්‍රිස්තුවරුන් | ධර්මිෂ්ඨයන්ට ප්‍රීතිමත් දිනයක් වන්නේය (මලාකි 4:5). |
| යේසුස්වහන්සේ පැමිණෙනසේක | රක්තවර්ණ වස්ත්‍රයෙන් (යෙසායා 63:1–3). |
| දෙවෙනි ඊම වනාහි | ලොව මුළුල්ලේම (මතෙව් 24:14). |
| දුෂ්ඨයන්ව | බොහෝ දෙනා මුලාකරනු ලබන්නේය (මතෙව් 24:24). |
| යේසුස්වහන්සේ එන විට උන්වහන්සේ | අඳුරුවන්නේය (යොවෙල් 2:10, 31). |
| ධර්මදූතයෝ ශුභාරංචිය දේශනා කරන්නෝය | යේසුස්වහන්සේ පැමිණෙන දවස සහ පැය (මතෙව් 24:36). |
| පාළුව නම් | විනාශකරනු ලැබේ (මලාකි 4:1). |
| ඉර | යුද්ධ, සාගත, වසංගත සහ පොලෝ කම්පා (මතෙව් 24:6–7). |

2. දෙවෙනි ඊම පිණිස ඔවුන් කෙතරම් හොඳින් සූදානම් වන්නේදැයි ලමයින්ට දැනගැනීමට උපකාරවීමට පහත සඳහන් හෝ එයට සමාන ප්‍රශ්න අසන්න. එම අංශයෙන් ඔවුන් කොපමණ හොඳට සූදානම් වී ඇත්දැයි සිතීමට කාලය දීම පිණිස එක් එක් ප්‍රශ්නයකට පසු නවත්වන්න. ශබ්දනගා පිළිතුරු දීමට ලමයින්ට නොකියන්න.

   ගැලවුම්කරුවාණන් මගේ නිවසට පැමිණියා නම් මට මේවා අවශ්‍යද:

   මා භාවිතාකරන සමහර වචන වෙනස්කිරීමට?
   සමහර සඟරා, පොත් හෝ වීඩියෝ පටි සැඟවීමට?
   රූපවාහිනී නාලිකා වෙනස්කිරීම හෝ රූපවාහිනීය නැවැත්වීමට?
   මා අසා සිටින සංගීතය නැවැත්වීමට?
   වඩා සදාචාරාත්මක ඒවාට මගේ ඇඳුම් වෙනස්කිරීමට?
   මා යන සෑම තැනකටම උන්වහන්සේ එක්ක යෑම?
   මගේ මිතුරන් සමග සිටින විට උන්වහන්සේව සම්බන්ධකරගැනීම?
   මා දැන් කරනවාට වැඩියෙන් ශුද්ධ ලියවිලි කියවීමට?
   මා සාමාන්‍යයෙන් කරනවාට වඩා වෙනස් අන්දමට මගේ පවුලට සැලකීම?

3. දහවෙනි ඇදහිල්ලේ කරුණ නැවත බලා ලමුන් සමග කඩපාඩම් කරන්න. මෙම ඇදහිල්ලේ කරුණේ සඳහන් සිද්ධීන් උනන්දුශීලී දේවල් වන අතර, යේසුස්වහන්සේගේ නැවත පැමිණීම කෙරෙහි ඉදිරියට බලා සිටීමට අපට හැකිවන බව පහදා දෙන්න.

4. ලෝකයේ දැනට සිදුවන විනාශය ගැන සඳහන් විස්තර තිබෙන ප්‍රවෘත්ති පත්‍ර හෝ සඟරා ගෙනැවිත් ලමයින්ට පෙන්වන්න.

5. 25වෙනි පඩමේ සඳහන් කන්‍යාවන් දසදෙනාගේ උපමා කථාව නැවත බලමින්, දෙවෙනි ඊම සඳහා සූදානම්වීමට මෙම උපමා කථාව අපට උගන්වන දේවල් ගැන සාකච්ඡා කරන්න.

6. දෙවෙනි ඊමට ඔවුන්ට සූදානම්වීමට හැකි එක් මාර්ගයක් තේරුම්ගැනීමට ලමුන්ට උපකාරවීම සඳහා එස්රා ටැෆ්. බෙන්සන්ගේ පහත සඳහන් උපුටාගැනීම සාකච්ඡා කරන්න.

   "දෙවෙනි ඊමට සූදානමවීම ගැන නිදර්ශනයක් මෝර්මන්ගේ පොතෙන් අපට සොයාගැනීමට හැකිය. අමෙරිකාවට ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමට අවුරුදු විසි ගණනකට පෙර, සිදුවූ දේවල් කෙරෙහි පොතෙහි වැඩි කොටසක් යොමුවෙයි. උන්වහන්සේගේ පැමිණීමට පෙර භයානක විනිශ්වයේදී සමහර අය විනාශවීමටද, අනෙක් අය බවුන්ටිෆුල් දේවමාළිගාවේ සිටගෙන උන්වහන්සේගේ අත්වල සහ පාදවල තුවාලවලට ඔවුන් අත්දැමීම ගැන එම කාලපරිච්ඡේදය සැලකිලිමත්ව අධ්‍යයනය කිරීමෙන් අපට තීරණයකර ගැනීමට හැකිවේ" (*The Teachings of Ezra Taft Benson*, පිටු. 58–59).

ඊළඟ වර්ෂයේ අධ්‍යයන පාඨමාලාව මෝර්මන්ගේ පොත බව පහදා දෙන්න. ගැලවුම්කරුවාණන්ගේ දෙවෙනි ඊම පිණිස ආත්මිකව සූදානම්වීමට අප කළ යුතු දේවල් ඉගෙනගැනීම පිණිසෙ මෙය අගනා අවස්ථාවක් වෙනවා ඇත.

---

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | පණත්වලට කීකරුව ධර්මිෂ්ට ජීවිතයක් ගතකරන අයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම ප්‍රීතියෙන් සහ සතුටින් බලාසිටීමට හැකිවන බවට සාක්ෂි දරන්න. මෙම මහිමවත් සිද්ධිය උදෙසා ආත්මිකව සූදානම්වීම පිණිස යේසුස්වහන්සේගේ දෙවෙනි ඊමේ සලකුණු ගැන සදහටම සැලකිලිමත්ව සිටීමට ළමුන්ව දිරිගන්වන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් මතෙව් 24:42–51 අධ්‍යයනය කිරීමට ළමුන්ට යෝජනා කරන්න.<br>අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. |

47
වෙනි පාඩම

# අපගේ ජීවිත උදෙසා ආශිර්වාද කිරීමට පූජකවරයට හැකිය (පූජකවර සූදානමේ පාඩම)

**අරමුණ**

පූජකවරයේ ආශිර්වාද සහ වගකීම් තේරුම්ගැනීමට අවුරුදු 11ක් වයසැති ළමයින්ට උපකාරකිරීම පිණිස මෙම පාඩම ලියනලදී. ඔබගේ පංතියේ පළවෙනි ළමයාට අවුරුදු 12ක් වීමට පෙර මෙම පාඩම ඉගැන්විය යුතුය.

**සූදානම්වීම**

1. මෝර්මන්ගේ පොතේ හැඳින්වීමේ සඳහන් "අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ගේ සාක්ෂිය" හෝ ජෝසප් ස්මිත්—ඉතිහාසය 1:29–54, 59, 66–72; දහම සහ ගිවිසුම 13, කොටසෙහි මාතෘකාව ඇතුලත්ව, දහම සහ ගිවිසුම 121:34–46. යාච්ඤාවෙන් අධ්‍යයනයකරන්න.
2. පාඩම අධ්‍යයනයකර, ශුද්ධ ලියවිලි විස්තර ළමයින්ට ඉගැන්වීමට ඔබට අවශ්‍ය අන්දම ගැන තීරණයකරන්න. (බලන්න "ඔබගේ පාඩම සූදානම්කිරීම," පි. 00 vi සහ "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii). පාඩමේ අරමුණ ඉතාම හොඳට ඉටුකරගැනීම උපකාරවන සාකච්ඡා ප්‍රශ්න සහ සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් තෝරාගන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. මෝර්මන්ගේ පොතක් එක් එක් ළමයා සඳහා.
   ආ. දහම සහ ගිවිසුමක්
   ඇ. විදුලි පන්දමක්, විදුලි බුබුලක් හෝ ලන්තෑරුමක් වැනි ආලෝකය ගෙන දෙන දෙයක්
   ඈ. පින්තූර 7-1, ක්‍රිස්තුස් නම්වූ යේසුස් (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 240; 62572); යොහාන් බව්තීස්ත ආරෝනික පූජකවරය ප්‍රදානයකිරීම, (සුභාරංචි චිත්‍ර පින්තූර මෙවලම 407; 62013); සහ පූජකවරයට නියමකිරීම (62341).

**යෝජිත පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ක්‍රියාකාරීත්වයට යොමුවීම

ආලෝකය ගෙනදෙන උපකරණයක් පෙන්වන්න.

- ඇඟ ආලෝකය සෑදීමට මෙම උපකරණයට අවශ්‍යවන්නේ කුමක්ද? ඔබට විදුලි පන්දමක් තිබෙනවා නම්, සියල්ල හරියාකාරව ක්‍රියාකරමින් ආලෝකය දීමට එයට බැටරි එලිය බල්බයක් හා ස්විච් එකක් අවශ්‍ය බව පෙන්වන්න. එලිය දෙන බල්බයට හොඳ ෆිලමන්ට් එකක් අවශ්‍යවන අතර, බලය නිපදවන මූලාශ්‍රය ඇණයක් මෙන් තව්වකට සම්බන්ධකළ යුතු වේ. විදුලි බලය ගලා ඒමට ස්විච් එකද ක්‍රියාත්මක කිරීම අවශ්‍යවේ.

  ඔබගේ පංතියේ ළමයින්ට නැගිට සිටීමට කියන්න. පිරිමි ළමයින්ට පූජකවරය ලැබීමට හැකියාව තිබේ. විදුලි බලයට වඩා වැඩි බලයක් එයට ඇත. මක්නිසාද දෙවියන්වහන්සේගේ නාමයෙන් ක්‍රියාකිරීමට එය බලය සහ අධිකාරී බලයවේ. මෙම බලය මගින් ස්වර්ගික පියාණන්වහන්සේගේ ළමයින්ට බව්තීස්ම කිරීමට සහ සභාවේ වෙනත් නියෝග ලැබීමට හැකියාව තිබේ. නමුත් දෙවියන් වහන්සේ අදහස්කරන පරිදි මෙම බලය ලබාගෙන භාවිතාකිරීමට පිරිමි ළමයි සුදුසුකම් ලබා නිසියාකාරව සූදානම්විය යුතුය.

ශුද්ධ ලියවිලි විස්තරය

අනාගතවක්තෘ "ජෝසප් ස්මිත්ගේ සාක්ෂිය" හෝ ජෝසප් ස්මිත්—ඉතිහාසය 1:29–54, 59, 66–72 සඳහන් ජෝසප් ස්මිත් රත්තරන් තහඩු ලබාගැනීම සහ ආරෝනික පූජකවරයට නියමකිරීමේ විස්තරය සුදුසු අවස්ථාවලදී පින්තූර භාවිතාකරමින් උගන්වන්න. (ශුද්ධ ලියවිලි විස්තර ඉගැන්වීමේ යෝජිත ක්‍රම සඳහා බලන්න, "ශුද්ධ ලියවිලිවලින් ඉගැන්වීම," පි. 00 vii.) ජෝසප් ස්මිත්ට රත්තරන් තහඩු ලබාගැනීමට මගපෙන්වීමේ සිද්ධිය ළමයින් සමග ඔබට නැවත බැලීමට අවශ්‍යවනවා ඇත.

සාකච්ඡා සහ අදාළකිරීමේ ප්‍රශ්න

ඔබ ඔබගේ පාඩම සූදානම්කරන විට, පහත සඳහන් ප්‍රශ්න සහ ශුද්ධ ලියවිලි සටහන් අධ්‍යයනය කරන්න. ළමයින්ට ශුද්ධ ලයවිලි සටහන් ඉතාම හොඳට තේරුම්ගැනීමටද, එම මූලධර්ම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගැනීමට උපකාරවනු ඇතැයි ඔබට හැඟෙන ප්‍රශ්න තෝරාගන්න, පංතියේදී ළමයින් සමග ශුද්ධ ලියවිලි කියවීම සහ සාකච්ඡාකිරීම ඔවුන්ට පුද්ගලික දැනුමක් ලබාගැනීමට උපකාරවනවා ඇත.

- පළමු දර්ශනයෙන් පසු, වහාම රත්තරන් තහඩු පරිවර්තනය කිරීමට පූජකවරය ලැබීමට සහ සභාව සංවිධානය කිරීමට ජෝසෆ් ස්මිත්ට නොහැකි වූයේ කුමක් නිසාද? (ඔහු සූදානම් වී නැත; ප්‍රඥාවෙන් සහ ඥානයෙන් වැඩීමට ඔහුට අවශ්‍ය විය.)
- ජෝසෆ් ස්මිත්ට කිරීමට ස්වාමීන්වහන්සේ කියන ලද පළමුවන ප්‍රධාන කාර්යය කුමක්ද? (මෝර්මන්ගේ පොත ලබාගැනීම පිණිස රත්තරන් තහඩු පරිවර්තනය කිරීමටය.)
- මොරෝනායි දේවදූතයා පළමුවෙන්ම ඔහුට ප්‍රකාශවන රාත්‍රියේදී ජෝසෆ් ස්මිත් කුමක් කරමින් සිටියේද? (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:29–30.) ජෝසෆ් රත්තරන් තහඩු පළමු වතාවට දැකීමට පෙර මොරෝනායි කී වතාවක් ජෝසෆ් ස්මිත්ට ප්‍රකාශ වූයේද? (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:30, 44–49; හතර වතාවක්.) තවත් තුන් වතාවක්ම මොරෝනි ඔහුගේ පණිවුඩය නැවත නැවතත් කීවේ ඔබ සිතන අන්දමට කුමක් නිසාද?
- රත්තරන් තහඩු පරිවර්තනය කිරීමට පටන්ගැනීමට පෙර ජෝසෆ්ට ලැබුනු වෙනත් උපදෙස් මොනවාද? (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:53–54.) ඔහුට කිරීමට තිබුන වෙනත් ශ්‍රේෂ්ඨ දේවල් කිරීම පිණිස ජෝසෆ් ස්මිත්ට සූදානම්වීම පිණිස මෙම උපදෙස් උපකාරවූයේ කෙසේද? ඔබගේ අනාගතය උදෙසා සූදානම්වීමට ඔබ කරන්නේ කුමක්ද?
- පසු-දවස්වල ශුද්ධවන්ත බොහෝ මිනිසුන් අවුරුදු දොළහ වන විට, ඔවුන් වෙත ගනු ලබන විශේෂ වගකීම් මොනවාද? (ආරෝනික පූජකවරය ඔවුන් ලබමින් උපස්ථායකයන් වශයෙන් නියම කරනු ලබයි.)
- ජෝසෆ් ස්මිත් ආරෝනික පූජකවරය ලැබුවේ කෙසේද? (ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:68–70.) අද තරුණ මිනිසෙකු ආරෝනික පූජකවරය ලබන්නේ කෙසේද? (සුදුසුකම සඳහා ඔහුව සම්මුඛ පරීක්ෂනයකට භාජනය කිරීමෙන් අනතුරුව, ඔහුව නියමකිරීමට අධිකාරීබලය ඇති මිනිසෙකු මගින් අත් තබා ඔහුව නියමකරනු ලැබේ.)
- පූජකවරය ලබාගැනීමට පිරිමි ළමයි ඔවුන්වම සූදානම් විය යුත්තේ කෙසේද? පූජකවරයේ ආශිර්වාද ලබාගැනීමට ගැහැණු ළමයි ඔවුන්වම සූදානම් විය යුත්තේ කෙසේද? (පිරිමි ළමයි සහ ගැහැණු ළමයි ඒ ආකාරයෙන්ම සූදානම්වනු ලැබේ. ඔවුන් යාච්ඤාකරමින්, ඇදහිල්ලෙන් යුතුව, දෙමාපියන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ශුභාරංචිය ඉගෙනගනිමින්, සුදුසු ආකාරයෙන් ජීවත්වෙමින්, පනත්වලට කීකරුකමින්, අන්‍යයන්ට සේවය කරමින්, එකිනෙකාට ගෞරවය දක්වමින් අවංක වීමෙන්ය.) (සාරවත්කිරීමේ 4වෙනි ක්‍රියාකාරකම බලන්න.)
- සභාව තුල උපස්ථායකයින්ට තිබෙන වගකීම් මොනවාද? (ධ්‍යසහයී 20:59.) මෙම වගකීම් ඔවුන් ඉටුකරන්නේ කෙසේද? (සක්‍රමේන්තුව බෙදාදීම, නිරාහාර පිදුම් එකතුකිරීම, සක්‍රමේන-තු රැස්වීමේදී සබානායකයාට පණිවුඩකරුවෙකු මෙන් ක්‍රියාකිරීම, සහ යහපත් ආදර්ශය තැබීමෙන්ය.)
- සක්‍රමේන්තුව බෙදාදීමේ පළමුවන පුද්ගලයා කවුද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.) සක්‍රමේන්තුව එතරම් පූජනීයවන්නේ මන්ද? (අප එක් එක්කෙනා වෙනුවෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කළ පූජාව නියෝජනයකරන නියෝගයකි එය.)

  වැඩිහිටි ජෙෆ්රි ආර්. හොලන්ඩ්ගේ පහත සඳහන් උපුටාගැනීම කියවන්න, නැතිනම් පංති සාමාජිකයෙකු ලවා කියවන්න: “සුදුසු ආකාරයෙන් සහ ගෞරවයෙන් ගැලවුම්කරුවාණන්ගේ පූජාවේ සංකේතයන්ට ආශිර්වාද කිරීමට සහ බෙදාදීමට සූදානම් වන පිණිස ආරෝනික පූජකවරයේ තරුණ මිනිසුන්ගෙන් අපි ඉල්ලමු. විශේෂයෙන් මෙවැනි තරුණ වයසේදී දී තිබෙන පූජනීය විශ්වාසය කෙතරම් විශිෂ්ඨ වරප්‍රසාදයක්ද! ස්වර්ගයෙන් ඔබට ලැබෙන වෙනත් අගයකිරීමක් ගැන මට සිතීමට නොහැකිය. අපි ඔබට ප්‍රේම කරන්නෙමු. ස්වාමීන්වහන්සේගේ රාත්‍රී භෝජනය වන සක්‍රමේන්තුවට ඔබ සහභාගිවන විට, ඉතාම හොඳට ජීවත්වෙන්න, ඉතාම හොඳ පෙනුමකින් සිටින්න” (Conference Report තුලිනි, ඔක්තෝ. 1995, පි. 89; හෝ *Ensign*, නොවැ. 1995, ප. 68).

- පූජකවරයට ගෞරවකරමින් සහ අනුමතකිරීමට අප සියලුදෙනාටම හැකිවන්නේ කෙසේද? (පූජකවර නායකයන් දෙන කැඳවීම් පිළිගැනීම; අන්‍යයන්ට සේවයකිරීම; සභා නායකයන් ගැන ගෞරවයෙන් කථාකිරීම; පියවරුන්ට, සහෝදරයන්ට, පවුලේ සාමාජිකයන්ට, සහ පූජකවරය උසුලන අනෙක් අය වෙනුවෙන් යාච්ඤාකිරීම.)

(සාරවත්කිරීමේ 3වෙනි ක්‍රියාකාරකම බලන්න.) ඔබ මේවා කිරීමෙන් ඔබගේ පියා හෝ සහෝදරයාට ඔවුන්ගේ පූජකවරයට ගරුකිරීම පිණිස උපකාරවන්නේ කෙසේද? පූජකවරය ලැබීමට හෝ පූජකවරයේ ආශිර්වාද ඔබට ලබාගැනීමට සූදානම්වීම පිණිස ඔවුන් ඔබට උපකාරවන්නේ කෙසේද?

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම් එකක් හෝ එයට වැඩියෙන් වුවත් පාඩමේ ඕනෑම අවස්ථාවක හෝ නැවත බැලීමක් වශයෙන්, සාරාංශයක් හෝ අභියෝගයක් මෙන් ඔබට භාවිතාකිරීමට හැකිය.

1. පූජකවරය මගින් පැමිණෙන පහත සඳහන් ආශිර්වාද වෙන වෙනම කාඩ්පතක හෝ කඩදාසි කැලිවල ලියන්න:

   නමක් සහ ආශිර්වාදයක් ලැබීම
   බව්තීස්මවීම
   ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව ලැබීම
   අසනීපවූ විට ආශිර්වාදයක් ලැබීම
   සක්‍රමේන්තුවට සහභාගිවීම
   දූතමෙහෙයක සේවයකිරීම
   දේවමාළිගාවේ විවාහවීම

   පංතිය කණ්ඩායම්වලට බෙදා, එක් එක් කණ්ඩායමකට එක් කාඩ්පත බැගින් දෙන්න. ඔවුන්ගේ කාඩ්පතෙහි ලියා තිබෙන ආශිර්වාදයට සම්බන්ධ සුදුසු පුද්ගලික හෝ පවුලේ අත්දැකීමක් බෙදාගැනීමට එක් එක් කණ්ඩායමේ ළමයින්ට ආරාධනාකරන්න.

2. කාමරය හැකි තරම් අන්ධකාර කරන්න. ගැඹුරු, අඳුරු ගුහාවකට ගිය සංචාරකයන් කණ්ඩායමක කථාව ළමයින්ට කියන්න. ගුහාව ඇතුලේදී මාර්ගෝපදේශකයා වරක් ආලෝකය නවත්වා මිනිත්තු ස්වල්පයක් සිට, පිටවීමේ දිසාවට යොමුවීමට එක් එක් පුද්ගලයෙකුට කීවේය. ආලෝකය නැවත පැමිණිවිට, නොයෙක් දිශාවලට ජනයා යොමුවී සිටියහ.

   නැවත ඔබගේ පංති කාමරය ආලෝකවත්කර, වැඩිහිටි රොබට් ඩී. හේල්ස්ගේ පහත සඳහන් උපුටාගැනීම බෙදාගන්න: "පූජකවරයේ බලය පොලොවෙහි නොතිබුනා නම්, කිසිම පාලනයක් නැතිව විරුද්ධවාදියා ඔහුට අවශ්‍ය අන්දමට ආණ්ඩුකිරීමට නිදහස ලබනවා ඇත. අපට මගපෙන්වීම, ඉගැන්වීමට හා දැනුවත්කිරීම පිණිස, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව එහි නොතිබෙනවා ඇත; ස්වාමීන්වහන්සේගේ නාමයෙන් කථාකිරීමට අනාගතවක්තෘවරයෙකු නොසිටිනවා ඇත; පූජනීය සදාකාලික ගිවිසුම් තැබීමට අපට දේවමාළිගා නොතිබෙනු ඇත; ආශිර්වාද කිරීමට හෝ බව්තීස්මකිරීමට, සුවකිරීමට හෝ සැනසීමට අධිකාරී බලය නොතිබෙනු ඇත. . . .ආලෝකයක් නොමැතිවන්නේය, බලාපොරොත්තුවක් නොතිබෙනු ඇත—අන්ධකාරය පමණක් පවතිනවා ඇත" (Conference Report තුලිනි, ඔක්තෝ. 1995, පි. 40; හෝ *Ensign*, නොවැ. 1995, පි. 32).

3. පූජකවර කැඳවීමේදී තම පියාට සහයදීම පිණිස එක් පවුලක් කළ දේවල් ගැන පහත සඳහන් කථාව කියවන්න;

   "[අවුරුදු ගණනකට පෙර, ප්‍රධාන සම්මන්ත්‍රනයේ] එක්කෙනෙකු මගේ විදුහලේ මගේ කාමරයේ සහායකයෙකුවූ එස්රා ටැෆ්. බෙන්සන්ගේ ළමයි හත්දෙනා සමග මම වාඩිවී සිටියෙමි. සභාපති මැකේ නැගිට ඊලඟ කථිකයා ගැන නිවේදනය කළ විට, මගේ උනන්දුව ප්‍රබල විය. තවම මට මූණ නොගැසුන වැඩිහිටි බෙන්සන් වෙතට ඇවිදගෙන එන විට මම ගෞරවයෙන් බලා සිටියෙමි. අඩි හයකටත් වඩා උස ඔහු විශාල මිනිසෙකි. ආචාර උපාධියක් සහිත ඔහු එක්සත් ජනපදයේ කෘෂිකර්ම ලේකම්වරයා සහ ස්වාමීන්වහන්සේගේ විශේෂ සාක්ෂිකරුවෙකු වශයෙන් ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් උසුලන ඔහු, ශාන්ත ස්ථිර පුද්ගලයෙක් වන අතර, ලොව පුරා සභාවලට කථාකල කෙනෙකි. එකෙනෙහිම කෙනෙක් මගේ අත ඇල්ලුවේය. කුඩා ගැහැණු ළමයෙක් මා වෙතට නැඹුරුවී, හදිසියකින් මෙන්, මෙසේ කෙඳුරුවාය, 'තාත්තට යාච්ඤාකරන්න.'

   "මම ටිකක් පුදුමවී මෙසේ සිතුවෙමි, 'මෙම පණිවුඩය පේළියේ පහළට යැවිය යුතුවේ. මා එය යවන්ට ඕනෑය, මා මෙසේ කියන්නද, 'වැඩිහිටි බෙන්සන්ට යාච්ඤාකරන්න'? මෙසේ කියන්නද, "ඔබගේ පියා වෙනුවෙන් යාච්ඤාකිරීම ඔබෙන් බලාපොරොත්තුවේ"?' වහාම ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාවය දැන මම නැඹුරුවී සරලව මෙසේ කීවෙමි, 'තාත්තා වෙනුවෙන් යාච්ඤාකරන්න

"හිස නමාගෙන වාඩිවී සිටින බෙන්සන් සොහොයුරිය වෙතට පේළිය දිගේ එම කෙඳිරීම යනවා මම බලාසිටියෙමි.

"එදින පටන් බොහෝ අවස්ථාවල එම පණිවුඩය මට සිහිවිය—නිවසේ ආදි පීතෘ පියා වෙනුවෙන් යාච්ඤාකරන්න, දිස්ත්‍රික් සභාපති හෝ නිවාස ගුරුවරයෙකු වශයෙන් ඔහු සේවයකරන විට, ඔහුට යාච්ඤාකරන්න. සමාජ කණ්ඩායමක විධායක ලේකම්වූ විටද, ව්‍යාපාරය සමෘද්ධිමත්වන විට, හෝ අඩු පඩියක් ගැනීමට සිදුවූ විට, ඔහු වෙනුවෙන් යාච්ඤාකරන්න. පවුල් නිවාස සැන්දෑවේ ඔහු උපදෙස් දෙන විට යාච්ඤාකරන්න. ජෙරෝල්ට දූතමෙහෙයකට යාමටද, ඩයනාට විදුහලට යාමට හැකි වන පිණිසද, පැය ගණනක් වැඩකරන පියා වෙනුවෙන් යාච්ඤාකරන්න. සක්‍රමේන්තු රැස්වීමේදී කථාකරන විට හෝ මවට නැවත සුවවීමට ආශිර්වාදයක් දෙන විට, ඔහු වෙනුවෙන් යාච්ඤාකරන්න. සැන්දෑවෙහි මහත්සිවී හෝ අධෛර්යවී නිවසට පැමිණෙන විට ඔහු වෙනුවෙන් යාච්ඤාකරන්න. කුඩා හෝ මහත් දේවල් මොනවා වුවත්, සියල්ලෙහිදී—පියා වෙනුවෙන් යාච්ඤාකරන්න.

"වසර ගෙවී යන විට මහා සම්මන්ත්‍රන බොහොමයක් තිබෙන්ට ඇත. සභාපති බෙන්සන් කථාකිරීමට නැගී සිටින විට එක් එක් අවස්ථාවකදීම, මම මෙසේ සිතුවෙමි, 'මහාද්වීපයේ සෑමතැනම විසිරී සිටින ඔහුගේ ළමයි ඔවුන්ගේ පියා වෙනුවෙන් දැන් යාච්ඤාවෙන් එකමුතුව සිටිති.'

"අවුරුදු [ගණනාවකට] පෙර පේළිය දිගේ පහළට ගිය එම කෙටි පණිවුඩය පවුල්වලට බෙදාගැනීමට හැකි ඉතා වැදගත් පණිවුඩය බව මම විශ්වාසකරමි. 'තාත්තා වෙනුවෙන් යාච්ඤා කරන්න' යන්න ලෝකයේ කොතැනක හෝ තම දුවෙකු හෝ පුතෙකු කොඳුරනවා නම්, ඕනෑම මිනිසෙකුට තම එදිනෙදා අභියෝගවලට මුහුණදීමට මොනතරම් ශ්‍රේෂ්ඨ බලයක් සහ ඇදහීමක් ඇතිවෙනවා ඇත්ද" (Elaine McKay, "Pray for Dad," *New Era,* ජූන 1975, පි. 33)

4. පූජකවරයේ වගකීම් භාරගැනීමටත්, ආශිර්වාද භුක්තිවිඳීමටත්, ශුභාරංචිය අනුව අපි ජීවත්වෙන විට, අපව සූදානම්කරනු ලබයි. "මගේ ශුභාරංචි ප්‍රමිතිය" (*මගේ අදහස් ඉටුකරගැනීමේ දින* [35317], යන පොත් පිංචේ පිටුපස කවරය කියවන්න. එම ප්‍රමිතියට සුදුසු අකාරයෙන් ඔවුන් ජීවත්වන අන්දම ගැන ලමුන්ට සිතීමට එකින් එක නවතිමින් කියවන්න. ලැයිස්තුව ඔබ කියවා නිම කළාට පසු, නිරූපන භාවිතාකිරීම, ප්‍රධාන වචන හෝ අංග චලනය මගින් එය නිරීක්ෂනය කිරීමට ඔබට අවශ්‍යවනවා ඇත.

   මගේ ශුභාරංචි ප්‍රමිතීන්

   1. මම මගේ බව්තීස්ම ගිවිසුම් මතකතබා ගනිමින් ශුද්ධාත්මයාණන් වහන්සේට සවන්දෙමි.
   2. ස්වර්ගික පියාණන්වහන්සේද, අන්‍යයන් සමග සහ මා ගැනද මම අවංකවෙමි.
   3. මම යහපත් මිතුරන් සොයමින්, අන්න්‍යයන්ටද කරුණාවෙන් සලකමි.
   4. ස්වර්ගික පියාණන්වහන්සේට සහ මා හටද ගෞරවය දක්වන ආකාරයට විනීත අන්දමට ඇඳුම් අඳිමි.
   5. ස්වර්ගික පියාණන්වහන්සේට ප්‍රසන්න දේවල් පමණක් මම කියවන අතර බලන්නෙමි.
   6. ස්වර්ගික පියාණන්වහන්සේට ප්‍රසන්න සංගීතයට පමණක් මම සවන්දෙමි.
   7. ස්වර්ගික පියාණන්වහන්සේගේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය ගෞරවාර්ථයෙන් මම භාවිතාකරමි. මම නොදිවුරන අතර අසභ්‍ය වචන භාවිතා නොකරමි.
   8. මගේ මනස සහ ශරීරය පූජනීයත්වයෙන් සහ පවිත්‍රව මම තබාගනිමි.
   9. අහිතකර කිසිවක් මම ශරීරයට නොගනිමි.
   10. ස්වාමීන්වහන්සේට සමීපවීමේ හැඟීම් ඇතිවීමට උපකාරවන දේවල් සබත් දිනයේ මම කරමි.
   11. මම හරි දෙය තෝරාගනිමි. මම වැරද්දක් කළ විට, මට පසුතැවිලිවීමට හැකි බව මම දනිමි.
   12. දේවමාළිගාවට යාමට සහ ධර්මදූත සේවයේ මෙහෙයට සූදුසුවන ආකාරයට දැන්ම මම ජීවත්වෙමි.
   13. මා උදෙසා ඇති ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම මම අනුගමනය කරමි.

5. සභාවේ පහලොස්වෙනි සභාපතිවරයා වන සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලිගේ පහත සඳහන් උපුටාගැනීම බෙදාගන්න: "මෙම සභාව එහි සභාපතිවරයාට අයිති නැත. [බව්තීස්මයේදී]. අප එක් එක්කෙනා අප වෙතට ගත් නාමය වන ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙහි ප්‍රධානියාවේ. අපි සියලුදෙනාම මෙම ශ්‍රේෂ්ට කටයුත්තේ කොටස්කරුවන් වන්නෙමු. 'මිනිසාගේ සදාකාල ජීවනය සහ අමරණීයත්වය ගෙන ඒමේ' (මෝසෙස් 1:39)

උන්වහන්සේගේ කටයුත්තට සහ උන්වහන්සේගේ මහිමයට අපගේ පියාණන්ට උපකාරකිරීම පිණිස අපි මෙහි සිටින්නෙමු. මාගේ පැත්තෙන් මගේ බැඳී සිටීම මෙන්ම, ඔබගේ පැත්තෙන් එම වගකීම්වලට ඔබ දැඩි ලෙස බැඳී සිටින්නේය. මෙම සභාවේ කිසිම කැඳවීමක් සුළු හෝ සුළු ප්‍රතිඵල ගෙන නොදෙන්නේය. මෙම වගකීම් ලුහුබැඳ යාමේදී අපි සියලුදෙනාම අන්‍යයන්ගේ ජීවිත ස්පර්ශ කරන්නෙමු" (Conference Report තුලිනි, අප්‍රේ. 1995, පි. 94; හෝ *Ensign,* මැයි 1995, පි. 71).

---

## අවසානය

| | |
|---|---|
| සාක්ෂිය | පූජකවරය නැවත පිහිටුවූ බවත්, එය දෙවියන්වහන්සේ වෙනුවෙන් ක්‍රියාකිරීමේ අධිකාරීබලය බවටත් සාක්ෂිදැරීමට ඔබට අවශ්‍යවනවා ඇත. ආරෝනික පූජකවරය ඉසිලීම පිණිස සුදුස්සන් වීමට දැන් පටන් ඒ අනුව ජීවත්වීමට පිරිමි ලමුන්ව දිරිමත්කරන අතර පූජකවරයේ සියලුම ආශිර්වාද පංති සාමාජිකයන් සියලුදෙනාම ලබාගැනීමට සුදුසු අන්-දමට ජීවත්වීමට දිරිමත්කරන්න. පූජකවරයේ නායකයන්ට ගරුකිරීමට සහ සහායවීමට ලමයින්ව දිරිගන්වන්න. |
| යෝජිත පවුලේ බෙදාගැනීම | පාඩමේ විශේෂිතවූ කොටසක්, කථාවක් වැනි දෙයක්, ප්‍රශ්න හෝ ක්‍රියාකාරකමක් නැතහොත් "නිවසේදී කියවීමට යෝජිත දේවල්" ඔවුන්ගේ පවුල් සමග බෙදාගැනීමට ලමයින් දිරිගන්වන්න. |
| නිවසේදී කියවීමට යෝජිත දේ | නිවසේදී මෙම පාඩම නිරීක්ෂනය කිරීමක් වශයෙන් දහම සහ ගිවිසුම 121:34–46 අධ්‍යයනය කිරීමට ලමයින්ට යෝජනාකරන්න.<br><br>අවසාන යාච්ඤාව දීමට ලමයෙකුට ආරාධනාකරන්න. |

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව